www.padippakam.com

# ශ්‍රී ලංකාවේ යුද අපරාධ

ආසියාව පිළිබඳ වාර්තාව අංක 191 - 2010 මැයි 17

International Crisis Group
WORKING TO PREVENT CONFLICT WORLDWIDE

ලොව පුරා ගැටුම් වැළැක්වීමට ක්‍රියා කරන - **ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම**

படிப்பகம்

www.padippakam.com

## පටුන


**සංක්ෂිප්ත අදහස හා නිර්දේශ............................... i**

**I. හැඳින්වීම.................................................................1**

**II. යුද්ධය හා එහි ප්‍රතිවිපාක..................................................3**

අ. කොටි සංවිධානයේ පරාජය.......................................3

ආ. ප්‍රතිවිපාක............................................................6

**III. ආණ්ඩුවේ ක්‍රියා........................................................9**

අ. මානුෂීය මෙහෙයුම්වලට එල්ල කළ ප්‍රහාර...................................10

ආ. රෝහල්වලට එල්ල කළ ප්‍රහාර................................................15

1. පුදුකුඩිඉරුප්පු රෝහල.............................................................16
2. පොන්නම්බලම් අනුස්මරණ රෝහල..............................18
3. පුදුමාතලන් රෝහල...................................................18
4. මුල්ලිවයික්කාල් රෝහල්...................................................19

ඇ. සිවිල් වැසියන්ට එල්ල කළ ප්‍රහාර............................................20

1. පළමු වන "යුද මුක්ත කලාපය"............................................21
2. දෙ වන "යුද මුක්ත කලාපය"............................................22
3. අවසන් "යුද මුක්ත කලාපය"................................................23

**IV. එල්ටීටීඊයේ ක්‍රියා..............................................................24**

අ. සිවිල් වැසියන් ඝාතනය හා ඔවුන්ට කුරිරු ලෙස සැලකීම............25

**V. පරීක්ෂණ සඳහා පවතින තත්ත්වය...............................................27**

අ. නීතිමය තත්ත්වය..............................................................27

ආ. ප්‍රතිපත්තිමය තත්ත්වය.....................................................28

1. දඬුවම් නොලබා සිටීම පිළිබඳ (Impunity) දුෂ්ට චක්‍රය.........................28
2. ගැටුම නැවත ආරම්භ වීම පිළිබඳ අවදානම්......................29




படிப்பகம்

www.padippakam.com


3. ශ්‍රී ලාංකික ආකෘතිය: ජාත්‍යන්තර මානුෂීය නීතියට එල්ල කළ ප්‍රහාරය...........29

4. එක්සත් ජාතීන්ට බාධා පැමිණවීම.................................29

ඇ. වග වීමේ දේශපාලනය.........................................30

1. දේශීය බලාපොරොත්තු නැතිකම...............................30

2. ජාත්‍යන්තර ක්‍රියාව...............................................31

**VI. යුක්තිය සඳහා පවතින විකල්ප.................................33**

අ. ජාත්‍යන්තර පරීක්ෂණය.............................33

ආ. ජාත්‍යන්තර අපරාධ අධිකරණය.............................34

ඇ. විදේශීය අධිකරණ බලය.........................................34

1. අපරාධ චෝදනා ඉදිරිපත් කිරීම....................................34

2. සිවිල් නඩු.........................................................35

**VII. ප්‍රතිපත්තිමය ප්‍රතිචාරය.............................................36**

**VIII. නිගමනය..............................................................37**




படிப்பகம்

www.padippakam.com

**උපග්‍රන්ථ**

අ. ශ්‍රී ලංකාවේ සිතියම...........................................................38

ආ. 2009 ජනවාරි 2 දා සිට වන්නියේ හා යුද පෙරමුණුවල සිතියම.............39

ඇ. පළමු වන "යුද මුක්ත කලාපයේ" සිතියම.................................40

ඈ. දෙ වන සහ තුන් වන "යුද මුක්ත කලාපවල" සිතියම........................41

ඉ. 2008 අවසාන භාගයේ සිට වන්නිය තුළ පැවති රෝහල්වල සිතියම..........42

ඊ. ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම පිළිබඳව..............................43

උ. 2007 සිට අර්බුද කණ්ඩායමේ වාර්තා හා ආසියාව පිළිබඳ කෙටි සටහන්..44

ඌ. අර්බුද කණ්ඩායමේ භාරකාර මණ්ඩලය...........................47



படிப்பகம்

www.padippakam.com



## ශ්‍රී ලංකාවේ යුද අපරාධ

### සංක්ෂිප්ත අදහස් හා නිර්දේශ

සිය 30 අවුරුදු සිවිල් යුද්ධයේ අවසන් මාස පහ තුළ දී ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා හා දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය (Liberation Tigers of Tamil Eelam - LTTE - එල්ටීටීඊ), ජාත්‍යන්තර මානුෂීය නීතිය නැවත නැවතත් උල්ලංඝනය කළෝ ය. වසර ගණනාවක් තිස්සේ දිග හැරුණු ගැටුම මුළුල්ලෙහි පාර්ශ්වයන් දෙක ම කෲර ක්‍රියාවල යෙදුණු නමුත්, විශේෂයෙන් ම 2009 ජනවාරි මාසයේ සිට ආණ්ඩුව ජයග්‍රහණය ප්‍රකාශයට පත් කළ මැයි මාසය දක්වා කාලය තුළ දී උල්ලංඝනයන්හි පරිමාණය හා ස්වභාවය වඩා නරක අතට හැරුණේය. ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම විසින් රැස් කර ගනු ලැබූ සාක්ෂිවලින් ඇඟවෙන්නේ මෙම මාසවල දී දසදහස් ගණන් පිරිමින්, කාන්තාවන්, ළමයින් හා වැඩිහිටියන් ඇතුළු දෙමළ සිවිල් වැසියන් ඝාතනයට ලක් වූ බවය. තවත් කිව නොහැකි තරමේ සංඛ්‍යාවක් තුවාල ලැබූ අතර සියදහස් ගණනකට නිසි ආහාර හා වෛද්‍ය ප්‍රතිකාර අහිමි වූ හේතුවෙන් තවත් මරණ සිදු වූ බවය.

එමෙන් ම, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා යුද අපරාධ සිදු කළේ ආණ්ඩුවේ හා හමුදාවේ වගකිව යුතු ඉහළ පෙළේ නායකයන් සමග එක්ව විය හැකි බව විශ්වාස කිරීමට ද මෙම සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සැපයෙන්නේය. එල්ටීටීඊය හා එහි නායකයන් විසින් සිදු කරනු ලැබූ යුද අපරාධ පිළිබඳව ද සාක්ෂි පවතින නමුත්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ඝාතනයට ලක් වූ බැවින් කිසි දිනක අධිකරණ ක්‍රියාවලියකට මුහුණ නොදෙනු ඇත. අව්‍යාජ පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කරන දේශපාලන අධිෂ්ඨානයක් හෝ හැකියාවක් දේශීය වශයෙන් නොමැති වීම, එමෙන් ම ශ්‍රී ලංකාව තුළ ඇති වූ ගැටුමට බලපෑ දුක්ගැනවිලිවලට විසඳුම් සෙවීම පිළිබඳ අවශ්‍යතාව සහ වෙනත් ආණ්ඩු තම අභ්‍යන්තර ගැටුම්වල දී ශ්‍රී ලාංකික කැරලි විරෝධී ආකෘතිය යොදා ගැනීමට ඉඩ තිබෙන තත්ත්වය තුළ, චූදිත අපරාධ පිළිබඳව ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම අත්‍යවශ්‍ය දෙයක් වී ඇත්තේය.

පහත දැක්වෙන චෝදනා සම්බන්ධයෙන් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයකට බලය පැවරිය හැකි ප්‍රමාණවත්, විශ්වසනීය සාක්ෂි අර්බුද කණ්ඩායම සතුව පවතී.



படிப்பகம்

- **හිතාමතා සිවිල් වැසියන්ට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම.** ජනවාරි මස අග සිට, ආණ්ඩුව හා ආරක්ෂක හමුදා, ආණ්ඩුව විසින් ප්‍රකාශිත යුද මුක්ත කලාප තුළට ගමන් කිරීමට සියදහස් ගණනක් සිවිල් වැසියන් පෙලඹවූහ. අනතුරුව, නැවත නැවත හා තීව්‍රතාව වඩ වඩා ඉහළ නංවමින් එල්ල කළ කාලතුවක්කු හා මෝටාර් වෙඩි වරුසාවලට සහ වෙනත් වෙඩි තැබීම්වලට එම ජනයා ගොදුරු කළෝ ය. සිවිල් ජනගහනයේ ප්‍රමාණය හා ඔවුන් සිටින ස්ථානය සහ හානියට පත් වූ සිවිල් වැසියන් ප්‍රමාණය කොතරම් ද යන වග ආණ්ඩුව හා ආරක්ෂක හමුදා දැන සිටි නමුත්, මැයි මස මුළුල්ලේ ම මෙය නොකඩවා සිදු විය.

- **හිතාමතා රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම.** රෝහල් පැවති ස්ථාන හා ඒවායේ ක්‍රියාකාරිත්වය නිශ්චිත වශයෙන් දැන සිටිය ද ආරක්ෂක හමුදා නානාවිධ අවස්ථාවල දී රෝහල්වලට හා තාවකාලික වෛද්‍ය මධ්‍යස්ථානවලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ අතර, ඉන් බොහෝ ඒවා ඒ වන විට තුවාලකරුවන්ගෙන් හා රෝගීන්ගෙන් පිරී ඉතිරී ගොස් තිබුණි. මෙම සිදුවීම් අතරතුර දී වෛද්‍ය කාර්ය මණ්ඩලය, එක්සත් ජාතීන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (International Committee of the Red Cross - ICRC) හා වෙනත් සංවිධාන විසින් ෂෙල් වෙඩි ප්‍රහාර පිළිබඳව අඛණ්ඩව දැනුවත් කරන ලද නමුත්, වෛද්‍ය මධ්‍යස්ථාන අත හැර යාමට සිවිල් වැසියන්ට බල කරමින් ආණ්ඩුව හා ආරක්ෂක හමුදා මැයි මස මුළුල්ලේ ම නොකඩවා ප්‍රහාර එල්ල කළෝ ය.

- **හිතාමතා මානුෂීය මෙහෙයුම්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම.** මානුෂීය මෙහෙයුම් සිදු වන ස්ථාන හා ආහාර බෙදා හරින ස්ථාන නිවැරදිව දැන සිටිය ද මානුෂීය සේවකයන්, වාහන හා සැපයුම්වලින් සහ සිවිල් වැසියන්ගෙන් පිරී තිබුණු මෙම ප්‍රදේශවලට ආරක්ෂක හමුදා නැවත නැවතත් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළෝ ය. මූලික මානුෂීය ආධාර බෙදා හැරීමට හෝ ලබා ගැනීමට උත්සාහ කරමින් සිටි කාන්තාවන්, ළමයින් හා බිළිඳුන් ඇතුළු බොහෝ දෙනෙක් ඝාතනයට හෝ තුවාලවලට ගොදුරු වූවෝය.

ආණ්ඩුව සිවිල් ජනගහනයට ආහාර හා වෛද්‍ය ප්‍රතිකාර සැපයීම අවහිර කිරීම හේතුවෙන් - සිවිල් ජනගහනය සැබෑ සංඛ්‍යාවෙන් තුනෙන් එකකටත් වඩා අඩු බව හිතාමතා කියමින් ප්‍රමාණවත් සැපයුම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම ද මීට ඇතුළත්ය - ආරක්ෂක හමුදා එල්ල කළ ෂෙල් වෙඩි ප්‍රහාරවල ප්‍රතිවිපාක සැලකිය යුතු ලෙස වඩා නරක අතට හැරුණි.

මෙම චෝදනා සම්බන්ධයෙන් අදහස් දක්වන ලෙස අර්බුද කණ්ඩායම කළ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීම ආණ්ඩුව ප්‍රතික්ෂේප කළේය.

එල්ටීටීඊය පහත දැක්වෙන ක්‍රියාවන්හි යෙදුණු බවට ද ප්‍රබල සාක්ෂි තිබේ:

- **හිතාමතා සිවිල් වැසියන්ට වෙඩි තැබීම.** ෂෙල් වෙඩි ප්‍රහාරවලින් බේරී පලා යාමට හා ආණ්ඩුවේ පාලනය යටතේ පැවති ප්‍රදේශවලට මාරු වීමට උත්සාහ කරමින් සිටි සිවිල් වැසියන්ට ගැටුම් කලාපය තුළ දී වෙඩි තබා, එල්ටීටීඊය බොහෝ දෙනෙකු ඝාතනයට හෝ තුවාලවලට ගොදුරු කළේය.

- **හිතාමතා සිවිල් වැසියන්ට පීඩා පැමිණවීම.** ෂෙල් වෙඩි ප්‍රහාරවලින් හා මානුෂීය සැපයුම් හිඟයෙන් එල්ල වූ බරපතළ අනතුර තිබිය දී ම, සිවිල් වැසියන් තුවාල ලබමින් සිටිය දී සහ මිය යමින් සිටිය දී පවා, එල්ටීටීඊය සිවිල් වැසියන්ට ගැටුම් කලාපය අත් හැර යාමට ඉඩ දීම ප්‍රතික්ෂේප කළේය. එමෙන් ම, සටන් කිරීම සඳහා හෝ කම්කරුවන් ලෙස සේවය කිරීම සඳහා බලාත්කාරයෙන් බොහෝ සිවිල් වැසියන් බඳවා ගත් එල්ටීටීඊය, බඳවා ගැනීම්වලට විරෝධය පෑ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට පහර දුන්නේය.

2009 අගෝස්තු මාසයේ සිට අර්බුද කණ්ඩායම රැස් කර ගත් සැලකිය යුතු සාක්ෂි සමූහයෙන්, දෙපාර්ශ්වයේ ම එදිරිවාදී කල්ක්‍රියාව සහ මිලිටරි හා දේශපාලන නායකත්වය ඉටු කළ භූමිකාව පිළිබඳව පරීක්ෂණයකට බල කරන තත්ත්වයක් සම්පාදනය වේ. අර්බුද කණ්ඩායම ලබා ගෙන ඇති හා විශ්වාස කළ හැකි බව සලකන ඇසින් දුටු සාක්ෂිකරුවන් බොහෝ ගණනකගේ ප්‍රකාශ ද, එමෙන් ම නානාවිධ විශ්වසනීය මූලාශ්‍රවලින් ලැබුණු සිය ගණනක් ඡායාරූප, වීඩියෝ පට, චන්ද්‍රිකා ඡායාරූප, ඉලෙක්ට්‍රොනික අදහස් හුවමාරු හා ලියවිලි ද එහි අඩංගු වේ. එහෙත්, ඉන් ආවරණය වන චූදිත උල්ලංඝනයන් සංඛ්‍යාව සුලු ප්‍රමාණයක් වුවත්, එය යුද්ධයේ අවසන් වසර පිළිබඳව විභාග කිරීම සඳහා දරන වඩා බලගතු පරිශ්‍රමයක් විය

යුතු යමක මුල් පියවරකි. පරීක්ෂා කළ යුතු අනෙක් චෝදනා අතර තිබෙන්නේ, එල්ටීටීඊය විසින් ළමයින් බඳවා ගනු ලැබීම හා ආයුධ පසෙක තබා යටත් වීමට උත්සාහ දරමින් සිටි අය ආරක්ෂක හමුදා විසින් ඝාතනය කරනු ලැබීමය.

උල්ලංඝනය කිරීම් සිදු වෙද්දී ජාත්‍යන්තර ප්‍රජාවේ බොහෝ රටවල් ඒවාට ඇස් පියා ගෙන සිටියේය. කවර හෝ අපරාධයක් සිදු වන බව ආණ්ඩුව විසින් දිගින් දිගට ම ප්‍රතික්ෂේප කරනු ලබන තතු තුළ ඇතැම් රටවල් ආත්ම සංයමය ඉල්ලා ප්‍රකාශ නිකුත් කළ නමුත්, කිසිදු පියවරක් නොගත්තේය. බොහෝ රටවල් එල්ටීටීඊය ත්‍රස්තවාදීන් බව ප්‍රකාශයට පත් කර තිබූ අතර, ඔවුන්ගේ පරාජය ප්‍රිය කළේය. දෙමළ ජනයාගේ දුක්ගැනවිලි විසඳීමේ දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා හෝ මානව අයිතිවාසිකම්වල කවර හෝ අභිවෘද්ධියක් සඳහා බල කිරීමක යෙදීමට අසමත් වූ ඔවුහු, ආණ්ඩුවේ දරදඬු ප්‍රතිචාරය දිරි ගැන්වූවෝය. අවසානයේ දී එල්ටීටීඊයේ මිලිටරි විනාශය ළඟා වූයේ සිවිල් වැසියන් අතිවිශාල සංඛ්‍යාවක් පීඩාවන්ට ගොදුරු කරමින් හා යුද නීතිවලට දැඩි අභියෝගයක් එල්ල කරමින්ය. එය එක්සත් ජාතීන් පිළිබඳ විශ්වසනීයත්වයට ද හානි කළ අතර, ශ්‍රී ලංකාව තුළ හා අන් තැන්වල දෙමළ ජනයා අතර පැවති මහත් දොම්නස තව දුරටත් ගැඹුරු කොට, කල් පවත්නා සාමය ළඟා කර ගැනීම අසීරු විය හැකි වාතාවරණයක් නිර්මාණය කළේය. දැන් තවත් රටවල් ගණනාවක්, කැරලිකරුවන් හා වෙනත් කණ්ඩායම් සමග පොර බැදීමේ ක්‍රමයක් ලෙස සලකා, "ශ්‍රී ලාංකික විකල්පය" - එනම්, අදාන්ත මිලිටරි ක්‍රියා, සාකච්ඡා ප්‍රතික්ෂේප කිරීම, මානුෂීය ගැටලු නොතැකීම - සලකා බලමින් සිටී.

මෙම හානියෙන් ප්‍රකෘති තත්ත්වයට පත් වීමට නම්, දෙපාර්ශ්වය ම සිදු කළ බවට චූදිත යුද අපරාධ පරීක්ෂා කිරීම සඳහා හා ඒවාට වගකිව යුත්තන්ට චෝදනා ඉදිරිපත් කිරීම සඳහා දරන සහයෝගී පරිශ්‍රමයක් තිබිය යුතු වන්නේය. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ *(International Criminal Court - ICC)* සාමාජික රාජ්‍යයක් නොවන අතර, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය කෙටි කාලයක් තුළ මෙම අපරාධ ජාත්‍යන්තර අපරාධ අධිකරණය වෙත යොමු කරතියි සිතිය නොහැකිය. එල්ටීටීඊයේ ඇතැම් අය ශ්‍රී ලංකාව තුළ දී නඩු මගට පිවිසිය හැකි නමුත්, දඬුවම් නොලබා සිටීමේ සංස්කෘතිය දැඩි ලෙස තහවුරු වී ඇති තත්ත්වය තුළ, ආණ්ඩුව හෝ ආරක්ෂක හමුදා සම්බන්ධයෙන් සිදු කෙරෙන කුමන දේශීය පරීක්ෂණයක් වුව ද අපක්ෂපාතී වීමට සැබවින් ම කිසිදු ඉඩක් නැත්තේය. ප්‍රමුඛතාව ලැබිය යුත්තේ එක්සත් ජාතීන්ගේ නියෝගයෙන් සිදු කෙරෙන ජාත්‍යන්තර පරීක්ෂණයකට වන අතර,

චූදිත අපරාධ සම්බන්ධයෙන් අධිකරණ බලය සහිත - දෙරටක පුරවැසි භාවය සහිත පුරවැසියන් හෝ වැසියන් සැක කිරීමේ අවස්ථාව තිබෙන එක්සත් ජනපදය වැනි රටවල් ඇතුළු - රටවල් දැඩි අධිෂ්ඨානයෙන් පරීක්ෂණ කර ගෙන යා යුතුය.

**නිර්දේශ**

**ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට:**

1. ගැටුම් කලාපය වෙත නිදහස් ප්‍රවේශය හා සාක්ෂිකරුවන්ගේ සැබෑ ආරක්ෂාව සහතික කරමින්, එක්සත් ජාතීන්ගේ නියෝගයෙන් සිදු කෙරෙන ජාත්‍යන්තර පරීක්ෂණයක් ඇතුළු, යුද අපරාධ පිළිබඳ චෝදනා පරීක්ෂා කිරීම සඳහා දැරෙන ජාත්‍යන්තර ප්‍රයත්න සමග පූර්ණ ලෙස සහයෝගී විය යුත්තේය.

2. ජාත්‍යන්තර නීතියෙන් නියම කරනු ලබන පූර්ණ ආරක්ෂාව ලබා ගැනීමට එල්ටීටීඊ සාමාජිකයන්ට හා ඔවුන්ට එරෙහි සාක්ෂිකරුවන්ට ඉඩ දෙමින් සහ ජාත්‍යන්තර අධීක්ෂණයට අවසර දෙමින්, යුද අපරාධ පිළිබඳව සැක කරනු ලබන එල්ටීටීඊ සාමාජිකයන් සම්බන්ධයෙන් විවෘත අධිකරණයෙහි නඩු විභාග කළ යුත්තේය, නැතහොත් ප්‍රමාණවත් සාක්ෂි නොමැති නම් ඔවුන් නිදහස් කළ යුත්තේය.

3. අධිකරණයෙන් බැහැර ඝාතන, වධහිංසා පැමිණවීම, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ආහාර සඳහා ඇති අයිතිය, සෞඛ්‍යය සඳහා ඇති අයිතිය, ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියා කිරීමේ දී මානව අයිතිවාසිකම්වල ආරක්ෂාව හා මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ තත්ත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ සබැඳියාකරුවන්ටත්, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ සහ ළමයින් හා සන්නද්ධ ගැටුම පිළිබඳ විශේෂ නියෝජිතයන්ටත්, එදිරිවාදීකම්වල අවසන් වසරේ කල්ක්‍රියාව පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ චාරිකා කරන ලෙස ආරාධනා කළ යුත්තේය.

4. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහ/හෝ මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ සහාය ඇතිව, යුද්ධයේ අවසන් මාසවල දී ඝාතනයට ලක් වූවන්ගේ, තුවාල ලැබූවන්ගේ හා අතුරුදන් වූවන්ගේ පූර්ණ හා

www.padippakam.com

ප්‍රසිද්ධ ලැයිස්තුවක් සම්පාදනය කළ යුත්තේ ය. ඔවුන් මරණයට පත් වූ, තුවාල ලැබූ හෝ අතුරුදන් වූ වාතාවරණය ද ඊට ඇතුළත් කළ යුත්තේ ය. එමෙන් ම, ඝාතනයට ලක් වූ හෝ තුවාල ලැබූ හා දේපළ විනාශ වූ හෝ හානි වූ සිවිල් වැසියන්ට මරණ සහතික නිකුත් කළ යුත්තේය, මූල්‍ය වන්දි ලබා දිය යුත්තේය.

5. එල්ටීටීඊ සැකකරුවන් හෝ යටත් වූවන් රඳවා සිටින සියලු රැඳවුම් කඳවුරු වෙත ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට පූර්ණ ප්‍රවේශය ලබා දිය යුතු අතර, රඳවා සිටින පුද්ගලයන්ට ජාත්‍යන්තර නීතිය යටතේ හිමි පූර්ණ රැකවරණය සලසා ගැනීමට ඉඩ දිය යුත්තේය.

**එක්සත් ජාතීන්ට හා එහි සාමාජික රාජ්‍යයන්ටඃ**

6. දෙපාර්ශ්වයේ ම කල්ක්‍රියාව පරීක්ෂා කිරීමට, සෑහෙන පමණ කෙටි කාලයක් තුළ දී සිය කටයුත්ත සම්පූර්ණ කිරීමට හා කවර හෝ අපරාධයක් පිළිබඳව වග වීම සහතික කිරීම සඳහා ජාතික හා ජාත්‍යන්තර බලාධිකාරයන් විසින් ගත යුතු පියවරයන් නිර්දේශ කිරීමට පවරමින්, ගැටුමේ අවසන් වසර තුළ ශ්‍රී ලංකාවේ දී කළ බවට චුදිත යුද අපරාධ පිළිබඳව ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයකට අවසර දිය යුත්තේය.

7. සටන් විරාමයකට බල කිරීමට දැරූ ප්‍රයත්නයන් හා ශ්‍රී ලංකා ආණ්ඩුවේ යුද සිර කඳවුරුවලට මැදිහත් වීම කරණ කොට ගෙන 2008 සැප්තැම්බරයේ දී එක්සත් ජාතීන් කිලිනොච්චියෙන් ඉවත් කිරීම පිළිබඳව විභාග කරමින්, ගැටුමේ අවසන් වසර තුළ දී එක්සත් ජාතීන්ගේ දේපළවලට හා කාර්ය මණ්ඩලයට සහ එක්සත් ජාතීන්ගේ කල්ක්‍රියාවට එල්ල වූ ප්‍රහාර පිළිබඳව පරීක්ෂණ ආරම්භ කළ යුත්තේය.

8. අධිකරණයෙන් බැහැර ඝාතන, වධහිංසා පැමිණවීම, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, ආහාර සඳහා ඇති අයිතිය, සෞඛ්‍යය සඳහා ඇති අයිතිය, ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියා කිරීමේ දී මානව අයිතිවාසිකම්වල ආරක්ෂාව හා මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්ගේ තත්ත්වය පිළිබඳ විශේෂ සබැඳියාකරුවන්ට ද, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශේෂ නියෝජිතයාට ද, එදිරිවාදීකම්වල අවසන් වසරේ කල්ක්‍රියාව පිළිබඳව, විශේෂයෙන් ම අධිකරණයෙන් බැහැර ඝාතන හා වධහිංසා පැමිණවීම් පිළිබඳව පූර්ණ පරීක්ෂණ සිදු කිරීම සඳහා බලය දිය යුත්තේ ය. එමෙන් ම, ළමයින් හා සන්නද්ධ ගැටුම පිළිබඳ විශේෂ නියෝජිතයාට, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සහ



படிப்பகம்

ළමයින් ඝාතනයට හා අංග විකල භාවයට පත් කිරීම පිළිබඳව වඩා පූර්ණ ලෙස පරීක්ෂා කිරීම සඳහා බලය දිය යුත්තේය.

9. ශ්‍රී ලංකාවේ දී කළ බවට චුදිත යුද අපරාධ පරීක්ෂා කිරීමට දැරෙන ඕනෑ ම විශ්වසනීය පරිශ්‍රමයක් සඳහා, එක්සත් ජාතීන්ගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින අදාළ සියලු තොරතුරු භුක්ති විඳිය හැකි හෝ ලබා ගත හැකි තත්ත්වයට පත් කළ යුත්තේය.

10. එක්සත් ජාතීන්ගේ සාමසාධක දූත මෙහෙයන්ට දායක කර ගන්නා ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලයේ කවර හෝ පුද්ගලයෙකු යුද අපරාධවලට හෝ මානව අයිතිවාසිකම් උල්ලංඝනයන්ට සම්බන්ධ බවට චුදිත ද යන්න හඳුනා ගැනීම සඳහා, සේවයෙහි යෙදීමට කලින් ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලය විධිමත් පරීක්ෂාවකට ලක් කරන බව ද සහතික කරමින්, එම දූත මෙහෙයන්ට ශ්‍රී ලංකාව ලබා දෙන දායකත්වය විශ්වීය මානව අයිතිවාසිකම් මූලධර්මවලට අනුරූප බව සහතික කළ යුත්තේය.

**ඉන්දියාවට, එක්සත් ජනපදයට, කැනඩාවට, ඕස්ට්‍රේලියාවට, එක්සත් රාජධානියට, ප්‍රංශයට, යුරෝපා සංගමයේ වෙනත් රටවලට, ස්විට්සර්ලන්තයට හා වෙනත් රටවලටඃ**

11. මානුෂීය ලෙස සලකන බව හා සාධාරණ නඩු විභාග පැවැත්වෙන බව සහතික නොකෙරෙන්නේ නම් එල්ටීටීඊ සැකකරුවන් ශ්‍රී ලංකාවට පිටුවාහල් නොකළ යුත්තේය. ඒ වෙනුවට, හැකි හා අදාළ තැන්වල දී දේශීය අධිකරණ තුළ ඔවුන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කළ යුත්තේය.

12. අධිකරණ බලය පවතින අවස්ථාවන් හී තම පුරවැසියන් හෝ වැසියන් සම්බන්ධ බවට යුද අපරාධයන් හෝ මානව අයිතිවාසිකම් අපයෝජනයන් සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කළ යුත්තේ ය. එවැනි පරීක්ෂණ සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බව සහතික කළ යුත්තේ ය. චන්ද්‍රිකා ඡායාරූප ඇතුළු ආණ්ඩුවල සන්තකයේ හෝ පාලනය යටතේ පවතින සාක්ෂි බෙදාහදා ගත යුත්තේය.

13. ආරක්ෂක හමුදාවන්හි හෝ එල්ටීටීඊයේ සාමාජිකයන් වන චුදිතයන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පැවරෙන නිරර්ථක නොවන සිවිල් නඩුවලට සහාය දිය යුත්තේ ය. මේ සඳහා නෛතික විනිර්මුක්තිය සීමා කිරීම ද අවශ්‍ය වන්නේ ය.

www.padippakam.com

14. විශේෂයෙන් ම, විශ්වසනීය පරීක්ෂණ සමග සහයෝගී වීමට නිලධාරීන්ට ඉඩ සලසා දීමෙන්, යුද අපරාධවල සාක්ෂිකරුවන්ට රැකවරණය හෝ වෙනත් ආරක්ෂිත තත්ත්වයක් පිරිනැමිය යුත්තේ ය. ඔවුන් හා යුද අපරාධ පිළිබඳ සාක්ෂි සුරැකීමට ක්‍රියා කළ යුත්තේය.

15. චුදිත යුද අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා දැරෙන ජාත්‍යන්තර පරිශ්‍රමයන් සමග සහයෝගී නොවන්නේ නම් හෝ සහයෝගී වන තෙක්, ශ්‍රී ලාංකික නිලධාරීන්ට හා ඔවුන්ගේ පවුල්වලට චාරිකා පිළිබඳ සීමාවන් ඇතුළු ඉලක්ක කළ සම්බාධක පැනවිය යුත්තේය.

**බ්‍රසල්ස්**, 2010 මැයි 17



படிப்பகம்

www.padippakam.com



# ශ්‍රී ලංකාවේ යුද අපරාධ

## I. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ පාර්ශ්ව දෙක ම 30 වසරක ගැටුම තුළ දී ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කළෝ ය.[1] කෙසේ වුව ද, විශේෂයෙන් ම 2009 මැයි මාසයේ දී ආණ්ඩුව දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය *(Liberation Tigers of Tamil Eelam - LTTE - එල්ටීටීඊ)*, පරාජය කර ජය ගත් බව ප්‍රකාශයට පත් කිරීමට පෙරාතු මාසවල දී උල්ලංඝනයන් නිරතුරුව සිදු වූ අතර, ඒවා මාරක වූයේ ය. ආණ්ඩුවේ ආරක්ෂක හමුදා සිවිල් වැසියන්ට, රෝහල්වලට හා මානුෂීය මෙහෙයුම්වලට ප්‍රහාර එල්ල කරමින් නැවත නැවතත් නීතිය උල්ලංඝනය කළ බවටත්, එල්ටීටීඊය සිවිල් වැසියන්ට වෙඩි තැබීම සහ ඔවුන් තුවාල ලද විට හා මිය යමින් සිටි විට පවා ගැටුම් කලාපයෙන් ඉවත් වී යාම වැළැක්වීම ද ඇතුළුව, සිවිල් වැසියන් ඝාතනය කරමින්, තුවාල කරමින් නැතහොත් අන්තරායට පත් කරමින් නීතිය උල්ලංඝනය කළ බවටත් වඩ වඩා සාක්ෂි ලැබෙමින් තිබේ. යුද්ධයේ අවසන් මාස පහ ඇතුළත දී සටන්කාමී නොවූ දෙමළ පිරිමින්, කාන්තාවන්, ළමයින් හා වැඩිහිටියන් දසදහස් ගණනක් ඝාතනය කරනු ලැබූ බව ජාත්‍යන්තර අර්බුද කණ්ඩායම විශ්වාස කරයි.

2009 අගෝස්තු මාසයේ දී, අර්බුද කණ්ඩායම යුද්ධයේ අවසන් මාසවල එදිරිවාදීකම් සම්බන්ධ සාක්ෂි රැස් කිරීමට පටන් ගත්තේය. අර්බුද කණ්ඩායම විසින් ලබා ගන්නා ලද හා විශ්වසනීය බවට කල්පනා කරන ලද ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මෙන් ම පුළුල් පරාසයකට අයත් මූලාශ්‍රවලින් ලැබුණු ඡායාරූප, වීඩියෝ පට, චන්ද්‍රිකා ඡායාරූප, විද්‍යුත් අදහස් හුවමාරු හා ලියවිලි සිය ගණනක් ඊට ඇතුළත් වන්නේය.

---

[1] බලන්න අර්බුද කණ්ඩායමේ Asia Reports (ආසියාව පිළිබඳ වාර්තා), අංක 135, *Sri Lanka's Human Rights Crisis*, 2007 ජූනි 14; අංක 146, *Sri Lanka's Return to War: Limiting the Damage*, 2008 පෙබරවාරි 20; අංක 172, *Sri Lanka: Politicised Courts, Compromised Rights*, 2009 ජූනි 30; සහ අංක 186, *The Sri Lankan Tamil Diaspora After the LTTE*, 2010 පෙබරවාරි 23; එමෙන් ම Asia Briefing (ආසියාව පිළිබඳ කෙටි සටහන්), අංක 99, *Sri Lanka: A Bitter Peace*, 2010 ජනවාරි 11.



படிப்பகம்

www.padippakam.com

කෙසේ වුව ද, එහි ඇතුළත් තොරතුරු ප්‍රමාණය ඉතා සුලු වේ; සැබවින් ම ඉන් ආවරණය වන්නේ සිදු වන්නට ඇති උල්ලංඝනයන්ගෙන් සුලු සංඛ්‍යාවක් පමණක්ය, හසු කර ගනු ලබන්නේ අතලොස්සක් පුද්ගලයන්ගේ චුදිත භූමිකාවන් පමණක්ය.

දෙපාර්ශ්වය ම යුද අපරාධ සිදු කළ බව විශ්වාස කිරීමට මෙම සාක්ෂිවලින් ප්‍රමාණවත් පදනමක් සැපයෙන්නේය. එමෙන් ම, ඉන් ආණ්ඩුවේ හා මිලිටරියේ ඉහළ පෙළේ නායකයන් ඇතුළු විශේෂ පුද්ගලයන් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම සඳහා ද ප්‍රමාණවත් පදනමක් සැපයේ. එල්ටීටීඊයේ නායකත්වය සම්බන්ධයෙන් ද මෙය අදාළ වන්නේය; සටනේ අවසන් දිනවල දී ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ඝාතනයට ලක් වූ නමුත්, ඇතැමෙකු ශ්‍රී ලාංකික අත් අඩංගුවේ පසු වන අතර, ඇතැමෙකු විදේශ රටවලට පැන යන්නට ඇත.

මෙම සිදුවීම් පසුපස ලුහුබැඳීමට බල කරන හේතු තිබෙන්නේය. චුදිත අපරාධ මෑත අවුරුදුවල දී සිවිල් වැසියන් දැවැන්ත පරිමාණයකින් පීඩාවට පත් වූ ඉතා ම දරුණු අපරාධ අතරට අයත් ඒවා වේ. එල්ටීටීඊය විනාශ කිරීම සඳහා ආණ්ඩුව විසින් තෝරා ගනු ලැබූ මිලිටරි මූලෝපාය, සටන්කරුවන් හා සිවිල් වැසියන් අතර වෙනස පිළිබඳ මූලධර්මය බරපතළ ලෙස බාදනය කර දැමීමක් පිළිබිඹු කරයි.[2] සන්නද්ධ ගැටුම් තත්ත්වයක් තුළ දී හෝ එවැනි ක්‍රියාවන්ට දක්වන ප්‍රතිචාරය සන්නද්ධ ගැටුමක ස්වරූපය ගන්නා තත්ත්වයක් තුළ දී සිදු වන - සිවිල් වැසියන් ඝාතනය කිරීම හෝ ඔවුන් ප්‍රාණ ඇපයට ගැනීම වැනි - "ත්‍රස්තවාදී" ලෙස සලකනු ලබන ක්‍රියාවන්හි දී ඇතුළුව සියලු සන්නද්ධ ගැටුම්වල දී ජාත්‍යන්තර මානුෂීය නීතිය අඛණ්ඩව සමාන

[2] වෙනස පිළිබඳ මූලධර්මය ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලික මූලධර්මයක් වේ. ගැටුමක පාර්ශ්වයන් හැම විට ම සිවිල් වැසියන් හා සටන්කරුවන් සහ සිවිල් ඉලක්ක හා මිලිටරි ඉලක්ක එකිනෙකින් වෙන් කර ගත යුතු බව එයින් තහවුරු වෙයි. ප්‍රහාර එල්ල කළ හැක්කේ සටන්කරුවන්ට හෝ මිලිටරි ඉලක්කවලට පමණක්ය. සිවිල් වැසියන්ට හෝ සිවිල් ඉලක්කවලට ප්‍රහාර එල්ල නොකළ යුත්තේය. Jean-Marie Henckaerts, "Study on customary international humanitarian law: A contribution to the understanding and respect for the rule of law in armed conflict," *International Review of the Red Cross* 87 (ඉන්ටර්නැෂනල් රිවීව් ඔෆ් ද රෙඩ් ක්‍රොස් 87), අංක 857, (2005 මාර්තු), 198 පි.



படிப்பகம்

www.padippakam.com

ආකාරයෙන් යොදා ගැනීම තීරණාත්මක වන්නේය.[3] ජාත්‍යන්තර මානුෂීය නීතියට ගරු කිරීමට අසමත් වීම යුක්ති සහගත කිරීම සඳහා ත්‍රස්තවාදය පිළිබඳ ව්‍යාජ හේතුව යොදා ගැනීමෙන් ඇඟවුම් සහිත හා හානිකර ප්‍රතිඵලයක් අත් විය හැකිය. තම රටවල පවතින ගැටුම්වල දී "ශ්‍රී ලංකා විකල්පය" යොදා ගැනීම පිළිබඳව රටවල් කිහිපයක් තුළ දැනටමත් සාකච්ඡා ආරම්භ වී ඇත.[4]

යුක්තිය ඉටු කිරීමේ වගකීම නිසැක ලෙස ම පාහේ පතිත වන්නේ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින්නන් මතය. එල්ටීටීඊ නායකයන්ට එරෙහිව දේශීය නීතිමය ක්‍රියාමාර්ග ගණුනත්, ආණ්ඩුවේ හෝ මිලිටරියේ නායකයන් යුක්තිය ඉදිරියට ගෙන ඒමට තිබෙන අවස්ථාව බෙහෙවින් ම අඩු විය හැක්කේය. ශ්‍රී ලංකාව තුළ පවතින දඬුවම් නොලබා

---

[3] පොදුවේ බලන්න, "Terrorism and international humanitarian law," resource page (මූලාශ්‍ර පිටුව), International Committee of the Red Cross (ජාත්‍යන්තර රතු කුරුස කමිටුව) (ICRC), www.icrc.org/web/eng/siteeng0.nsf/html/terrorism.

[4] "the Sri Lanka option" (ශ්‍රී ලංකා විකල්පය) පිළිබඳ සාකච්ඡාව සඳහා, බලන්නː V.K. Shashikumar, "Lessons from the War in Sri Lanka," *Indian Defence Review* 24 (ඉන්ඩියන් ඩිෆෙන්ස් රිවීව් 24), අංක 3, (2009 ජුලි-සැප්තැම්බර්) සහ "The Rajapaksa Model of Defeating Terror, Securing Peace and National Reconciliation", *Indian Defence Review* 24 (ඉන්ඩියන් ඩිෆෙන්ස් රිවීව් 24), අංක 4, (2009 ඔක්තෝබර්-දෙසැම්බර්), www.indiandefencereview.com; Lawrence Hart, "The option no one wants to think about", *The Jerusalem Post* (ද ජෙරූසලෙම් පෝස්ට්), 2009 දෙසැම්බර් 9, www.jpost.com/servlet/Satellite?cid=1259243055252&pagename=JPArticle%2FShowFull; "Gov-ernment mulls adopting tactics of Sri Lanka", *Bangkok Post* (බැංකොක් පෝස්ට්), 2009 ඔක්තෝබර් 23, www.bangkokpost.com/news/local/26109/govt-mulls-adopting-tactics-of-sri-lanka; "Is Than Shwe seeking military advice in Sri Lanka?", The Irrawaddy (ද ඉරවඩ්ඩි), 2009 නොවැම්බර් 12, www.irrawaddy.org/article.php?art_id=17202; "No Sri Lanka solution to Moro conflict", *Inquirer* (ඉන්ක්වයරර්), 2009 ඔක්තෝබර් 4, http://newsinfo.inquirer.net/breakingnews/nation/view/20091004-228327/No-Sri-Lanka-solution-to-Moro-conflict; "Border tribes ask Pakistan to crush the Taliban", Associated Press (ඇසෝසියේටඩ් ප්‍රෙස්), 2010 මාර්තු 21; සහ "B'desh keen to learn counter-insurgency tactics from Lanka", News 24 (නිවුස් 24), 2010 මාර්තු 23, www.news24.lk/20100323673/news/sri-lanka-local-news/bdesh- keen-to-learn-counter-insurgency-tactics-from-lanka.html.



படிப்பகம்

සිටීමේ සංස්කෘතිය නොකඩවා වෙනස් නොවී පැවතෙන හෙයින්, දෙමළ ජනතාවගේ බරපතළ තුවාල සුවපත් කිරීමට නුපුළුවන් විය හැකි අතර, ගැටුම පෝෂණය කළ දුක්ගැනවිලි නොවිසඳෙනු ඇත්තේය. යුක්තිය හඹා යාමට අසමත් වීමකින්, නිසැක ලෙස ම පාහේ තවත් ගැටුම්වලට මග පෑදෙනු ඇත්තේය.

අර්බුද කණ්ඩායම විසින් රැස් කරන ලද සාක්ෂි සුරක්ෂිතව තිබෙන අතර, සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව ඇතුළු විශ්වසනීය නීතිමය ක්‍රියාවලියක් සහතික කිරීමට සමත් වන ජාත්‍යන්තර හෝ ජාතික බලාධිකාරයන්ට ඒවා ලබා ගැනීමට අවස්ථාව සලසා දෙනු ඇත. සාක්ෂිකරුවන්ගේ අනන්‍යතාව මෙම වාර්තාව තුළ දී හෙළිදරව් නොකෙරෙන්නේය. විවේචකයන් සහ කෲර ක්‍රියා පිළිබඳව දන්නා අය බිය ගැන්වීමේ දිගු ඉතිහාසයක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සතුව ඇත.[5]

---

[5] සාක්ෂිකරුවන් හෝ විවේචකයන් බිය ගැන්වීම පිළිබඳව ආණ්ඩුව සැකයට බඳුන් වී ඇති මෑත කාලීන සිදුවීම් ගණනාවක් තිබෙන්නේය. උදාහරණයක් ලෙස, 2006 ජනවාරි 26 දා ත්‍රිකුණාමලයේ දී ඝාතනය කරනු ලැබුණු සිසුන් පස් දෙනෙකුගෙන් එක් අයෙකුගේ පියා මාධ්‍යවලට කතා කොට, මූලික අධිකරණ නඩු විභාගයක දී පොලීසිය ඊට සම්බන්ධ බව ඇඟවුණු බවට සාක්ෂි ලබා දුන් පසු ඔහුට තර්ජනය කෙරුණු අතර, අවසානයේ ඔහුට රට හැර යාමට සිදු වූයේය. “Injustice fuels Sri Lanka’s cycle of abuse and impunity,” Amnesty International (ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්), පියා වන ආචාර්ය කාසිපිල්ලේ මනෝහරන්ගේ (Dr. Kasipillai Manoharan) පුවත්පත් නිවේදනය හා විඩියෝ පටය, www.amnesty.org/en/news-and-updates/report/injustice-fuels-sri-lankas-cycle-abuse-and-impunity-20090611. එම සිදුවීම පසුපස හඹා ගිය දෙමළ පුවත්පත් කලාවේදියෙකු වූ සුබ්‍රමනියම් සුගිතරාජා 2006 ජනවාරි 24 දා ත්‍රිකුණාමලයේ දී ඝාතනය කරනු ලැබුණේය. බලන්න Committee to Protect Journalists (පුවත්පත් කලාවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව), http://cpj.org/ killed/2006/subramaniyam-sugitharajah.php. ගිනිකොණ ප්‍රදේශයේ පිහිටි පොතුවිල් නගරයෙන් පිටත දී මුස්ලිම් කම්කරුවන් දස දෙනෙකු අගෝස්තු 26 දා ඝාතනය කිරීම පිළිබඳ එක ම සාක්ෂිකරුවාට, ඊට එල්ටීටීඊය සම්බන්ධ බව අඟවන ලෙස බල කෙරුණු බව වාර්තා වූයේය. “From Welikade to Mutur and Pottuvil: A generation of moral denudation and the rise of heroes with feet of clay,” University Teachers for Human Rights (Jaffna) (මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය)) (UTHR), Special Report (විශේෂ වාර්තාව) අංක 25, 2007 මැයි 31, www.uthr.org/SpecialReports/spreport25.htm. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම්වලට අසම්බන්ධිත එක් සිදුවීමක දී, පොලිස් නිලධාරීන් සත් දෙනෙකුට එරෙහිව ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩුවක දී සාක්ෂි විමසනු ලබන්නට දින කිහිපයකට පෙර, පොලිස් වධහිංසාවලට ගොදුරු වුණු සිංහල ජාතිකයෙකු වූ ජෙරල්ඩ් පෙරේරා 2004 නොවැම්බර් 21 දා වෙඩි

අර්බුද කණ්ඩායමට මෙය අසාමාන්‍ය වාර්තාවක් වන්නේය. ඉන් බොහෝ ඒවා උකහා ගන්නා ලද්දේ ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවලින් වන අතර, එහි විශ්ලේෂණය ජාත්‍යන්තර නීතිය මත සමීපව පදනම් වේ. එහි දී මිනුම් දණ්ඩ ලෙස යොදා ගෙන ඇත්තේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය ය. කෙසේ වුව ද, එහි අන්තර්ගතය වන්නේ ගැටුම් වැළැක්වීම ය. ඒ අනුව, ශ්‍රී ලංකාව සිය සිවිල් යුද්ධය නැවත ආරම්භ වීම මග හැරීමට නම්, රට තුළ දී යුක්තියට හා වග වීමට අතිශය වැදගත් ස්ථානයක් හිමි විය යුත්තේය. තිස් වසරක ගැටුමේ මූලික හේතුවක් වන 1983 දී දෙමළ ජනයාට එරෙහිව එල්ල කෙරුණු ප්‍රචණ්ඩත්වය මෙන් ම, වන්නියෙහි සිදු වූ ඝාතන ද අනාගත ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකිය. ප්‍රචණ්ඩත්වයේ හා දඬුවම් නොලබා සිටීමේ චක්‍රය අවසන් කිරීම අත්‍යවශ්‍යය. අර්බුද කණ්ඩායම විසින් රැස් කර ගන්නා ලද සාක්ෂිවලින් එකක් හෝ අධිකරණයක් තුළ පරීක්ෂාවට ලක්ව නැති අතර, ඒවායින් කිසිදු පුද්ගලයෙකුගේ වරදකාරිත්වය හෝ නිර්දෝෂී භාවය ඔප්පු නොවන්නේය. එහෙත් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයකට බලය දීම සඳහා සාක්ෂි ප්‍රමාණවත් බව අර්බුද කණ්ඩායම විශ්වාස කරන්නේය.

---

තබා ඝාතනය කරනු ලැබුණේය. "SAARC Human Rights Report 2006" (සාක් මානව හිමිකම් වාර්තාව 2006), Asian Centre for Human Rights (මානව අයිතිවාසිකම් සඳහා ආසියානු මධ්‍යස්ථානය), www.achrweb.org/ reports/saarcar2006/srilanka.htm. අවසන් වශයෙන්, 2009 වසරේ දී ස්වාධීන පුවත්පත් කලාවේදීන් කිහිප දෙනෙකුට ප්‍රහාර එල්ල වූයේය - පුවත්පත් කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය හා රටේ විශාලතම ස්වාධීන ගුවන් විදුලි සමාගමට බෝම්බ ගැසීම ඒවායින් දෙකකි. ආණ්ඩුව වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත්තේය. "Attacks on the press 2009: Sri Lanka," Committee to Protect Journalists (පුවත්පත් කලාවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව), 2010 පෙබරවාරි 16, www.cpj.org/2010/02/attacks-on-the-press-2009-sri-lanka.php.

www.padippakam.com

## II. යුද්ධය සහ එහි ප්‍රතිවිපාක

### අ. කොටි සංවිධානයේ පරාජය

2009 ජනවාරි මාසය වන විට, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව එල්ටීටීඊය සැබවින් ම පරාජය කර තිබුණි. දෙමළ සටන්කරුවෝ උතුරු පළාතෙහි වන්නිය[6] නමින් හඳුන්වනු ලබන කුඩා කොටසකට මුලු ගන්වනු ලැබුණු අතර, සංඛ්‍යාත්මක වශයෙන් වඩා වැඩි හා වඩා හොඳින් සන්නද්ධ වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ හමුදා විසින් වට කරනු ලැබුණෝය.[7] එමෙන් ම, ප්‍රදේශය තුළ 300,000කට වැඩි සිවිල් වැසියන් ද සිටි අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනා පෙර දී එල්ටීටීඊය අල්ලා ගෙන සිටි ප්‍රදේශවලින් නැවත නැවත අවතැන් වී තිබූ අයය.[8] එල්ටීටීඊය මේ අවධිය වන විට වැඩ කර ගෙන ගියේ ආයුධ හා සැපයුම් හිඟයෙන් යුක්තවය. ඔවුන්ගේ බොහෝ සාමාජිකයන්ගේ තත්ත්වය බලාපොරොත්තු රහිත බව විශ්වාස කළ අතර, බලාත්කාරී බඳවා ගැනීම හා වන්නිය

---

[6] ආණ්ඩුව විසින් නම් කරනු ලැබ ඇති පරිපාලන දිස්ත්‍රික්ක 5ක් නැතහොත් ඒවායින් කොටසක් වන්නිය තුළ අඩංගු වේ. එනම්, කිලිනොච්චිය හා මුලතිව් දිස්ත්‍රික්ක සම්පූර්ණයෙන් ම සහ වවුනියාව, මන්නාරම හා යාපනය දිස්ත්‍රික්කවලින් කොටසක් ඊට ඇතුළත් වේ.

[7] ආ. උපග්‍රන්ථය ලෙස සම්බන්ධ කර ඇති සිතියම, 2009 ජනවාරි 2 දා සිට වන්නියේ දේශ සීමා හා යුද පෙරමුණු ආසන්න වශයෙන් දක්වයි. යුද්ධයේ අවසන් මාසවල දී සටන් වැදි එල්ටීටීඊ සාමාජිකයන්ගේ හා ශ්‍රී ලාංකික සොල්දාදුවන්ගේ සැබෑ සංඛ්‍යාව දැන ගැනීම දුෂ්කර වේ. තොරතුරු හොඳින් දත් එක් සාක්ෂිකරුවෙකු තක්සේරු කළ ආකාරය අනුව, 2008 සැප්තැම්බර් මාසයේ දී එල්ටීටීඊයේ මිලිටරි අංශය තුළ ආසන්න වශයෙන් සමාජිකයන් 8,000ත් 10,000ත් අතර සංඛ්‍යාවක් සිටි අතර, මේ තුළ ගොඩ බිම් හා මුහුදු කොටි අඩංගු වන නමුත්, රහසින් ක්‍රියා කළ හා සාපේක්ෂ වශයෙන් සුලු සංඛ්‍යාවක් වූ ගුවන් හා කළු කොටි අඩංගු නොවන්නෝය. 2010 අප්‍රේල් මාසයේ දී පළ වූ සම්මුඛ සාකච්ඡාවක ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පවසා ඇත්තේ, යුද හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ ඒකාබද්ධ සේනා ශක්තිය 2005 දී පැවති 125,000 සිට 2009 දී 450,000 දක්වා වැඩි වූ අතර, යුද හමුදාවේ සේනා ශක්තිය 300,000ක්ව පැවති බවය. V.K. Shashikumar, "Winning wars: political will is the key", *Indian Defence Review* 25 (ඉන්ඩියන් ඩිෆෙන්ස් රිවීව් 25), අංක 2 (2010 අප්‍රේල්-ජූනි).

[8] වන්නියෙහි සිටි සිවිල් ජනගහනයේ ප්‍රමාණය හා ඒ සම්බන්ධ මතභේද පිළිබඳ සාකච්ඡාවක් සඳහා පහත III කොටස ඇ. බලන්න.



படிப்பகம்

හැර යාම සම්පූර්ණයෙන් ම පාහේ තහනම් කිරීම වැනි ප්‍රතිපත්ති පිළිබඳව දෙමළ සිවිල් ජනගහනය වඩ වඩා අමනාපයට පත් වෙමින් සිටියෝය.[9]

එල්ටීටීඊයේ භයානක තත්ත්වය ඔවුන්ගේ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් විසින් කරන ලද තීරණාත්මක වැරදි මාලාවක ප්‍රතිඵලයක් විය. 1991 දී ඔවුන් සිදු කළ ඉන්දියානු අගමැති රජීව් ගාන්ධි ඝාතනය, ඔහුගේ වැන්දඹුව විසින් නායකත්වය දෙනු ලබන නව දිල්ලියේ කොන්ග්‍රස් ආණ්ඩුවක ස්වරූපයෙන් ඔවුන් මත ආපසු හොල්මන් කරන්නට පටන් ගෙන තිබුණි. දෙමළ ජනයාගේ දුක්ගැනවිලි විසඳීම සඳහා සංයමයෙන් යුක්ත හා දේශපාලනික පරිශ්‍රමයන් දරන ලෙස විටින් විට ඉල්ලා සිටි නමුත්, ඉන්දියානු ආණ්ඩුව කොටින්ට එරෙහි ශ්‍රී ලංකා ආණ්ඩුවේ මිලිටරි ක්‍රියාවට නිහඬව සහාය දුන්නේය. එල්ටීටීඊය සාකච්ඡාවල දී පළ කළ සම්මුති විරහිත බව හා 2005 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය ඇතුළු අවස්ථා ගණනාවක දී එය සටන් විරාමය උල්ලංඝනය කිරීම හේතුවෙන්, 2002-2006 සාම ක්‍රියාවලියට සහාය දුන් හා අරමුදල් සැපයූ ආණ්ඩු කෝපයට පත් වූයේය. ඔවුන්ට යම් ජාත්‍යන්තර සුජාතභාවයක් තිබුණි නම්, මේ නිසා ඉන් බොහෝ කොටසක් අහිමි වු

[9] 2006 ජුලි මාසයේ දී ආරක්ෂක හමුදා නැගෙනහිර පළාත තුළ ආක්‍රමණයක් දියත් කළ වහා ම, එල්ටීටීඊය තමන් අල්ලා ගෙන සිටි ප්‍රදේශවල දී සිවිල් වැසියන්ට පනවා තිබූ සීමාවන් වැඩි කළේය. එම ප්‍රදේශවලින් පිටත චාරිකා කිරීමට නම් අවසර පත් සඳහා අයැදුම් කළ යුතු බවට හා තමන් ආපසු පැමිණෙන බව සහතික කිරීම සඳහා "ඇපකාරයෙකු" - සාමාන්‍යයෙන් ඥාතියෙකු - තබා යා යුතු බවට ඔවුහු පුද්ගලයන්ගෙන් ඉල්ලා සිටියෝය. 1995 තරම් මුල් කාලයේ දී ද එල්ටීටීඊය මේ හා සමාන සීමාවන් පනවා තිබූ නමුත්, සටන් විරාම කාල පරිච්ඡේදයේ දී ඒවා ලිහිල් කර තිබුණි. 2008 සැප්තැම්බර් වන විට, වෛද්‍යමය හේතු කිහිපයක් සඳහා හෝ වැඩිහිටියන් සඳහා හැරුණු විට, එල්ටීටීඊය අවසර පත් ලබා දීම සැබවින් ම නතර කර තිබුණි. එමෙන් ම, වඩා දැඩි ලෙස බල කරමින් හා ඇතැම් අවස්ථාවල දී "එක් පවුලකින් එක් පුද්ගලයෙක්" යන චිරකාලීන ප්‍රතිපත්තිය ඉක්මවා ගොස්, ඔවුහු බලාත්කාරයෙන් බඳවා ගැනීම ද වැඩි කළෝය. බොහෝ දෙමළ පවුල් ඒ සඳහා සුදුසුකම් ඇති ළමයින් සැඟවීමට දැඩි ප්‍රයත්න ගත් අතර, නැත් නම් ඉන් නිදහස් කර ගැනීම සඳහා ඔවුන් නිසි වයසට පෙර විවාහ කර දී ඇත්තේය. යුද්ධයේ අවසන් අවුරුද්දේ දී ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූ අය සිටියේ ඉතා සුලු පිරිසක් වන අතර, විශාල වශයෙන් දෙමළ ජනයා පැහැර ගෙන ගොස්, බොහෝ අවස්ථාවල දී බංකර හා වෙනත් තාවකාලික ආරක්ෂක ඉදි කිරීම් ගොඩ නැගීමට කම්කරුවන් ලෙස සේවය කිරීම සඳහා යුද පෙරමුණුවලට යවනු ලැබුණෝය. බලන්න "Trapped and Mistreated: LTTE Abuses against Civilians in the Vanni," Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2008 දෙසැම්බර් 15.

අතර ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස සලකා 2006 මැයි මාසයේ දී යුරෝපා සංගමය ඔවුන් තහනම් කළේය.

ප්‍රභාකරන් 2002 සටන් විරාමය යොදා ගෙන තිබුණේ දෙමළ ප්‍රජාව - එනම් තර්ජනයක් ලෙස දකිනු ලබන ඕනෑ ම කෙනෙකු - විරේක කර දැමීම සඳහාය. දිවයින පුරා සිටි සිය ගණනක් දෙමළ විරුද්ධ මතධාරීහු ඝාතනය කරනු ලැබුණෝය. ප්‍රභාකරන් මහා අපේක්ෂා තබා තිබූ මෙන් ම, සටන්කරුවන් 6,000ක් සමඟ 2004 දී එල්ටීටීඊයෙන් භේද වූ, නොසන්සුන් නැගෙනහිර නියෝජ්‍ය නායක සේනාපති කරුණාට පැවති අවකාශය මෙමගින් කුඩා වූ අතර, ඔහු ඉක්මනින් ම ආණ්ඩුව සමග සහයෝගී වීමට පටන් ගත්තේය. 2007 වසරේ මැද භාගය වන විට, කරුණාගේ සහාය ඇතිව නැගෙනහිර පළාත තුළ පාලනය නැවත අත් කර ගැනීමට කොළඹ සමත් විය.

2005 දී එල්ටීටීඊ නායකයා ජනාධිපතිවරණය වර්ජනය කරන ලෙස දෙමළ ජනයාට නියෝග කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, වර්ධනය වන සිංහල ජාතිකවාදයේ හා අමනාපයේ වාසිය ගැනීමේ තියුණු හැකියාවක් සහිත දේශපාලනඥයෙකු වූ මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කළේය. නව පරිපාලනය ආයුධ මිල දී ගැනීම් වැඩි කළ අතර, කොටින් වනසා දැමීමේ කැප වීමකින් යුක්තව, යුද්ධය නැවත ඇරඹීම සඳහා සැලසුම් සැකසීමට පටන් ගත්තේය. 2006 දී, බොහෝ විට එල්ටීටීඊය විසින් කරන ලද උල්ලංඝනයන් හේතුවෙන් හැම විට ම බාධාවන්ට මුහුණ දුන් සටන් විරාමය බිඳ වැටීමට පටන් ගත් අතර, 2008 ජනවාරි 16 දා එය නිල වශයෙන් අවසන් වූයේය. ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව *(Sri Lanka Monitoring Mission - SLMM)* සමඟ ස්කැන්ඩිනේවියානු නිරීක්ෂකයන් රටින් පිටව යාමට මෙය හේතු විය.

ඒ වන විට ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා උතුරට - එනම් එල්ටීටීඊ පාලනය යටතේ පැවති ඉතිරි ප්‍රදේශ තුළට - කා වැදීම ආරම්භ කර තිබුණේය. ප්‍රභාකරන් පෙර දී උපායශීලීව ආණ්ඩුවේ හමුදා හැම විට ම පරාජය කර තිබූ නමුත්, එල්ටීටීඊය - ජනගහනයක් හා ප්‍රදේශය අල්ලා ගෙන සිටින ස්ථාවර හමුදාවක් සහිත - රාජ්‍යයක ආයිත්තම් පවත්වා ගෙන යා යුතු බවට තිබූ අභිලාෂය හේතුවෙන් ඔහුට පැවති මිලිටරි විකල්ප සීමා විය. ගරිල්ලා යුද්ධය කරා ආපසු යාමට එල්ටීටීඊයට පැවති මහත් අපේක්ෂාව කිසි විටෙක ඉටු නොවූයේය.

ආරක්ෂක හමුදා, තවත් බොහෝ කාර්ය මණ්ඩලයක් හිමි කර ගත්තාට අමතරව, යුද්ධයේ කලින් අවධීන්ට වඩා හොඳින් පුහුණු වී හා සන්නද්ධව ද සිටියේය. වඩා

හොඳ කාලතුවක්කුවල සිට, ගැටුම් කලාපය නිරීක්ෂණය කළ හැකි හා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සඳහා උපදෙස් දෙන පූර්ව නිරීක්ෂකයන් ලෙස ක්‍රියා කළ හැකි මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානා *(Unmanned Aerial Vehicles - UAVs)* වැඩි සංඛ්‍යාවක් දක්වා වූ නව ආයුධ පෙළක් ඒවා සතුව තිබුණි.[10] ආයුධ සඳහා කළ ඉල්ලීම්වලින් බොහොමයක් සපුරාලීමට චීනය හා පකිස්ථානය ඉදිරිපත් වූ අතර,[11] පකිස්ථාන ගුවන් හමුදාව "තාක්ෂණික සහාය හා පුහුණුව පිරිනැමුවේය."[12] ආරක්ෂක හමුදා ගුවන් ආධිපත්‍යය හිමි කර ගැනීම අවසන් කර තිබූ අතර, එල්ටීටීඊ පෙරමුණුවලට පසුපසින් කොමාන්ඩෝ ඒකක යවමින් ද, මල්ටි බැරල් රොකට් විදින *(Multi-Barrel Rocket Launchers - MBRLs)* හා ගුවන් ප්‍රහාර භාවිත කර ආරක්ෂක ස්ථානවලට දැඩි ලෙස පහර දෙමින් ද, වඩා ආක්‍රමණකාරී උපායන් යොදා ගත්තේය. ඉන්දියාවේ හා වෙනත් රටවල බුද්ධි අංශයන්හි සහාය ඇතිව එල්ටීටීඊ ආයුධ තොග සහිත නැව් මාලාවක් හඹා ගොස් විනාශ කළ නාවික හමුදාව, නැවත සන්නද්ධ වීමට එල්ටීටීඊයට තිබූ හැකියාව සාර්ථක අයුරින් වසා දැම්මේය.

මිලිටරි හා සිවිල් වැසියන් අතර මරණ හා තුවාළ පිළිබඳ සංඛ්‍යාලේඛන වාරණය කිරීම මිලිටරි සහ යුද විවේචකයන්ට පහර දීම ඇතුළු වඩා ආක්‍රමණකාරී දේශපාලන

---

[10] ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට අනුව, ආණ්ඩුව 2006 වසරේ සිට මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානා, නැව්, ගුවන් යානා, සන්නාහ සන්නද්ධ සටන් රථ, රේඩාර් සහ කාලතුවක්කු බණ්ඩ හා මෝටාර් මාලාවක් හිමි කර ගත්තේය. ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග යටතේ පැවති කලින් පරිපාලනය, ඊශ්‍රායලයේ තැනූ කයිෆර් ජෙට් ගුවන් යානා, රුසියානු මිග් 27 ගුවන් යානා, චෙකොස්ලෝවැකියාවේ තැනූ මල්ටි බැරල් රොකට් විදින හා මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානා මීට පෙර හඳුන්වා දී තිබුණේය. "Opposition's claim Mahinda bought only Ammo countered – 'The Island' (දි අයිලන්ඩ්)," 2010 ජනවාරි 4, www.army.lk/ detailed.php?NewsId=1723.

[11] "Sri Lanka still sourcing arms from Pak, China," *The Times of India* (ද ටයිම්ස් ඔෆ් ඉන්ඩියා), 2009 මාර්තු 4, http://timesofindia.indiatimes.com/India/Sri-Lanka-still-sourcing-arms-from-Pak-China/articleshow/4220337.cms.

[12] "Pakistan Air Force chief arrives in Sri Lanka", Sri Lanka Air Force news (ශ්‍රී ලංකා ගුවන් හමුදා පුවත්), 2009 නොවැම්බර් 12, www.airforce.lk/news.php? news=135#. යුද්ධයේ දී පකිස්ථාන ගුවන් හමුදා නියමුවන් මෙහෙයුම්වල යෙදුණු ගුවන් යානා පැදවූ බවට පළ වූ වාර්තා ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයා ප්‍රතික්ෂේප කළේය. "Sri Lanka denies Pakistani pilots flew its planes", *Dawn* (ඩෝන්), 2009 මැයි 29, www.dawn.com.

www.padippakam.com

ප්‍රතිපත්තියකින් වඩා දැඩි මිලිටරි ක්‍රියාවන්ට සහාය ලැබුණේය. එල්ටීටීඊය ජාත්‍යන්තර වශයෙන් තහනම් කරවීම සඳහා පීඩනය යෙදූ ආණ්ඩුව, "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" යන ඒත්තු ගැන්වීම යොදා ගෙන ආරක්ෂාව තර කළේය. දෙමළ අභිලාශයන් මුණගැස්වීමට ඉදිරිපත් වූ යෝජනාවන් දිගින් දිගට ම අතපසු කිරීමත් සමග දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා දැරූ පරිශ්‍රම නතර විය.

මේ තුළ වඩා දුෂ්ට පැත්තක් පැවතුණිඃ අතුරුදන් වූවන්ගේ සංඛ්‍යාව අහස උසට නැග්ගේය, පුවත්පත් කලාවේදීහු ඝාතනය කරනු ලැබුණෝය, පහර කෑවෝය, හෝ නිහඬ කරනු ලැබුණෝය, දේශපාලනඥයන්ට තර්ජනය කරනු ලැබුණේය, රාජ්‍ය නොවන සංවිධානවලට පහර දුන් අතර, එක්සත් ජාතීන් වැනි ජාත්‍යන්තර සංවිධාන බිය ගන්වනු ලැබුණේය.[13] ආරක්ෂක හමුදා හා එල්ටීටීඊය විසින් කරන ලද බවට චූදිත අපයෝජනයන් පිළිබඳව ආණ්ඩුව ආරම්භ කළ පරීක්ෂණය බිඳ වැටුණු අතර, "සත්‍යය සෙවීම සඳහා සහාය දීමට දේශපාලන අධිෂ්ඨානයක් නැතිකම" අවබෝධ වීමත් සමග 2008 මාර්තු මාසයේ දී තම භූමිකාව අවසන් කළ ප්‍රමුඛ ජාත්‍යන්තර නිරීක්ෂකයන් කණ්ඩායමක් එම පරීක්ෂණය ප්‍රසිද්ධියේ හෙළා දැක්කෝය.[14] ආණ්ඩුව පිළිබඳව එල්ල

---

[13] බලන්න Crisis Group Reports (අර්බුද කණ්ඩායමේ වාර්තා), *Sri Lanka's Human Rights Crisis*, *Sri Lanka's Return to War: Limiting the Damage* සහ *Sri Lanka: Politicised Courts, Compromised Rights*, සියල්ල ම කලින් සඳහන් කර ඇත.

[14] ඇක්ෂන් කොන්ත්‍රෙ ලා ෆයිම් (Action Contre la Faim - ACF) නමැති ප්‍රංශ රාජ්‍ය නොවන සංවිධානය විසින් සේවයේ යොදවන ලද සහන සේවකයන් දහහත් දෙනෙකු ඝාතනය කිරීම ඇතුළු මානව අයිතිවාසිකම් අපයෝජනයන් මාලාවක් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා 2006 දී ජනාධිපති පරීක්ෂණ කොමිසමක් පිහිටුවනු ලැබුණේය. එහි දී අවධානය යොමු කරනු ලැබූ සිදුවීම් දහසයෙන් පරීක්ෂාවට ලක් කරන ලද්දේ හතක් පමණක් වන අතර, සම්පූර්ණ කෙරුණේ පහක් පිළිබඳ වාර්තා පමණකි. එක ද සිදුවීමකට හෝ අදාළව චෝදනා ඉදිරිපත් කිරීමක් සිදු නොවූයේය. 2009 දී කොමිසම අත් හැර දමනු ලැබුණි. පරීක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් විශිෂ්ට පුද්ගලයන්ගේ ස්වාධීන ජාත්‍යන්තර කණ්ඩායමකට (International Independent Group of Eminent Persons - IIGEP) ආරාධනා කරනු ලැබූ නමුත්, කොමිසම ජාත්‍යන්තර ප්‍රමිතීන් නොසපුරන බව, අවශ්‍යතා පිළිබඳ ගැටුම්වලින් හා මූල්‍ය පරාධීනත්වයෙන් පීඩා ලබන බව, සාක්ෂිකරුවන් හා ගොදුරු වූවන් ආරක්ෂා නොකරන බව, ඊට රාජ්‍ය ආයතනවලින් සහයෝගයක් නොලැබෙන බව සහ එහි විනිවිද භාවය ප්‍රමාණවත් නැති බව නිගමනය කිරීමෙන් පසු 2008 මාර්තු මාසයේ දී එම කණ්ඩායම තම භූමිකාව අවසන් කළේය. බලන්න Crisis Group Report (අර්බුද කණ්ඩායමේ වාර්තාව), *Sri Lanka's Human Rights Crisis*, කලින් සඳහන් කර ඇත; "Twenty years of make-believe: Sri Lanka's Commissions of Inquiry," Amnesty International



படிப்பகம்

වූ ඕනෑම විවේචනයක් එල්ටීටීඊ හිතවාදි ලෙස හුවා දැක්වීමට රජයේ පක්ෂපාතී මාධ්‍ය හා අනෙකුත් නොවලහා කතාකරන නිළධාරීන් පෙළඹුනි. එක්සත් ජාතීන්ගේ මානුෂීය සම්බන්ධීකාරකවරයා කළ නිහතමානී අදහස් දැක්වීමක් පවා ඔහු "ත්‍රස්තවාදියෙකු" ලෙස විස්තර කිරීමට ශ්‍රී ලාංකික ඇමතිවරයෙකු පෙලඹවූයේය.[15] රාජපක්ෂ සිංහල ජාතිකවාදය වසං කළ කබායක් පොරවා ගත් අතරෙහි, යුද්ධයේ දී ඔහුගේ ප්‍රධාන ජනරාල්වරයා වූ හමුදාපති සරත් ෆොන්සේකා ශ්‍රී ලාංකික සමාජය තුළ හිමි තැන පිළිබඳව සුලුතරයන්ට අනතුරු ඇඟවූයේය.[16]

---

(ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්), 2009 ජූනි 11; සහ IIGEP, public statement (ප්‍රසිද්ධ නිවේදනය), 2008 අප්‍රේල් 15, www.ruleoflawsrilanka.org/resources/IIGEPnbspSTM.pdf වෙබ් පිටුවෙන් ලබා ගත හැකිය.

[15] බලන්න "Jeyaraj slams Ban Ki-moon", *The Nation on Sunday* (ද නේෂන් ඔන් සන්ඩේ), 2007 අගෝස්තු 19, www.nation.lk/2007/08/19/news6.htm; සහ "Top Sri Lanka official calls U.N. aid chief 'terrorist'," Reuters (රොයිටර්ස්), 2007 අගෝස්තු 15. ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙකු හා පාර්ලිමේන්තුවේ ආණ්ඩුපක්ෂ ප්‍රධාන සංවිධායක වූ ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ විසින් මානුෂීය කටයුතු සම්බන්ධීකාරකවරයාගේ කාර්යාලයේ (Office of the Coordinator for Humanitarian Affairs - OCHA) ප්‍රධානියා වූ ශ්‍රීමත් ජෝන් හොල්ම්ස් "ත්‍රස්තවාදියෙකු" ලෙස විස්තර කරනු ලැබුණි. මානුෂීය සේවකයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ඇත්තේ නරක ම වාර්තාවක් බව සඳහන් කිරීමට, එම අදහස් දැක්වීම විසින් හොල්ම්ස් පොලඹවනු ලැබුණි.

[16] ෆොන්සේකා මෙසේ පැවසුවේයඃ "මේ රට අයිති සිංහලයන්ට බව මම දැඩි ලෙස විශ්වාස කරනවා, ඒ වුණත් සුලු ජාතීනුත් ඉන්නවා, අපි ඔවුන්ට අපේ ජනයාට සමානව සලකනවා. රටේ බහුතරය අපි, සියයට 75ක්, අපි කවදා වත් යටත් වෙන්නේ නැහැ, අපිට මේ රට ආරක්ෂා කිරීමට අයිතිය තියෙනවා.... ඔවුන්ට අපිත් එක්ක මේ රටේ ජීවත් වෙන්න පුළුවන්. ඒත් සුලුතරයක් වීමේ මුවාවෙන් අයුතු දේවල් ඉල්ලන්න ඔවුන් උත්සාහ නොකළ යුතුයි." Stewart Bell, "Inside Sri Lanka: a life given over to war," *National Post* (නැෂනල් පෝස්ට්), 2008 සැප්තැම්බර් 23.

මාධ්‍ය සැබෑ වාරණයකට යටත් කරනු ලැබීමත් සමග යුද්ධය පිළිබඳ විවේචකයෝ නිහඬ වූවෝය. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" තුළ දී ජාත්‍යන්තර ප්‍රජාව බිය ගන්වනු ලැබූ අතර, එම යුද්ධය තුළ පටලනු ලැබුණෝය. ඒ අතරතුර සිංහල ජනගහනය ජයග්‍රහණය කෙරෙහි ලොල් වූවෝය; ආණ්ඩුව බාධාවකින් තොරව අධිෂ්ඨාන සහගතව කටයුතු කර ගෙන ගියේය. 2008 මැද භාගයේ සිට මූලෝපාය වූයේ, ස්වාධීන නිරීක්ෂකයන්, ආධාර සංවිධාන හා පුවත්පත් කලාවේදීන් බැහැර කරනු ලැබූ[17] කුඩා ප්‍රදේශයක් තුළට එල්ටීටීඊය හා උතුරේ දෙමළ ජනගහනය ගාල් කිරීමය.

2009 ජනවාරි මාසයේ මුල දී කිලිනොච්චියේ පිහිටි එල්ටීටීඊ මූලස්ථානය අල්ලා ගැනීමෙන් පසුව ආරක්ෂක හමුදා එල්ටීටීඊයට වඩ වඩා සමීප වූ අතර,

[17] ආණ්ඩුව මෙම ක්‍රියාකාරකයන් බැහැර කිරීමට තමන් දැරූ පරිශ්‍රමයන් යුක්ති සහගත කළේ ඔවුන් එල්ටීටීඊයට පක්ෂපාතීව ක්‍රියා කරන බව හෝ ඊට සහාය දෙන බව හෝ ආරක්ෂක අවදානම් ඉතා ඉහළ බව කියමින්ය. මෙම මූලෝපායේ එක් තීරණාත්මක පියවරක් වූයේ, තව දුරටත් සටන්වලින් ආරක්ෂාව සහතික කළ නොහැකි බව කියමින්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව *(International Committee of the Red Cross - ICRC)* හැර එක්සත් ජාතීන් හා සියලු ජාත්‍යන්තර මානුෂීය සංවිධාන එල්ටීටීඊ පාලනය යටතේ ඉතිරිව තිබෙන ප්‍රදේශවලින් ඉවත් විය යුතු බවට 2008 සැප්තැම්බර් මාසයේ මුල් සතියේ දී ආණ්ඩුව නියෝග කිරීමය. එක්සත් ජාතීන්ගෙන් විරෝධයක් නොමැතිව, රතු කුරුස කමිටුව හැර සියලු ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය සැප්තැම්බර් මස අග වන විට එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශවලින් ඉවත් වී තිබුණි. අවසන් වශයෙන්, 2009 පෙබරවාරි මාසයේ දී රතු කුරුස කමිටුවේ ස්ථිර කාර්ය මණ්ඩලය ද ඉවත් වූ නමුත්, තුවාල ලැබූ සිවිල් වැසියන් මුහුදු මාර්ගය හරහා ඉවත් කිරීමේ දී සහාය වීම සඳහා කාර්ය මණ්ඩලයේ ඇතැම් අය නිතිපතා වන්නියට ඒමත් යාමත් සිදු කළෝය. මෙම සියලු සංවිධානවල ජාතික කාර්ය මණ්ඩලයන්හි ඇතැම් අය වන්නිය තුළ නැවතී සිටියෝය. එක්සත් ජාතීන් වෙනුවෙන් රැකියාවෙහි යෙදුණු අය අඛණ්ඩව තමන්ට අදාළ නියෝජිත ආයතනවලට සිය සේවය සැපයූ අතර, ජාත්‍යන්තර සංවිධාන වෙනුවෙන් රැකියාව කළ බොහෝ අයට, තම සංවිධානවලින් සිය සාමාන්‍ය වැටුප් ලබන අතර ම, පළාත් ආණ්ඩුවේ නිලධාරීන් වෙනුවෙන් වැඩ කිරීමට පවරනු ලැබුණි. ආණ්ඩුව 2006 සිට නියාමකයන් සහිත චාරිකා හැර ස්වාධීන පුවත්පත් කලාවේදීන් එල්ටීටීඊය අල්ලා ගෙන සිටි ප්‍රදේශවලට චාරිකා කිරීම තහනම් කර තිබුණේය. "Call for journalists to be let into area where 'a major humanitarian crisis' is unfolding with no media presence," පුවත්පත් නිවේදනය, Reporters Without Borders (දේශ සීමා රහිත පුවත්පත් කලාවේදියෝ), 2009 අප්‍රේල් 10.

අවසානයේ දී ඔවුන් හා සිවිල් ජනගහනය ඊසානදිග/උතුරු නැගෙණහිර වෙරළේ පිහිටි පටු බිම් තීරුවක වර්ග කිලෝමීටර් කිහිපයක් තුළ කොටු කළේය.

ජනවාරි මාසයේ සිට ගැටුමේ ස්වභාවය සුවිශේෂී ලෙස වෙනස් විය. ආරක්ෂක හමුදා බරපතල ලෙස ගැටුම් කලාපයේ විශාලත්වය අඩු කිරීමත් සමඟ, ආණ්ඩුව පෙර දී කිසි විටෙක නොතිබූ තරම් කුඩා ප්‍රමාණයේ ඊනියා යුද මුක්ත කලාප මාලාවක් ඒකපාර්ශ්වීයව ප්‍රකාශයට පත් කළ අතර, සිවිල් ජනගහනය ඒවා තුළ කොටු කළේය.[18] එමෙන් ම, සිවිල් ජනගහනය එහි සැබෑ ප්‍රමාණයෙන් තුනෙන් එකකට වඩා අඩු බව කියා සිටි ආණ්ඩුව, ප්‍රමාණවත් තරම් ආහාර හා වෛද්‍ය පහසුකම් සැපයීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කළේය.[19] ඒ අතර, පලා යාමට උත්සාහ කළ ඇතැමුන්ට මරණයට පත් වන ලෙස වෙඩි තබමින් එල්ටීටීඊය සිවිල් වැසියන් ප්‍රදේශය අත් හැර යාම නොකඩවා වැළැක්වූයේය. "මිනිස් පලිහවල් යොදා ගැනීම" හා "ප්‍රාණ ඇපකරුවන් ගැනීම" ලෙස එල්ටීටීඊයේ ක්‍රියාවන් ප්‍රසිද්ධියේ හෙළා දුටු ආණ්ඩුව, "සිවිල් වැසියන්ට සිදු වන හානි මග හැරීම සඳහා ආරක්ෂක හමුදා උපරිම පූර්ව පියවරයන්" ගනිමින් සිටින බව කියා සිටියේ,[20] ඇත්ත වශයෙන් ම ආරක්ෂක හමුදා කිසිදු සංයමයකින් තොරව නොකඩවා ඉදිරියට ගියේය. ආණ්ඩුව ප්‍රභාකරන්ගේ මරණය නිවේදනය කරන තෙක් හා මැයි 18 දා යුද්ධය අවසන් වූ බව ප්‍රකාශයට පත් කරන තෙක් ම, ඒවා තමන් අනුපිළිවෙළින් ගොඩ නැගූ එක් එක් යුද මුක්ත කලාපය තුළට පසුබැසීමට එල්ටීටීඊයේ යුද පෙරමුණුවලට බල කළේය.

---

[18] ජනවාරි හා මාර්තු අතර කාල පරිච්ඡේදයේ දී ආණ්ඩුව මෙම ප්‍රදේශ තුනක් නිර්මාණය කළ අතර, ඒවා "ආරක්ෂිත කලාප" (safe zone) හා "යුද මුක්ත කලාප" (no fire zone) ලෙස හැඳින්වූයේය. මෙම වාර්තාව එය මුළුල්ලෙහි යොදා ගන්නේ "යුද මුක්ත කලාප" යන්නය. බලන්න, උදා., "Army expands safe zone for entrapped civilians – Mullaittivu" (යුද හමුදාව දුෂ්කරතාවට පත්ව සිටින සිවිල් වැසියන් වෙනුවෙන් ආරක්ෂිත කලාපය පුළුල් කරයි - මුලතිව්), 2009 ජනවාරි 22, www.defence.lk/new.asp?fname=20090121_05; සහ "LTTE clamps on civilian outflow: Mounts artillery batteries inside No-fire zones – Mullaittivu" (එල්ටීටීඊය සිවිල් වැසියන් පිටතට ගලා යාමට බාධා පමුණුවයිඃ යුද මුක්ත කලාප තුළ කාලතුවක්කු ඛණ්ඩ සංඛ්‍යාව ඉහළ යාම), 2009 ජනවාරි 31, www.defence.lk/new.asp?fname=20090130_F01.

[19] පහත III කොටස ඇ. බලන්න.

[20] බලන්න, උදා., "Civilian safety is the top priority – Defence Secretary," MOD news (එම්ඕඩී නිවුස්), 2009 පෙබරවාරි 17.

මෙම මාසවල දී ආරක්ෂක හමුදා හිතාමතා හා නැවත නැවතත් සිවිල් වැසියන්ට, රෝහල්වලට හා මානුෂීය මෙහෙයුම්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ බව විශ්වාස කිරීමට, අර්බුද කණ්ඩායම විසින් රැස් කරන ලද සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සැපයෙන්නේය. ආණ්ඩුවේ හා මිලිටරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ආරක්ෂක හමුදාවල ප්‍රහාර නිසා සිවිල් වැසියන්ට සිදු වූ හානි පිළිබඳව දැන සිටි නමුත්, යුද නීති යටතේ බැඳී සිටි බැවින් සිවිල් වැසියන් ආරක්ෂා කිරීමට අසමත් වූ බව විශ්වාස කිරීමට ද ඒවායින් හේතු සැපයේ.

ගැටුම් කලාපය තුළ සිටි නිලධාරීන් හා ආධාර සේවකයන් සමග සමීපව වැඩ කළ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන, 2009 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය තුළ සිවිල් වැසියන් 7,000ක් ඝාතනය කෙරුණු බව වාර්තා කළේය. මෙම අභ්‍යන්තර සංඛ්‍යා සංග්‍රහ කළ අය, සැබෑ ගැටුම් මරණ පිළිබිඹු වන තාක් දුරට ඒවා විශ්වසනීය බව කල්පනා කළ අතර, එහෙත් එය තව මත් කෙරී ගෙන යන කටයුත්තක් බව හා අසම්පූර්ණ බව කියා සිටියෝය. සටනේ අවසන් සති තුන තුළ පමණක් වුව සටන්කරුවන් නොවන දහස් ගණනක් ඝාතනයට ලක් වූ බවක් පෙනේ.[21] කොළඹ සිටින ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා රාජ්‍ය තාන්ත්‍රිකයන් අභ්‍යන්තර සංඛ්‍යා විශ්වසනීය බව පිළිගත්ත ද නිව් යෝක්හි සිටින එක්සත් ජාතීන්ගේ නිලධාරීහු එක දිගට ම ඒවා පිළිබඳව අවිශ්වාසය පළ කළෝය.[22] බොහෝ සිරුරු කිසි විටෙක රෝහල් වෙත ගෙන

[21] සටනේ අවසානය දක්වා අවසන් යුද මුක්ත කලාපය තුළ සිටි ඇසින් දුටු සාක්ෂිකරුවෝ ගණනාවක්, ආණ්ඩුවේ කඳවුරුවලට එන ලෙස කළ දැනුම් දීම අනුව ප්‍රදේශය හැර යද්දී භූමිය හා පාරවල් පුරා තිබූ කාන්තාවන්ගේ, ළමයින්ගේ, වැඩිහිටියන්ගේ හා පිරිමින්ගේ සිරුරු සංඛ්‍යාව පිළිබඳව ස්වාධීන වාර්තා සැපයුවෝය. මිය ගිය සිවිල් වැසියන් සිය ගණනක් දුටු බවට ඔවුහු සෑම කෙනෙක් ම තක්සේරු කළෝය. මැයි 17 දා රාත්‍රියේ සිට 18 දා උදෑසන දක්වා කාලය තුළ පමණක් සිදු වූ සිවිල් වැසියන්ගේ මරණ සංඛ්‍යාව 1,000ත් 4,000ත් අතර බව මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු (UTHR) තක්සේරු කළේය. "A Marred Victory and a Defeat Pregnant with Foreboding," UTHR (යූටීඑච්ආර්), Special Report (විශේෂ වාර්තාව) අංක 32, 2009 ජූනි 10, www.uthr. org. සටනේ අවසන් දින දහනවය ඇතුළත දී 13,000කට වැඩි සිවිල් වැසියන් සංඛ්‍යාවක් ඝාතනය කෙරුණු බව එක් පුවත්පත් කළ පරීක්ෂණයකින් වාර්තා වූයේය. Cath-erine Philp and Michael Evans, "Times photographs expose Sri Lanka's lie on civilian deaths at beach", *The (London) Times* (ද (ලන්ඩන්) ටයිම්ස්), 2009 මැයි 29.

[22] Crisis Group interviews (අර්බුද කණ්ඩායම පැවැත්වූ සම්මුඛ සාකච්ඡා), diplomats (රාජ්‍ය තාන්ත්‍රිකයෝ), කොළඹ, 2009 මාර්තු-මැයි. 2009 මැයි මාසයේ දී, කොළඹ සිටි එක්සත් ජාතීන්ගේ

නොගිය බවත් නොගැඹුරු මිනී වළවල් තුළ හෝ බිඳ වැටුණු බංකර තුළ වළ දමන ලද බවත් අර්බුද කණ්ඩායමේ සාක්ෂිවලින් පෙන්නුම් කෙරෙන්නේය. අවසන් මාස පහ තුළ දී සිදු වූ සිවිල් වැසියන්ගේ මරණ සංඛ්‍යාව දසදහස් ගණනක් විය යුතු බව, මේ වන විට රැස් කර ගෙන ඇති සාක්ෂි පදනම් කර ගනිමින් අර්බුද කණ්ඩායම විශ්වාස කරයි.[23]

---

ප්‍රකාශකයා වූ ගෝර්ඩන් වයිස් මෙසේ ප්‍රකාශ කළේය: *"නිශ්චිත අවස්ථාවක් දක්වා, 7,000ක් ජනයා ඝාතනය කෙරුණු බව පෙන්වා දීමට අප සතුව ඉතා හොඳ සාක්ෂි තිබුණා. ... ඊළඟට දරුණු සටන පටන් ගත්තා ම, තවත් බොහෝ මරණ සිදු වුණා, ඒත් ඒ කොපමණ ද යන වග අපි හරියට ම දැන ගෙන හිටියේ නැහැ."* "Paper: 20,000 killed in Sri Lanka conflict", CNN (සීඑන්එන්), 2009 මැයි 29, www.cnn.com/2009/WORLD/asiapcf/05/29/srilanka.death.toll/index.html. 30,000ත් 40,000ත් අතර සිවිල් වැසියන් සංඛ්‍යාවක් ඝාතනය වන්නට ඇති බව වයිස් වඩා මෑත කාලයේ දී තක්සේරු කර ඇත්තේය. බලන්න "War Stories", SBS Dateline (එස්බීඑස් ඩේට්ලයින්), 2010 පෙබරවාරි 28, www.sbs.com.au/dateline/story/transcript/id/600331/n/War-Stories. ඊට ප්‍රතිචාර දක්වමින් මානව හිමිකම් හා ආපදා කළමනාකරණ ඇමති මහින්ද සමරසිංහ මෙසේ පැවසුවේය: " ඔහුගේ අනාවරණය ගැන අදහස් දක්වන්න වටින්නේ නැහැ, ඒක මුළුමනින් ම නොමග යවන සහ ව්‍යාජ එකක්." "Civilian deaths: Gordon Weiss' comment a false utterance – Mahinda Samarasinghe," *Sunday Observer* (සන්ඩේ ඔබ්සර්වර්), 2010 පෙබරවාරි 14. විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම වයිස්ගේ ප්‍රකාශ ප්‍රතික්ෂේප කරමින් මෙසේ පැවසුවේය: "[වයිස්] කියන්නේ ඒ වගේ ව්‍යාජ ප්‍රකාශයක් කළ කෙනෙක්, අපි මුළුමනින් ම මේ ප්‍රකාශ ප්‍රතික්ෂේප කරනවා. ඒ වගේ ම ඔහු රටින් පිට කරලා තියෙන කෙනෙක්." "Govt. says Ex-UN spokesman Weiss spreading lies", *Daily Mirror* (ඩේලි මිරර්), 2010 පෙබරවාරි 13. එක්සත් ජාතීන් ද ප්‍රතිචාර දැක්වූ අතර, මෙලෙස ප්‍රකාශ කරමින් තම සංඛ්‍යා තව දුරටත් පසුපසට ගෙන ගියේය: "හානි පිළිබඳව අප අභ්‍යන්තර තක්සේරු කර ගෙන ගිය ද ඒවායේ සත්‍ය අසත්‍යතාව බිම් මට්ටමේ දී ස්වාධීනව පරීක්ෂා කර බැලීමට වාතාවරණයක් නොතිබුනු බැවින්, කොපමණ හානි පැවතියේ ද යන්න සම්බන්ධයෙන් සත්‍ය අසත්‍යතාව පරීක්ෂා කර බැලිය හැකි සංඛ්‍යා අප සතුව නොමැත." "UN statement on former spokesman views," 2010 පෙබරවාරි 15, www.un.lk/media_centre/ for_the_record.php.

[23] ගැටුමක මරණ සංඛ්‍යාව තීරණය කිරීම හැම විට ම පරිස්සමින් ප්‍රවිෂ්ට විය යුතු කටයුත්තක් වුවත්, සිවිල් වැසියන් දසදහස් ගණනක් ඝාතනයට ලක් වූ බවට කෙරෙන තක්සේරුවක් යුක්ති සහගත බව විශ්වාස කිරීමට නානාවිධ හේතු තිබේ. පළමුවෙන්, සටන අතරතුර දී වන්නියෙහි සිටි බවට දන්නා සිවිල් වැසියන් සංඛ්‍යාව සටන අවසානයේ දී ආණ්ඩුවේ යුද සිර කඳවුරු තුළට ළඟා වී ඇති බවට පිළිගත හැකි සංඛ්‍යාව සමග සංසන්දනය කිරීමෙන් ඝාතනය වූවන් හෝ අතුරුදන් වූවන් පිළිබඳ දළ තක්සේරුවක් සැපයේ. පෙබරවාරි මස මැද සිට අග දක්වා කාල පරිච්ඡේදය තුළ දෙ වන යුද මුක්ත කලාපය හා තදාසන්න ප්‍රදේශ තුළ අභ්‍යන්තරව අවතැන් වූ සිවිල් වැසියන් 330,000ක් සිටි බවට



படிப்பகம்

www.padippakam.com

## ආ. ප්‍රතිවිපාක

සටනේ අවසන් මාස තුළ දී දෙමළ සිවිල් වැසියන් 28,000කට වැඩි සංඛ්‍යාවක් ආණ්ඩුව අල්ලා ගෙන තිබූ ප්‍රදේශවලට මාරු වූ අතර, ආරක්ෂක හමුදා විසින් පවත්වා ගෙන යන ලද හදිසි කඳවුරු තුළ ඔවුහු නීති විරෝධී ලෙස සිර කරනු ලැබුණෝය.[24]

---

විශ්වසනීය සාක්ෂි අර්බුද කණ්ඩායම සතුව ඇත. එමෙන් ම, ආණ්ඩුවට අනුව, ආණ්ඩුව අල්ලා ගෙන තිබූ ප්‍රදේශ තුළ පිහිටි කඳවුරු තුළ ඒ වන විටත් වන්නියෙන් අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයෝ 33,000ත් 38,000ත් අතර සංඛ්‍යාවක් සිටියෝය. එය, දන්නා සිවිල් වැසියන්ගේ මුළු ගණන 365,000ක් බවට පත් කරන්නේය. සටනේ අවසානය වන විට, ආණ්ඩුව විසින් පවත්වා ගෙන යනු ලැබූ කඳවුරු තුළ 2009 මැයි 26 දා සිට ලියාපදිංචි වූ දිවි බේරා ගත් අයගේ ඉහළ ම සංඛ්‍යාව 290,000ක් විය. මෙම සංඛ්‍යාව තුළ යටත් වූ හෝ එල්ටීටීඊය සමග සම්බන්ධ බවට සැක කර රඳවා ගනු ලැබූ 10,000කට වැඩි පිරිස ඇතුළත් වන්නේ කොතරම් දුරකට ද යන වග පැහැදිලි නැත. එමෙන් ම, ආණ්ඩුවේ කඳවුරු තුළ රඳවා ගනු ලැබීම මග හැර බෝට්ටුවෙන් ඉන්දියාවට පලා ගිය නැතහොත් යුද කලාපයෙන් පලා ගිය කීප දහසක් ජනයා ද සිටිය හැකිය. මෙම අවිනිශ්චිතතාවන් පිළිගත් විට, පුද්ගලයන් 75,000ක් තරම් ප්‍රමාණයක් ගණන් කිරීමට හසු නොවී සිටින බවට පෙනෙන තත්ත්වයක් පවතින්නේය. 330,000 යන සංඛ්‍යාවෙන් 30,000ක් තරම් ප්‍රමාණයක් අඩු කරනු ලැබුණ ද නැතහොත් තමන් ඉලක්ක කර ගන්නා විට එදිරිවාදිකම් තුළ ඍජුව සහභාගි වෙමින් සිටි නිසා නීත්‍යානුකූල ලෙස ඝාතනය කරනු ලබන්නට ඇති සිවිල් වැසියන් - අර්බුද කණ්ඩායම විශ්වාස කරන්නේ මෙම සංඛ්‍යාව ඉතා පහළ අගයක් බවය - ඇතුළත් කර ගැනීම සඳහා හෝ ආණ්ඩුවේ කඳවුරුවලින් බේරෙන්නට ඇති යම් සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීම සඳහා 330,000 සහ 290,000 අතර තිබෙන වෙනසට යම් ගැළපීමක් කළ ද ඝාතනයට ලක් වූවන් හෝ අතුරුදන් වූවන් පිළිබඳ 30,000කට වඩා අඩු සංඛ්‍යාවක් වෙත ළඟා වීම දුෂ්කර වන්නේය. තව ද, මරණවල පරිමාණය ඒ සමයේ වාර්තා වූ සංඛ්‍යාවට වඩා බෙහෙවින් ඉහළ අගයක් ගන්නා බව සහ නිසැකව ම එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර සංඛ්‍යාව වන 7,000 මෙන් තුන් ගුණයක් වත් වන බව යෝජනා කිරීමට, සටනේ අන්තිම අවසානය දක්වා ම යුද මුක්ත කලාප තුළ සිටි විවිධ පුද්ගලයන්ගෙන් ලැබුණු සාක්ෂි අර්බුද කණ්ඩායම සතුව ඇත. එමෙන් ම, මෙම මරණවලින් වැඩිප්‍රමාණයක් ආණ්ඩුවේ වෙඩි ප්‍රහාර නිසා සිදු වූයේ බව අර්බුද කණ්ඩායම විශ්වාස කරන්නේය. අවසානයේ දී, ශ්‍රී ලංකාවේ මෙම කොටසේ ඉතිහාසය තහවුරු කිරීම සඳහා උතුරු පළාත තුළ තව මත් ජීවත් වන්නන් පිළිබඳ ස්වාධීන හා අපක්ෂපාතී සමීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය වනු ඇත්තේය.

[24] 2010 ජනවාරි මාසය වන විට යුද සිරකරුවන් ලෙස තබා ගෙන සිටි හා මුදා හැරුණු සංඛ්‍යා පිළිබඳ වැඩි දුර තොරතුරු සඳහා, බලන්න Crisis Group Briefing (අර්බුද කණ්ඩායමේ කෙටි සටහන්), *Sri Lanka: A Bitter Peace*, කලින් සඳහන් කර ඇත, 2-9 පිටු. 2009 මැයි 26 දා වන විට අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු හා රෝහල් තුළ පුද්ගලයන් 289,915ක් (වවුනියාව දිස්ත්‍රික්කය තුළ 269,417ක්) සහ 2009 ජූනි 8 දා වන විට 280,812ක් (වවුනියාව දිස්ත්‍රික්කය තුළ 260,295ක්) සිටි බව කොළඹ පිහිටි එක්සත් ජාතීන්ගේ මානුශීය කටයුතු සම්බන්ධීකාරකවරයාගේ කාර්යාලය(OCHA



படிப்பகம்

www.padippakam.com

ප්‍රධාන වශයෙන් වවුනියාවෙහි ස්ථානගත කරන ලද මෙම කඳවුරු තදබද ඒවා වූ අතර, සනීපාරක්ෂාව, වෛද්‍ය රැකවරණය හා ආහාර පිළිබඳ දරුණු හිඟයකින් පීඩා වින්දේය. රැඳවියන්ට එල්ටීටීඊය සමග සම්බන්ධකම් පැවතියේ ද යන වග දැන ගැනීම සඳහා ආණ්ඩුවේ බුද්ධි අංශ හා දෙමළ පැරාමිලිටරි සංවිධාන ඔවුන් නැවත නැවතත් පරීක්ෂාවට ලක් කළ අතර, මෙය අපයෝජනයන් පිළිබඳ වාර්තාවලට හේතු විය.[25] කඳවුරු තුළ රඳවා සිටි විදේශීය පුරවැසියන් වෙත ප්‍රවේශ වීමට තානාපතිවරුන්ට ඉඩ ලබා දෙන ලෙස තානාපති කාර්යාල කළ ඉල්ලීම් මාස කිහිපයක් යන තුරු ප්‍රතික්ෂේප කෙරුණු අතර, මාධ්‍යවලට අවසර ලැබුණේ නියාමකයන් සහිත චාරිකාවලට පමණකි. ආණ්ඩුව විසින් එක්සත් ජාතීන්ගේ හා මානුෂීය නියෝජිත ආයතනවල ප්‍රවේශය සීමා කෙරුණු අතර හා තදින් නිරීක්ෂණය කෙරුණු අතර, 2009 ජුලි මාසයේ සිට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වවුනියාවේ කඳවුරුවලට ප්‍රවේශ වීම තහනම් කරනු ලැබුණි. රතු කුරුස කමිටුවට පැනවූ තහනම 2010 මැයි මාසය වන විටත් ක්‍රියාත්මක වූයේය. ජාත්‍යන්තර වශයෙන් එල්ල වූ සැලකිය යුතු පීඩනය නිසා 2009 අවසානය

---

වාර්තා කළේය. 2009ට පෙර කඳවුරුවලට පිවිසියේ සුලු සංඛ්‍යාවක් නමුත්, අතිවිශාල බහුතරයක් පැමිණියේ ජනවාරි මාසයෙන් පසුව වන අතර, අප්‍රේල් හා මැයි මාස තුළ දී පමණක් 200,000කට වැඩි පිරිසක් පැමිණියෝය. බලන්න "Vanni IDP Camps and Hospitals Information, as of 26 May 2009," සිතියම, UN OCHA (එක්සත් ජාතීන්ගේ ඕසීඑච්ඒ), www.reliefweb.int/rw/fullmaps_sa.nsf/luFullMap/2AF28A9E61C90B68852575C5006955E0/$File/map.pdf?OpenElement; "Vanni IDP Camps and Hospitals Information, as of 8 June 2009," සිතියම, UN OCHA (එක්සත් ජාතීන්ගේ ඕසීඑච්ඒ), www.reliefweb.int/rw/fullmaps_sa.nsf/luFullMap/6F6D19343765134DC12575D1003F4526/$File/map.pdf?OpenElement; සහ "Vanni IDP Information & Safe Area Declared by the Government of Sri Lanka in Mullaitivu, as of 1 April 2009," සිතියම, UN OCHA (එක්සත් ජාතීන්ගේ ඕසීඑච්ඒ), www.reliefweb.int/rw/fullmaps_sa.nsf/luFullMap/657617D099999764C125758C0030BA3E/$File/map.pdf?OpenElement.

[25] ආරක්ෂක හමුදා විසින් හෝ නාඳුනන පුද්ගලයන් විසින් සිවිල් වැසියන්, බොහෝ විට තරුණයන්, පැහැර ගෙන ගොස් ප්‍රශ්න කිරීමට හා පහර දීමට නැතහොත් වෙනත් අපයෝජනයන්ට ලක් කරන ලද බව ඇසින් දුටු සාක්ෂිකරුවන් පවසා ඇත. මාධ්‍ය තුළ ද මීට සමාන වාර්තා තිබී ඇත. බලන්න, උදා., "Traumatised Tamils live in fear of new crackdown in Sri Lanka", *The Guardian* (ද ගාඩියන්), 2009 අප්‍රේල් 5.



படிப்பகம்

www.padippakam.com

වන විට අභ්‍යන්තර අවතැන් වූවන්ගෙන් බොහෝ දෙනෙකු මුදා හැරුණු නමුත්, 2010 අප්‍රේල් මාසය වන විට ද සිවිල් වැසියන් 80,000ක් කඳවුරුවල සිටියෝය.[26]

එමෙන් ම එල්ටීටීඊය සමග සම්බන්ධකම් තිබුණේ ය යන චෝදනාව මත ආණ්ඩුව තවත් පුද්ගලයන් 10,000කට වැඩි පිරිසක් වෙන ම පිහිටුවන ලද කඳවුරු තුළ රඳවා ගෙන සිටින අතර, කිසිදු බාහිර පුද්ගලයෙකුට එම කඳවුරුවලට ඇතුළු වීමට අවසර නොලැබේ.[27] මෙම රඳවා ගැනීම් නීති විරෝධී වන අතර, විශේෂයෙන් ම බලාත්කාර අතුරුදන් කිරීම් හා වධහිංසා පැමිණවීම් සම්බන්ධයෙන් ආණ්ඩුවට විරුද්ධව තිබෙන චෝදනාවල ඉතිහාසය සැලකිල්ලට ගත් විට මාරක අවදානම් මතු කරන්නේය.[28]

---

[26] "Joint Humanitarian Update," Report #23 (වාර්තා අංක 23), Office of UN Resident and Humanitarian Coordinator (එක්සත් ජාතීන්ගේ නේවාසික හා මානුෂීය සම්බන්ධීකාරකවරයාගේ කාර්යාලය), 2010 මාර්තු 27-අප්‍රේල් 9.

[27] යටත් වූවන් හෝ එල්ටීටීඊය සමග වැඩ කළේය යන සැකය මත අභ්‍යන්තරව අවතැන් වූ ජනගහනය අතරින් රඳවා ගත්තවුන් සම්බන්ධයෙන් ආණ්ඩුව නිකුත් කර ඇත්තේ එකිනෙකට ගැටෙන සංඛ්‍යාවන්ය. වඩා මෑතක දී අගමැති දි.මු. ජයරත්න ප්‍රකාශ කළේ, එල්ටීටීඊ සාමාජිකයන් 11,700ක් යටත් වූ හෝ අත් අඩංගුවට ගනු ලැබූ බවය; ඉන් 1,350කට විරුද්ධව චෝදනා ඉදිරිපත් කිරීමට නියමිත අතර, 2,400ක් දැනට මත් "පුනරුත්ථාපනය කොට" මුදා හැර ඇති බවය. "Reconciliation Commission to be established," Presidential Media Unit (ජනාධිපති මාධ්‍ය ඒකකය), 2010 මැයි 5, www.priu.gov.lk; සහ "Tiger military wing forming," *Daily Mirror* (ඩේලි මිරර්), 2010 මැයි 4. කලින් වෙනත් නිලධාරියෙකු ප්‍රකාශ කළේ, එල්ටීටීඊය සමග සම්බන්ධකම් පවතින්නට ඇතැයි සිතිය හැකි බැවින් පුද්ගලයන් 12,700ක් පමණ රඳවා ගෙන සිටි බවය. Palitha Kohona, "The 'Elders' Statement on IDPs in Sri Lanka – Sadly outdated and Inaccurate – Dr. Kohona", *Asian Tribune* (ඒෂියන් ට්‍රිබියුන්), 2009 දෙසැම්බර් 5.

[28] අත්තනෝමතික ලෙස සිර කර තබා ගත් මුළු කාල පරිච්ඡේදය තුළ ම රැඳවියන්ට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව වෙත, රැකවරණය සපයන වෙනත් නියෝජිත ආයතන වෙත හා නීති උපදේශකයන් වෙත ප්‍රවේශ වීමට ඉඩ දීම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. ඔවුන් රඳවා තබා ගෙන සිටින්නේ කුමන නීතිමය පදනමක් මත ද එවැනි කුමන හෝ නීතිමය පදනමක් තිබෙන්නේ ද යන වග නොපැහැදිලිය. "Legal Limbo: The Uncertain Fate of Detained LTTE Suspects in Sri Lanka," Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2010 පෙබරවාරි 2; Crisis Group Briefing (අර්බුද කණ්ඩායමේ කෙටි සටහන්), *Sri Lanka: A Bitter Peace*, කලින් සඳහන් කර ඇත, 8-9 පිටු; සහ "Recurring Nightmare: State Responsibility for 'Disappearances' and Abductions in Sri Lanka", Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2008 අගෝස්තු 27.



படிப்பகம்

බොහෝ ශ්‍රී ලාංකිකයෝ කොටින්ගේ පරාජය පිළිබඳව අතිශයින් ප්‍රීතියට පත් වූවෝය. රට තුළ හා විදේශවල සිටි බොහෝ දෙමළ ජනයා, උතුර තුළ සිටි තම ස්වදේශිකයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබූ ආකාරය හේතු කොට ගෙන කම්පනයට හා කැලඹීමට පත් වූවෝය. තත්ත්වය පිළිබඳව උනන්දුව වීමක් පළ කළ නමුත්, ජාත්‍යන්තර ප්‍රජාවේ ප්‍රමුඛ නායකයන් කළේ සුලු දෙයක්ය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය යුද්ධය හෝ යුද සිරකරුවන් තබා ගැනීම් පිළිබඳව සාකච්ඡා කිරීම ප්‍රතික්ෂේප කළ අතර, චීනය, රුසියාව හා තවත් රටවල් කියා සිටියේ එය දේශීය ප්‍රශ්නයක් බවය. 2009 මැයි මස අග දී, චූදිත අපරාධ පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට කළ යෝජනාවක් සම්බන්ධයෙන් කරනු ලැබූ ඡන්ද විමසීමක දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය *(Human Rights Council - HRC)* එය පරාජය කළේය.[29]

ඇස් වසා එකට තබා බැඳ දෙමළ පිරිමින් අට දෙනෙකු 2009 ජනවාරි මාසයේ දී ශ්‍රී ලාංකික සොල්දාදුවන් විසින් ඝාතනය කරනු ලැබීම පෙන්නුම් කරන බව කියැවුණු විඩියෝ පටයක් 2009 අගෝස්තු මාසයේ දී බ්‍රිතාන්‍ය රූපවාහිනියේ විකාශනය වීමෙන් පසුව, පශ්චාත් යුද්ධ වග වීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් කෙරුණු කැඳවුම්

[29] 2009 මැයි 27 දා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (එච්ආර්සී) ශ්‍රී ලංකාව විසින් සාකච්ඡාවට ඉදිරිපත් කරන ලද යෝජනාවක් ඊට පක්ෂව ඡන්ද 29ක්, එරෙහිව දොළහක් හා හයක් ඡන්දය දීමෙන් වැළකී සම්මත කළේය. පක්ෂව ඡන්දය දුන්නේ, ඇංගෝලාව, අසර්බයිජානය, බහරේනය, බංග්ලාදේශය, බොලිවියාව, බ්‍රසීලය, බර්කිනා ෆැසෝ, කැමරූන්, චීනය, කියුබාව, ජිබූටි, ඊජිප්තුව, ඝානාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජෝර්දානය, මැඩගස්කරය, මලයාසියාව, නිකරගුවාව, නයිජීරියාව, පකිස්ථානය, පිලිපීනය, කටාර්, රුසියානු සමූහාණ්ඩුව, සවුදි අරාබිය, සෙනෙගාලය, දකුණු අප්‍රිකාව, උරුගුවේ හා සැම්බියාවය. විරුද්ධව ඡන්දය දුන්නේ, බොස්නියාව හා හර්සෙගොවිනාව, කැනඩාව, චිලී, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, මෙක්සිකෝව, නෙදර්ලන්තය, ස්ලොවාකියාව, ස්ලොවීනියාව, ස්විට්සර්ලන්තය සහ මහා බ්‍රිතාන්‍යය, එක්සත් රාජධානිය හා උතුරු අයර්ලන්තයය. ඡන්දය දීමෙන් වැළකී සිටියේ, ආර්ජන්ටිනාව, ගැබොන්, ජපානය, මොරීෂස්, කොරියානු සමූහාණ්ඩුව හා යුක්රේනය. යෝජනාව ශ්‍රී ලංකාවට ප්‍රශංසා කළ අතර, කිසිදු පරීක්ෂණයක් සඳහා කැඳවුම් කිරීමට අසමත් වූයේය. දෙපාර්ශ්වයේ ම ක්‍රියාවන් හෙළා දකිමින් සහ රඳවා ගෙන සිටින සිවිල් වැසියන් වෙත අසීමිත ප්‍රවේශය ලබා දෙන ලෙස හා චූදිත යුද අපරාධ සම්බන්ධයෙන් දේශීය පරීක්ෂණයක් ඉල්ලා සිටිමින් යුරෝපා රටවල් ඉදිරිපත් කළ වඩා දැඩි යෝජනාව මානව හිමිකම් කවුන්සිලය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුණේය.

නැවතත් ඉස්මතු විය.[30] ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වහා ම චෝදනාව ප්‍රතික්ෂේප කළ අතර, එල්ටීටීඊ හිතවාදී ප්‍රචාරකයන් විසින් ව්‍යාජ ලෙස ගොතන ලද එකක් බවට වීඩියෝ පටය හෙළා දැක, අභූත චෝදනා විකාශනය කිරීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයේ 'චැනල් 4' නාලිකාවට පහර දුන්නේය.[31] ආණ්ඩුව විසින් යොදවා ගන්නා ලද විශේෂඥයන් ඉදිරිපත් කළ තාක්ෂණික වාර්තා කියා සිටියේ වීඩියෝ පටයේ අක්‍රමිකතා මාලාවක් පෙනෙන බවය.[32] 2010 ජනවාරි 7 දා, එක්සත් ජාතීන් විසින් පත් කරන ලද විශේෂඥයන්ගේ විශ්ලේෂණවලින් වීඩියෝ පටය සත්‍ය බව සොයා ගෙන ඇතැයි නිවේදනය කළ අධිකරණයෙන් බැහැර ඝාතන පිළිබඳ එක්සත් ජාතීන්ගේ සබැඳියාකරු පිලිප් ඇල්ස්ටන්, "ශ්‍රී ලංකාව තුළ දී සිදු කෙරුණු බවට චූදිත යුද අපරාධ සහ ජාත්‍යන්තර මානුෂීය හා මානව හිමිකම් නීතිය පිළිබඳ අනෙකුත් මාරක උල්ලංඝනයන් සම්බන්ධයෙන්" "ස්වාධීන" හා "අපක්ෂපාතී පරීක්ෂණයකට" ඉඩ දෙන ලෙස ශ්‍රී ලංකාවේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටියේය.[33]

---

[30] Jonathan Miller, "Execution video: is this evidence of 'war crimes' in Sri Lanka?," 2009 අගෝස්තු 25, www.channel4.com.

[31] "මේ වීඩියෝ පටය නිර්මාණය කරලා තියෙන්නේ සන්නද්ධ හමුදා අපකීර්තියට පත් කරන්න. මේක රූපගත කරලා තියෙන්නේ කොටි සටන්කරුවනුත් ශ්‍රී ලාංකික මිලිටරි නිල ඇඳුම්වලින් සැරසිලා ක්‍රියා කළ කාලයක බව ප්‍රකාශ කරලා තිබුණා," ශ්‍රී ලංකා යුද හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර, "Sri Lanka calls 'war crimes' video a fake," 2009 අගෝස්තු 26, සහ "Sri Lanka steps up death video rebuttal," 2009 සැප්තැම්බර් 11, දෙක ම ඇතුළත් වූයේ www.channel4.com.

[32] බලන්න "Technical analyst exposes 'C- 4' gutter journalism," 2009 සැප්තැම්බර් 3, www.defence.lk/new.asp?fname=20090903_05.

[33] "Deeming Sri Lanka execution video authentic, UN expert calls for war crimes probe," 2010 ජනවාරි 7, www.un.org/apps/news/story.asp?NewsID=33423. සති කිහිපයකට පෙර, " ලන්ඩනයේ *'ද ටයිම්ස්'* පුවත්පත විශේෂඥ අධ්‍යයනයක ප්‍රතිඵල ප්‍රසිද්ධ කර තිබූ අතර, වීඩියෝ පටය සත්‍ය එකක් බව හා ව්‍යාජයක් නොවන බව ද එම අධ්‍යයනයේ දී සොයා ගෙන තිබුණේය. Rhys Blakely, "Sri Lankan war crimes video is authentic, Times investigation finds," *The Times* (ද ටයිම්ස්), 2009 දෙසැම්බර් 15, www.timesonline.co.uk/tol/news/world/asia/article6956569.ece#cid=OTC-RSS&attr=797093. ආණ්ඩුව මෙම සොයා ගැනීම් දෙක ම ප්‍රතික්ෂේප කළේය. සටනේ අවසන් දිනවල දී එල්ටීටීඊ ආධාරකරුවන් ලෙස සැක කළ අය දහස් ගණනක් රඳවා ගනු ලබන තෙක් ශ්‍රී ලංකාවේ 30 අවුරුදු ගැටුම තුළ දී පාර්ශ්ව දෙකෙන් කුමක් වුව යුද සිරකරුවන් තබා

එල්ටීටීඊ දේශපාලන අංශ නායක බී.නඩේසන් හා එල්ටීටීඊයේ සාම මහ ලේකම් එස්. පුලීදේවන් සමග ඔවුන්ගේ පවුල්වල හා කාර්ය මණ්ඩලවල 60 දෙනෙකු සටන් බිමේ දී ඝාතනය කළ බවට එල්ල වන චෝදනාව පිළිබඳව ද, පරීක්ෂණයක යෝග්‍යතාව සැපයෙන්නේ ය.[34] කලින් දුන් පොරොන්දු නොතකා එල්ටීටීඊ නායකයන් හා අනෙකුත් අය ඝාතනය කිරීමට අණ දුන්නේ ආරක්ෂක ලේකම් හා ජනාධිපතිවරයාගේ සොහොයුරා වන ගෝඨාභය රාජපක්ෂ බවට විශ්‍රාම ලත් හමුදාපති හා ඒ වන විට ජනාධිපති අපේක්ෂක සරත් ෆොන්සේකා චෝදනා කිරීමත් සමග, ඔවුන්ට වෙඩි තබනු ලැබුණේ සුදු කොඩි අතැතිව යටත් වෙමින් සිටිය දී බවට නැගී තිබූ චෝදනා 2009

---

ගත්තේ ස්වල්ප වශයෙනිය යන කරුණ නිසා, විඩියෝ පටය තව දුරටත් විශ්වසනීය භාවයක් හිමි කර ගනියි. සටන් බිමේ දී කරන ලද බවට චුදිත ඝාතන පුළුල්ව පැතිර පැවති ඒවා වන අතර, නිතිපතා සිදු වූ ඒවා විය. ජංගම දුරකථන හා කුඩා විඩියෝ කැමරා පුළුල් ලෙස භාවිත වීම හේතු කොට ගෙන, යුද සමයේ දී කරන ලද වෙනත් කෲර ක්‍රියා පෙන්නුම් කරන තවත් දීර්ඝ විඩියෝ පට ඇති බවට විශාල විශ්වාසයක් තිබේ. Crisis Group interviews (අර්බුද කණ්ඩායම පැවැත්වූ සම්මුඛ සාකච්ඡා), diplomats (රාජ්‍ය තාන්ත්‍රිකයෝ), journalists (පුවත්පත් කලාවේදීහු), human rights advocates (මානව අයිතිවාසිකම්වලට පක්ෂව කතා කරන්නෝ), Colombo (කොළඹ), 2009 නොවැම්බර්.

[34] මැයි 18 දා උදෑසන වෙඩි තබා මරා දමනු ලබන්නට පැය කිහිපයකට පෙර, සුදු කොඩියක රැකවරණය යටතේ තම යටත් වීම පිළිගන්නා බවට පුලීදේවන් හා නඩේසන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ හා මිලිටරියේ ඉහළ මට්ටම්වලින් එකඟතාවක් ලබා ගෙන තිබූ බව රාජ්‍ය තාන්ත්‍රික හා වෙනත් මූලාශ්‍ර ගණනාවක් වාර්තා කර ඇත. Crisis Group interviews (අර්බුද කණ්ඩායම පැවැත්වූ සම්මුඛ සාකච්ඡා), 2009 ජූනි, ජූලි, නොවැම්බර්. විශේෂ පුළුල් බවක් සහිත එක් විස්තරයක්, ඝාතනවලට වගකිව යුත්තේ යුද හමුදා විශේෂ බලකායන් බවට චෝදනා කරයි. D.B.S. Jeyaraj, "LTTE leaders who surrendered were killed by Army Special Forces," 2009 දෙසැම්බර් 28, http://dbsjeyaraj.com/dbsj/archives/1267.

දෙසැම්බර් මාසයේ දී නැවතත් මතු වූයේය.[35] ගෝඨාභය හා ආණ්ඩුවේ අනෙකුත් නිලධාරීන් චෝදනා ප්‍රතික්ෂේප කර ඇත්තේය.[36] 2010 ජනවාරි මාසයේ දී ජනාධිපති රාජපක්ෂ තවත් වසර හයක ධුර කාලයක් දිනා ගත් අතර, ඉන් කෙටි කලක් තුළ, නිල ඇඳුමේ සිටිය දී දේශපාලන කටයුතුවල යෙදීම හා වංචනික අවි ගනුදෙනුවල යෙදීම

---

[35] "'Gota ordered them to be shot' – General Sarath Fonseka," *The Sunday Leader* (ද සන්ඩේ ලීඩර්), 2009 දෙසැම්බර් 13. එල්ටීටීඊ නායකයන් ඝාතනය කිරීමට ආරක්ෂක ලේකම්වරයා නීති විරෝධී නියෝගයක් දුන් බව වාර්තාකරුවෙකු තමන්ට පැවසූ නමුත්, එම නියෝගය ක්‍රියාත්මක වී නොමැති අතර නායකයන් ඝාතනයට ලක් වී ඇත්තේ සටනේ දී බව ප්‍රකාශ කරමින් ෆොන්සේකා සතියකට පසු තමන්ගේ ප්‍රකාශයෙන් කොටසක් ඉල්ලා අස් කර ගත්තේය. "Clarification by General Sarath Fonseka on our lead story on December 13," *The Sunday Leader* (ද සන්ඩේ ලීඩර්), 2009 දෙසැම්බර් 20. Amantha Perera and Jyothi Thottam, "The Conquerors of the Tigers Now Battle for the Spoils", *Time* (ටයිම්), 2009 දෙසැම්බර් 20.

[36] එල්ටීටීඊ නායකයන් ඝාතනය කරනු ලැබූ ආකාරය සම්බන්ධයෙන් ආණ්ඩුවේ නිලධාරීන් විවිධ පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා තානාපති පාලිත කොහොන මුල දී අඟවා සිටියේ එල්ටීටීඊ සටන්කරුවන් ඔවුන්ට සැඟවී වෙඩි තබා ඇති බවය. "Tamil Tiger leaders 'killed trying to surrender'," Agence France-Presse (ප්‍රංශ පුවත් ඒජන්සිය), 2009 මැයි 21. ෆොන්සේකා ඉදිරිපත් කළ චෝදනා ප්‍රතික්ෂේප කරමින් ලබා දුන් සම්මුඛ සාකච්ඡාවක දී ගෝඨාභය රාජපක්ෂ මෙලෙස පැහැදිලි කළේය: "මේක සිද්ධ වුණාය කියන්නේ අන්තිම දවසෙ - 2010 මැයි 18 වෙනිදා [ඔහු දිනය දැක්වූයේ එලෙසය] - ප්‍රභාකරන් ඝාතනයට ලක් වූ දවසේ. එල්ටීටීඊ නායකයන්, ඔවුන් 200 දෙනෙක් පමණ, හමුදාවෙන් වට කරලා ඒ වෙන කොට වර්ග මීටර් 1600ක ප්‍රදේශයකට කොටු වෙලා හිටියේ. එතකොට හොඳට ම රෑ වෙලා, මධ්‍යම රාත්‍රියත් පහු වෙලා. හිතා බලන්න මේ අවස්ථාව ගැන. ඔබට පුළුවනි ද තිත්ත කළුවරේ ඝන කැළෑව ඇතුළේ සුදු කොඩි අර ගෙන ඔවුන් එළියට එනවා දකින්න? ඒ වේලාවේ ත්‍රස්තවාදී සාමාජිකයන් කිහිපයක් ප්‍රතිප්‍රහාර එල්ල කළා. ප්‍රභාකරන් හදිසි ප්‍රහාරයක් එල්ල කරලා කලපුවට පැන ගන්න උත්සාහ කරමිනුයි හිටියේ, ඔහුගේ පුත්‍රයා වෙනත් දිසාවකට ගියා. ඒ අතරේ යටත් වූ සාමාජිකයන් 10,000ක් එක පැත්තකින් පසුබැස්සා. මේ වගේ බරපතළ සටන් තත්ත්වයක දී, සටන් බිම තුළ යන්තම් මාසයක් විතර ගත කරපු තරුණ භටයෙකුට, ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ සාමාජිකයන් හඳුනා ගෙන ඔහු තෝරලා වෙඩි තියනවා ද නැති නම් වෙඩි තැබීමෙන් වළකිනවා ද කියන තීරණය ගන්න පුළුවනිය කියලා ඔබට බලාපොරොත්තු වෙන්න හැකි ද?" "Some Western powers wanted a regime change in Sri Lanka," Asiantribune.com, 2010 පෙබරවාරි 25. ඝාතන පිළිබඳව ආණ්ඩුව සතුව යම් තොරතුරක් තිබේ නම් එය ලබා දෙන ලෙස ඉල්ලා එක්සත් ජාතීන්ගේ විශේෂ සබැඳියාකරු පිලිප් ඇල්ස්ටන් 2009 දෙසැම්බර් 18 දා ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ලිපියක් ලියුවේය. ලිපියේ පෙළ www.innercitypress.com/lanka1alston122109.html. වෙබ් පිටුවෙන් ලබා ගත හැකි වේ.

සම්බන්ධයෙන් යුද්ධාධිකරණය හමුවට පැමිණවීම සඳහා ෆොන්සේකා අත් අඩංගුවට ගනු ලැබුණේය.[37]

සිවිල් වැසියන් අධික ලෙස ඒකරාශී වී සිටි රෝහල්වලට හා ප්‍රදේශවලට ආණ්ඩුව විසින් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරනු ලැබීම සහ තම පාලනය යටතේ පැවති ප්‍රදේශවලින් පලා යාමට තැත් කළ සිවිල් වැසියන් එල්ටීටීඊය විසින් ඝාතනය කරනු ලැබීම ඇතුළු වාර්තා වූ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ ලැයිස්තුවක්, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව 2009 ඔක්තෝබර් මාසයේ නිකුත් කළ වාර්තාවකින් ඉදිරිපත් වේ.[38] චුදිත සිදුවීම් සිවිල් වැසියන් දහස් ගණනකගේ මරණ සමග ගැළපේ. "චුදිත සිදුවීම් ... සැබවින් ම සිදු වූයේ ද," එම සිදුවීම් ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් බවට පත් වන්නේ ද, "යන වග පිළිබඳව නිගමනවලට එළඹෙන්නේ" නැති බව සඳහන් කිරීමට එක්සත් ජනපද වාර්තාව පරිස්සම් වන්නේය.[39] අවාසනාවන්ත ලෙස, කොන්ග්‍රසයේ අනුමැතිය ලද වාර්තාව සඳහා කැප කරනු ලැබූ සම්පත් අවම වූ අතර, චන්ද්‍රිකා ඡායාරූප හෝ එක්සත් ජනපද ආණ්ඩුවේ විවිධ අංශවලට අයත් මිනිස් බුද්ධි අංශවලින් ලැබුණු තොරතුරු පිළිබඳව

[37] තමන්ගෙන් ඉල්ලා සිටිය හොත් ජාත්‍යන්තර පරීක්ෂණයක් හමුවේ තමන් දන්නා දේ එළිදරව් කිරීමට සූදානම් බවට මාධ්‍ය වෙත කළ අදහස් දැක්වීම්වලින් පසුව, 2010 පෙබරවාරි 8 දා ෆොන්සේකා අත් අඩංගුවට ගනු ලැබුණි. "Sri Lanka election loser Sarath Fonseka arrested," BBC News (බීබීසී නිවුස්), 2010 පෙබරවාරි 8. ෆොන්සේකා මේ වන විට යුද්ධාධිකරණ දෙකකට මුහුණ දෙමින් මිලිටරි සිර අඩස්සියේ පසු වන්නේය. අප්‍රේල් 8 දා, ජනතා විමුක්ති පෙරමුණේ (ජවිපෙ) සහාය ලබන ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයේ අපේක්ෂකයෙකු ලෙස ෆොන්සේකා පාර්ලිමේන්තුවට තේරී පත් විය. මැයි 6 දා, චුදිත යුද අපරාධ සම්බන්ධයෙන් පවත්වනු ලබන ජාත්‍යන්තර පරීක්ෂණයක් සඳහා ෆොන්සේකා නැවතත් තම සහාය පළ කළේය. "Sri Lanka ex-army chief vows to expose war crimes," Agence France-Presse (ප්‍රංශ පුවත් ඒජන්සිය), 2010 මැයි 6. ශ්‍රී ලංකාවේ ස්වෛරී භාවයට හානි කිරීමට ෆොන්සේකාගේ චෝදනා යොදා ගැනීම සඳහා එල්ටීටීඊය විසින් මෙහෙයවනු ලබන ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් ඇති බවට චෝදනා කරමින්, රටට අනර්ථදායක වන න්‍යාය පත්‍රයකට අනුබල දෙන ඕනෑ ම ශ්‍රී ලාංකිකයෙකු මරණ දඬුවමට මුළුමනින් ම සුදුසු ද්‍රෝහියෙකු බවට ගෝඨාභය රාජපක්ෂ පවසා ඇතැයි සඳහන් වේ. Shamindra Ferdinando, "Traitors should be given Capital punishment," *Island* (අයිලන්ඩ්), 2010 මැයි 6.

[38] "Report to Congress on Incidents During the Recent Conflict in Sri Lanka," U.S. Department of State (එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව), 2009 ඔක්තෝබර් මෙම වාර්තාවට බලය පැවරුණේ 2009 පරිපූරක විසර්ජන පණතිනි.

[39] එම, 3 පි.



படிப்பகம்

www.padippakam.com

කිසිදු සඳහනක් කර නොතිබුණේය. එහෙත්, ඇසින් දුටු සාක්ෂි හා විශ්වසනීය සංවිධානවලින් ලද වාර්තා පදනම් කර ගත්, "ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සහ/හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ බවට පත් විය හැකි සිදුවීම් හා කල්ක්‍රියාවන්" විශාල සංඛ්‍යාවක්, වාර්තාව ලැයිස්තුගත කරන්නේය.[40] වාර්තාව දෙපාර්ශ්වයේ ම වරදකාරිත්වය තහවුරු කරන දෝෂාරෝපණයක් ඉදිරිපත් කරන අතර, බැරෑරුම්, මනා ලෙස මූල්‍ය සම්පාදිත හා ස්වාධීන පරීක්ෂණයකට මුළුමනින් ම බල කරන තත්ත්වයක් නිර්මාණය කරයි.[41]

[40] එම, 5 පි.

[41] යුද අපරාධ සිදුවීම් සම්බන්ධයෙන්, "එවැනි සිදුවීම් පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හා ජාත්‍යන්තර ආයතන විසින් ගනු ලැබ ඇති කිසි යම් පියවරයන් වෙතොත් ඒ මොනවා ද යන වග විස්තර කරන සහ එවැනි පරිශ්‍රමයන්හි සඵලදායකත්වය තක්සේරු කරන" පසු විපරම් වාර්තාවක් විෂය පිළිබඳ පොදු තානාපතිවරයාගෙන් ( Ambassador-at-Large) ලබා ගැනීම සඳහා කොන්ග්‍රසය බලය පවරා ඇත. Division F (එෆ් කොට්ඨාසය), Statement of Managers (කළමනාකරුවන්ගේ ප්‍රකාශය), Department of State (රාජ්‍ය දෙපාර්තමේන්තුව), Foreign Operations, and Related Programs Appropriations Act (විදේශීය මෙහෙයුම් හා ඒවාට සම්බන්ධ වැඩ සටහන් පිළිබඳ විසර්ජන පණත), 2010. වාර්තාව 2010 ජූනි 16 දාතම හා බැඳේ.



படிப்பகம்

www.padippakam.com

## III. ආණ්ඩුවේ ක්‍රියා

මෙම කොටස තුළ ඇතුළත් වන චෝදනාවලට සහාය දීම සඳහා අර්බුද කණ්ඩායම සතුව ඇසින් දුටු සාක්ෂි හා වෙනත් සාක්ෂි ඇත්තේය. කාලයන්, ස්ථානයන් හා වෙනත් තත්ත්වයන් හැකි තරම් නිශ්චිතතාවෙන් යුතුව සැපයෙන නමුත්, තවත් සාක්ෂි සොයා ගැනීමත් සමග වඩා පැහැදිලි විය හැක්කේය. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව, යුද්ධයේ අවසන් මාසවල දී කිසිදු නීති විරෝධී කල්ක්‍රියාවක් සිදු වූ බව ප්‍රතික්ෂේප කර ඇති අතර, මෙහි සඳහන් වන චෝදනාවලින් බොහෝ ඒවා ඉවත ලා ඇත.[42] එහෙත් ශ්‍රී

---

[42] උදාහරණයක් ලෙස, 2010 පෙබරවාරි 2 දා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ බීබීසී වාර්තාකරුවෙකුට මෙලෙස පැවසීය: "එක්සත් ජාතීන් වේවා වෙන යම් රටක් වේවා, මේ රට තුළ කරන කිසිදු පරීක්ෂණයකට අපි - මම - ඉඩ දෙන්නේ නැහැ. කිසිදු හේතුවක් නැහැ. මේ රට තුළ කිසි ම වරදක් සිදු වෙලා නැහැ. මා කියන දේ පිළිගන්න. මේ රට තුළ කිසි ම දෙයක් සම්බන්ධයෙන් කිසි ම පරීක්ෂණයක් සිද්ධ වෙන්නේ නැහැ." BBC World News Asia Today (බීබීසී ලෝක ප්‍රවෘත්ති '' ඒෂියා ටුඩේ'), www.youtube.com/watch?v=1DyFQ-xdD-U වෙබ් පිටුවෙන් ලබා ගත හැකි වේ. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ඔක්තෝබර් වාර්තාවට ප්‍රතිචාර වශයෙන් 2009 ඔක්තෝබර් 22 දා මාධ්‍ය නිවේදනයක් නිකුත් කළ විදේශ කටයුතු අමාත්‍යාංශය මෙලෙස ප්‍රකාශ කළේය: "ආරක්ෂක මෙහෙයුම් අතරතුර දී ජනාධිපතිවරයා විසින් සන්නද්ධ හමුදාවල සියලු ශ්‍රේණි වෙත නිකුත් කරන ලද පණිවුඩය වූයේ, මිලිටරි වෑයම හැම විට ම එල්ටීටීඊයේ සන්නද්ධ ත්‍රස්තවාදයට එරෙහිව යොමු කළ යුතු බවය. එම නිසා, සිවිල් වැසියන්ට රැකවරණය සැලසීමෙහිලා හා ඔවුන්ගේ සුභසාධනය ආරක්ෂා කිරීමෙහිලා ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සාවධාන විය." 2009 මැයි 18 දා, ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ ඇමති මහින්ද සමරසිංහ මෙලෙස නිවේදනය කළේය: "ලේ බිඳක් වත් නොහෙළා සියලු දෙමළ සිවිල් වැසියන් මුදා ගෙන තියෙනවා." Ministry of Defence News (ආරක්ෂක අමාත්‍යාංශ පුවත්), www.defence.lk/new. asp?fname=20090518_02. එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා තානාපති පාලිත කොහොන, 2010 පෙබරවාරි 28 දා විකාශනය වූ ඕස්ට්‍රේලියානු ප්‍රවෘත්ති වැඩ සටහනක දී වඩා පරිස්සම් සහගත ස්ථාවරයක් ගනිමින් මෙලෙස ප්‍රකාශ කළේය: "දැන්, යුද අපරාධ සිද්ධ වුණා ද කියලා කිසි කෙනෙක් හරියට ම නොදන්නා නිසා මේක පිළිතුරු දෙන්න අමාරු ප්‍රශ්නයක්. කිසිදු සාක්ෂියක් නැහැ. යෝජනා තියෙනවා, චෝදනා තියෙනවා, ඒත් ඉන් එහාට කිසිදු නිශ්චිත දෙයක් නැහැ." "War Stories," SBS Dateline (එස්බීඑස් ඩේට්ලයින්), කලින් සඳහන් කර ඇත. එහෙත් පසුව ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් විනිශ්චයකාර නිහාල් ජයසිංහ "වෙනත් කරුණු අතර [පැවසුවේ] අහිංසකයන්ගේ ජීවිත හානි වූ බව විවිධ ජාත්‍යන්තර සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන කියා සිටියත් ආණ්ඩුව අනුගමනය කළේ හානි නොකිරීමේ ප්‍රතිපත්තියක්" බවය. "SL's UK High Commissioner protests over UK MP's comment," 2010 මාර්තු 10, www.priu.lk. ආණ්ඩුව සිදු කළ ආක්‍රමණය තුළ දී සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය වන්නට ඇති බව පිළිගත්



படிப்பகம்

ලංකා ආරක්ෂක හමුදා යුද අපරාධ සිදු කළ බවත් ආණ්ඩුවේ හා මිලිටරියේ ඉහළ පෙළේ නායකයන් ඇතුළු ඒවාට සම්බන්ධ නිශ්චිත පුද්ගලයන් පිළිබඳව පරීක්ෂණ පැවැත්විය යුතු බවත් විශ්වාස කිරීමට සැලකිය යුතු පදනමක් පවතින බව, අර්බුද කණ්ඩායම රැස් කර ගෙන ඇති සාක්ෂිවලින් පෙන්නුම් කෙරෙන්නේය.

ඒ ඒ ජාත්‍යන්තර අපරාධවලට මෙම සාක්ෂි අදාළ වන්නේ කෙසේ ද යන වගත් මෙම කොටසෙන් සංක්ෂිප්තව දැක්වෙන්නේය. එහි දී පදනම ලෙස යොදා ගන්නේ, ව්‍යවහාරික නීතිය තුළ හා ජාතික අධිකරණ බලය තුළ පිළිබිඹු වන ජාත්‍යන්තර අපරාධවලින් බොහොමයක් සංග්‍රහ කොට ඇති, ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව තුළ දැක්වෙන නිර්වචනයන්ය.[43] එසේ කර ඇත්තේ චූදිත

---

ආණ්ඩුවේ එක ම ජ්‍යෙෂ්ඨ නිලධාරියා ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයේ හිටපු ලේකම් රජීව විජේසිංහ වන අතර, සිවිල් මරණ සංඛ්‍යාව 3,000ත් 5,000ත් අතර බවට ඔහු තක්සේරු කළේය. මරණවලට හේතුව කොටින් සිවිල් වැසියන් "මිනිස් පලිහවල්" ලෙස යොදා ගැනීම බවට ඔහු දෝෂාරෝපණය කළේය. Julian Borger, "Sri Lanka says up to 5,000 civilians died in Tigers battle," *The Guardian* (ද ගාඩියන්), 2009 ජූනි 4.

[43] ශ්‍රී ලංකාවේ සිදු වූ ආකාරයේ අභ්‍යන්තර සන්නද්ධ ගැටුම් සඳහා ශ්‍රී ලංකාව ද පාර්ශ්වකරුවෙකු වන 1949 ජිනීවා සම්මුති හතරේ තුන්වන පොදු වගන්තිය යළි ලිඛිතව තහවුරු කරන රෝම ව්‍යවස්ථාව, "... ස්ථාපිත ජාත්‍යන්තර නීති රාමුවට අනුව ජාත්‍යන්තර ස්වභාවයක් නොගන්නා සන්නද්ධ ගැටුම් තුළ දී අදාළ කර ගත හැකි වෙනත් බරපතළ නීති හා රීති උල්ලංඝනය කිරීම්" දොළහක් නියම කරයි. 8 වගන්තිය (2)(c) සහ (e). ශ්‍රී ලංකාවේ සිදු වූ ආකාරයේ ගැටුමක දී වෙනත් අධිකරණයක් හෝ පරීක්ෂණ ආයතනයක් විසින් සැලකිල්ලට ගනු ලැබිය හැකි යුද අපරාධ නිශ්චිතව සඳහන් කොට ඇතුළත් කර ගැනීමට ලැයිස්තුව උත්සාහ නොකරන්නේ, ව්‍යවස්ථාව පිළිගත් විට මෙම සියලු නීති විරෝධී ක්‍රියාවන් ව්‍යවහාරික නීතියේ කොටසක් බවට පත් වන බැවින්ය. පෙර පැවති යුගෝස්ලාවියාව පිළිබඳ ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාවේ (International Criminal Tribunal for the former Yugoslavia - ICTY) අභියාචනා මණ්ඩලය පවත්වා ඇති ආකාරය සැලකිල්ලට ගැනීමෙන් පෙනී යන්නේ, "අභ්‍යන්තර සන්නද්ධ ගැටුමට ගොදුරු වූවන්ට ආරක්ෂාව සැපයීම පිළිබඳ අනෙක් සාමාන්‍ය මූලධර්ම හා නීතිරීතිවලින් ඌනපූරණය කෙරෙන තාක් දුරට, 3 වන පොදු වගන්තිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම් සඳහාත් එමෙන් ම සිවිල් ගැටුම් තුළ දී භාවිත වන සටන් උපායන් හා විධික්‍රම සම්බන්ධ ඇතැම් මූලික මූලධර්ම හා නීතිරීති සඳහාත්" ව්‍යවහාරික නීතියෙන් අපරාධ වගකීම පැවරුණු බවය. Prosecutor v. Tadić, case no. IT-94-1-AR72, Decision (චෝදක වී. ටැඩික්ට්ෂ්, නඩු අංක IT-94-1-AR72, 1995 ඔක්තෝබර් 2 දා අධිකරණ පාත්‍රතාව පිළිබඳ අතුරු ඇපෑල සඳහා විත්තිය ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ තීන්දුව. 119; 119; 96 ff ඡේදය ද බලන්න. මෙලෙස, රෝම ව්‍යවස්ථාව විසින් ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්

කල්ක්‍රියාවේ බරපතළකම විදහා පෑමට මිස, මේවා තොරතුරුවලින් තහවුරු වන්නට ඉඩ ඇති අපරාධ බව හෝ සිදු වන්නට ඇති අපරාධවලට අදාළ තොරතුරු බව යෝජනා කිරීම සඳහා පමණක් නොවේ. එමෙන් ම, ජාත්‍යන්තර අපරාධ අධිකරණය යනු පරීක්ෂණ පැවැත්වීමේ බලය සහිත එක ම අධිකාරය ද නොවන්නේය; සැබවින් ම, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් ජාත්‍යන්තර අපරාධ අධිකරණයට නිර්දේශ කරනු ලැබීමේ අවශ්‍යතාවක් පවතින බැවින්, වර්තමානයේ දී එය එසේ විය නොහැක්කේය. මෙම අදියරේ දී අවශ්‍ය වන්නේ, අදාළ කල්ක්‍රියාවේ මුළු පරාසය ම අනාවරණය කර ගැනීම සඳහා, අපරාධ සම්බන්ධයෙන් දැරිය යුතු වගකීමේ ප්‍රමාණය තීරණය කර ගැනීමට උදව් වීම සඳහා හා වග වීම සහතික කිරීම සඳහා ගත යුතු නිසි පියවරයන් නිර්දේශ කිරීමට, එක්සත් ජාතීන්ගේ නියෝගයෙන් සිදු වන ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක්ය.

භූමිකාව පරීක්ෂාවට ලක් කළ යුතු සියලු පුද්ගලයන් හඳුනා ගැනීමට හෝ සටනේ අවසන් මාසවල දී සම්බන්ධ වූ ආරක්ෂක හමුදා හා ආණ්ඩුවේ ආයතන සියල්ල ම වරදකාරිත්වය සම්බන්ධයෙන් සැක කළ යුතු බව යෝජනා කිරීමට මෙම වාර්තාව ප්‍රයත්න නොදරන්නේය. එමෙන් ම, එය ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කරන ලද යුද මුක්ත කලාප තුළ සිදු වූ සිදුවීම් පිළිබඳව ද මූලික අවධානයක් යොමු කරන නමුත්, එම කාල සීමාවෙන් හා භූගෝලීය රාමුවෙන් බාහිරව සිදු වූ වෙනත් සිදුවීම් පිළිබඳව සාක්ෂි ද අර්බුද කණ්ඩායම සතුව ඇත්තේය.

---

සඳහා පමණක් නියම කරනු ලබන යුද අපරාධ සම්බන්ධයෙන් මෙන් ම වෙනත් වර්ගවල ගැටුම්වල දී සිදු වන යුද අපරාධ සම්බන්ධයෙන් ද අපරාධ වගකීම පූර්ණ ලෙස අදාළ විය හැක්කේය. තව ද, ඇතැම් ජාතික අධිකරණ බලයන් විසින් යුද අපරාධ නිර්වචනය කරනු ලබන්නේ, අපරාධ සිදු වන සමයේ දී ව්‍යවහාරික හෝ සම්මත ජාත්‍යන්තර නීතිය යටතේ යුද අපරාධ බවට පත් වන හා එලෙස රෝම ව්‍යවස්ථාව යටතේ නිශ්චිතව නියම නොකෙරෙන ක්‍රියාවන් ද ඇතුළත් විය හැකි ක්‍රියාවන් ලෙසය. බලන්න, උදා., Canada , කැනඩාවේ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ හා යුද අපරාධ පනත, S.C. 2000, c.24. ශ්‍රී ලංකාව තුළ කරන ලද බවට චූදිත අපරාධ පරීක්ෂාවට ලක් කරන ඕනෑ ම අධිකරණ බලයක් හෝ පරීක්ෂණයක්, අදාළ තොරතුරු පිළිබඳව කරන පූර්ණ සමාලෝචනයක් මත පදනම්ව උචිත නීතිය තීරණය කළ යුත්තේය.

www.padippakam.com

ප්‍රසිද්ධ කිරීමට පෙර, අර්බුද කණ්ඩායම ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හා විවිධ ශ්‍රී ලාංකික නිලධාරීන්ට පහත දැක්වෙන චෝදනා සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලබා දුන්නේය. එහෙත් කිසි ම ප්‍රතිචාරයක් නොලැබුණි.[44]

## අ. මානුෂීය මෙහෙයුම්වලට එල්ල කළ ප්‍රහාර

2008 සැප්තැම්බර් මාසයේ දී එක්සත් ජාතීන්ට හා ජාත්‍යන්තර ආධාර ආයතනවලට ඉවත් වීමට නියෝග කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වන්නිය තුළ මානුෂීය මෙහෙයුම් සීමා කළේය. ඉන් පසුව ආණ්ඩුව ප්‍රදේශය තුළ අවතැන් වී සිටි සියදහස් ගණනක් සිවිල් වැසියන්ට ආහාර, වෛද්‍ය සැපයුම් හා වෛද්‍ය රැකවරණය යැවීම සීමා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දරුණු හිඟකම් ඇති වූයේය.[45] කාන්තාවන් හා ළමයින්

[44] 2010 අප්‍රේල් 15 දා, අර්බුද කණ්ඩායම මෙම කොටස තුළ දළ වශයෙන් දැක්වෙන චෝදනා පිළිබඳ සාරාංශයක් බ්‍රසල්ස්හි ශ්‍රී ලංකා තානාපතිවරයා වෙත භාර දුන් අතර, එහි පිටපත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, හමුදාපති ජගත් ජයසූරිය හා දැනට ආණ්ඩුවේ අත් අඩංගුවේ පසු වන හිටපු හමුදාපති සරත් ෆොන්සේකා, මෙන් ම ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානීන්, ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය, නැවත පදිංචි කිරීම් හා ආපදා සහන සේවා අමාත්‍යාංශය, ජාතිය ගොඩ නැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය, සන්නද්ධ හමුදා සහ ජනාධිපති කාර්යාලය වෙත යොමු කරන ලෙස ආයාචනයක් ද ඒ තුළ අඩංගු විය. එමෙන් ම, අර්බුද කණ්ඩායම කොළඹ සිටින ගෝඨාභය රාජපක්ෂ හා ජගත් ජයසූරිය වෙත ඍජුව ම ද සාරාංශය යැව්වේය. ආරම්භක සන්නිවේදනයන්ට හෝ බ්‍රසල්ස්හි තානාපතිවරයා වෙත යැවූ පසු විපරමට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණේය.

[45] එල්ටීටීඊය වන්නිය පාලනය කරමින් පොලීසිය හා උසාවි සපයන අතරතුර, උපත්, මරණ හා විවාහ ලියාපදිංචි කිරීම; සෞඛ්‍ය හා රෝහල් පහසුකම්; අධ්‍යාපනය; ජල සම්පාදනය, සනීපාරක්ෂාව සහ අත්‍යවශ්‍ය ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය ප්‍රදේශයට ප්‍රවාහනය කිරීම ඇතුළු අනෙක් සේවාවන් සියල්ල ම පාහේ සැපයුවේ හෝ පාලනය කළේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවය. වන්නියෙහි සිටි ආණ්ඩුවේ කාර්ය මණ්ඩලයට එල්ටීටීඊය සමග සන්නිවේදනයෙහි යෙදීම නිල වශයෙන් තහනම් කරනු ලැබ තිබූ නමුත්, ප්‍රායෝගික වශයෙන් සිය රාජකාරි ඉටු කිරීමේ දී එල්ටීටීඊය සමග සම්බන්ධීකරණ කටයුතුවල යෙදීමට ඔවුන්ට සිදු විය. 2008 අග දී හා 2009 මුල දී, ආණ්ඩුව වන්නියෙහි අභ්‍යන්තර අවතැන් වූවන් සඳහා ඇතැම් ආහාර සැපයූ නමුත්, බහුතරය සපයනු ලැබුණේ ලෝක ආහාර වැඩ සටහන (WFP) විසිනි. ආහාර වැඩ සටහන සතුව වන්නිය තුළ බඩු ගබඩා මාලාවක් තිබූ අතර, ඒවා වෙත ආහාර රැගෙන ආ ඔවුහු අනතුරුව එම ආහාර පළාත් ආණ්ඩුවේ බලධාරීන්ට භාර දුන්නෝය. වැඩ සටහන කරන භාර දීම්වලට ඉඩ දීමට ආණ්ඩුව වඩ වඩා නොකැමති වන තත්ත්වයක් ඇති වූයේය. ජනගහනයේ අවම අවශ්‍යතා සැපිරීමට වත් තමන්ට ලැබෙන සැපයුම් ප්‍රමාණවත් නොවන බව, 2008 අග සිට පළාත් ආණ්ඩුවේ නිලධාරීහු ආණ්ඩුවට හා ලෝක ආහාර වැඩ සටහනට දැනුම්



படிப்பகம்

www.padippakam.com

බොහෝ සංඛ්‍යාවක් ඇතුළු සිවිල් වැසියන් ඝාතනය කරමින් හා තුවාලවලට ගොදුරු කරමින් සහ තීරණාත්මක මානුෂීය සැපයුම් විනාශ කරමින්, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා මානුෂීය මෙහෙයුම්වලට ද ප්‍රහාර එල්ල කළේය. එවැනි සිදුවීම්වලින් මුල් කාලීන එකක් වනුයේ 2009 ජනවාරි මස අග දී එක්සත් ජාතීන්ගේ මෙහෙයුමකට එල්ල කරන ලද ප්‍රහාරයකි.

එම ප්‍රහාරයට මාස තුනකට පෙර, එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය ආණ්ඩුව අල්ලා ගෙන තිබූ වවුනියාවට ඉවත් කර ගැනීමෙන් පසුව ඉතිරි වූ එක්සත් ජාතීන්ගේ දේශීය කාර්යමණ්ඩල සාමාජිකයෝ,[46] ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා කිලිනොච්චිය තුළට පිවිසීමත් සමග එක්සත් ජාතීන්ගේ මෙහෙයුම කිලිනොච්චි මූලස්ථානයේ සිට පුදුකුඩිඉරිප්පු වෙත ගෙන ගියෝය. පුදුකුඩිඉරිප්පුවල දී, එක්සත් ජාතීන් සන්නිවේදන මධ්‍යස්ථානයක් (පුදුකුඩිඉරිප්පු මධ්‍යස්ථානය) මෙන් ම ලෝක ආහාර වැඩ සටහනේ (WFP) සැපයුම් සඳහා ගබඩා ස්ථාන ද පිහිටුවූයේය.[47] ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය රාත්‍රි කාලය වන්නිය තුළ ගත කිරීමට ආණ්ඩුව විරුද්ධත්වය පළ කළ අතර,

---

දුන්නෝය. ෂෙල් වෙඩි ප්‍රහාර හේතුවෙන් වැඩි වන සිවිල් තුවාලකරුවන් සංඛ්‍යාවට ප්‍රතිකාර කිරීම සඳහා වැඩිපුර වෛද්‍ය සැපයුම් රැගෙන ඒමට ආණ්ඩුව ඉඩ දිය යුතු බවට, වන්නියෙහි රෝහල් ද ඉල්ලා සිටියේය. ඉන් පසු මාසවල දී මෙම හිඟකම් සැලකිය යුතු මට්ටමකින් වඩා නරක අතට හැරුණේය. පහත III. ආ. සහ ඇ. කොටස් බලන්න.

[46] එක්සත් ජාතීන්ගේ විවිධ නියෝජිත ආයතන විසින් අඩු ගණනේ ශ්‍රී ලාංකිකයන් පහළොස් දෙනෙකු වත් සේවයෙහි යෙදවුණු අතර, එක්සත් ජාතීන් ඉවත් කර ගැනීමෙන් පසුව එම ශ්‍රී ලාංකිකයන්ගෙන් යැපෙන්නෝ 80කට වැඩි සංඛ්‍යාවක් ද ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල බොහෝ ජාතික කාර්ය මණ්ඩල සාමාජිකයෝ ද වන්නිය තුළ රැඳී සිටියෝය. එල්ටීටීඊය එක්සත් ජාතීන්ගේ ජාතික කාර්ය මණ්ඩල සාමාජිකයන් ගණනාවකට වන්නියෙන් ඉවත් වීමට ඉඩ දී තිබූ නමුත්, සාමාන්‍යයෙන් යැපෙන්නන්ට අවසර දීම ප්‍රතික්ෂේප කර තිබූ නිසා, කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙක් ද ඉවත් නොවී රැඳී සිටියෝය.

[47] පුදුකුඩිඉරිප්පු හන්දියට මඳක් උතුරින් පිහිටුවනු ලැබුණු පුදුකුඩිඉරිප්පු මධ්‍යස්ථානය, විශාල ඉඩම් කට්ටි දෙකකින්, ලෝක ආහාර වැඩ සටහනේ තාවකාලික ගබඩා ගොඩනැගිලි දෙකකින්, කලින් ඉදි කර තිබූ ගොඩනැගිලි දෙකකින් හා මඩුවලින් සමන්විත වූයේය. ඒ-35 මාර්ගය දිගේ කිලෝමීටරයක් පමණ බටහිරට පිහිටුවනු ලැබ තිබූ ලෝක ආහාර වැඩ සටහනේ ස්ථානය, එම වැඩ සටහනේ අතිරේක තාවකාලික ගබඩා ගොඩනැගිලි දෙකකින් සමන්විත වූයේය. වීක් හෝල්ස් (Wiik Halls) ලෙස හඳුන්වනු ලැබුණු මෙම තාවකාලික ගබඩා ගොඩනැගිලි ප්ලාස්ටික් තහඩුවලින් ආවරණය වූ ලෝහ රාමුවකින් සමන්විත අර්ධ-ජංගම ගොඩනැගිලි වේ. ඒවා පැතිවල හා වහලවල එක්සත් ජාතීන්ගේ ලාංඡනය සහිත සුදු පැහැ ගොඩනැගිලි විය.



படிப்பகம்

ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය නොමැති වීමෙන් ජාතික කාර්ය මණ්ඩලය වඩා බලගතු අවදානමකට ඇද වැටීමේ ඉඩක් අනිවාර්යයෙන් ම තිබුණ ද එක්සත් ජාතීන් මෙහෙයුම සඳහා යෙදුවේ එම කාර්ය මණ්ඩලය පමණකි.

පුදුකුඩිඉරිප්පු මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුණේ පුදුකුඩිඉරිප්පුවල පිහිටි උපදිසාපතිවරයාගේ නිවසේ අංගනය තුළය.[48] එල්ටීටීඊය වෙත, කොළඹ පිහිටි ආරක්ෂක අමාත්‍යාංශ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය වෙත හා මේජර් ජනරාල් ජගත් ජයසූරියගේ ආඥාපතිත්වය යටතේ පැවති වවුනියාවෙහි පිහිටි ආරක්ෂක හමුදා මූලස්ථානය වෙත, එක්සත් ජාතීන් තම මධ්‍යස්ථානය සම්බන්ධ ජීපීඑස් සම්බන්ධීකාරක (GPS coordinates) සැපයුවේය. ජනරාල් ජයසූරිය ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකාට වාර්තා කළ අතර, අනතුරුව ඔහු ආරක්ෂක හමුදාවන්හි අණ දෙන නිලධාරියා හා ප්‍රධානියා වූ ජනාධිපති මහින්ද රාජපක්ෂට වගකියූ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට වාර්තා කළේය.[49]

---

[48] සෑම දිස්ත්‍රික්කයක ම දිස්ත්‍රික්ක ලේකම් නමින් ද හඳුන්වනු ලබන දිසාපතිවරයෙකුත්, අතිරේක දිසාපතිවරයෙකු මෙන්ම කොට්ඨාස නමින් හඳුන්වනු ලබන දිස්ත්‍රික්ක උපපරිපාලන ඒකක අධීක්ෂණය කරන නානාවිධ උපදිසාපතිවරුත් සිටියෝය. අතිරේක දිසාපතිවරු "ප්‍රාදේශීය ලේකම්වරුන්" ලෙස ද හඳුන්වනු ලැබුවෝය. මෙම නිලධාරීහු කොළඹට වාර්තා කරන අතර, එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශවල ආණ්ඩුවේ සේවාවන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වගකීම දරන්නෝය.

[49] 2007 අගෝස්තු මස සිට යුද්ධයේ අවසානය දක්වා වන්නි ආඥාපති ලෙස කටයුතු කළේ මේජර් ජනරාල් ජගත් ජයසූරියය. 2009 ජුලි මාසයේ දී ජනාධිපති රාජපක්ෂ ඔහු ලුතිනන් ජනරාල් තනතුරට උසස් කොට, සරත් ෆොන්සේකා ඉවත් කරමින් යුද හමුදාපති ලෙස පත් කළේය. "යුද හමුදාවෙහි සියලු ක්ෂේත්‍ර තුළ උපායාත්මක සැලසුම්කරණ කටයුතු සම්බන්ධයෙන් වගකීම දැරුවේ ජනරාල් ෆොන්සේකා. සටන ඉදිරියට යන ආකාරය ඔහු දිවා රෑ පෞද්ගලිකව ම අධීක්ෂණය කළා. ඔහු වගේ කෙනෙක් යුද හමුදාපතිවරයා ලෙස සිටීම අපට තීරණාත්මක සාධකයක් වුණා. ඔහු අත්දැකීම් සහිත නිලධාරියෙක්. ඔහු වෘත්තියෙහි යෙදුණු සමස්ත කාලය තුළ දී ඔහු ත්‍රස්ත විරෝධී කටයුතුවලත් යුද්ධ කාලය තුළ දී සිදු වූ සියලු ප්‍රධාන සටන්වලත් යෙදවිලා තියෙනවා. ... ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනරාල් සරත් ෆොන්සේකාගේ දක්ෂතාවන් හා හැකියාවන් හඳුනා ගත්තා, ඒ නිසයි ඔහු ජනරාල් ෆොන්සේකා යුද හමුදාපතිවරයා ලෙස පත් කළේ. ... වන්නියෙහි ආරක්ෂක හමුදා ආඥාපතිවරයා වන ජනරාල් ජගත් ජයසූරිය ආරම්භයේ සිට අවසානය දක්වා ම මෙහෙයුම් සම්බන්ධීකරණය කළා. කලින් සඳහන් කළ සේනාංකවල [53 වන, 57 වන, 58 වන හා 59 වන සේනාංක] සමස්ත ආඥාපතිවරයා වුණේ ඔහු. මෙම යුද ව්‍යාපාරයට ඔහු ලබා දුන් දායකත්වය අතිවිශාලයි." "Defence Secretary Gotabaya Rajapaksa salutes the war heroes," *Business Today* (බිස්නස් ටුඩේ), 2009

2008 ඔක්තෝබර් හා 2009 ජනවාරි අතරතුර දී, එක්සත් ජාතීන් වවුනියාවෙහි සිට පුදුකුඩිඉරිප්පු මධ්‍යස්ථානය දක්වා ආහාර හා සැපයුම් රැගෙන යන ආරක්ෂිත වාහන කණ්ඩායම් (convoys) එකොළහක්(11) පවත්වා ගෙන ගියේය.[50] සෑම වාහන කණ්ඩායමක් ම එල්ටීටීඊය හා ආණ්ඩුව ලවා අනුමත කරවා ගැනීමට සිදු වූයේය. වාහන හා වාහන කණ්ඩායම තුළ සිටින කාර්ය මණ්ඩලය, වාහනවල අන්තර්ගත දේ සහ ගමන් මාර්ගය හා ගමනාන්තය පිළිබඳ තොරතුරු අනාවරණය කරන ලෙස එක්සත් ජාතීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබුණි. කොළඹ පිහිටි ආරක්ෂක අමාත්‍යාංශය හා වන්නි ආරක්ෂක හමුදා මූලස්ථානය ලවා මෙම තොරතුරු අනුමත කරවා ගැනීමට සිදු වී තිබුණි.[51]

---

ජූනි. එක් අවස්ථාවක ෆොන්සේකා ජයසූරියට එරෙහිව පරීක්ෂණයක් නියම කළ බවට වාර්තා ලැබීමත් සමග ජනරාල්වරුන් අතර තරගයක් පිළිබඳ ඇඟවීම් කෙරී ඇත. "Fonseka challenges impartiality of judges," Express News Service (එක්ස්ප්‍රස් නිවුස් සර්විස්), 2010 මාර්තු 22, http://expressbuzz.com/world/fonseka-challenges-impartiality-of-judges/158467.html; සහ D.B.S. Jeyaraj, "Rajapakse regime and the Fonseka phenomenon: Genesis of current crisis," 2009 නොවැම්බර් 14, http://dbsjeyaraj.com/dbsj/archives/1227. ආරක්ෂක ලේකම්වරයාගේ ම භූමිකාව පිළිබඳවː "තමන් [ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල - යුද හමුදාවේ, නාවික හමුදාවේ හා ගුවන් හමුදාවේ] ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් සමග සෑම පැයක ම, සෑම දිනක ම යුද මෙහෙයුම් 'අධ්‍යයනය කළ' බව ගෝඨාභය කියයි. 'ඕනෑඑපාකම් හා අවශ්‍යතා අවබෝධ කර ගන්න හා මැන ගන්න මට පුළුවන් වුණා. ඕනෑ ම මිලිටරි ආඥාපතියෙක් සෑම දෙයක් ම, හැකි සෑම ආයුධයක් ම, හැකි සෑම භාණ්ඩ ලේඛනයක් ම ලබා ගැනීමට උත්සාහ කරනවා. මගේ කාර්යය වුණේ ප්‍රමුඛතාවන් අවබෝධ කර ගැනීම, ජයග්‍රහණය සඳහා සැබවින් ම අවශ්‍ය වන්නේ කුමක් ද යන්න සැලකිල්ලට ගෙන එම ප්‍රමුඛතාවන් තර්කානුකූලව සංවිධානය කිරීම හා අපගේ අරමුණුවලට කිසි ම අදාළත්වයක් නොතිබූ ඕනෑඑපාකම් හා අවශ්‍යතා ඉවතලීම.'" "Winning wars: political will is the key," *Indian Defence Review* (ඉන්ඩියන් ඩිෆෙන්ස් රිවිව්), කලින් සඳහන් කර ඇත. ජනාධිපතිවරයා හා ඔහුගේ සොහොයුරා පිළිබඳ ෆොන්සේකාගේ සම්පූර්ණ සහතික කිරීම සඳහා, බලන්න, V.K. Shashikumar, "Lessons from the War in Sri Lanka," කලින් සඳහන් කර ඇත.

[50] භාර දුන් පසු අත්සන් තබා ආහාර ද්‍රව්‍ය තමන් භාරයට ගෙන බෙදා හැරීමේ ඒකක පද්ධතියක් හරහා අභ්‍යන්තරව අවතැන් වූ ජනගහනයට ඒවා බෙදා දීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ, ප්‍රදේශයට අදාළ ජ්‍යෙෂ්ඨ ආණ්ඩු නිලධාරියා බවට ආණ්ඩුව නියම කළේය.

[51] එක්සත් ජාතීන් යෝජනා කළ අත්‍යවශ්‍ය සැපයුම් කිහිපයක් ප්‍රතික්ෂේප කරනු ලැබුණේය. උදාහරණයක් ලෙස, 2008 දෙසැම්බර් මාසයේ මෝසම් වැසි සමයේ උච්ච ම අවස්ථාවේ දී එක්සත්



படிப்பகம்

ආරක්ෂක හමුදා, ට්‍රක් රථවලට බඩු පැටවීම අධීක්ෂණය කොට ගබඩාවලට මුද්‍රා තබා මුර කළ අතර, වන්නියට ඇතුළු කිරීමට තහනම් ද්‍රව්‍ය නැති බව සහතික කර ගැනීම සඳහා පිටත් වීමට කලින් ට්‍රක් රථ සෝදිසි කළේය. ඕමන්තේ මුර පොළේ දී ද ආරක්ෂිත වාහන කණ්ඩායම් පරීක්ෂා කරනු ලැබුණි. ආරක්ෂිත වාහන කණ්ඩායම් තුළ යොදා ගන්නා ලද සියලු වාහන පැහැදිලිව සලකුණු කොට හා හඳුනා ගනු ලැබ තිබුණේය.[52] ආරක්ෂිත වාහන කණ්ඩායමේ කාර්ය මණ්ඩලයට ඇතුළත් වූයේ එක්සත් ජාතීන්ගේ විවිධ නියෝජිත ආයතනවලට අයත් ජාත්‍යන්තර හා ශ්‍රී ලාංකික කාර්ය මණ්ඩලයන්ය.

එක් එක් ආරක්ෂිත වාහන කණ්ඩායම පිටත් වන වේලාව හා ගමන් මාර්ගය පිළිබඳව ආරක්ෂක හමුදා හා එල්ටීටීඊය එකඟතාවකට පැමිණ තිබුණත් නානාවිධ අවස්ථාවල දී ආරක්ෂිත වාහන කණ්ඩායම් සමීපයෙහි ෂෙල් වෙඩි පතිත වූ අතර, එක් ගමනක් නතර කිරීමට ද සිදු වූයේය. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරනු ලබමින් තිබුණේ එල්ටීටීඊ ස්ථානවලට හෝ ඒවා ආසන්නයට නිසා සහ සාමාන්‍යයෙන් එල්ටීටීඊය ආරක්ෂිත වාහන කණ්ඩායම්වලින් වාසි ලැබූ නිසා,[53] ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරන ලද්දේ ආරක්ෂක හමුදා විසින් බව එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය විශ්වාස කළේය. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීමේ සිදුවීම් පිළිබඳව එක්සත් ජාතීන් ආරක්ෂක හමුදාවලට

---

ජාතීන් සූදානම් කළ වාසස්ථාන කට්ටල 10,000 නිදහස් කිරීම ආරක්ෂක අමාත්‍යාංශය ප්‍රතික්ෂේප කළේය.

[52] ලෝක ආහාර වැඩ සටහනේ වාහන විශාල ලොරි වූ අතර, ඒවා ආහාර වැඩ සටහනේ වාහන බව හඳුනා ගත හැකි වන ආකාරයට එක්සත් ජාතීන්ගේ හෝ ලෝක ආහාර වැඩ සටහනේ සලකුණු ලොකු නිල් පාට අකුරින් පින්තාරු කරන ලද සුදු පැහැ වාහන හෝ නිල් පාට අකුරින් පින්තාරු කරන ලද විශාල සුදු බැනරවලින් සලකුණු කරන ලද කුලියට ගත් වාහන වූයේය.

[53] වඩ වඩා අපේක්ෂා භංගත්වයට පත් වෙමින් සිටි දෙමළ ජනගහනය ආහාර හේතුවෙන් දිරිමත් වන නිසා, ආරක්ෂිත වාහන කණ්ඩායම්වලින් ප්‍රදේශය තුළට කැටුව එන ජාත්‍යන්තර කාර්ය මණ්ඩලවලට ආණ්ඩුවේ ෂෙල් වෙඩි ප්‍රහාර හා සිවිල් ජනගහනයේ තත්ත්වය නිරීක්ෂණය කළ හැකි නිසා හා වාර්තා කළ හැකි නිසා සහ එල්ටීටීඊය ආහාරවලින් යම් ප්‍රමාණයක් පැහැර ගෙන ඒවා තම සාමාජිකයන්ට ලබා දුන් නිසා, එල්ටීටීඊය සාමාන්‍යයෙන් ආරක්ෂිත වාහන කණ්ඩායම් සාදරයෙන් පිළිගත්තේය. සාමාන්‍යයෙන්, ආණ්ඩුව හෝ ලෝක ආහාර වැඩ සටහන පළාත් ආණ්ඩුවේ නිලධාරීන් වෙත ආහාර පවරා දෙන මුල් අවස්ථාවේ දී එල්ටීටීඊය ඒවා පැහැර නොගත් අතර, එය ඒවා පැහැර ගත්තේ ආහාර අනෙක් බෙදා හැරීම් ස්ථාන වෙත ගෙන යන අතරතුර දීය. 2009 ජනවාරි මාසයෙන් පසු එල්ටීටීඊයේ ප්‍රතිපත්තිය වූයේ තම සාමාජිකයන් සඳහා ආහාරවලින් සියයට 25කට ආසන්න ප්‍රමාණයක් පැහැර ගැනීම බව සාක්ෂිකරුවෝ වාර්තා කළෝය.

දැනුම් දුන් නමුත්, එය ප්‍රතික්ෂේප කළ ආරක්ෂක හමුදා, එල්ටීටීඊය පළමුවෙන් වෙඩි තැබූ නිසා දස වන ආරක්ෂිත වාහන කණ්ඩායම අතරතුර දී එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාරය යුක්ති සහගත බව කියා සිටියේය.

එකොළොස් වන ආරක්ෂිත වාහන කණ්ඩායම එක්සත් ජාතීන් දැරූ අවසන් ප්‍රයත්නයය. එය පිටත් වීමට පෙර, පුදුකුඩිඉරිප්පු රෝහලේ දී ද ඇතුළුව වන්නිය තුළ දී නිරීක්ෂණය කළ තත්ත්වයන් පිළිබඳව එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය නානාවිධ අවස්ථාවල දී ජනරාල් ජයසූරියට දැනුම් දී තිබුණේය. කාන්තාවන්, ළමයින් හා වැඩිහිටියන් ඇතුළු සිවිල් වැසියන් ඉහළ සංඛ්‍යාවක් ඝාතනයට හෝ තුවාලවලට ලක් වූ බව පිළිබඳව ඔහුට දැනුම් දෙනු ලැබුණේය. ඊට ප්‍රතිචාර දක්වමින් ඔහු පැවසුවේ, ආරක්ෂක හමුදා වෙඩි තබා ඇත්තේ එල්ටීටීඊයට පමණක් බවත් සිවිල් වැසියන්ට නොවන බවත්ය. සිවිල් වැසියන් හා එල්ටීටීඊය වෙන් කොට හඳුනා ගැනීම දුෂ්කර නිසා සිවිල් වැසියන් යුද පෙරමුණු තුළ නොසිටිය යුතු බව ද ඔහු පැවසුවේය. එමෙන් ම, යුද්ධය නිසා ඇති වන හාමතින්, තුවාලවලින් හා රෝගවලින් ඔවුන් විඳින පීඩාවන් අවම කිරීම සඳහා සිවිල් ජනගහනයට සැපයුම් යැවීමේ හා උපකාර කිරීමේ විකල්ප උපායක් අවශ්‍ය බව ද ජනරාල් ජයසූරියට තව දුරටත් දැනුම් දෙනු ලැබුණේය.

එක්සත් ජාතීන්ගේ අවසන් ආරක්ෂිත වාහන කණ්ඩායම වවුනියාවෙන් පිටත් වූයේ 2009 ජනවාරි 16 දාය. සැහැල්ලු වාහන ද, ලෝක ආහාර සංවිධානයෙන් සැපයුණු ආහාර ද්‍රව්‍ය (පිටි, සීනි, පරිප්පු, සහල් හා පිසින තෙල්) හා වාසස්ථාන අයිතම කිහිපයක් අඩංගු ලොරි 50කට වැඩි සංඛ්‍යාවක් ද ඊට ඇතුළත් වූයේය. පිටත් වීමට කලින්, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා මුළු ආරක්ෂිත වාහන කණ්ඩායම ම සෝදිසි කර බැලුවේය. යුද පෙරමුණු පසු කර යාමට හා ආධාර බෙදා පසු දින ආපසු ඒමට ඊට ඉඩ දීම සඳහා එල්ටීටීඊය හා ආරක්ෂක හමුදා සටන් විරාමයකට එකඟ වූයේය. ආරක්ෂිත වාහන කණ්ඩායම එදින පුදුකුඩිඉරිප්පු වෙත ළඟා වූ අතර, ලෝක ආහාර සංවිධානයේ සලාක තාවකාලික ගබඩා ගොඩනැගිලි තුළට බානු ලැබුණි.[54]

[54] ගමන අතරතුර දී ආරක්ෂාව හා සම්බන්ධ සිදුවීම් කිසිවක් සිදු නොවූයේය. කෙසේ වුව ද, ආරක්ෂිත වාහන කණ්ඩායම ආරක්ෂක හමුදාවල යුද පෙරමුණ හරහා යද්දී වාහන පසෙකින් ඇවිද ගෙන සොල්දාදුවෝ එල්ටීටීඊය දෙසට ඉදිරියට ගියෝය. මෙය කිසිදු එල්ටීටීඊ වෙඩි තැබීමකට හේතු නොවූයේය.



படிப்பகம்

ආරක්ෂිත වාහන කණ්ඩායම ජනවාරි 17 දා උදෑසන ආපසු වවුනියාවට ඒමට සැලසුම් කර තිබුණ ද ආරක්ෂක හමුදා අවසරය නොදුන්නේය. ඒ වෙනුවට, පුදුකුඩිඉරිප්පුවලට එරෙහිව සැලසුම් කළ ආක්‍රමණයක් පිළිබඳ වාර්තා තිබිය දී සහ ප්‍රදේශය තුළ අභ්‍යන්තරව අවතැන් වූ ජනගහනය වැඩෙමින් පවතිද්දී, ඒවා දකුණු යුද පෙරමුණ ඔස්සේ නොකඩවා ම එල්ටීටීඊය සමග සටන් වැදුණේය. ඊළඟ දින කිහිපය තුළ දී මෝටාර් හා කාලතුවක්කු වෙඩි ඒම හා යාම තීව්‍ර විය. එල්ටීටීඊය ෂෙල් වෙඩි දියත් කරමින් සිටියේ පුදුකුඩිඉරිප්පු සමීපයෙහි සිට ආණ්ඩුව අල්ලා ගෙන තිබූ ප්‍රදේශය තුළට වන අතර, ආරක්ෂක හමුදාවලින් එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාර වැදුණේ පුදුකුඩිඉරිප්පු තුළටය. එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය බංකරයක් ගොඩ නැගුවේය.

සුදන්දිරපුරම්, උඩයාර්කඩ්ඩු උතුර, වල්ලිපුනම් හා දේව්පුරම් ඇතුළත් වන අයුරින් පුදුකුඩිඉරිප්පුවල සිට කිලෝමීටර් 7ක් පමණ දුරින් තමන් "යුද මුක්ත කලාපයක්" පිහිටුවමින් සිටින බවට ආණ්ඩුව ඒ ආසන්න වේලාවක දී තොරතුරු මුදා හළේය.[55] කලාපය ප්‍රකාශයට පත් කරනු ලැබුණු විට, එල්ටීටීඊයේ බටහිර පෙරමුණ පැවතියේ කලාපයේ දකුණු සීමාවෙන් කිලෝමීටර් කිහිපයකට පමණක් නොවැඩි දුරකින් ඒ-35 මාර්ගයට සමාන්තරවය. එය ප්‍රකාශයට පත් කරන විට, බොහෝ සිවිල් වැසියන් ස්ථානගතව සිටි ඒ-35 මාර්ගය ආසන්නයේ නොව කලාපය තුළ ඔබ්බෙහි එල්ටීටීඊය සතුව කාලතුවක්කු බණ්ඩ තිබූ බව ද පුළුල් ලෙස දැන සිටි කරුණකි.[56] යුද මුක්ත කලාපය පිහිටා තිබුණේ ආරක්ෂක හමුදාවල කාලතුවක්කු පරාසය තුළ වන අතර, වවුනියාවට ඍජුව ප්‍රවේශ විය නොහැකි වන ආකාරයෙන් එය ඉඩම්වලින් කොටු වී

---

[55] ඇ. උපග්‍රන්ථය ලෙස සම්බන්ධ කර ඇති සිතියම, 2009 ජනවාරි 21 දා ආණ්ඩුව නිල වශයෙන් ප්‍රකාශයට පත් කළ මෙම වර්ග කිලෝමීටර් 35.5 යුද මුක්ත කලාපය පිහිටි ස්ථානය පෙන්නුම් කරයි. ඊට මන්ජල් පාලම් පාලමේ සිට බටහිරට සුදන්දිරපුරම් හන්දිය දක්වා දිවෙන ඒ-35 මාර්ගයේ කොටසක් මෙන් ම වල්ලිපුනම් රෝහල ද ඇතුළත් වූයේය. කලාපය මුලින් පිහිටුවනු ලැබුණු අවස්ථාවේ සිවිල් වැසියන් ඒකරාශි වී සිටියේ ඒ-35 මාර්ගය හා සුදන්දිරපුරම් හන්දියේ සිට උතුරට යන මාර්ගය අවටය. අවශේෂ ප්‍රදේශයෙන් බොහෝ කොටසක් කැළෑව වූ අතර, හරහා යාමට දුෂ්කර වූයේය.

[56] යුද මුක්ත කලාපය ප්‍රකාශයට පත් කළ පසු ඒ තුළට කාලතුවක්කු හා වෙනත් උපකරණ රැගෙන ඒම පිළිබඳව ආණ්ඩුව එල්ටීටීඊයට චෝදනා කළේය. "LTTE clamps on civilian outflow: Mounts artillery batteries inside No-fire zones – Mullaittivu," 2009 ජනවාරි 31, www.defence.lk/new.asp?fname=20090130_F01.



படிப்பகம்

තිබුණේය. හැකි ඉක්මනින් යුද මුක්ත කලාපය තුළට මාරු වන ලෙස ආණ්ඩුව සිවිල් ජනගහනයට පැවසුවේය.[57] ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර මෙසේ පැවසූ බව උපුටා දක්වනු ලැබුණි: "අපි ඒ ප්‍රදේශය තුළට වෙඩි තියන්නේ නැහැ."[58]

මෙම මුල් යුද මුක්ත කලාපය හා පසුව ගොඩ නගන ලද කලාප දෙක පිහිටුවනු ලැබුණේ ඒකපාර්ශ්වීයව ආණ්ඩුව විසිනි, එල්ටීටීඊය සමග එකඟතාවෙන් නොවේ.[59] ඒ අනුව, යුද මුක්ත කලාපය තුළ එල්ටීටීඊය සිටීම ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් නොවූයේය. කෙසේ වුව ද, ප්‍රහාරවල බලපෑමෙන් සිවිල් ජනගහනය ආරක්ෂා කිරීම සඳහා කල් තියා පියවර ගැනීමේ වගකීමක් ඔවුන්ට එවිටත් තිබුණි. අනෙක් අතට, යුද මුක්ත කලාප නම් කිරීමෙන් හා ඒවාට මාරු වීම සඳහා සිවිල් වැසියන් දිරි ගැන්වීමෙන්, ආණ්ඩුව සිවිල් ජනගහනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අධිකත්වයට පමුණුවන ලද වගකීමක් ආරෝපණය කර ගත්තේය.

අවසානයේ ආරක්ෂක හමුදා ජනවාරි 21 දා එකොළොස් වන ආරක්ෂිත වාහන කණ්ඩායමට වවුනියාවට ආපසු යාමට අවසර දුන්නේය. එල්ටීටීඊය - තුවක්කු පෙන්වා නතර කරමින් - එක්සත් ජාතීන්ගේ ජාතික කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට ආරක්ෂිත වාහන කණ්ඩායම සමග නික්ම යාමට ඉඩ දීම ප්‍රතික්ෂේප කිරීම නිසා, ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු සමග එක් සැහැල්ලු වාහනයක් හා ලොරි හතක් නතර වූයේය. නගරයට හා ඒ වටා පිහිටි එල්ටීටීඊ ප්‍රහාරක ස්ථානවලට ප්‍රහාරයක් දියත් කිරීමට අදහස් කරමින් සිටින නිසා පුදුකුඩිඉරිප්පු හැර යන ලෙස, වන්නි ආරක්ෂක හමුදා මූලස්ථානය එක්සත් ජාතීන්ට දැනුම් දුන්නේය. වන්නි ආරක්ෂක හමුදා මූලස්ථානය, යුද මුක්ත කලාපයට නැවත මාරු වීමට එක්සත් ජාතීන් යොමු කළේය.

---

[57] ගුවන් විදුලිය තුළින් සහ පළාත් ආණ්ඩුවේ නිලධාරීන් විසින් පුදුකුඩිඉරිප්පු තුළ බෙදා හරින ලද හා ගුවන් හමුදාව විසින් ගුවනින් හෙළන ලද පත්‍රිකා හරහා ඇතුළු බොහෝ ආකාරවලින් මෙය සන්නිවේදනය කරනු ලැබුණේය.

[58] "250,000 Tamil civilians urged to flee to safety," Associated Press (ඇසෝසියේටඩ් ප්‍රෙස්), 2009 ජනවාරි 22.

[59] එම නිසා, ඔවුන්ගේ තත්ත්වය පාලනය කරනු ලැබුණේ, උදාහරණයක් ලෙස, හතර වන ජිනීවා සම්මුතියේ 14 වන වගන්තිය තුළ සපයා ඇති ආකාරයට ජාත්‍යන්තර නීතිය යටතේ පාර්ශ්වයන්ගේ එකඟතාවෙන් නොවේ.



படிப்பகம்

ජනවාරි 22දා යුද මුක්ත කලාපය සමාලෝචනය කිරීමෙන් සහ ආරක්ෂක හමුදා හා එල්ටීටීඊය සමග පිටත් වීමේ වේලාවක් සාකච්ඡා කර ගැනීමෙන් පසුව, එක්සත් ජාතීන් ජනවාරි 23 දා සිය කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ යැපෙන්නන් සහ සැපයුම් ඒ වෙත ගෙන ගියෝ ය.[60] සුදන්දිරපුරම් හන්දියට උතුරින් පිහිටි, පළාත් පාලන නිලධාරීන් විසින් අධීක්ෂණය කරනු ලබන ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස යොදා ගැනීමට නියමිතව තිබූ විවෘත ක්‍රීඩා පිටියකට ඔවුහු මාරු වූවෝය.[61] බොහෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල ජාතික කාර්ය මණ්ඩල ද එහි නතර වී සිටියෝය. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙක් පුදුකුඩිඉරිප්පුවලින් ඉවත් වී සුදන්දිරපුරම් හන්දියට ගිනිකොණ දෙසින් නතර වූවෝය. සිවිල් වැසියෝ ඒ-35 මාර්ගය ඔස්සේ යුද මුක්ත කලාපය තුළට කැටි වෙමින් සිටියෝය. දහස් ගණනක් ජනයා ආහාර හා වාසස්ථාන ඉල්ලමින් බෙදා හැරීම් මධ්‍යස්ථානයට සමීප හාත්පස සිටියෝය. මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානා අහසෙහි දුටු බව එහි සිටි පුද්ගලයන් වාර්තා කළ අතර, ඊට පෙර දිනය තුළ දී වල්ලිපුනම් රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කොට තිබුණේය.

ළඟා වූ විගස ම එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය තමන් හා තම යැපෙන්නන් සඳහා බංකර ගොඩ නැගීමට පටන් ගත් අතර, අඩවියේ වට ප්‍රමාණය පිළිබඳ ජීපීඑස් මිනුමක් කොට මීටර් 200ක ආරක්ෂක අවරෝධක කලාපයක් (buffer zone) වෙන් කළෝය. ඒ අපර භාගයේ, කොළඹ පිහිටි ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානය හා වවුනියාවෙහි පිහිටි වන්නි ආරක්ෂක හමුදා මූලස්ථානය සහ එල්ටීටීඊය වෙත සම්බන්ධීකාරක (coordinates) සන්නිවේදනය කරනු ලැබුණි. විශාල සුදු ලොරි හතක් හා එක්සත් ජාතීන්ගේ ධජයක් ඔවුන් එහි සිටින බව තහවුරු කළේය.

---

[60] එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට හා යැපෙන්නන්ට ආරක්ෂක නියාමකයන් හා වෙනත් අය එකතු වීමෙන් කණ්ඩායම 130 ඉක්මවා ගියේය. ඉතිරි වී තිබූ වාහන අට තුළ ගමන් කළ ඔවුහු, ගොඩනැගිලි කොටස්, බංකර ගොඩ නැගීමට අවශ්‍ය ද්‍රව්‍ය, සන්නිවේදන උපකරණ, ඇතැම් වෛද්‍ය සැපයුම්, ආහාර හා ඉන්ධන ප්‍රවාහනය කළෝය. පුදුකුඩිඉරිප්පුවල පිහිටි ලෝක ආහාර වැඩසටහනේ ගබඩා ගොඩනැගිලි තුළ තිබූ ආහාරවලින් වැඩි කොටස යුද මුක්ත කලාපයට මාරු කරනු ලබන්නට පෙර කොල්ල කනු ලැබුණේය.

[61]එම නිලධාරීහු විවිධ උපකරණ සමඟ ආහාර මෙට්‍රික් ටොන් 100කට ආසන්න ප්‍රමාණයක් මධ්‍යස්ථානය වෙත රැගෙන ආවෝය.



படிப்பகம்

www.padippakam.com

සපයන ලද ජීපීඑස් සම්බන්ධීකාරක තුළ හෝ ඒවා ආසන්නයේ එල්ටීටීඊ ප්‍රහාරක ස්ථාන නොතිබුණේය. බෙදා හැරීම් මධ්‍යස්ථානය ආසන්නයේ ඉන් පිටත රයිෆල්වලින් සන්නද්ධ වූ සාමාජිකයන් හතර දෙනෙකුගේ කුඩා කඳවුරක් තිබූ අතර, එක් *කොටි හඬ* ගුවන් විදුලි අනුපොළකට රැකවරණ සපයා තිබුණේ අඩවියේ කෙළවර පිහිටි නාවික බහාලුමක් තුළය. මධ්‍යස්ථානයේ සිට මීටර් 500ක් ඇතුළත එල්ටීටීඊ තුවක්කු ප්‍රහාරක ස්ථාන කිහිපයක් පැවතුණේය. කෙසේ වුව ද, සාමාජිකයන්ගෙන් අතිවිශාල බහුතරය ස්ථානගත කර තිබුණේ යුද පෙරමුණුවලය - ආරක්ෂක හමුදා හා යුද මුක්ත කලාප අතරය; ඔවුන්ගේ කාලතුවක්කුවලින් බොහෝ ඒවා ස්ථානගත කර තිබුණේ යුද මුක්ත කලාපය තුළ වඩා ඔබ්බෙහි හෝ වෙල්ලාමුලිවයික්කාල් වෙරළ තීරයේය. ඇත්ත වශයෙන් ම, ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ම ජනවාරි 31 දා පෙන්වා දුන්නේ, "තාක්ෂණික හා බුද්ධි අංශ මූලාශ්‍රවලින් ලැබුණු නිවැරදි තොරතුරුවලින් සලකුණු කර ගත්" එල්ටීටීඊ කාලතුවක්කු ප්‍රහාරක ස්ථාන පිහිටා තිබුණේ යුද මුක්ත කලාපය තුළ ඔබ්බෙහි සහ ඒ-35 මාර්ගයට හා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානයට ඈතින් බවය.[62] එක්සත් ජාතීන් තමන් සිටි ස්ථානයේ උතුරු වට ප්‍රමාණය සලකුණු කරමින් සිටිය දී, යුද පෙරමුණු දෙසට කෙටි දුරක් මෙහායින් යුද මුක්ත කලාපයෙන් පිටතට එල්ටීටීඊ වෙඩි ප්‍රහාරයක් සිදු වූයේය.

ඒ ආසන්න වේලාවක දී හෝ පසුව ඒ-35 මාර්ගය ආසන්නයට පහර දෙමින් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා යුද මුක්ත කලාපය තුළට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේය. බොහෝ සිවිල් වැසියෝ ඝාතනයට හා තුවාල වීමට ලක් වූවෝය. එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය හා අනෙක් අය ආණ්ඩුව හා ආරක්ෂක හමුදා අමතා බෝම්බ හෙළීම නතර කරන ලෙස ඉල්ලා සිටියෝය. බෙදා හැරීමේ මධ්‍යස්ථානය තුළින් නොව, නමුත් යුද මුක්ත කලාපය තුළින් පිටතට කඩින් කඩ වෙඩි ප්‍රහාර එල්ල වූයේය.

ජනවාරි 24 දා පෙ.ව. 3.00ට පමණ, බෙදා හැරීමේ මධ්‍යස්ථානය තුළට සහ ඒ හාත්පසට ආරක්ෂක හමුදා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේය. එක් ෂෙල් වෙඩිල්ලක් පතිත වූයේ, එක්සත් ජාතීන්ගේ බංකරයට මීටර් 5ත් මීටර් 8ත් අතර දුරකින්, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ වාසස්ථාන කිහිපයක් මැදටය. මෙම ප්‍රහාරයේ දී අඩු ගණනේ සිවිල් වැසියන් එකොළොස් දෙනෙකු ඝාතනයට ලක් වූ අතර, කාන්තාවන් හා ළමයින්

---

[62] "LTTE clamps on civilian outflow: Mounts artillery batteries inside No-fire zones – Mullaittivu," MOD news (එම්ඕඩී නිවුස්), 2009 ජනවාරි 31, www.defence.lk/new.asp?fname=20090130_F01.



படிப்பகம்

ඇතුළුව වැඩි දෙනෙක් තුවාල ලැබුවෝය. ලෝක ආහාර වැඩ සටහනේ රියැදුරෙකුගේ හිස පසුපස තුළට උණ්ඩ කැබලි වැදුණි. තරුණ කාන්තාවකගේ හිස සුන් දේහය එක්සත් ජාතීන්ගේ බංකරය ඉදිරිපිට පතිත වූයේය. ෂෙල් වෙඩිල්ලේ කැබලිවලින් එක්සත් ජාතීන්ගේ වාහනයකට හානි සිදු වූ අතර, පිපිරීම නිසා වීසි වූ මස් කැබලිවලින් හා වෙනත් සුන්බුන්වලින් එය වැසී ගියේය. එක්සත් ජාතීන්ගේ බංකරවලට ද හානි සිදු විය. එක් අවස්ථාවක දී, එක්සත් ජාතීන්ගේ වාහනයක් තුළ ආරක්ෂාව සලසා ගෙන සිටිය දී, එහි කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ පවුලේ සාමාජිකයෙකුගේ හිස තුළට උණ්ඩ කැබලි වැදුණි. කෙයාර්(CARE) නමැති රාජ්‍ය නොවන සංවිධානයෙන් පරිත්‍යාග කර තිබූ පළාත් ආණ්ඩුවේ නිලධාරීන්ගේ වාහන ද විනාශ වූයේය. ෂෙල් වෙඩි ප්‍රහාර, මධ්‍යස්ථානය තුළ ආරක්ෂාව සෙවූ සිවිල් වැසියන් අතර භීතිය ඉපදවූයේය.

වෙඩි තැබීම නතර කරන ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හා ආරක්ෂක හමුදාවලින් ඉල්ලා සිටිමින් නැවත වතාවක් වහා ම පණිවුඩ කිහිපයක් යවනු ලැබුණේය. තානාපති කාර්යාලයන්හි ප්‍රධානීන් වෙත ද ඉල්ලීම් ඉදිරිපත් කෙරුණු අතර, ඔවුහු සිය සලකා බැලීම් ආණ්ඩුව වෙත යොමු කළෝය. වෙඩි තැබීම නිකුත් වූයේ ආරක්ෂක හමුදාවන්හි ස්ථානයෙන් වුවත් ආරක්ෂක හමුදාවල ප්‍රතිචාරය වූයේ වෙඩි තැබීම පිළිබඳව එල්ටීටීඊයට දෝෂාරෝපණය කිරීමය. අවසානයේ දී, එක්සත් ජාතීන්ගේ ස්ථානය ආසන්න වටපිටාවට එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාර නතර වූයේය. යුද මුක්ත කලාපය තුළ සිටි එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය ජනරාල් ජයසූරියට ඍජුව පණිවුඩ යැව්වේය.

ජනවාරි 24 දා ඉතිරි කොටසේ දී, දකුණු හා ගිනිකොණ ස්ථානවල සිට ආරක්ෂක හමුදා නොකඩවා යුද මුක්ත කලාපයට බරපතළ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේය. අවස්ථා කිහිපයක දී, ආහාර ලබා ගැනීම සඳහා පෝලිම් ගැසී සිටි ජනයා ඝාතනයට හා තුවාලවලට ලක් කරමින් බෙදා හැරීම් මධ්‍යස්ථානය තුළ ෂෙල් වෙඩි පතිත වූයේය. සිවිල් වැසියන් සන්ත්‍රාසයට පත් වූ අතර, බොහෝ අය මධ්‍යස්ථානයෙන් පලා ගොස් උතුරට ගමන් කළෝය. එක්සත් ජාතීන් හා අනෙකුත් අය, යුද මුක්ත කලාපය තුළට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම නතර කරන ලෙස ඉල්ලා සිටීම සඳහා නොකඩවා ආණ්ඩුව හා ආරක්ෂක හමුදා ඇමතුවේය. සිවිල් වැසියන් ඒකරාශි වී සිටීම නිසා, හානි වූවන්ගේ සංඛ්‍යාව බෙහෙවින් ඉහළ ගියේය. මල්ටි බැරල් රොකට් විදිනවලින් (Multi-barrelled Rocket Launchers - MBRLs) එල්ල කරන ලද ෂෙල් වෙඩි ද යුද මුක්ත

කලාපය තුළට පතිත වූයේය.[63] එක්සත් ජාතීන්ගේ අඩවියේ සිට මීටර් 500ත් කිලෝමීටර් 2ත් අතර දුරක පිහිටි ස්ථානවල සිට එල්ටීටීඊය යුද පෙරමුණු දෙසට වෙඩි තැබුවේය. වක්‍ර හෝ ආරුක්කු වෙඩි සඳහා ඔවුන්ගේ කාලතුවක්කු සතු අවම පරාසය යටත් පිරිසෙයින් කිලෝමීටර් 5කි.[64]

තම කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා යැපෙන්නන්ට යුද මුක්ත කලාපයෙන් නික්ම පුදුකුඩිඉරිප්පු වෙත ආපසු යාමට ඉඩ සලසා දීම සඳහා එක්සත් ජාතීන් ආණ්ඩුව හා එල්ටීටීඊය සමග සාකච්ඡා කළේය. ජනවාරි 25 දා පෙ.ව. 11.30ට පමණ ෂෙල් වෙඩි ප්‍රහාර නැවතුණු අතර, එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය පිටත් වී, කෙටි වේලාවකින් පුදුකුඩිඉරිප්පු වෙත ළඟා වූයේය. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ජාත්‍යන්තර හා ජාතික කාර්ය මණ්ඩලය සහ පළාත් පාලන නිලධාරීහු ද යුද මුක්ත කලාපය හැර දමා ඒ වේලාවේ දී ම වාගේ පුදුකුඩිඉරිප්පු වෙත ආපසු ගියෝ ය. ඒ-35 මාර්ගය දිගට මිය ගිය හා තුවාල ලද සිවිල් වැසියෝ බොහෝ සංඛ්‍යාවක් සිටියෝය, විනාශ වූ පාපැදි හා යතුරු පැදි බොහෝ සංඛ්‍යාවක් තිබුණේය, මිය ගිය සත්තු විශාල ප්‍රමාණයක් සිටියෝය. පුදුකුඩිඉරිප්පු හන්දියේ එල්ටීටීඊ සටන්කරුවෝ සිටියෝය.

පුදුකුඩිඉරිප්පු රෝහල තුවාල ලැබූ හා මිය යමින් සිටි සිවිල් වැසියන්ගෙන් පිරී තිබුණ ද ෂෙල් වෙඩි ප්‍රහාරවලින් පුදුකුඩිඉරිප්පුවලට සිදු වී තිබුණේ සංසන්දනාත්මකව අඩු හානියකි. බොහෝ අය පැමිණ තිබුණේ උදයාර්කඩ්ඩු, වල්ලිපුනම්, කයිවේලි හා සුදන්දිරපුරම් අවට ප්‍රදේශවලින්ය - බොහෝ අය යුද මුක්ත කලාප තුළින්ය. ඊළඟ දින කිහිපයේ දී එම ප්‍රදේශවලින් ම තවත් අය පැමිණියෝය. ජනවාරි 25 දා එක්සත්

[63] මෙම ආයුධවලින් එක විට රොකට් විශාල සංඛ්‍යාවක් විදින ලද අතර, ඒවා සැලසුම් කර තිබෙන්නේ ඉලක්ක කර ගත් ප්‍රදේශය තුළ පවතින ඕනෑ ම දෙයක් සම්පූර්ණයෙන් ම විනාශ කිරීම සඳහාය. ආරක්ෂක හමුදාවන්හි මල්ටි බැරල් රොකට් විදිනවලට කිලෝමීටර් 5ක පමණ අවම පරාසයක් තුළ එක විට රොකට් හෝ ෂෙල් වෙඩි 40ක් දක්වා විදීමේ හැකියාව ඇත්තේය. එල්ටීටීඊය සතුව ද මල්ටි බැරල් රොකට් විදින කිහිපයක් තිබූ බවට විශ්වාස කෙරෙන නමුත්, ඒවාට විදිය හැකි වූයේ රොකට් හයක් හෝ නවයක් පමණක්ය.

[64] සටනේ අවසන් මාස පහ තුළ දී, දෙපාර්ශ්වයේ ම කාලතුවක්කු ඛණ්ඩවල අවම පරාසය යටත් පිරිසෙයින් කිලෝමීටර් කිහිපයක් වූයේය. ඒ අනුව සිවිල් වැසියන්ට එල්ල කරන ඕනෑ ම ෂෙල් වෙඩි ප්‍රහාරයක් යම් දුරක සිට හට ගැන්වීමට සිදු වූයේය. කැනිස්ටර් උණ්ඩවලින් ආසන්න පරාසයක් තුළ වෙඩි තැබීම සඳහා කාලතුවක්කු ඛණ්ඩ තිරස් අතට පහත් කළ හැකි නමුත්, එක් පාර්ශ්වයකින් හෝ මෙවැනි ආකාරයේ වෙඩි තැබීම් සිදු වූ බවට කිසි ම චෝදනාවක් එල්ල වී නොමැත්තේය.



படிப்பகம்

www.padippakam.com

ජාතීන්ගේ කාර්ය මණ්ඩලය පැමිණි පසු, එදා රාත්‍රියෙහි පුදුකුඩිඉරිප්පු තුළට ෂෙල් වෙඩි ප්‍රහාර කිසිවක් එල්ල නොවූයේය.

2009 ජනවාරි 26 දා, මිලිටරි ප්‍රකාශක උදය නානායක්කාර මෙලෙස පැවසූ බව උපුටා දක්වා තිබුණි: "අපි මේ ආරක්ෂිත කලාපය ඉලක්ක කර ගන්නේ නැහැ. ... [එල්ටීටීඊය] තමන්ගේ ආයුධ ආරක්ෂිත කලාපයට ගෙන ගිහින් ආරක්ෂිත කලාපය තුළ සිට වෙඩි තැබුවත් අපි ඔවුන් සමග සටන් කළේ නැහැ."[65] ආණ්ඩුවේ කාලතුවක්කු ප්‍රහාරයක් එක්සත් ජාතීන්ගේ අංගනයකට වැදී ඇති බව ඔහු ප්‍රතික්ෂේප කළේ යැයි ජනවාරි 27 දා වාර්තා කළ *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත, එල්ටීටීඊය සහන හා රෝහල් කාර්ය මණ්ඩලයට අසත්‍ය ප්‍රකාශ කිරීමට බල කළ බව නැතහොත් කැරලිකරුවන් ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කර ඇති බව ප්‍රකාශ කළේය.[66]ජනවාරි 28 දා, ඔහු මෙලෙස පැවසූ බව වාර්තා විය: "කිසි ම සිවිල් වැසියෙක් ඝාතනයට ලක් වෙලා නැහැ... අප ඉලක්ක කර ගනිමින් සිටින්නේ එල්ටීටීඊය. අපි කිසි ම සිවිල් වැසියෙක් ඉලක්ක කර ගන්නේ නැති නිසා, කිසි ම සිවිල් වැසියෙක් මැරෙන්න විදියක් නැහැ."[67]

යුද මුක්ත කලාපය තුළ සිටි සිවිල් වැසියන්ට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම හා සිවිල් වැසියන්ට සිදු වූ හානි පිළිබඳව, එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය ජනවාරි මස අග දී නැවතත් ජනරාල් ජයසූරිය වෙත දැනුම් දුන්නේය. ආරක්ෂක හමුදා ඔවුන්ට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල නොකළේය යන ස්ථාවරයෙහි ඔහු තරයේ පිහිටා සිටියේය.

ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව තුළ සිටින පුද්ගලයන් යුද අපරාධ සිදු කළ බව, විශේෂයෙන් ම සිවිල් වැසියන්ට එරෙහිව හිතාමතා ප්‍රහාර එල්ල කිරීම (පහත III කොටස ඇ. තුළ සාකච්ඡා කරනු ලැබේ) සහ "එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුව මානුෂීය සහාය සැපයීමේ මෙහෙයකට සම්බන්ධ වී සිටි කාර්ය මණ්ඩලයට,

---

[65] "UN: Trapped civilians in Sri Lanka war a 'crisis'," Associated Press (ඇසෝසියේටඩ් ප්‍රෙස්), 2009 ජනවාරි 26.

[66] "U.N. staff and hospital come under shelling as Sri Lanka fights cornered rebels," *The New York Times* (ද නිව් යෝක් ටයිම්ස්), 2009 ජනවාරි 27.

[67] "Sri Lanka UN staff come under fire while in 'safe zone'," Associated Press (ඇසෝසියේටඩ් ප්‍රෙස්), 2009 ජනවාරි 28.



படிப்பகம்

ස්ථානවලට, ද්‍රව්‍යවලට, ඒකකවලට හෝ වාහනවලට හිතාමතා ප්‍රහාර එල්ල කිරීම"[68] කළ බව, විශ්වාස කිරීමට ඉහත සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සම්පාදනය වේ. එවැනි පුද්ගලයන් මෙන් ම චූදිත අපරාධවලට අණ කළ හෝ සහාය දුන් අනෙක් අය නොහොත් මිලිටරි හෝ සිවිල් ප්‍රධානීන් ලෙස වගකිව යුතු අය[69] සාපරාධී ලෙස

[68] රෝම ව්‍යවස්ථාවේ 8 වගන්තිය (2)(e)(iii) සම්පූර්ණයෙන් සපයනු ලැබේ: "මානුෂීය සහාය සැපයීමකට හෝ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූල සාමසාධක මෙහෙයකට සම්බන්ධ කාර්ය මණ්ඩලයට, ස්ථානවලට, ද්‍රව්‍යවලට, ඒකකවලට හෝ වාහනවලට එරෙහිව හිතාමතා ප්‍රහාර එල්ල කරන්නේ යම් තාක් දුරට ද, සන්නද්ධ ගැටුම් පිළිබඳ ජාත්‍යන්තර නීතිය යටතේ සිවිල් වැසියන්ට හෝ සිවිල් ඉලක්කවලට ලැබෙන ආරක්ෂාවට ඔවුහු සහ ඒවා හිමිකම් කියන්නෝය." පහත විදහා දැක්වෙන මූලයන් උපුටා ගනු ලබන්නේ රෝම ව්‍යවස්ථාවේ අපරාධ මූලයන් තුළ සඳහන් වන අදාළ වගන්තියෙන්ය. මෙහි දී, පොදුවේ සියලු නීති විරෝධී ප්‍රහාරමය අපරාධ සාකච්ඡාවට ලක් වේ: "මෙම වරදකාරිත්වය තනි තනි සිවිල් වැසියන්ට එරෙහි ප්‍රහාරවලට පමණක් සීමා වන්නක් නොවන්නේය. යම් විශේෂ මිලිටරි ඉලක්කයකට හෝ සටන්කරුවන්ට එරෙහිව එල්ල නොකෙරෙන ප්‍රහාර හෝ අහඹු ආයුධ යොදා ගන්නා ප්‍රහාර, හෝ සිවිල් ජනගහනය හෝ තනි තනි සිවිල් වැසියන් ඉලක්ක වීම වැළැක්වීමට අවශ්‍ය පූර්ව පියවරයන් ගැනීමෙන් තොරව සිදු වන ප්‍රහාර, විශේෂයෙන් ම ප්‍රහාර එල්ල කළ යුතු ඉලක්ක හෝ පුද්ගලයන් පිළිබඳව *නිශ්චිත තොරතුරු සොයා ගැනීමට අසමත් වීම*, එය අනිවාර්යයෙන් ම අඩංගු කර ගන්නේය. අවශ්‍ය කරන *සාවද්‍ය චේතනාව* අඟවනු ලබන්නේ ප්‍රහාරයට පෙර හා ප්‍රහාරය තුළ දී ... අවශ්‍ය පූර්ව පියවරයන් ... නොගනු ලැබුණේය ... යන කරුණෙන් විය හැකිය." Knut Dörmann, *Elements of War Crimes under the Rome Statute of the International Criminal Court: Sources and Commentary* (ICRC and Cambridge University Press(2003), 131-132, 445 පිටු (අවධාරණය මුල් ලිපියෙන්ය). 'යුද ප්‍රතිපාක්ෂිකයකුගේ පාලනය යටතේ පසුවන සිවිල් ජනතාවකට ප්‍රහාර එල්ල කිරීමද සම්පූර්ණයෙන්ම තහනම් කොට ඇත. බලන්න 140-144, 145 පිටු'

[69] රෝම ව්‍යවස්ථාව, අපරාධයක් සිදු කරන ඕනෑ ම කෙනෙකු සම්බන්ධයෙන් පුද්ගල අපරාධ වගකීම නියම කරන්නේය; එය ඉටු කිරීමට අණ කරන්නේය, ඉල්ලා සිටින්නේය හෝ පොලඹවන්නේය; එය ඉටු කිරීමේ දී ආධාර, අනුබල නැතහොත් සහාය දෙන්නේය; නැතහොත්, කණ්ඩායමේ අපරාධ ක්‍රියාව හෝ අපරාධ අරමුණ හෝ අපරාධය සිදු කිරීම සඳහා කණ්ඩායමට තිබූ අභිප්‍රාය පිළිබඳ අවබෝධය දියුණු කිරීමේ ඉලක්කය ඇතිව, පොදු අරමුණකින් ක්‍රියා කරන පුද්ගලයන් කණ්ඩායමක් විසින් එය ඉටු කරනු ලැබීමට දායක වන්නේය. 25 වගන්තිය. අණ දීමේ වගකීම පිළිබඳ මූලධර්මය යටතේ, තම ක්‍රියාකාරී ආඥාව නොහොත් අධිකාරය හා පාලනය යටතේ සිටින බලකායන් හෝ යටත් නිලධාරීන් විසින් සිදු කරන ලද අපරාධ සම්බන්ධ වගකීම, පාලනය නිසි ලෙස පවත්වා ගෙන යාමට අසමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස මිලිටරි ආඥාපතිවරුන්ට හා ඉහළ පෙළේ සිවිල් ප්‍රධානීන්ට පැවරිය හැකිය. 28 වගන්තිය. මිලිටරි ආඥාපතිවරුන් සම්බන්ධයෙන් මෙය ඉල්ලා සිටින්නේ, "එවක පැවති තත්ත්වයන් දැන සිටි හෝ එවක පැවති තත්ත්වයන් නිසා" පුද්ගලයා "බලකායන් එවැනි අපරාධ සිදු කරමින් සිටින බව හෝ කිරීමට සැරසෙමින් සිටින බව දැන සිටිය යුතු" අතර, අපරාධ

වගකීම දරනවා විය හැකිය. මෙම අපරාධයේ මූලයන් හා අදාළ සාක්ෂි පිළිබඳ සාරාංශය පහත ආකාරයේ වේ:

- **අපරාධකාරයා ප්‍රහාරයක් එල්ල කළේය.** ආරක්ෂක හමුදා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානයට හා ඒ තුළ තිබූ එක්සත් ජාතීන්ගේ අඩවියට නැවත නැවතත් ආයුධවලින් දමා ගැසූ බව සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ පෙන්වයි. ජනවාරි 24 දා පාන්දර සිදු වූ තදබල ෂෙල් වෙඩි ප්‍රහාරවලින් පසුව වෙඩි තැබීම නතර වීම සහ වෙඩි තැබීම නතර කරන ලෙස ඉල්ලමින් ආණ්ඩුවට හා ආරක්ෂක හමුදාවලට දුන් නානාවිධ ඇමතුම් පෙන්වන්නේ, ඒවා තම ප්‍රහාරවල නිරන්තරතාව හා ප්‍රහාරවල දිසාව පාලනය කර ගෙන තිබූ බවය. යුද මුක්ත කලාපය තුළ තිබූ එල්ටීටීඊ ප්‍රහාරක ස්ථාන මධ්‍යස්ථානය තුළට ආරුක්කු කාලතුවක්කු ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නොහැකි තරමට ඊට ඉතා සමීපව පිහිටි අතර, තමන්ගේ ම සටන්කරුවන්ට වෙඩි තැබීමට හෝ එක්සත් ජාතීන් හා විශේෂයෙන් ම ජාත්‍යන්තර කාර්ය මණ්ඩල ඉවත් වී යාමට සැලැස්වීමට සාමාන්‍යයෙන් එල්ටීටීඊයට හේතුවක් නොතිබුණේය.

- **ප්‍රහාරයේ ඉලක්කය වූයේ මානුෂීය සහාය සැපයීමේ මෙහෙයකට සම්බන්ධ කාර්ය මණ්ඩලය, ස්ථාන, ද්‍රව්‍ය, ඒකක හෝ වාහන ය.** එක්සත් ජාතීන්ගේ මෙහෙයුමේ හා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානයේ මානුෂීය ස්වභාවය මැනවින් තහවුරු කොට තිබුණේය. ප්‍රදේශය තුළට රැගෙන ගිය එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය හා සැපයුම් ආරක්ෂක අමාත්‍යාංශයෙන් හා වන්නි ආරක්ෂක හමුදා මූලස්ථානයෙන් අනුමත කොට තිබූ අතර, ආරක්ෂක හමුදා විසින් සෝදිසි කරනු ලැබ තිබුණි. ආහාර බෙදා හැරීම සම්බන්ධීකරණය කෙරෙමින් තිබුණේ ආණ්ඩුවේ නියෝජිතයා විසින්ය. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල

---

වැළැක්වීමට හෝ මර්දනය කිරීමට හෝ පරීක්ෂා කිරීමට හා ඒවා සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කිරීමට

"අවශ්‍ය සියලු හා යුක්ති සහගත පියවරයන් ගැනීමට අසමත් වී" සිටිය යුතු බවය; ඉහළ පෙළේ සිවිල් ප්‍රධානීන් සම්බන්ධ ප්‍රමිතියෙන් ඉල්ලා සිටින්නේ, පුද්ගලයා "තමන් යටතේ සිටින නිලධාරීන්" අපරාධ "සිදු කරමින් සිටින බව හෝ කිරීමට සැරසෙමින් සිටින බව පැහැදිලිව ඇඟවෙන තොරතුරු දැන සිටි හෝ දැනුවත්ව නොතකා හැරි" අතර, පුද්ගලයා ඒවා වැළැක්වීමට හෝ මර්දනය කිරීමට හෝ පරීක්ෂා කිරීමට "අවශ්‍ය සියලු හා යුක්ති සහගත පියවරයන් ගැනීමට අසමත් වී" සිටිය යුතු බවය. 28වන වගන්තිය බොහෝ අපරාධ අධිකරණ යොදා ගන්නේ සමාන ආකාරයේ වගකීම්ය.

www.padippakam.com

වූයේ, බංකර තුළ ආරක්ෂාව සලසා ගෙන සිටි එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් මීටර් කිහිපයක් ඔබ්බට වන අතර, අඩු ගණනේ එක්සත් ජාතීන්ට සම්බන්ධ පුද්ගලයන් දෙදෙනෙකුට තුවාල සිදු වී යටත් පිරිසෙයින් එක්සත් ජාතීන්ගේ එක් වාහනයකට හානි සිදු වූයේය. ආහාර, වාසස්ථාන හෝ සහාය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් මධ්‍යස්ථානය තුළ සිටි බොහෝ සිවිල් වැසියන් ඝාතනයට ලක් වූ අතර, ද්‍රව්‍ය විනාශ වූයේය.

- **ප්‍රහාරයේ ඉලක්කය විය යුත්තේ එවැනි කාර්ය මණ්ඩලය, ස්ථාන, ද්‍රව්‍ය, ඒකක හෝ වාහන බව අපරාධකාරයා අදහස් කළේය.** ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානය සහ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය, වාහන හා ද්‍රව්‍ය පිහිටි ස්ථානය පිළිබඳව ආණ්ඩුවේ හා මිලිටරියේ නිලධාරීන් ගණනාවක් සතුව විස්තරාත්මක දැනුමක් තිබුණේය. වන්නි ආරක්ෂක හමුදා මූලස්ථානය පුදුකුඩිඉරිප්පුවලින් ඉවත් වී යුද මුක්ත කලාපය තුළට යාමට ඔවුන් යොමු කර තිබුණේය. එක්සත් ජාතීන් තමන් සිටින නිශ්චිත ස්ථානය පිළිබඳව ජීපීඑස් දත්ත සපයා තිබූ අතර, මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානයට ඉහළ අහසෙහි පියාසර කරමින් තිබෙනු සාක්ෂිකරුවෝ දුටුවෝය.[70] යුද මුක්ත කලාපය වෙත යන ලෙසට ආරක්ෂක හමුදා දුන් උපදෙස් පිළිපැදි එක්සත් ජාතීන් වෙත, සිවිල් වැසියන් වෙත හෝ ආණ්ඩුවේ නියෝජිතයන් වෙත, එම ප්‍රදේශයට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල විය හැකි බවට කිසිදු අනතුරු ඇඟවීමක් කරනු නොලැබුණේය. ෂෙල් වෙඩි ප්‍රහාර ඇරඹුණු පසුව, මධ්‍යස්ථානය හා එක්සත් ජාතීන්ගේ අඩවිය පිහිටි ස්ථානය

[70] මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානා පුළුල් ලෙස යොදා ගත යුතු බවට ආරක්ෂක ලේකම් රාජපක්ෂ අවධාරණය කර ඇත: "අපි සියලු ආඥාපතිවරුන්ට මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානා සමග ඍජුව සම්බන්ධ වෙන්න අවස්ථාව ලබා දුන්නා. එම නිසා, සියලු හමුදාංකවල ආඥාපතිවරුන්ට තමන් ඉදිරියේ, එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශ තුළ සිද්ධ වෙමින් තියෙන දේ දැක ගන්න පුළුවන් උනා. මානුෂීය මෙහෙයුම් මුළුල්ලේ ම අපි මෙම පහසුකම යුද හමුදා ආඥාපතිවරුන්ට ලබා දුන්නා. එම නිසා, මෙහෙයුම් සැලසුම් කරද්දී හා ඒවා ක්‍රියාත්මක කරද්දී ඉදිරියේ සිදු වන දේ දකින්න, සතුරා ඒකරාශි වී සිටින ස්ථාන පිහිටා තිබෙන්නේ කොතැන ද යන වග දකින්න, වෙඩි නිකුත් වන්නේ කොතැනක සිට ද යන වග දකින්න හා ස්ථානගත කර ගන්න, ඒවාට ඉලක්ක නොවී ඒ අනුව ක්‍රියා කරන්න යුද හමුදා ආඥාපතිවරුන්ට ඒක බොහොම උදව් වුණා." "Defence Secretary Gotabaya Rajapaksa salutes the war heroes," *Business Today* (බිස්නස් ටුඩේ), කලින් සඳහන් කර ඇත.



படிப்பகம்

පිළිබඳව හා ඊට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වෙමින් පවතින බව පිළිබඳව ආණ්ඩුව හා ආරක්ෂක හමුදා වෙත තව දුර තහවුරු කිරීමක් ලැබුණේය. ෂෙල් වෙඩි ප්‍රහාර අඛණ්ඩව සිදු වී ගෙන යද්දී ස්ථානය පිළිබඳව ආණ්ඩුව වෙත නැවතත් දැනුම් දෙනු ලැබුණේය. එල්ටීටීඊයේ වෙඩි ප්‍රහාර නිකුත් වූයේ විටින් විට වන අතර, ඒවා නිකුත් වූයේ මධ්‍යස්ථානය ඇතුළතින් නොවේ. එල්ටීටීඊයේ යුද පෙරමුණු හා සාමාජිකයන්ගෙන් අතිවිශාල බහුතරය සිටියේ යුද මුක්ත කලාපයෙන් පිටතය. යුද මුක්ත කලාපය තුළට හා හාත්පසට එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාරවලින් සිවිල් වැසියන්ට සැලකිය යුතු හානි හා පීඩාවන් සිදු වූ අතර, එම කාල සීමාව තුළ ම - එක්සත් ජාතීන්ට හා සිවිල් වැසියන්ට ඉවත් වන ලෙස ආරක්ෂක හමුදා පවසා තිබූ - පුදුකුඩිඉරිප්පු තුළට එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාරවල තීව්‍රතාව සැලකිය යුතු මට්ටමකින් ඊට වඩා අඩු වූයේය.

- **සන්නද්ධ ගැටුම් පිළිබඳ ජාත්‍යන්තර නීතිය යටතේ සිවිල් වැසියන්ට ලබා දී තිබෙන ආරක්ෂාව ලබා ගැනීම සඳහා එවැනි කාර්ය මණ්ඩලයට, ස්ථානවලට, ද්‍රව්‍යවලට, ඒකකවලට හෝ වාහනවලට හිමිකම තිබුණේය.** ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානය තුළ සිටි ආණ්ඩුවේ නියෝජිතයන් මෙන් ම එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් හා ඒ තුළ තිබූ ද්‍රව්‍ය ද සම්බන්ධ වූයේ මානුෂීය මෙහෙයුම්වලට පමණක්ය. ඔවුන් හෝ ඒවා කිසි විටෙක එල්ටීටීඊ සාමාජිකයන්ට සහාය සැපයුවේ හෝ ආරක්ෂක හමුදාවලට හානිකර විය හැකි ක්‍රියාවන්හි යෙදුණේ නැත. වන්නිය තුළට යාමට පෙර ආරක්ෂක හමුදා විසින් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය, වාහන හා ද්‍රව්‍ය සෝදිසි කොට අනුමත කරනු ලැබ තිබුණේය. ආණ්ඩුව යුද මුක්ත කලාප ප්‍රකාශයට පත් කර තිබුණේ සිවිල් වැසියන් ආරක්ෂා කිරීමේ අභිප්‍රාය ප්‍රකාශයට පත් කරමින් වන අතර, ඉන් අනතුරුව තම කාර්ය මණ්ඩලය, වාහන හා ද්‍රව්‍ය එහි පිහිටුවීමට එය එක්සත් ජාතීන් යොමු කර තිබුණේය. බෙදා හැරීමේ මධ්‍යස්ථානය අවට සිටි සිවිල් වැසියෝ එදිරිවාදීකම්වලට සහභාගි වෙමින් නොසිටියෝය.

- **එම ආරක්ෂාව තහවුරු කෙරුණේ කවර සැබෑ තත්ත්වයන් යටතේ ද යන වග අපරාධකාරයා දැන සිටියේය.** ආරක්ෂක හමුදා හා ආණ්ඩුව එක්සත් ජාතීන් සිටි ස්ථානය අනුමත කළේය. මධ්‍යස්ථානය තුළ සිටි කාර්ය මණ්ඩලය හා එහි තිබූ ද්‍රව්‍ය එදිරිවාදීකම් තුළ සම්බන්ධ නොවන බව තහවුරු කරමින් නානාවිධ පණිවුඩ හුවමාරු සිදු වී තිබුණේ ය.

මෙම චෝදනාවල බරපතළ බව හේතුවෙන් පළමු වන යුද මුක්ත කලාපය පිහිටුවීමට පෙර හා පසු සිදුවීම් පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් සඳහා බලය පැවරෙන්නේය. මේජර් ජනරාල් ජයසූරිය වැනි පුද්ගලයන්, එක්සත් ජාතීන්ගේ මෙහෙයුමේ හා ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානයේ ස්වභාවය හා ඒවා පිහිටි ස්ථානය පිළිබඳව දැනුවත්ව සිටි බව සහ ආරක්ෂක හමුදා මෙහෙයවීමේ බලය සතුව සිටි බව විශ්වාස කිරීමට සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සැපයෙන බැවින්, මෙහි දී ඔවුන් සලකා බැලීමට ලක් කළ යුතුය. එමෙන් ම, ජනරාල් ෆොන්සේකා හා ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඇතුළු ඔහුගේ මිලිටරි හා සිවිල් ප්‍රධානීන් පිළිබඳව ද එහි දී සලකා බැලිය යුතුය.

ආරක්ෂක හමුදා මානුෂීය මෙහෙයුම්වලට නැවත නැවත ප්‍රහාර එල්ල කිරීමේ රටාවක් පැවති බව විශ්වාස කිරීමට අර්බුද කණ්ඩායම රැස් කර ගෙන ඇති සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සැපයෙන බැවින්, පරීක්ෂණයකට විශේෂයෙන් බලය පැවරෙන්නේය. වාර්තා වී ඇති වෙනත් බොහෝ ඒවා අතර තිබෙන එක් උදාහරණයක් නම්, අප්‍රේල් 8 දා දෙ වන යුද මුක්ත කලාපය තුළ අම්පලාවන්පොක්කනෙයි ආසන්නයේ දී බෙදා හැරුණු කිරිපිටි ලබා ගැනීම සඳහා පෝලිම් ගැසී සිටි කාන්තාවන්, ළමයින් හා වෙනත් සිවිල් වැසියන් විශාල පිරිසකට එල්ල වුණු ෂෙල් වෙඩි ප්‍රහාරයය. සිය ගණනක් ඝාතනයට හෝ තුවාලවලට ගොදුරු වූවෝය. ප්‍රහාරයට පෙර ආරක්ෂක හමුදාවල මුර ගුවන් යානා එම ස්ථානයට ඉහළින් පියාසාර කළ අතර, බෙදා හැරීම සිදු කරන වේලාව හා ස්ථානය ඔවුන්ට දැනුම් දී තිබුණි.

### ආ. රෝහල්වලට එල්ල කළ ප්‍රහාර

යුද්ධයේ අවසන් මාස පහ තුළ දී, රෝහල්වලට හා තාවකාලික වෛද්‍ය මධ්‍යස්ථානවලට එල්ල වූ ප්‍රහාර දුසිම් ගණනක් වාර්තා වූයේය.[71] ආණ්ඩුව එක්කෝ

---

[71] රෝහල් සිදුවීම් පිළිබඳ තොරතුරු, රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ඔක්තෝබර් වාර්තාව තුළ මෙන් ම හියුමන් රයිට්ස් වොච් (Human Rights Watch) හා මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු (UTHR) යන සංවිධානවල වාර්තා තුළ ද රැස් කරනු ලැබ ඇත. බලන්න "Report to Congress on Incidents During the Recent Conflict in Sri Lanka," U.S. Department of State (එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව), 2009 ඔක්තෝබර්; "War on the Displaced: Sri Lankan Army and LTTE Abuses against Civilians in the Vanni," Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2009 පෙබරවාරි, 16-19 පිටු (2008 දෙසැම්බර් 15 හා 2009 පෙබරවාරි 10 අතර වාර්තා වූ ප්‍රහාර දහසයක් හඳුනා ගෙන ඇත); "Sri Lanka: Repeated Shelling of Hospitals Evidence of

www.padippakam.com

මෙම සිදුවීම් මුළුමනින් ම ප්‍රතික්ෂේප කළේය;[72] නැතහොත්, එම ස්ථාන එල්ටීටීඊය විසින් මිලිටරි අරමුණු සඳහා යොදා ගනු ලැබූ බව හා එම නිසා ඒවා නීත්‍යානුකූල ඉලක්ක බව ප්‍රකාශ කළේය. එමෙන් ම, සිවිල් වැසියන්ට සිදු වන හානි හා පීඩාවන් ඉහළ යමින් පවතින බවට බොහෝ විට රෝහල් තුළ සිටි වෛද්‍ය කාර්ය මණ්ඩලවලින් හෝ සාක්ෂිකරුවන්ගෙන් ලැබුණු වාර්තා ද එය ප්‍රතික්ෂේප කළේය. සටනේ අවසානය දක්වා අවසන් වෛද්‍ය මධ්‍යස්ථාන පාලනය කළ ආණ්ඩුවේ වෛද්‍යවරුන් හතර දෙනා, ඔවුන් මුදා හළ තොරතුරු නිසා, යුද මුක්ත කලාපය අත හැර යාම මත අත් අඩංගුවට ගනු ලැබුණෝය.[73] "තම මානුෂීය ක්‍රියාකාරිත්වයට

---

War Crimes," press release (පුවත්පත් නිවේදනය), Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2009 මැයි 8; "Let Them Speak: Truth about Sri Lanka's Victims of War," Special Report no. 34 (විශේෂ වාර්තාව අංක 34), UTHR, 2009 දෙසැම්බර් 13.

[72] රෝහල්වලට එල්ල කළ බවට චුදිත ප්‍රහාර පිළිබඳව නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා තානාපති පාලිත කොහොන මෙලෙස ප්‍රකාශ කළේය: "ඒ මුළු ප්‍රදේශය තුළ ම කවුරු හරි සිතියමක ලකුණු කරල තිබුණු රෝහලක් තිබුණ නම්, ඒ එකක් පමණයි, ඒ රෝහල කිසි විටෙක ඉලක්ක කර නොගත් බව පෙන්නුම් කිරීමට අපි ඡායාරූප ලබා ගෙන තියෙනවා. ... රෝහලකට ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ල කරන්න සිද්ධ වුණා නම් ... එවැනි ස්ථාන තුළ සිටින එල්ටීටීඊ නිලධාරීන්, ඒවා තුළ තිබෙන ඔවුන්ගේ කඳවුරු නිවැරදිව හඳුනා ගෙන අපි ඔවුන් හා ඒවා සායනික ලෙස ඉවත් කරන හැටි මම දන්නවා - අපිට ඒක රෝහලකට කරන්න වුවමනා වුණා නම්, අපිට ඒකත් කරන්න තිබුණා. වුවමනා කළේ ඇත්තට ම ඒක අවසන් කරන්න නම්, උදාසීනව කටයුතු කරන්නේ ඇයි? "War Stories," SBS Dateline (එස්බීඑස් ඩේට්ලයින්), කලින් සඳහන් කර ඇත.

[73] ඔවුන් 2009 මැයි 15 දා යුද කලාපය අත හැර ගිය අතර, ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ රඳවා ගනු ලැබ, විදේශ මාධ්‍ය වෙත සාවද්‍ය තොරතුරු මුදා හැරීම හා එල්ටීටීඊයට සහාය දීම පිළිබඳව ඔවුන්ට චෝදනා කරනු ලැබුණේය. ජුලි 8 දා පැවති, ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද පුවත්පත් සාකච්ඡාවක දී වෛද්‍යවරුන් පැවසුවේ, ඝාතනයට ලක් වූවන් හා තුවාලකරුවන් සංඛ්‍යාව අතිශයෝක්තියට නැංවීමට එල්ටීටීඊය ඔවුන්ට බල කළ බවත් ඇත්ත වශයෙන් ම ඝාතනයට ලක් වී තිබුණේ සිවිල් වැසියන් 750 දෙනෙකු පමණක් බවත්ය. ඊට කෙටිකලකට පසුව වෛද්‍යවරුන් මුදා හැරුණු නමුත්, ඔවුන්ගේ කටයුතු ආණ්ඩුවේ දැඩි පරීක්ෂාවට යටත් කරනු ලැබුණි. එල්ටීටීඊ වෛද්‍ය බලකාය තුළ සේවය කළ පස් වන වෛද්‍යවරයෙකු ද එම පුවත්පත් සාකච්ඡාව තුළ දී පෙනී සිටි අතර, ඔහු ආණ්ඩුවේ අත් අඩංගුවේ පසු වන්නේය. "Tamil doctors released on bail," www.bbcsinhala.com, 2009 අගෝස්තු 24; සහ Rajan Hoole, "Doctoring the evidence," *Himal Southasian* (හිමාල් සවුත්ඒෂියන්), 2009 අගෝස්තු, www.himalmag.com/Doctoring-the-evidence_nw3217.html.



படிப்பகம்

www.padippakam.com

පරිබාහිරව එදිරිවාදී ක්‍රියාවන් සිදු කිරීම සඳහා යොදා ගන්නේ" නැති නම්,[74] රෝහල් ජාත්‍යන්තර නීතිය යටතේ ආරක්ෂිතය. තුවාල ලැබූ සටන්කරුවන් හෝ එල්ටීටීඊ වෛද්‍යවරුන් සිටි පමණින් ම රෝහල්වල ආරක්ෂිත තත්ත්වයට කිසිදු බලපෑමක් සිදු නොවන්නේය.

මෙම ප්‍රහාරවලින් ගණනාවක් පිළිබඳව විස්තරාත්මක සාක්ෂි අර්බුද කණ්ඩායම සතුව ඇත්තේය. ඒවා, වන්නිය පුරා පිහිටි රෝහල් අත හැර යාමට වෛද්‍ය කාර්ය මණ්ඩලවලට හා සිවිල් වැසියන්ට බල කරනු ලැබුණු රටාව පෙන්නුම් කරන්නේය.[75]

## 1. පුදුකුඩිඉරිප්පු රෝහල

පුදුකුඩිඉරිප්පු රෝහල් සංකීර්ණය, කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්තා කළ ආණ්ඩුවේ කාර්ය මණ්ඩලයකින් යුක්ත ආණ්ඩුව විසින් පවත්වා ගෙන යනු ලැබූ රෝහලක් වූයේය.[76] ජනවාරි මාසයේ අග වන විට, ඒ වන විටත් මුලින් පිහිටි ස්ථානයේ ම ක්‍රියාත්මක වෙමින්, වන්නිය තුළ පැවති ආණ්ඩුව විසින් පවත්වා ගෙන යනු ලැබූ එක ම රෝහල එය වූයේය; අනෙක් ඒවා සියල්ල තාවකාලික රෝහල් බවට වෙනස් වී තිබුණේය. එමෙන් ම, යුද මුක්ත කලාපය තුළ දී තුවාල ලැබූ කාන්තාවන්, ළමයින් හා වැඩිහිටියන් බොහෝ සංඛ්‍යාවක් ඇතුළු සිවිල් වැසියන් සිය ගණනකින් එය පිරී ගොස් තිබුණේය. ඔවුන්ගේ තුවාලවලට ප්‍රධාන හේතුව උණ්ඩ කැබලි බව පෙනුණු අතර, අත්පා අහිමි වූ බොහෝ දෙනෙක් එහි සිටියෝය. කිහිප දෙනෙකුට දරුණු පිළිස්සුම් තුවාල තිබුණේය. වෛද්‍ය කාර්ය මණ්ඩලයට වැඩ අධික වූ අතර, සැපයුම් හිඟයක් පැවතුණි. බොහෝ විවෘත තුවාලවලින් සැර ගඳක් වහනය වූ අතර, බිම මත, පිවිසුම් ශාලා හෝ පටු ආලින්දවල හා වාහන ගමන් කිරීමට තිබූ මාර්ගවල ද රෝගීහු පිරී සිටියෝය. රෝහල තුළ සිටින අතරතුර දී, බොහෝ දෙනෙක් සිය තුවාල නිසා මිය ගියෝය.

---

[74] ජිනීවා සම්මුතියේ II අතිරේක නියමය, 11 වගන්තිය. ඒ යටතේ ද, ක්‍රියාත්මක අනතුරු ඇඟවීමක් ලබා දෙන තෙක් හා කඩ නොකෙරෙන තෙක් රෝහල් ඉලක්ක කර ගත නොහැකි වන්නේය.

[75] වන්නිය තුළ පැවති ස්ථිර හා තාවකාලික රෝහල් සහ ඒවා අත හැර දමනු ලැබූ දින පිළිබඳ සිතියමක් සඳහා උ. උපග්‍රන්ථය බලන්න.

[76] පුදුකුඩිඉරිප්පු රෝහල් සංකීර්ණය පිහිටා තිබුණේ පුදුකුඩිඉරිප්පු-මුලතිව් මාර්ගයේ පුදුකුඩිඉරිප්පු හන්දියෙන් නැගෙනහිර දිසාවේය. ඊට ගොඩනැගිලි ගණනාවක් ඇතුළත් වූ අතර, ඉන් බොහෝ ඒවායේ වහලවල් මත සුදු පසුබිමේ රතු කුරුස ඇඳ තිබුණේය. වන්නිය තුළ ක්‍රියාකාරී වූ ජාත්‍යන්තර සංවිධාන සහ ආණ්ඩුව හා ආරක්ෂක හමුදා එහි පිහිටීම මනාව දැන සිටියේය.



படிப்பகம்

එල්ටීටීඊය තුවාල ලැබූ සාමාජිකයන් සඳහා පුදුකුඩිඉරිප්පු රෝහල් සංකීර්ණය තුළ වෙන ම පිහිටි කුඩා ප්‍රදේශයක් යොදා ගත්තේය. ජනවාරි මස අග දී එහි සිටි සටන්කරුවන්ගෙන් බොහෝ දෙනෙක් උණ්ඩවලින් සිදු වූ තුවාලවලින් හා කැඩුණු අස්ථිවලින් පීඩා විඳිමින් සිටියෝය. එල්ටීටීඊ ප්‍රදේශය යොදා ගනිමින් තිබුණේ වෛද්‍ය අරමුණු සඳහාය.

එක්සත් ජාතීන් හා පළාත් ආණ්ඩුවේ කාර්ය මණ්ඩලය මුල දී යුද මුක්ත කලාපයට මාරු වූ අවස්ථාවේ, පුදුකුඩිඉරිප්පු රෝහල දිගට ම ක්‍රියාත්මක වන බව ඔවුහු කොළඹට දැනුම් දුන්නෝය. ඔවුන් ආපසු පුදුකුඩිඉරිප්පු වෙත ගිය පසුව, රෝහල ආරක්ෂා කරන බවට ඔවුන්ට සහතික කරනු ලැබුණ ද, ඉවත්ව යන ලෙස ආරක්ෂක හමුදා ආණ්ඩුවේ වෛද්‍යවරුන්ට පවසා තිබුණි. පෙබරවාරි 1 දා ආරක්ෂක හමුදාවලින් එක්සත් ජාතීන් වෙත ලැබුණු ලිපියකින් රෝහල් පරිශ්‍රයෙන් පිටත පිහිටි එක්සත් ජාතීන්ගේ ජාතික කාර්ය මණ්ඩලය නැවතී සිටි ස්ථාන වෙන් කොට දක්වන ලද අතර, ඉන් ඇඟවුණේ එහි ආරක්ෂාව සහතික කළ නොහැකි බවය. ඉවත්ව යන ලෙස හා රෝහල වසා දමන ලෙස ආරක්ෂක හමුදා පසුව නැවතත් වෛද්‍යවරුන්ට පැවසූ නමුත්, මෙම උපදෙස් පිළිපැදිය නොහැකි බවත් සිවිල් ජනගහනයේ සුභසාධනය සඳහා රෝහල තුළ රැඳී සිටින බවත් වෛද්‍යවරු ආණ්ඩුවට දැනුම් දුන්නෝය.

ජනවාරි 26 දාට පසුව, ප්‍රධාන වශයෙන් දකුණින් හා නැගෙනහිරින්, පුදුකුඩිඉරිප්පු හාත්පස ප්‍රදේශයට කාලතුවක්කු හා මල්ටි බැරල් රොකට් විදින ප්‍රහාර එල්ල වූයේය.[77] මේවායින් ඇතැම් ඒවා පතිත වූයේ රෝහල් සංකීර්ණයේ සිට මීටර් 200ක් ඇතුළතය. එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය සිටින ස්ථානය හා ෂෙල් වෙඩි ප්‍රහාර පිළිබඳ තොරතුරු, ආණ්ඩුව හා මිලිටරිය වෙත නැවතත් යවනු ලැබුණේය. එල්ටීටීඊය ද රෝහල ආසන්නයේ සිට විටින් විට වෙඩි තැබූ නමුත්, බර අවි යොදා නොගත් අතර, රෝහල් සංකීර්ණය තුළ සිට වෙඩි නොතැබුවේය. යුද මුක්ත කලාපයේ සිට වෙඩි තැබීම් නොකළ බවට ප්‍රතික්ෂේප කර තිබූ අයුරින් ම, රෝහල ආසන්නයේ සිට කිසිදු වෙඩි තැබීමක් නොකළ බවට ද එල්ටීටීඊය ප්‍රතික්ෂේප කළේය. පුදුකුඩිඉරිප්පු

[77] ආරක්ෂක හමුදා එල්ල කළ ෂෙල් වෙඩි ප්‍රහාර මීට පෙර ද පුදුකුඩිඉරිප්පු තුළට වැදුණේය. ජනවාරි 13 දා, රෝහල ආසන්නයේ හා රෝහල තුළ ෂෙල් වෙඩි පතිත වූයේය. අඩු ගණනේ එක් කාන්තාවක් ඝාතනය වූ අතර, කුඩා ගැහැණු ළමයෙකු ඇතුළු අනෙක් අයට තුවාල වූයේය. රෝහලට හානි සිදු වූයේය. එක්සත් ජාතීන්ගේ නිලධාරීහු, රෝහලට එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාරය පිළිබඳව එදින ආණ්ඩුව වෙත දැනුම් දුන්නෝය.

ආසන්නයේ පිහිටි එල්ටීටීඊ ස්ථානයක සිට යුද මුක්ත කලාපය තුළට කළ බව පෙනී යන වෙඩි තැබීමක් පිළිබඳව තමන්ට දැනුම් දී තිබූ බවට ජනවාරි 26 දා එක්සත් ජාතීන් වාර්තා කළ නමුත්, පැවති සාක්ෂිවලින් සිදුවීම තහවුරු නොවීය.

ජනවාරි 29 දා, රෝගීන් 200කට වැඩි සංඛ්‍යාවක් හා ඔවුන් රැක බලා ගන්නන් පුදුකුඩිඉරිප්පු රෝහලෙන් ආණ්ඩුවේ පාලනයේ තිබූ වවුනියාවෙහි පිහිටි රෝහල් වෙත මාරු කිරීමට, ආරක්ෂක හමුදා හා එල්ටීටීඊය ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට අවසර දුන්නේය. වන්නිය තුළ සිටි එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජිකයෝ දෙදෙනා ද එදින වවුනියාව බලා ආපසු ගියෝය. නොකඩවා පවතින සටන හා එල්ටීටීඊයේ බාධා කිරීම හේතුවෙන් ඊට කලින් දිනවල දී රෝගීන් මාරු කිරීම වැළකී තිබුණි (පහත IV කොටස අ බලන්න). මාරු කිරීමෙන් පසුව ද පුදුකුඩිඉරිප්පු රෝහල තුළ සිය ගණනක් රෝගීන් රැඳී සිටි අතර, ඔවුන්ගෙන් වැඩි දෙනෙකු පැමිණියේ ජනවාරි 29 දා උදෑසන තවතවත් රෝගීහු ඒ වෙත පැමිණෙමින් සිටිය හ.

එදින සන්ධ්‍යාවේ, එල්ටීටීඊයට "සිවිල් වැසියන්ගේ සුරක්ෂිත භාවය හා ආරක්ෂාව සහතික කිරීම සඳහා ඔවුන්ට නිදහසේ එහා මෙහා යාමට ඉඩ සලසා දීමට," ජනාධිපති රාජපක්ෂ පැය 48ක කාලයක් ප්‍රකාශයට පත් කළේය. ඔහු සියලු සිවිල් වැසියන්ට "සුරක්ෂිත පරිසරයක් වෙත සුරක්ෂිත ගමනක්" පොරොන්දු වූයේය.[78] ඊළඟ දිනයේ, "ආණ්ඩුව සටන් විරාමයක් ලබා නොගැනීමට අධිෂ්ඨාන කර ගෙන සිටින බව ඒකාන්ත ලෙස ප්‍රකාශ කළ" මානව හිමිකම් හා ආපදා කළමනාකරණ ඇමති මහින්ද සමරසිංහ, ප්‍රකාශිත "ආරක්ෂිත කලාපය" වෙත යාමට සිවිල් වැසියන්ට ඉඩ දෙන ලෙස ආණ්ඩුව එල්ටීටීඊයට බල කරමින් සිටින බව පැවසුවේය.[79]

සුරක්ෂිත ගමනක් පිළිබඳව දුන් පොරොන්දුව නොතකා පුදුකුඩිඉරිප්පු රෝහල හාත්පස ප්‍රදේශයට හා යුද මුක්ත කලාපය ඇතුළු අනෙක් ප්‍රදේශ තුළට නොකඩවා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ අතර, සිවිල් වැසියෝ ගණනාවක් ඝාතනයට ලක් වූවෝය. එල්ටීටීඊය තම "අවසාන නිවේදනය" නොතකා හැර ඇති බව පෙබරවාරි 1 දා උදෑසන පැවසූ ආණ්ඩුව, "ආරක්ෂිත කලාපයේ පිට මායිම තුළ ඉදිරි ආරක්ෂක

[78] "Allow free movement to the civilians in 48 hours – President urges LTTE," 2009 ජනවාරි 30, www.defence.lk/new.asp?fname=20090130_01.

[79] "Truce not a ceasefire," 2009 ජනවාරි 31, www.defence.lk/new.asp?fname=20090131_01.

වළල්ලක්" පිහිටුවීම පිළිබඳව ඔවුන්ට චෝදනා කළේය.[80] "ත්‍රස්තවාදීන් මුලිනුපුටා දැමීම සඳහා තමන් මුළු ශක්තිය යොදා දරන පරිශ්‍රමය තුළ යෙදී සිටින අතර ම, කිසිදු සිවිල් වැසියෙකුට හානි නොකිරීමේ ප්‍රතිපත්තිය අඛණ්ඩව පිළිපැදීමට" ද ආණ්ඩුව කැප වූයේය.[81] ආරක්ෂක හමුදා එදින ම පුදුකුඩිඉරිප්පුවලට තම ප්‍රහාරය එල්ල කිරීමට පටන් ගත් අතර, පෙබරවාරි 4 දා නිදහස් දිනය වන විට නගරය අල්ලා ගැනීමට සැලසුම් කර තිබෙන බවට වාර්තා වූයේය.

ආරක්ෂක හමුදා, පෙබරවාරි 1 දා නානාවිධ අවස්ථාවල දී පුදුකුඩිඉරිප්පු රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ අතර, කාන්තාවන්ගෙන් හා ළමයින්ගෙන් යුක්ත වාට්ටුවක් ඇතුළු නොයෙක් ගොඩනැගිලිවලට හා පල්ලියකට ෂෙල් වෙඩි වැදුණේය. ප්‍රහාර එල්ල වෙද්දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ජාත්‍යන්තර කාර්ය මණ්ඩලය රෝහල තුළ සිටියේය. රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කොට ඇති බවටත් එහි තවමත් නේවාසික රෝගීන් 500කට වැඩි සංඛ්‍යාවක් සිටින බවටත්, තුවාල ලැබූ පුද්ගලයන් නොකඩවා පැමිණෙමින් තිබෙන බවටත් එදින පුවත්පත් නිවේදනයක් නිකුත් කරමින්, එම සංවිධානය අසාමාන්‍ය පියවරක් ගත්තේය.[82] අඩු ගණනේ පුද්ගලයන් නව දෙනෙකු මිය ගිය බවටත් යටත් පිරිසෙයින් 20 දෙනෙකුට තුවාල සිදු වූ බවටත් පසු දින නිකුත් කළ ප්‍රකාශයක දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව තහවුරු කළේය.[83]

---

[80] ඇත්ත වශයෙන් ම, යුද මුක්ත කලාපය ප්‍රකාශයට පත් කෙරුණු අවස්ථාවේ එල්ටීටීඊයේ යුද පෙරමුණ පිහිටා තිබුණේ එහි සීමාවෙන් කිලෝමීටර් කිහිපයකට පමණක් ඔබ්බෙහි වන අතර, ඒ දෙසට පසු බැසීමට මිලිටරිය ඔවුන්ට බල කරමින් සිටියේය.

[81] "Ultimatum to LTTE expires: terrorists ignore safe passage for stranded civilians," 2009 පෙබරවාරි 1, www.defence.lk/new.asp?fname=20090201_01.

[82] "Sri Lanka: Vanni hospital shelled," press release (පුවත්පත් නිවේදනය), ICRC (ජාත්‍යන්තර රතු කුරුස කමිටුව) (කොළඹ/ජිනීවා), 2009 පෙබරවාරි 1, www.alertnet.org/thenews/fromthefield/220224/337f825ea91083b3d1f83a3867f85d31.htm.

[83] "ICRC maintains support for hospital hit by shelling," interview with Monica Zanarelli, ICRC deputy head of operations for South Asia (ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ දකුණු ආසියානු මෙහෙයුම් පිළිබඳ නියෝජ්‍ය ප්‍රධානී මොනිකා සනරෙල්ලි සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව), 2009 පෙබරවාරි 2, www.icrc.org/web/eng/siteeng0.nsf/html/sri-lanka-interview-020209.

www.padippakam.com

පෙබරවාරි 2 දා, ගෝඨාභය රාජපක්ෂ හා සම්මුඛ සාකච්ඡාකරුවෙකු අතර පහත දැක්වෙන අදහස් හුවමාරුව සිදු විය:

ගෝඨාභය: ඒවා [වාර්තා] අදාළ වෙන්නේ [පුදුකුඩිඉරිප්පු] රෝහලට නම්, දැන් එතැන [පුදුකුඩිඉරිප්පු] රෝහලක් හෝ කිසි දෙයක් තියෙන්න බැහැ අපි ඒක ඉවත් කළ නිසා. අපි සියලු රෝගීන් එතැනින් ඉවත් කරලා වවුනියාවට ගත්තා. ඒ නිසා, යුද මුක්ත කලාපයට ඔබ්බෙන් කිසි දෙයක් නොතිබිය යුතුයි. ... සම්මුඛ සාකච්ඡාකරු: මේ රෝහල ක්‍රියාත්මක වෙන්නේ නැති බව එපමණට ම පැහැදිලි ද ... ගෝඨාභය: කිසි ම රෝහලක්, කිසි ම රෝහලක් දැන් ක්‍රියාත්මක නොවිය යුතුයි ... සම්මුඛ සාකච්ඡාකරු: ඒක තිබෙන්නේ ආරක්ෂිත කලාපයෙන් පිටත නම්, ඒක නීත්‍යානුකූල ඉලක්කයක් ද. ගෝඨාභය: ඔව්. ප්‍රදේශය තුළ කිසි ම රෝහලක් ක්‍රියාත්මක නොවිය යුතුයි, කිසි ම දෙයක් ක්‍රියාත්මක නොවිය යුතුයි. ඒ නිසයි අපි පැහැදිලිව මේ යුද මුක්ත කලාප ලබා දුන්නේ.[84]

ආරක්ෂක අමාත්‍යාංශය ද පෙබරවාරි 2 දා ප්‍රකාශයක් නිකුත් කළේය:

ආරක්ෂක හමුදා, ආරක්ෂිත කලාප තුළ සිටින සිවිල් වැසියන්ගේ ආරක්ෂාව හා රැකවරණය සහතික කිරීමේ වගකීම මුළුමනින් ම භාර ගන්නා නමුත්, කලාපවලින් පිටත රැඳී සිටින්නන් වෙත එවැනි සහතිකයක් ලබා දීමට ඒවාට නොහැකිය. එම නිසා, ආරක්ෂිත කලාප තුළට පැමිණෙන ලෙස ආණ්ඩුව පූර්ණ වගකීමෙන් යුක්තව සියලු සිවිල් වැසියන් උනන්දු කරයි. එමෙන් ම, මෙම ඉල්ලීම සැලකිල්ලට නොගන්නා සිවිල් වැසියන් සිටිනු ඇත්තේ එල්ටීටීඊ සාමාජිකයන් අතර බැවින්,

[84] "Packed Sri Lanka hospital shelled," Skynews (ස්කයිනිවුස්), 2009 පෙබරවාරි 2, http://news.sky.com/skynews/Home/World-News/Sri-Lanka-War-Hospital-In-Puthukkudiyiruppu-Shelled-Killing-Adults-And-Children/Article/200902115214899?lpos=World_News_Third_Home_Page_Article_Teaser_Region__6&lid=ARTICLE_15214899_Sri_Lanka_War%3A_Hospital_In_Puthukkudiyiruppu_Shelled%2C_Killing_Adults_And_Children and www.youtube.com/watch?v=pKmM2qg95R0&feature=related.



படிப்பகம்

ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම භාර ගැනීමට ආරක්ෂක හමුදාවලට නොහැකි වනු ඇති බව ප්‍රකාශ කරයි.[85]

ආරක්ෂක හමුදා පෙබරවාරි 2-4 සිට නැවතත් රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ අතර, රෝගීන් වැඩි සංඛ්‍යාවක් ඝාතනය කරමින් පෙබරවාරි 4 දා උදෑසන එල්ල වූ තීව්‍ර ප්‍රහාරයක් ද ඒ අතරට ඇතුළත් වන්නේය. එක්සත් ජාතීන් හා අනෙක් සංවිධාන මෙම ෂෙල් වෙඩි ප්‍රහාර පිළිබඳව ආණ්ඩුවට හා මිලිටරියට නැවත නැවතත් දැනුම් දුන්නේය. ගෝඨාභය රාජපක්ෂ මෙලෙස පැවසූ බව පෙබරවාරි 3 දා පළ වූ ප්‍රවෘත්ති වාර්තාවක උපුටා දක්වා තිබුණි: "එහි ස්වාධීන නිරීක්ෂකයන් නැහැ. සිටින්නේ එල්ටීටීඊයට සහාය දක්වන්නන් පමණයි. ගුවන් විදුලි නිවේදන නිකුත් කළා, සිවිල් වැසියන්ගේ ගමන ආරම්භ වුණේ මාස එක හමාරකට කලින්."[86]

පෙබරවාරි 4 දා, රෝගීන් 300කට ආසන්න සංඛ්‍යාවක් හා ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ කාර්ය මණ්ඩලයේ දහඅට දෙනෙක්, ඉතිරිව සිටි එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය හා යැපෙන්නන් සමග, පුදුකුඩිඉරිප්පු රෝහලෙන් පුදුමාතලන් වෙත පලා ගියෝය.[87] එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය, තම ගමන් මාර්ගය හා තමන් සිටින ස්ථානය මේජර් ජනරාල් ජයසූරියට හා එල්ටීටීඊයට දැනුම් දුන්නේය.

දින දෙකකට පසුව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව පුදුකුඩිඉරිප්පු රෝහල පිළිබඳ පෙබරවාරි 5 දා දීර්ඝ ගුවන් විඩියෝ පටයක් මුදා හළ අතර, එය "කාලතුවක්කු වෙඩි හෝ ගුවන් බෝම්බ හෙළීම් හේතුවෙන් කිසි ම හානියක් සිදු වී නොමැති පෙර පැවති පුදුකුඩිඉරිප්පු රෝහලේ ගොඩනැගිලි පැහැදිලිව පෙන්නුම් කරන" බව ප්‍රකාශ

[85] "Come to Security of Safety Zone – Govt. Urges all Civilians," 2009 පෙබරවාරි 3, www.priu.gov.lk/news_update/Current_Affairs/ca200902/20090203come_to_safety_zone.htm.

[86] "Can't ensure safety of civilians in LTTE areas: Sri Lanka," IBNLive (අයිබීඑන්ලයිව්), 2009 පෙබරවාරි 3, http://ibnlive.in.com/news/cant-ensure-safety-of-civilians-in-ltte-areas-sri-lanka/84336-2.html.

[87] "Sri Lanka: parties must grant safe passage to stranded patients and medical staff," interview with Monica Zanarelli (මොනිකා සනරෙල්ලි සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව), 2009 පෙබරවාරි 9, www.icrc.org/Web/Eng/siteeng0.nsf/html/sri-lanka-feature-090209.

www.padippakam.com

කළේය.[88] ඇතැම් කොටස් සංස්කරණය කර ඇති බව විඩියෝ දර්ශනය පෙන්නුම් කරන අතර, විඩියෝ පටය සියලු ගොඩනැගිලිවල සමීප රූප නොසපයන්නේය. කෙසේ වුව ද, වන්නිය තුළ පිහිටි ඉලක්කවල හා ජනයාගේ ස්වභාවය හා ස්ථානගත වීම පිළිබඳව විස්තරාත්මක තොරතුරු සැපයිය හැකි ගුවන් මුර ඡායාරූප වෙත ප්‍රවේශ වීමේ හැකියාව ආරක්ෂක හමුදාවලට තිබූ බව එය පෙන්වන්නේය.

## 2. පොන්නම්බලම් අනුස්මරණ රෝහල

පොන්නම්බලම් අනුස්මරණ රෝහල පුදුකුඩිඉරිප්පු හන්දියේ සිට වෙරළබඩ පුදුමාතලන් නගරය දෙසට දිවෙන ඉරණයිපලයි මාර්ගයේ පිහිටි පෞද්ගලික රෝහලක් වූයේය. ඊට අරමුදල් සපයනු ලැබුණේ ශ්‍රී ලංකාවෙන් පිටත සිටි එල්ටීටීඊ ආධාරකරුවන් විසින් වුවත්, එය සිවිල් වැසියන් හා සාමාජිකයන් යන දෙකොට්ඨාසයට ම ප්‍රතිකාර කළේය.[89] ගිලන් රථ ඒ වෙත හා ඉන් පිටතට යන ආකාරය සහ කිහිලි කරුවලින් හා රෝද පුටුවලින් යන රෝගීන් ඉදිරිපස අංගනය තුළ අව්වේ වාඩි වී සිටින ආකාරය, රෝහල හුරු පුරුදු සාක්ෂිකරුවෝ නිරන්තරයෙන් දුටුවෝය. ගොඩනැගිල්ල ඉදිරියේ කිසි ම ආරක්ෂාවක් තිබෙන බවක් හෝ එය මිලිටරි අරමුණු සඳහා යොදා ගනු ලබන බව අඟවන වෙනත් යමක් ඔවුහු නොදුටුවෝය. රෝහලෙන් පිටත තිබුණේ රෝහලේ නම සහිත පුවරුවක් හා සුදු පසුබිම මත අඳින ලද රතු කුරුසයකි.

පෙබරවාරි 6 දා, ශ්‍රී ලංකා ගුවන් හමුදාව රෝහලට බෝම්බ දැමුවේය. බෝම්බ ප්‍රහාරය ප්‍රධාන රෝහල් ගොඩනැගිල්ලේ පසුපසට දරුණු ලෙස හානි කළ අතර, රෝගීන්ට නවාතැන් සැපයීම සඳහා යොදා ගෙන තිබූ, මාර්ගය එහා පැත්තේ පිහිටි ඇනෙක්සිය නමින් හඳුන්වන ලද විශාල නිවසක් විනාශ කළේය. ප්‍රධාන රෝහලේ දී, සාක්ෂිකරුවෙක් කොන්ක්‍රීට් තට්ටුව යට තිබූ සිරුරු දුටු අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු සරම් හැඳ සිටි පිරිමින් බව පෙනුණි. ඇතැමුන්ගේ අත්වල හෝ පාදවල

---

[88] "Former Puthukudduyiruppu hospital unharmed; Air Force Beechcraft exposes how LTTE has taken UN for ride," 2009 පෙබරවාරි 6, www.defence.lk/new.asp?fname=20090206_03 (last modified 7 February 2009 (අවසන් වශයෙන් වෙනස් කිරීම් කරන ලද්දේ 2009 පෙබරවාරි 7)).

[89] "Let them speak," UTHR (මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු, කලින් සඳහන් කර ඇත, 40 පි.



படிப்பகம்

බදාම පැලැස්තර තිබුණි. රළු ගල් කැබලි අතර, ඇඳන්වල හා වෙනත් රෝහල් උපකරණයන්හි සැකිලි දර්ශනය විය. සුන්බුන් ඉවත් කිරීම සඳහා විශාල යන්ත්‍රයක් යොදා ගනු ලැබුණි. එදින ම පසුව නැවතත් අඩවියට බෝම්බ ප්‍රහාර එල්ල කරනු ලැබුණි. 75ක් පමණ ජනයා ඝාතනයට ලක් වන්නට ඇති බව සිතිය හැකිය.[90]

"කෆීර් හා එෆ්-7 සටන් ජෙට් යානා ... පුදුකුඩිඉරිප්පු හන්දියෙන් කිලෝමීටර් 1ක් ඊසානේ පිහිටි ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ නායක සූසේගේ තිප්පොළක් විනාශ කළ බව පසු දිනයේ නිවේදනය කළ ගුවන් හමුදාව, මෙහෙයුමෙන් ලබා ගත් දීර්ඝ වීඩියෝ පටයක් මුදා හළේය.[91] ප්‍රකාශක වින්ග් ආඥාපති ජනක නානායක්කාර පැවසුවේ, ප්‍රහාරය සිදු වන අවස්ථාවේ දී සූසේ සිටියේ ඉලක්කය තුළ - භූගත බංකරයක් හා සුඛෝපභෝගී නිවසකි - බව මූලාශ්‍ර හෙළිදරව් කළ නමුත්, ඔහු මරණයට පත් වූ බවට හෝ තුවාල ලැබූ බවට කිසි ම සහතිකයක් නොමැති බවය. "පස් ප්‍රවාහනය කරන වාහන තුනක් ඇතිව ත්‍රස්තවාදීන් ස්ථානය හැරීමට අසාර්ථක ප්‍රයත්නයක් දරමින් සිටින ආකාරය නිරීක්ෂණය කළ" පසුව, සටන් ජෙට් යානා දෙවන වතාවටත් ඉලක්කයට පහර දුන් බව ප්‍රකාශය තව දුරටත් පැවසුවේය.[92]

මෙම වීඩියෝ පටය ද සංස්කරණය කර තිබූ අතර, මාර්ගයකට යාබදව පිහිටි විශාල ගොඩනැගිල්ලක් නිවැරදිව එල්ල කර සිදු කරන ගුවන් ප්‍රහාරයක් පෙන්නුම් කරයි. අනතුරුව, එය බැක් ෂෝ යන්ත්‍රයක් රළු ගල් කැබලි අතරින් හාරා ගෙන යන ආකාරය හා දෙවන ගුවන් ප්‍රහාරයකින් එය විනාශ වී යන ආකාරය පෙන්වයි. එදින සිදු වූ ගුවන් ප්‍රහාරවලින් මොහොතකට පසු පොන්නම්බලම් අනුස්මරණ රෝහලෙහි සිටි සාක්ෂිකරුවෝ මෙම වීඩියෝ පටය තුළ තිබෙන ගොඩනැගිල්ල රෝහල් ඇනෙක්සිය බවට හඳුනා ගෙන ඇත. එල්ටීටීඊ නායකයන් ප්‍රදේශය තුළ පිහිටි නිවාස යොදා ගත් බවට වාර්තා වූ නමුත්,[93] ඔවුහු ප්‍රධාන රෝහල හෝ ඇනෙක්සිය යොදා

---

[90] එම, 41 පි.

[91] "Soosai's luxury manson destroyed in air raid – Puthukudduyiruppu [Video Updated]" www.defence.lk/new.asp?fname=20090207_03 (last modified 8 February 2009 (අවසන් වශයෙන් වෙනස් කිරීම් කරන ලද්දේ 2009 පෙබරවාරි 8)).

[92] එම.

[93] "Let them speak," UTHR (මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු, කලින් සඳහන් කර ඇත, 41 පි.

www.padippakam.com

නොගත්තෝය. මිලිටරිය සුසේ හඹා යාම යුද්ධයේ අවසානය තෙක් නොකඩවා සිදු වූයේය.[94]

### 3. පුදුමාතලන් රෝහල

පෙබරවාරි 4 දා පුදුකුඩිඉරිප්පු රෝහලෙන් පලා ගිය පසු, ආණ්ඩුවේ වෛද්‍ය කාර්ය මණ්ඩලය හා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව පුදුමාතලන් පාසලෙහි තාවකාලික රෝහලක් පිහිටුවූ අතර, එය පන්ති කාමර ගොඩනැගිලි හතරකින් හා තාවකාලික වාසස්ථාන දෙකකින් යුක්ත වූයේය. ඒ වන විටත් වන්නියෙහි සිටි එක්සත් ජාතීන්ගේ ජාතික කාර්ය මණ්ඩලය හා යැපෙන්නෝ තමන් සතු එක්සත් ජාතීන්ගේ වාහන හා එක්සත් ජාතීන්ගේ ධජයක් පාසල ආසන්නයේ පිහිටුවූවෝය. සංවිධාන දෙක ම තමන් සිටින ස්ථානය සම්බන්ධයෙන් ආණ්ඩුවට හා මිලිටරියට ජීපීඑස් සම්බන්ධීකාරක සැපයුවේය. රෝහල ද සුදු පසුබිමේ රතු කුරුසයක් සහිත ධජයක් එල්ලුවේය. එක්සත් ජාතීන්ගේ හා ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ආරක්ෂාව පතා අභ්‍යන්තර අවතැන් වූවෝ දහස් ගණනක් අසල ස්ථානගත වූවෝය. රෝහල තුළ හා රෝහලෙන් පිටත ගස් යට එලා ගත් මෙට්ටවල රෝගීහු සිය ගණනක් සිටියෝය. උණ්ඩ කැබලි හේතුවෙන් ඇති වූ තුවාලවලින් ජනයා ලේ ගලමින් සිටි අතර, ඔවුන්ට ප්‍රතිකාර කිරීමට ප්‍රමාණවත් තරම් වෙළුම් පටි එහි නොතිබුණේය.

මෙම රෝහල පිහිටා තිබුණේ, පෙබරවාරි 12 දා සිට ක්‍රියාත්මක වූ දෙ වන යුද මුක්ත කලාපය බවට පත් වූ ස්ථානයෙහිය.[95] එය එක් පසෙකින් වෙරළ තීරය හා අනෙක් පසින් කලපුව පිහිටි පටු බිම් තීරුවක් වූයේය. රෝහල පිහිටියේ කලපුවෙන් මීටර් 50ක් පමණ දුරින් ඉහළ ස්ථානයකය; එහි සිටි අයට කලපුවෙන් එගොඩ පැහැදිලිව දැකිය හැකි විය. වහලෙහි ද සුදු පසුබිමේ රතු කුරුසයක් පින්තාරු කර තිබුණේය. නව යුද මුක්ත කලාපයෙන් "අපේක්ෂා කෙරෙන්නේ, එල්ටීටීඊයෙන් පිළිසරණක් නොමැති ජනයා සඳහා මානුෂීය ආධාර හා වෛද්‍ය සැපයුම් ගලා ඒමට පහසුකම් සැපයීම බව

---

[94] සුසේ මුහුදු කොටින්ගේ නායකයා වූ අතර, සටනේ අවසන් දිනයේ දී ඝාතනයට ලක් වූ බවට විශ්වාස කෙරේ.

[95] කිලෝමීටර් දොළහක් දිග මෙම කලාපය වඩ්ඩුවාකල් උතුර සිට පුදුමාතලන් පසු කර විහිදුණේය. "'No fire zone' declared further facilitating civilian safety," 2009 පෙබරවාරි 12, www.defence.lk/new.asp?fname=20090212_09. ඈ. උපග්‍රන්ථය ලෙස සම්බන්ධ කර ඇති සිතියම බලන්න.



படிப்பகம்

www.padippakam.com

ආණ්ඩුව පැවසුවේය.[96] නව යුද මුක්ත කලාපය ක්‍රියාත්මක වීමට කලින් දින තුන මුළුල්ලෙහි, පුදුමාතලන්හි සිවිල් වැසියන් සිටි ප්‍රදේශයට දකුණින් හා උතුරෙන්, චාලයිහි සිට ආරක්ෂක හමුදා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ අතර, රෝහලට ඉතා ආසන්න හාත්පසට පහර දී සිවිල් වැසියන් ඝාතනයට හා තුවාලවලට ගොදුරු කළේය.

රෝහල ආසන්නයේ එල්ටීටීඊ මිලිටරියේ කිසිවෙක් නොසිටියෝය. තමන් තුවාලකරුවන් 240 දෙනෙකු පුදුමාතලන්වලින් ඉවත් කොට ත්‍රිකුණාමලය වෙත ගෙන යමින් සිටින බව පෙබරවාරි 10 දා නිවේදනය කළ ජාත්‍යන්තර රතු කුරුස කමිටුව, ෂෙල් වෙඩි ප්‍රහාරවලින් අඩු ගණනේ රෝගීන් දහසය දෙනෙකු ඝාතනයට ලක් වූ බව තහවුරු කළේය.[97] ඊළඟ සතිය තුළ දී එය තවත් රෝගීන් 840කට වැඩි ගණනක් හා පවුල්වල සාමාජිකයන් ඉවත් කළේය.[98]

ඉන් පසු සතිවල දී පුදුමාතලන් රෝහලට හා ඒ අවට ප්‍රදේශයට තවත් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූයේය. පෙබරවාරි මාසයේ අග දී, කිලෝමීටර් 12ක් පමණ දුර සිට ආරක්ෂක හමුදා විසින් විදින ලද කාලතුවක්කු ෂෙල් වෙඩි දෙකක හඬ සාක්ෂිකරුවෙකුට ඇසුණි. ෂෙල් වෙඩි පතිත වූයේ ඔහුගේ පවුලේ කූඩාරම් වාසස්ථානයට මීටර් 30-40ක් දුරින් වන අතර, එය උණ්ඩ කැබලිවලින් රෝහලට හානි සිදු වීමට තරම් ප්‍රමාණවත් සමීපතාවක් වූයේය. ඒ වන විට අගලක නිදා සිටි නිසා ඔහුට හා ඔහුගේ පවුලට තුවාලයක් සිදු නොවීය. එහෙත්, අඩු ගණනේ කුඩා ළමයින් දෙදෙනෙකු ඇතුළු සිවිල් වැසියෝ හත් දෙනෙක් ඝාතනයට ලක් වූවෝය. ෂෙල් වෙඩි ප්‍රහාරය එල්ල වන විට එල්ටීටීඊය රෝහල තුළ හෝ පවුලේ වාසස්ථානය ආසන්නයේ

---

[96] එම.

[97] "Sri Lanka: ICRC evacuates over 240 wounded and sick from the Vanni by sea," ICRC (ජාත්‍යන්තර රතු කුරුස කමිටුව), 2009 පෙබරවාරි 10, www.icrc.org/Web/Eng/siteeng0.nsf/html/sri-lanka-news-100209.

[98] "Sri Lanka: ICRC carries on evacuation of sick and wounded by sea," ICRC (ජාත්‍යන්තර රතු කුරුස කමිටුව), 2009 පෙබරවාරි 12, www.icrc.org/web/eng/siteeng0.nsf/html/sri-lanka-news-120209; "Sri Lanka: ICRC evacuates more sick and wounded from the Vanni," ICRC (ජාත්‍යන්තර රතු කුරුස කමිටුව), 2009 පෙබරවාරි 16, www.icrc.org/web/eng/siteeng0.nsf/html/sri-lanka-news-160209.



படிப்பகம்

නොසිටියේය. ඇත්ත වශයෙන් ම, මෙම සාක්ෂිකරුවා පෙබරවාරි මාසයේ අග සිට මාර්තු මාසයේ මුල දක්වා සතියකට වතාවක් පමණ රෝහලෙහි සිටි අතර, කිසි විටෙක ඒ තුළ හෝ ඒ ආසන්නයේ එල්ටීටීඊ මිලිටරිය සිටින බවක් නොදුටුවේය.

රෝහලේ සිට මීටර් 100ක් පමණ දුරින් වාසස්ථානයක් හා බංකරයක් පිහිටුවා ගෙන සිටි දෙ වන සාක්ෂිකරුවෙකු වාර්තා කළේ, පෙබරවාරි 17 දා ආසන්නයේ, රෝගීන් ඝාතනය කරමින් හා අනෙක් අයට තවත් තුවාල සිදු කරමින් රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ බවය. ෂෙල් වෙඩි ප්‍රහාර අඛණ්ඩව එල්ල වෙද්දී, ඒ වන විටත් එහා මෙහා යාමේ හැකියාව තිබූ ඇතැම් රෝගීන් රෝහලෙන් පලා යන ආකාරය ඔහු දුටුවේය. එල්ටීටීඊයේ කිසිවෙකු ප්‍රදේශය තුළ සිටින බවක් ඔහු නොදුටු අතර, රෝහලෙන් පිටතට වෙඩි තැබීමක් සිදු නොවූයේය. ඔහු පුදුමාතලන්හි සිටිය දී තුවාල ලැබූ ජනයාගෙන් රෝහල් ගොඩනැගිලි පිරී ඉතිරී ගිය අතර, බොහෝ දෙනෙකුට ප්‍රතිකාර කරනු ලැබුණේ පිටත විවෘත ප්‍රදේශ තුළ දීය. ෂෙල් වෙඩි ප්‍රහාරවලින් පසුව, රෝහලට යාමට හෝ මූලික ප්‍රතිකාර ගැනීමෙන් පසු එහි රැඳී සිටීමට තුවාල ලැබූ ඇතැම් ජනයා බිය වූවෝය.

පෙබරවාරි මාසයේ අග දී හා මාර්තු මාසයේ මුල දී අවස්ථා ගණනාවක් රෝහලෙහි සිටි තුන් වන සාක්ෂිකරුවෙක්, පැවති දැඩි තදබදය පිළිබඳව හා එහි සිටි උණ්ඩ කැබලිවලින් සිදු වූ තුවාල සහිත රෝගීන් සිය ගණනක් පිළිබඳව විස්තර කළේය. අඛණ්ඩ නළ ජල පහසුකම් නොතිබූ අතර, නිර්වින්දක, ධමනි පෝෂක හා රුධිරය සැපයුම සීමිත වූයේය. රෝහල තුළ දී සිය තුවාල නිසා මිය ගිය කාන්තාවන්, ළමයින් හා වැඩිහිටියන් ඇතුළු රෝගීන්ගේ සිරුරු අංගනය තුළ පෙළ ගස්වා තිබුණි. එමෙන් ම, ආරක්ෂක හමුදා කලපුව හරහා රෝහලට ආර්පීජී (RPG) ෂෙල් වෙඩිල්ලක් එල්ල කරන ආකාරය ද මෙම පුද්ගලයා දුටුවේය. ෂෙල් වෙඩිල්ල වැදුණේ රෝහලේ ගේට්ටුව ළඟ පිහිටි ගසකට වන අතර, හය දෙනෙකුට පමණ තුවාල සිදු විය. සොල්දාදුවන් වැලි ගෝනි පුරවන ආකාරය හා බංකර ගොඩ නගන ආකාරය ඔහුට දැකිය හැකි වූ බැවින්, එය පැමිණියේ ආරක්ෂක හමුදාවල යුද පෙරමුණෙන් බව ඔහු දැන සිටියේය. මාර්තු 5 දා පුදුකුඩිඉරිප්පු අල්ලා ගැනීමෙන් පසු, ආරක්ෂක හමුදා රෝහල හරහා කලපුව වෙත ගිය බව සාක්ෂිකරුවෝ බොහෝ දෙනෙක් තහවුරු කළෝය.

මාර්තු 10 දාට දින කිහිපයකට පසුව, ආරක්ෂක හමුදාවල පැත්තෙන් මල්ටි බැරල් රොකට් විදින ෂෙල් වෙඩි (MBRL shells) එල්ල කරන ශබ්දය හා ඒවා රෝහල

ආසන්නයේ පුපුරා යන ශබ්දය, හතර වන සාක්ෂිකරුවෙකුට ඇසුණි. ඔහු රෝහලට ළඟා වන විට ඉදිරිපසට හා වහලට හානි සිදු වී තිබූ අතර, සිවිල් වැසියන් හා වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයෝ ගණනාවක් ඝාතනයට ලක් වී තිබුණෝය. එම දිනයේ ඊට කලින්, රෝහලෙන් පිටත සිවිල් වැසියන් සිටි ප්‍රදේශයකට කාලතුවක්කු හා මල්ටි බැරල් රොකට් විදිනවල ඒකාබද්ධ ප්‍රහාරයක් එල්ල වී තිබුණේය. සිවිල් වැසියන් ගණනාවක් ඝාතනයට ලක් වූ අතර, තවත් අයට තුවාල සිදු වූයේය. රෝහල ආසන්නයේ එල්ටීටීඊ ස්ථාන නොවූයේය.

මාර්තු මාසයේ අග හා අප්‍රේල් මාසය දක්වා ෂෙල් වෙඩි හා අනෙක් ප්‍රහාර නොකඩවා සිදු වූයේය. ඉතිරි වී තිබූ ලොරියකට හානි කරමින් මාර්තු මාසයේ දී එක්සත් ජාතීන්ගේ අඩවියකට ෂෙල් වෙඩිල්ලක් එල්ල විය. මාර්තු 24 දා හෝ ඒ ආසන්නයේ දී, රෝහල හාත්පසට බලපාන ආකාරයෙන් තීව්‍ර වෙඩි තැබීම් හා ආර්පීජී ප්‍රහාර සිදු වන ආකාරය, පස් වන සාක්ෂිකරුවෙක් දුටුවේය. රෝහල තුළ සිටි එක් කාන්තාවකගේ පාද තුළ පුපුරා නොගිය ආර්පීජී උණ්ඩයක් තැන්පත් වී තිබුණි.

අනතුරුව, අප්‍රේල් 19 දා සිට - කලපුව තරණය කර යුද මුක්ත කලාපයට පිවිසීමට ආරක්ෂක හමුදා සූදානම් වෙමින් සිටිය දී - පුදුමාතලන් හා අම්පරන්පොක්කනි අතර තීව්‍ර ෂෙල් වෙඩි ප්‍රහාර පැවතුණු අතර, සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවකට හානි සිදු වූයේය. අප්‍රේල් 20 දා උදෑසන, රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ අතර, තදින් හානි සිදු විය; ආරක්ෂක හමුදා හා එල්ටීටීඊය රෝහල ඉදිරිපිට සටන් කරමින් සිටියේය. ආරක්ෂක හමුදා එල්ටීටීඊය පසුබස්වද්දී හා යුද මුක්ත කලාපය දෙකට බෙදද්දී බොහෝ දෙනෙකු ඝාතනයට ලක් වූ අතර, රෝහල තුළ හෝ ආසන්නයෙහි මිය ගිය සහ මිය යමින් සිටි සිවිල් වැසියෝ අත හැර දමනු ලැබුණෝය. ඉන් පසු දිනවල දී, සිවිල් වැසියන් 100,000ක් පමණ ආණ්ඩුවේ පාලනය යටතේ පැවති ප්‍රදේශවලට මාරු වුවත්, ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වූයේය. රෝහල හා අවට ප්‍රදේශය තුළ දී සිවිල් වැසියන්ට බරපතළ හානි අත්විඳීමට සිදු වූ අතර, වෛද්‍ය සැපයුම් හා උපකරණ අහිමි වූයේය, නැති නම් වෛද්‍ය කාර්ය මණ්ඩලයට නැවතත් ඉවත් වී යාමට සිදු වූ විට ඒවා අත හැර දමා ගියේය.

**4. මුල්ලිවයික්කාල් රෝහල්**

රෝහල්වලට එල්ල වූ මාරක ම ෂෙල් වෙඩි ප්‍රහාර සිදු වූයේ සටනේ අවසන් සති හතර තුළ දීය. ඒ කාලය තුළ දී, ඉතිරි වී පැවති යුද මුක්ත කලාප තුළ පැවති

තත්ත්වය තව දුරටත් පිරිහී තිබුණේය. මුල්ලිවයික්කාල්හි තාවකාලික රෝහල් දෙකක් පිහිටුවනු ලැබුණේය. පළමු වැන්න පිහිටුවූයේ පෙබරවාරි මාසයේ අග දී මුල්ලිවයික්කාල් ද්විතීයික පාසලෙහි වන අතර, එය පුදුමාතලන් රෝහල සමග එක්ව ක්‍රියාත්මක වූයේය. පළමු වැන්න තීව්‍ර ෂෙල් වෙඩි ප්‍රහාරවලට ගොදුරු වීමෙන් පසුව දෙ වැන්න පිහිටුවූයේ තව දුරටත් නැගෙනහිරට පිහිටි තවත් පාසලකය. අප්‍රෙල් මාසයේ අග වන විට තත්ත්වය භයානක වූයේය. සැපයුම් අධික ලෙස අප්‍රමාණවත් විය. නිවාරක මාධ්‍ය, අත් වැසුම්, ලේ දීම සඳහා රුධිරය නොමැතිව සිය ගණනක් රෝගීහු වැල්ල හෝ ඉටි රෙදි මත වැතිර සිටි අතර, හිමිකම් නොකී සිරුරු ගණනාවක් තිබුණි. දුර්ගන්ධය ඉවසිය නොහැකි වූයේය.

අප්‍රේල් 30 දා ආරක්ෂක හමුදා පළමු වන මුල්ලිවයික්කාල් රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ අතර, මැයි 2 දා ප්‍රහාර වඩා තීව්‍ර විය. පසුව කී ප්‍රහාරය අතරතුර දී සාක්ෂිකරුවෙකු ප්‍රදේශයට ඉහළින් මිනිසුන් රහිතව පියාසර කරන ගුවන් යානාවක් දුටු අතර, සිවිල් වැසියෝ බොහෝ ගණනක් ඝාතනයට හෝ තුවාලවලට ලක් වූවෝය. සැපයුම් හා තුවාලකරුවන් හැකි උපරිම ප්‍රමාණයක් දෙ වන රෝහල වෙත ගෙන යාමට වෛද්‍ය කාර්ය මණ්ඩලය උත්සාහ කළේය. මැයි 11 දා, ආරක්ෂක හමුදා සමස්ත මුල්ලිවයික්කාල් ප්‍රදේශයට ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේය. සිවිල් වැසියන් බොහෝ ගණනක් තම බංකර තුළ මිය ගිය අතර, ඔවුන් රැස් කර වළ දැමීම සඳහා පැමිණීමට කිසිවෙක් නොසිටියෝය. මැයි 12 දා, තුවාලකරුවන්ගෙන් බොහෝ දෙනෙකු දෙ වන රෝහල වෙත ගෙන ගිය පසුව, ආරක්ෂක හමුදා ඊට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේය. සිවිල් වැසියන් හා වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයෝ ගණනාවක් ඝාතනයට හා තුවාලවලට ගොදුරු වූවෝය. එක් සාක්ෂිකරුවෙකු පැවසූ ආකාරයට: "මේ අය එල්ටීටීඊ එක නෙවෙයි, පවුල්, ළමයි, වයසක අය, මේක විශ්වාස කරන්න බැහැ."

මැයි 12 දා සන්ධ්‍යාවේ සිට සටනේ අවසානය දක්වා රෝහල් නොවැළැක්විය හැකි ලෙස ම ඇන හිට තිබුණි. මේ නිසා, තව මත් කොටු වී හා තීව්‍ර ප්‍රහාරවලට ලක් වෙමින් සිටි සිවිල් වැසියන් දසදහස් ගණනකට වෛද්‍ය පහසුකම් නොමැතිව ගියේය. සටන අවසන් වී ආරක්ෂක හමුදා ඉතිරි වී සිටි සිවිල් වැසියන් ඉවත් කළ අවස්ථාවේ තුවාලකරුවෝ සිය ගණනක් අත හැර දමනු ලැබුණෝය.

"මිලිටරි ඉලක්ක නොවන, රෝගී වූවන් හා තුවාලකරුවන් ඒකරාශි වී සිටි රෝහල්වලට හා ස්ථානවලට ... එරෙහිව හිතාමතා ප්‍රහාර එල්ල කිරීම" යුද

www.padippakam.com

අපරාධයකි.[99] ආරක්ෂක හමුදා තුළ සිටින පුද්ගලයන්, මෙම අපරාධය මෙන් ම සිවිල් වැසියන්ට හිතාමතා ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ අපරාධය (පහත III කොටස ඇ. තුළ සාකච්ඡාවට ලක් වේ) සිදු කළ බව විශ්වාස කිරීම සඳහා, මෙම රෝහල්වලට නැවත නැවත් එල්ල කළ ප්‍රහාර පිළිබඳව අර්බුද කණ්ඩායම රැස් කර ගෙන ඇති සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සැපයෙන්නේය එවැනි පුද්ගලයන් මෙන් ම චූදිත අපරාධවලට අණ කළ හෝ ඒවාට සහාය දුන් හෝ මිලිටරි හෝ සිවිල් ප්‍රධානීන් ලෙස වගකීම දරන අනෙක් අය ද සාපරාධීව වගකීම දරනු ඇත. රෝහල්වලට හිතාමතා ප්‍රහාර එල්ල කිරීමේ අපරාධයේ ප්‍රධාන මූලයන්[100] හා අදාළ සාක්ෂිවල සාරාංශය පහත දැක්වෙන ආකාරයට වේ:

- **අපරාධකාරයා ප්‍රහාරයක් එල්ල කළේය.** ශ්‍රී ලාංකික ආරක්ෂක හමුදාවලින් එල්ල වූ වෙඩි ප්‍රහාර නැවත නැවතත් මෙම රෝහල් වෙත වදින ආකාරය සාක්ෂිකරුවෝ නිරීක්ෂණය කළෝය. සාක්ෂිකරුවන් පොන්නම්බලම් අනුස්මරණ රෝහලේ ඇනෙක්සිය ලෙස හඳුනා ගෙන ඇති ගොඩනැගිල්ලට බෝම්බ හෙළු බව ශ්‍රී ලංකා ගුවන් හමුදාව පිළිගත් අතර, අනුස්මරණ රෝහලේ ප්‍රධාන ගොඩනැගිල්ලට ද ඊට සමාන හානියක් සිදු වී තිබෙන බව සාක්ෂිකරුවෝ දුටුවෝය. පුදුකුඩිඉරිප්පු රෝහලට හා පොන්නම්බලම් අනුස්මරණ රෝහලට සම්බන්ධිතව ආරක්ෂක හමුදා විසින් මුදා හැරුණු දීර්ඝ ගුවන් විඩියෝ පටය, ඉලක්ක පිළිබඳ විස්තරාත්මක තොරතුරු වෙත බාධාවකින් තොරව ප්‍රවේශ වීම සඳහාත් නිවැරදි එල්ලයට පහර දීමටත් ඔවුන්ට තිබෙන හැකියාව පෙන්නුම් කරයි.

- **ප්‍රහාරයේ ඉලක්කය වූයේ රෝගී වූවන් හා තුවාලකරුවන් ඒකරාශි වී සිටි රෝහල් හෝ ස්ථාන එකක් හෝ වැඩි ගණනක්ය.** රෝහල් යොදා ගනු ලැබුණේ එදිරිවාදීකම් තුළ දී කිසිදු භූමිකාවක් ඉටු නොකළ රෝගීන් සිය

[99] රෝම ව්‍යවස්ථාව, 8 වගන්තිය (2)(e)(iv).

[100] 'රෝම ව්‍යවස්ථාවේ අපරාධ මූලයෝ (Rome Statute , Elements of Crimes) ', 8 වගන්තිය (2)(e)(iv), ආරක්ෂිත ඉලක්කවලට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ යුද අපරාධය. "... 1949 ජිනීවා සම්මුතිය යටතේ විශේෂයෙන් රැකවරණය සැලසෙන පුද්ගලයන් සිටින ප්‍රදේශයක් තුළ හෝ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ තනි අරමුණ සඳහා රඳවා තිබෙන පොලිස් බලකායන් සිටින ප්‍රදේශයක් තුළ සිටීම මගින් ම ප්‍රදේශය මිලිටරි ඉලක්කයක් බවට පත් නොවන" බව මූලයෝ විශේෂයෙන් සඳහන් කරති."



படிப்பகம்

ගණනකින් සමන්විත වෛද්‍ය අරමුණු සඳහා බව ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ප්‍රකාශවලින් හා සාක්ෂිකරුවන්ගේ වාර්තාවලින් තහවුරු වේ. සාක්ෂිකරුවෝ රෝහල තුළ සිට එල්ල කෙරුණු කවර හෝ වර්ගයක කිසිදු එල්ටීටීඊ වෙඩි තැබීමක් නිරීක්ෂණය නොකළ අතර, රෝහල් ආසන්නයෙහි කිසිදු බර ආයුධයකින් වෙඩි තැබීමක් සිදු වන බව ද නොදුටුවෝය. තුවාල ලැබූ සාමාජිකයන් නීත්‍යනුකූල ඉලක්කයක් නොවේ.

- **ප්‍රහාරයේ ඉලක්කය විය යුත්තේ රෝගීන් හා තුවාලකරුවන් ඒකරාශී වී සිටි, මිලිටරි ඉලක්ක නොවූ, ප්‍රහාරයේ ඉලක්කය වීමට නියමිතව තිබුණු එවැනි රෝහල් හෝ සථාන බව අපරාධකාරයා අදහස් කළේය.** මෙම රෝහල් යොදා ගනු ලබමින් තිබුණේ වෛද්‍ය අරමුණු සඳහා බව තහවුරු කරන - ගුවන් ඡායාරූප, ඍජු දෘෂ්ටි රේඛා (direct lines of sight), ජීපීඑස් සම්බන්ධීකාරක සහ එක්සත් ජාතීන්ගෙන් හා වෙනත් සංවිධානවලින් ලැබුණු අනෙකුත් තොරතුරු ඇතුළු - තොරතුරු ආණ්ඩුව හා මිලිටරි නිලධාරීන් සතුව තිබුණි. එම තොරතුරු තිබූ නමුත් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා නැවත නැවතත් ඒවාට ප්‍රහාර එල්ල කළේය. යටත් පිරිසෙයින්, පුදුකුඩිඉරිප්පු හා පොන්නම්බලම් අනුස්මරණ රෝහල් සහ යම් කලකට පුදුමාතලන් රෝහල ද ඇතුළත් වූ යුද මුක්ත කලාපයෙන් පිටත සිටින කිසි ම සිවිල් වැසියෙකුගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා වගකීම භාර නොගන්නා බවට ආණ්ඩුවේ නිලධාරීහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළෝය.

මෙම සෑම සිදුවීමක් ම පරීක්ෂාවට ලක් කළ යුතු වේ. රෝහල්වලට එල්ල වූ එක ම ප්‍රහාර ඒවා පමණක් නොවන බැවින්, වඩා වැදගත් වනුයේ පූර්ණ පරීක්ෂණයක් පැවැත්වීමය.[101] ආණ්ඩුව ජනවාරි මාසයේ දී ප්‍රදේශය "ආරක්ෂිත" බව ප්‍රකාශයට පත් කොට පළමු වන යුද මුක්ත කලාපයට යාමට සිවිල් වැසියන්, ආණ්ඩුවේ නිලධාරීන් හා මානුෂීය සේවකයන් උනන්දු කිරීමෙන් ඉතා කෙටි කලකට පසුව වල්ලිපුනම් හා උඩයාර්කඩ්ඩු රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම ඇතුළු අනෙක් ඒවා පිළිබඳ සාක්ෂි අර්බුද කණ්ඩායම සතුව ඇත.

### ඇ. සිවිල් වැසියන්ට එල්ල කළ ප්‍රහාර

---

[101] බලන්න, උදා., "Sri Lanka: Repeated Shelling of Hospitals Evidence of War Crimes," press release (පුවත්පත් නිවේදනය), Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2009 මැයි 8.

මානුෂීය මෙහෙයුම්වලට හා රෝහල්වලට එල්ල කළ මෙම චූදිත ප්‍රහාරවලට ප්‍රධාන වශයෙන් ගොදුරු වූයේ ආහාර, වාසස්ථාන හා වෛද්‍ය රැකවරණය පතා එම ස්ථානවලට ගිය දෙමළ සිවිල් වැසියන්ය. එහෙත් ඒවා හුදෙකලා සිදුවීම් නොවූයේය. සිවිල් වැසියන් සඳහා ආහාර හා වෛද්‍ය රැකවරණ සැපයීමට බාධා කිරීම් සිදු වූ හා ඒවා පිළිබඳව හිඟයන් පැවති තත්ත්වයන් යටතේ යුද මුක්ත කලාප තුන තුළ සිටි සිවිල් වැසියන්ට නැවත නැවතත් එල්ල කළ ෂෙල් වෙඩි ප්‍රහාර, වන්නිය තුළ දී ආණ්ඩුවේ සමස්ත මිලිටරි මූලෝපායේ කොටසක් වූ බව විශ්වාස කිරීම සඳහා සැලකිය යුතු පදනමක් සම්පාදනය කරන සාක්ෂි අර්බුද කණ්ඩායම රැස් කර ඇත්තේය.

සාක්ෂිවලින් ඇඟවෙන්නේ, සැලසුම ක්‍රියාත්මක කිරීමට කලින් මෙන් ම සැලසුම ක්‍රියාවට නැංවෙද්දී ද එය කර ගෙන ගියේ එහි ප්‍රතිවිපාක දැන දැන ම බවය. විශේෂයෙන් ම, එහි සිටින්නේ තමන් සිතුවාට වඩා ඉතා අඩු සිවිල් වැසියන් සංඛ්‍යාවක් බව ආණ්ඩුව නැවත නැවතත් අවධාරණය කිරීමත් ඒ වඩා අඩු සංඛ්‍යාවලට අනුව ආහාර හා වෛද්‍ය සැපයුම් වෙන් කිරීමත් අවසානයේ දී ආණ්ඩුව අල්ලා ගෙන තිබූ ප්‍රදේශ තුළට මාරු වූ සිවිල් වැසියන් සංඛ්‍යාවට ආසන්න සංඛ්‍යාවක් භාර ගැනීමට කිසි තැනක දී සූදානම් වී නොසිටීමත් යන චෝදනාවලට අනුබල දීමට සාක්ෂි පවතින්නේය. එමෙන් ම, එල්ටීටීඊය සිවිල් වැසියන්ට ඉවත් වීමට ඉඩ නොදෙන බව දැන දැන ම සිවිල් වැසියන් එල්ටීටීඊය සමග එක්තැන් කරමින් වඩ වඩා කුඩා වෙමින් පැවති යුද මුක්ත කලාප තුළට යාමට ආරක්ෂක හමුදා සිවිල් වැසියන් දිරි ගැන්වූ අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ඉවත්ව යාමට පසුබට වූයේ ආරක්ෂක හමුදාවලට පවතින බිය ද හේතු කොට ගෙනය. අවසන් වශයෙන්, සිවිල් වැසියන් සිටින ප්‍රදේශ තුළ දී බර අවි යොදා ගැනීම නතර කරන බවට හෝ " ආරක්ෂිත ගමනක්" සඳහා කාල සීමාවන් වෙන් කර දෙන බවට ප්‍රසිද්ධ හා පෞද්ගලික පොරොන්දු දෙමින් හා ඒවාට ගරු කිරීමට අසමත් වෙමින් එය යුද මුක්ත කලාපවලට නැවත නැවතත් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේය.

මෙම කල්ක්‍රියා රටාව පැහැදිලි වූයේ යුද මුක්ත කලාප තුනෙන් සිවිල් වැසියන් අවතැන් වෙද්දී නමුත්, පළමු යුද මුක්ත කලාපය පිහිටුවීමටත් පෙර සිට ම ආණ්ඩුව තම ක්‍රියාවන්හි ප්‍රතිවිපාක දැන සිටි බවට ද සාක්ෂි පවතී. උදාහරණයක් ලෙස, අවසානයේ අවසන් යුද කලාපය බවට පත් වූ ප්‍රදේශය තුළට යාමට එල්ටීටීඊයට බල කිරීමේ මූලෝපාය පිළිබඳවත් එම වෙරළබඩ තීරයේ ම සිවිල් වැසියන් සඳහා යුද

www.padippakam.com

මුක්ත කලාපයක් නිර්මාණය කිරීමේ සැලසුම් පිළිබඳවත් 2008 මැද සිට අග භාගය දක්වා කාලය තුළ ජනරාල් ජයසූරිය සාකච්ඡා කළ බවට සාක්ෂි තිබේ. ඔහු සිවිල් වැසියන් උතුරෙහි ආරක්ෂිත ස්ථානයකට ඉවත් කළ හැකි බව යෝජනා කළ නමුත්, එය කරන ආකාරය පැහැදිලි කිරීමට අසමත් විය.

මෙවැනි තත්ත්වයක් තුළ දී, විරුද්ධ බලවේග දෙකක යුද පෙරමුණු හරහා යාමට ද දෙමළ සිවිල් වැසියන්ට ඉවත් වී යාමට ඉඩ නොදීමේ එල්ටීටීඊයේ සුප්‍රකට ප්‍රතිපත්තියෙන් කෙසේ හෝ බේරීමට ද සිවිල් ජනගහනයට සිදු වනු ඇති අතර, සැබෑ වශයෙන් සිදු වූ සිදුවීම්වල දී සිදු වූයේ එයය. උතුරෙහි සිදු කරන තම මිලිටරි ක්‍රියාවන් "ප්‍රාණ ඇපකරුවන් මුදා ගැනීමක්" හෝ "මානුෂීය මෙහෙයුමක්" ලෙස ආණ්ඩුව විසින් නොකඩවා චිත්‍රණය කරනු ලැබුණත්, සිවිල් වැසියන් එල්ටීටීඊයෙන් වෙන් කිරීමේ මානුෂීය සැලසුමක් එය සතුව කිසි විටෙක නොතිබුණේය - ඒ වෙනුවට එය කළේ, ෂෙල් වෙඩි ප්‍රහාර තීව්‍ර කිරීම සහ ආහාර, ජලය හා ඖෂධ සීමා කිරීම හරහා ඔවුන්ට පිටතට ඒමට බල කිරීමට සැලසුම් කිරීමය.

සැබවින් ම, එය සිවිල් වැසියන් සම්බන්ධ තම ප්‍රතිපත්ති බොහෝ විට විස්තර කළේ මිලිටරි උපායන් පමණක් අදාළ කර ගෙනය. උදාහරණයක් ලෙස, මානුෂීය සටන් විරාමයක් සඳහා එක්සත් ජාතීන් කළ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන්, මාර්තු 23 දා ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයෙන් එක්සත් ජාතීන් වෙත යවන ලද ලිපිය මෙලෙස ප්‍රකාශ කළේය: "වෙඩි තැබීම, බිය ගැන්වීම හා අත් අඩංගුවට ගැනීම ඇතුළුව එල්ටීටීඊය විසින් දරන ලද ප්‍රයත්නයන් කිහිපයක් තිබිය දීත් කැළෑව, බිම් බෝම්බ අටවා තිබෙන ප්‍රදේශ හා මුහුද හරහා සිවිල් වැසියන් නොකඩවා ආරක්ෂක හමුදාවල පාලනය යටතේ පවතින ප්‍රදේශ තුළට පලා යන බව ද ඉස්මතු කර දැක්වීම වැදගත් වේ. ... සිවිල් වැසියන් මුදා හැරීමෙන්/පලා යාමෙන් එල්ටීටීඊයට ආහාර හා ඖෂධ අහිමි කෙරෙනු ඇති බවට මෙන් ම පහර දෙමින් සිටින ශ්‍රී ලාංකික හමුදාවන්ට එල්ටීටීඊය නිරාවරණය කෙරෙනු ඇති බවට ද කිසි ම සැකයක් නොමැත. එම නිසා, දැන් කිසි යම් අදියරක දී එල්ටීටීඊය මත පවතින ග්‍රහණය ලිහිල් වුව හොත්, ප්‍රදේශයෙන් පලා යමින් සිටින සිවිල් වැසියන්ට බාධා කිරීමට සහ තම ස්ථාන ශක්තිමත් කර ගැනීමට හා බලාත්කාරී බඳවා ගැනීම් ඉහළ නැංවීමට ඔවුන්ට ප්‍රමාණවත් අවස්ථා ලැබෙනු ඇත."

ආණ්ඩුවේ වඩ වඩා ආක්‍රමණකාරී වන මූලෝපායෙන් ඇති වන අවදානම් පිළිබඳව, 2009 මුල දී ඊට අනතුරු අඟවනු ලැබුණි. එක්සත් ජාතීන් විසින් විදේශ කටයුතු



படிப்பகம்

අමාත්‍යාංශය වෙත ජනවාරි 13 දා යවන ලද ලිපියක් මෙලෙස සඳහන් කළේය: "වසර ආරම්භ වූ අවස්ථාවේ සිට, ෂෙල් වෙඩි ප්‍රහාරවල හා ගුවනින් කරන ලද බෝම්බ හෙළීම්වල ප්‍රතිඵලයක් ලෙස සිවිල් වැසියන් තුවාල ලැබීම හා මරණයට පත් වීම පිළිබඳව අපට වාර්තා ගණනාවක් ලැබී ඇත." ලිපිය නව සිදුවීම් දෙකක් පිළිබඳව, එනම් ජනවාරි 13 දා පුදුකුඩිඉරිප්පු රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම හා විශ්වමඩු ප්‍රදේශය තුළ සිදු කරන ලද ප්‍රහාරයක් පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කළේය. එය තව දුරටත් මෙලෙස පැවසුවේය:

> ආණ්ඩුවේ බලකායන් ඉදිරියට යද්දී හා යුද පෙරමුණු වේගයෙන් එහා මෙහා වෙද්දී සිවිල් වැසියන්ට අනර්ථයක් වීමේ අවදානම වැඩි වන්නේය. ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ ශ්‍රී ලංකා ආණ්ඩුවට තිබෙන බැඳීම් ගෞරවයෙන් නැවත සිහිපත් කර දීම සඳහා මෙම අවස්ථාව යොදා ගත යුතු බවට [එක්සත් ජාතීන්] අපේක්ෂා කරයි. සන්නද්ධ ගැටුම් තත්ත්වයන්හි දී සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සඳහා සියලු පරිශ්‍රමයන් දැරිය යුතු බවට ජිනීවා සම්මුතියේ 3 වන පොදු වගන්තිය හා ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය ඉල්ලා සිටියි. එම නිසා, සිවිල් වැසියන් පදිංචි වී සිටින ප්‍රදේශ තුළට ප්‍රහාර එල්ල කිරීමෙන් වැළකීමට [එක්සත් ජාතීන්] ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් තරයේ ඉල්ලා සිටියි.

ආණ්ඩුව ජනවාරි 15 දා ප්‍රතිචාර දැක්වූයේය: "මෙම සිදුවීම්වලට කිසි යම් ම හෝ සම්බන්ධයක් ඇති බව ශ්‍රී ලංකා හමුදාව ඒකාන්තයෙන් ම ප්‍රතික්ෂේප කරයි. ... එල්ටීටීඊ ත්‍රස්තවාදයේ වන්නි කලාපය නිදහස් කර ගැනීමේ ඉලක්කයෙන් මේ වන විට කර ගෙන යන මෙහෙයුම් තුළ දී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව 'කිසිදු සිවිල් වැසියෙකුට හානි නොකිරීමේ' ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව නැවත නැවතත් ප්‍රකාශ කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය කැමතිය." මාධ්‍ය, එක්සත් ජාතීන් හා වෙනත් සංවිධාන දිගින් දිගට ම සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය වීම හා තුවාල ලැබීම පිළිබඳ සංඛ්‍යා වාර්තා කළ ද ආණ්ඩුව කිසි විටෙක තම "කිසිදු සිවිල් වැසියෙකුට හානි නොකිරීමේ" ප්‍රතිපත්තියෙන්[102] පසුබැස්සේ නැත.

**1. පළමු වන "යුද මුක්ත කලාපය"**

---

[102] බලන්න, උදා., "SL's UK High Commissioner protests over UK MP's comment," 2010 මාර්තු 10, www.priu.lk.

www.padippakam.com

ජනවාරි 21 දා පළමු වන යුද මුක්ත කලාපය නිල වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන විට, වන්නිය තුළ සිටින මුළු ජනගහනය 300,000කට වඩා වැඩි විය හැකි බවට විවිධ මූලාශ්‍රවලින් ලැබුණු තොරතුරු ආණ්ඩුව සතුව තිබුණි.[103] ගැටුම් තත්ත්වයන්හි දී ජනගහන සංඛ්‍යා සම්බන්ධයෙන් හැම විට ම යම් අවිනිශ්චිතතාවක් පවතින නමුත්, ආණ්ඩුව යොදා ගත්තේ බරපතළ අවතක්සේරුවකි. ඉහළ සංඛ්‍යා පිළිබඳව ආණ්ඩුවට තිබෙන දැනුම සහ ජාත්‍යන්තර හා දෙමළ ප්‍රවෘත්ති මූලාශ්‍රවලින් තමන්ට තොරතුරු ලැබෙමින් තිබෙන (හා තමන් ඒවා ප්‍රතික්ෂේප කරමින් සිටින) බව, ආරක්ෂක අමාත්‍යාංශයේ ජනවාරි 31 දා පුවත් බුලටිනය තහවුරු කළේය:

> යුද මුක්ත කලාපය තුළ සිටින සිවිල් වැසියන් සංඛ්‍යාව මිලියන කාලක් ඉක්මවා අතිශයෝක්තියට නැංවීම සඳහා විදේශීය ප්‍රවෘත්ති ඒජන්සි හා "ශ්‍රී ලාංකික ගොදුරු ව්‍යාපාරයේ" ගෝත්‍රික මාධ්‍ය ආවතේවකාරයන් නැවත නැවතත් ප්‍රයත්න දරා ඇතත්, බිම් මට්ටමේ මූලාශ්‍ර හා විශ්වාස කටයුතු තොරතුරු උපුටා දක්වමින් ආරක්ෂක නිරීක්ෂකයන් ස්ථිර ලෙස ප්‍රකාශ කොට ඇත්තේ, උපරිම තක්සේරුවක් කළ හොත්, සැබෑ සංඛ්‍යාව ජනයා 75,000-100,000ත් ආසන්නයේ උච්චාවචනය විය හැකි බවය.[104]

මෙම ප්‍රකාශය සඳහන් කරන්නේ යුද මුක්ත කලාපය තුළ සිටින ජනගහනය පිළිබඳව පමණක් වන අතර, ආණ්ඩුව දිගින් දිගට ම මුළු වන්නිය සඳහා ම එම සංඛ්‍යාව

---

[103] 2008 සැප්තැම්බර් මාසය වන විට, ස්ථිර පදිංචිකරුවන් හා අවතැන් වූ පුද්ගලයන් ඇතුළුව වන්නිය තුළ 400,000කට වැඩි ජනයා ජීවත් වෙමින් සිටි බව විශ්වසනීය මූලාශ්‍ර විසින් ආණ්ඩුවට දැනුම් දෙනු ලැබුණු බවටත් ආණ්ඩුව එම සංඛ්‍යාව සම්බන්ධයෙන් මතභේදයක් ඇති කර නොගත් බව හා ඒ අනුව ආණ්ඩුවේ සේවාවන් වෙන් කළ බවටත් අර්බුද කණ්ඩායම සතුව සාක්ෂි ඇත්තේය. යුද පෙරමුණු හරහා ගොස් ආණ්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශවලට මාරු වීමට ඇතැම් සිවිල් වැසියන් සමත් වුවත්, ජනවාරි මාසයේ අග වන විට අනෙක් අය ඝාතනය කර තිබූ අතර, පළමු වන යුද මුක්ත කලාපය පිහිටුවන විට වන්නිය තුළ 300,000කට වඩා බෙහෙවින් වැඩි සිවිල් වැසියන් සංඛ්‍යාවක් සිටි බවටත් අර්බුද කණ්ඩායම විශ්වාස කරයි. බොහෝ ජාත්‍යන්තර මානුෂීය සංවිධාන තක්සේරු කළේ අභ්‍යන්තර අවතැන් වූවන් 250,00ක් සිටින බවටය. බලන්න, උදා., "Sri Lanka: 250,000 people in war zone need food," WFP (ලෝක ආහාර වැඩ සටහන), 2009 පෙබරවාරි 6.

[104] "LTTE clamps on civilian outflow: Mounts artillery batteries inside No-fire zones – Mullaittivu," 2009 ජනවාරි 31, www.defence.lk/new.asp?fname=20090130_F01.



படிப்பகம்

www.padippakam.com

සම්පාදනය කළේය.[105] අනතුරුව එය මෙම සාවද්‍ය සංඛ්‍යාව මත පදනම් වී ආහාර හා වෛද්‍ය සැපයුම් පිළිබඳව තීන්දු ගත් අතර, ප්‍රතිඵලය වූයේ දරුණු හිඟයන් ඇති වීමය. එක්සත් ජාතීන් ඇතුළු සංවිධාන ගණනාවක්, ප්‍රසිද්ධ හා පෞද්ගලික ප්‍රකාශ හරහා එම හිඟයන් පිළිබඳ තොරතුරු ආණ්ඩුවට හා මිලිටරියට දැනුම් දුන්නේය.

සිවිල් ජනගහනයේ ප්‍රමාණය පිළිබඳ තම ප්‍රකාශවල ඇලී සිටින අතරතුර, ආණ්ඩුව පළමු වන යුද මුක්ත කලාපය තුළ පිහිටි නානාවිධ සිවිල් ඉලක්කවලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම දිගට ම කර ගෙන ගියේය. මීට ඇතුළත් වූයේ, සුදන්දිරපුරම් හන්දිය ආසන්නයේ පිහිටි ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථානය සහ වල්ලිපුනම් හා උඩයාර්කඩ්ඩු රෝහල් පමණක් නොවේ. පෙබරවාරි මාසයේ මුල දී, දේවිපුරම් ප්‍රජා ශාලාව හා සිවිල් වාසස්ථාන පොකුරු වැනි වෙනත් සැලකිය යුතු ස්ථාන ද ඊට අඩංගු වූයේය. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූයේ ආරක්ෂක හමුදාවල යුද පෙරමුණුවලට පසුපසින් බවට හා ඒවා වැදුණේ සිවිල් වැසියන්ගේ බංකරවලට, අගල්වලට හා කුඩාරම්වලට බවට, සිවිල් වැසියන් ඝාතනයට හා තුවාලවලට ලක් වූ බවට සහ ඔවුන්ගේ ඉතිරි වී තිබූ සැපයුම් විනාශ වූ බවට අර්බුද කණ්ඩායම සතුව නානාවිධ විශ්වසනීය වාර්තා ඇත. මෙම සිදුවීම්වල දී, සාක්ෂිකරුවන් කිසි ම එල්ටීටීඊ කාලතුවක්කුවක් හෝ තමන් සිටින ස්ථානවලට ආසන්න වෙනත් ප්‍රහාරක ස්ථාන නුදුටු අතර, ආණ්ඩුවේ මිනිසුන් රහිතව පියාසාර කරන ගුවන් යානා අහසෙහි පියාසර කරන ආකාරය ඔවුහු නිරන්තරයෙන් දුටුවෝය. මෙම ප්‍රහාර හේතුවෙන් සිවිල් වැසියන්ට සිදු වූ හානි, බොහෝ මූලාශ්‍ර විසින් ආණ්ඩුවට ප්‍රසිද්ධියේ හා පෞද්ගලිකව වාර්තා කරනු ලැබුණි.

## 2. දෙ වන "යුද මුක්ත කලාපය"

දෙ වන යුද මුක්ත කලාපය තුළ (පෙබරවාරි මැද භාගයේ සිට මාර්තු මුල දක්වා) පැවති තත්ත්වය ද සමාන රටාවක් ගත් නමුත්, එල්ටීටීඊය හා සිවිල් ජනගහනය වර්ග කිලෝමීටර් දහහතරක් පමණක් වූ බෙහෙවින් කුඩා ප්‍රදේශයකට කොටු කරමින් -

[105] "The actual number of civilians trapped in the Vanni is less than 100,000" ("වන්නිය තුළ කොටු වී සිටින සැබෑ සිවිල් වැසියන් සංඛ්‍යාව 100,000කට වඩා අඩුය"). "Tell the whole truth' says Secretary Defence," 2009 පෙබරවාරි 7, (අනුග්‍රහය: *Daily News* (ඩේලි නිවුස්), අවසන් වශයෙන් වෙනස් කිරීම් කරන ලද්දේ 2009 පෙබරවාරි 26), www.defence.lk/new.asp?fname=20090207_01.



படிப்பகம்

www.padippakam.com

බොහෝ සිවිල් වැසියන් සිටියේ නිව්යෝක් නුවර මැන්හැට්න්හි සෙන්ට්‍රල් පාක් උද්‍යානය ප්‍රමාණයේ තීරුවක් තුළය - ආරක්ෂක හමුදා ඉදිරියට ඇදෙන විට, ප්‍රතිවිපාක බෙහෙවින් දරුණු වූයේය. වන්නිය තුළ බිම් මට්ටමේ මූලාශ්‍ර විසින්, ඉතිරි වී තිබෙන ප්‍රදේශය තුළ සිටින ජනගහනය පවුල් 81,000ක් හෝ ජනයා 330,000ක් බවට පෙබරවාරි හා මාර්තු මාසවල දී කරනු ලැබුණු දැනුම් දීම් නොතකා ආණ්ඩුව අඛණ්ඩව ජනගහනය අඩු කර කියූ අතර, අප්‍රේල් මුල දී 70,000කට ආසන්න තක්සේරු ඉදිරිපත් කළේය.[106]

සිවිල් වැසියන් සම්බන්ධ තත්ත්වයන්ගේ පිරිහීම පිළිබඳව කොළඹ සිටින නිලධාරීන්ට ද දැනුම් දෙනු ලැබුණේය: ජනයාගෙන් බොහෝ දෙනෙකු ජීවත් වූයේ ගස්වල යට හා ඉටි රෙදි යෙදූ තාවකාලික වාසස්ථානවලය; දරුණු ඖෂධ හිඟයක් පැවති අතර, විශේෂයෙන් නිර්වින්දක, ප්‍රතිජීවක, වේදනා නාශක හා ධමනි පෝෂක හිඟ වූයේය. ආහාර හිඟයක් පැවති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දහතුන් දෙනෙක් හාමතින් මිය ගියෝය. එමෙන් ම, හානි සිදු වූ සිවිල් වැසියන්ගේ සංඛ්‍යාව නොකඩවා ඉහළ ගියේය. දෙ වන යුද මුක්ත කලාපය තුළ සිටි ඇසින් දුටු සාක්ෂිකරුවෝ මෙම තත්ත්වයන් තහවුරු කර ඇති අතර, ෂෙල් වෙඩි ප්‍රහාර හේතුවෙන් සිදු වූ හානි, ආහාර හා වෛද්‍ය රැකවරණ හිඟය හේතුවෙන් සිදු වූ මරණ හා පීඩාවන් පිළිබඳව දුසිම් ගණනක් උදාහරණ සැපයුවෝය.

එහෙත් මෙම තොරතුරු සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිචාරය වූයේ, සැපයුම් වැඩි කිරීම නොව, වඩා විශාල සිවිල් වැසියන් සංඛ්‍යාවකට සැපයුම් එවීමේ අවශ්‍යතාව අවධාරණය කළ අයට තර්ජනය කිරීමය. මාර්තු මාසයේ ලියූ ලිපියක දී ආණ්ඩුව මෙලෙස අනතුරු ඇඟවූයේය:

---

[106] "UAVs show frantic Tiger attempts to bury weapons," *The Nation* (ද නේෂන්), 2009 පෙබරවාරි 15, www.nation.lk/2009/02/15/militarym.htm ("no more than 75,000" ("75,000කට වඩා වැඩි නොවේ")); "Foreign Minister briefs diplomatic community on the current situation in the North," 2009 පෙබරවාරි 18, www.defence.lk/PrintPage.asp?fname=20090218_07 ("around 70,000" ("70,000කට ආසන්නය")); "Troops manoeuvring to open main road access to NFZ; hostage rescue mission continues," 2009 අප්‍රේල් 19, www.defence.lk/new.asp?fname=20090419_03 (70,000කට ආසන්නය).



படிப்பகம்

www.padippakam.com

> විශේෂයෙන් ම අභ්‍යන්තර අවතැන් වූවන් සම්බන්ධයෙන්, ඔබ විවිධ මූලාශ්‍ර වෙත තොරතුරු සපයන විට, ඒවා සැබෑ ඒවා විය යුතු බවත් කිසි ම මූලාශ්‍රයකින් එය මතභේදයට ලක් නොවිය යුතු බවත් කරුණාකර සඳහන් කර ගන්න. එමෙන් ම, විශේෂයෙන් ම අභ්‍යන්තර අවතැන් වූවන් සම්බන්ධයෙන්, ඔබ යම් මූලාශ්‍රයක් වෙත වැරදි තොරතුරු ලබා දුන හොත්, ආණ්ඩුව ඔබට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට පසුබට නොවන බවත් ඔබ සිත තබා ගත යුතුය.

ආණ්ඩුව නිර්වින්දක හා වෙනත් තීරණාත්මක වෛද්‍ය ද්‍රව්‍ය යැවීම ද ප්‍රතික්ෂේප කළ අතර, පුදුමාතලන් හා මුල්ලිවයික්කාල් රෝහල්වල වෛද්‍ය කාර්ය මණ්ඩලය වඩ වඩා තම සැත්කම් කරමින් සිටියේ රෝගීන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා නිර්වින්දක නොමැතිවය. මෙම වෛද්‍ය ප්‍රතිකාරවලින් බොහෝ ඒවා අවශ්‍ය වූයේ, ආණ්ඩුව සිවිල් වැසියන්ගේ තාවකාලික වාසස්ථානවලට හා බංකරවලට නොකඩවා කාලතුවක්කු හා අනෙක් ප්‍රහාර එල්ල කරමින් සිටි බැවින්ය. කාන්තාවන්, ළමයින් හා වැඩිහිටියන් ඝාතනයට හා තුවාල වීමට ගොදුරු වූ එවැනි ප්‍රහාර ගණනාවක් සම්බන්ධයෙන් අර්බුද කණ්ඩායම සතුව ඇසින් දුටු සාක්ෂි හා වෙනත් සාක්ෂි ඇත්තේය. ප්‍රමාණවත් ආහාර හා වෛද්‍ය රැකවරණය සඳහා අවසර දීම ප්‍රතික්ෂේප කිරීමට අමතරව, ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් සැපයුම් ගෙන යනු ලැබීමට හා තුවාලකරුවන් ඉවත් කරනු ලැබීමට ද ආණ්ඩුව බාධා කළේය. තොටුපළක් සඳහා අවසර දී තිබුණ ද ප්‍රවාහනය කිරීමට එකඟ වී තිබූ වේලාවන්හි දී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව බොහෝ විට ෂෙල් වෙඩි ප්‍රහාරවලට හා සටන්වලට මුහුණ දුන් හ.

අප්‍රේල් 20-21 දිනවල දී ආරක්ෂක හමුදා කලපුව තරණය කළ පසු හා යුද මුක්ත කලාපය බෙදූ පසු, වන්නියෙහි ජනගහනය පිළිබඳ ආණ්ඩුවේ කතාව වෙනස් වූයේය. ආරක්ෂක හමුදා ඉදිරියට යාමට පෙර එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාර අතිශයින් තදබල ඒවා වූ අතර, සිවිල් වැසියන් බොහෝ දෙනෙක් ඝාතනයට ලක් වූවෝය. එහෙත් අප්‍රේල් මාසයේ දින කිහිපයක් තුළ දී, ආණ්ඩුව අල්ලා ගත් ප්‍රදේශවලට මාරු වීමට සිවිල් වැසියන් 100,000කට පමණ ඉඩ දීම සඳහා අවස්ථාව නිර්මාණය කිරීම මගින්, ජනගහනය පිළිබඳව ආණ්ඩුව කළ ප්‍රකාශ - අප්‍රේල් 27 දා වන විට එය යුද මුක්ත කලාපය තුළ 15,000 සිට 20,000 දක්වා ගණනකට පහත වැටුණි[107] - වඩ වඩාත්

---

[107] "The humanitarian mission will continue," 2009 අප්‍රේල් 27, www.defence.lk/new.asp?fname=20090427_08 ("the remaining 15,000 to 20,000 people held hostage" ("ඉතිරි 15,000 සිට 20,000 දක්වා ජනයා ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගැනෙති")).



படிப்பகம்

තහවුරු කළ නොහැකි තත්ත්වයකට පත් වූයේය. මැයි 1 දාට පසුව, යුද මුක්ත කලාපය තුළ සිට ආණ්ඩුවේ පාලනය යටතේ පැවති කඳවුරු වෙත තවත් සිවිල් වැසියෝ 100,000කට ආසන්න සංඛ්‍යාවක් පිවිසුණෝය.

සිවිල් වැසියන්ට සිදු වන හානි සීමා කරන ලෙස එල්ල වන ජාත්‍යන්තර පීඩනය වර්ධනය වන විට, "බර අවි" යොදා ගැනීම නතර කරන බවට ආණ්ඩුව ප්‍රසිද්ධ හා පෞද්ගලික  කැපවීම් මාලාවක් කළේය. මෙම පොරොන්දු කඩනු ලැබුණි. නැවත ලබා දෙන ලැබුණි. අනතුරුව නැවත කඩනු ලැබුණි.[108] 2009 අප්‍රේල් 23 දා, හට පිරිස් දෙ වන යුද මුක්ත කලාපය තුළට පිවිසුණු වහා ම ගෝඨාභය රාජපක්ෂ බීබීසීයට පැවසුවේ, "ඉතිරි සිවිල් වැසියන් මුදා ගන්න අපි ඉතා සෙමින් යුද මුක්ත කලාපයෙන් දකුණට යමින් සිටිනවා. අපේ හට පිරිස් ඉහළ වෙඩි බලයක් යොදා ගන්නේ නැහැ, ඔවුන් යොදා ගන්නේ තුවක්කු හා පෞද්ගලික ආයුධ පමණයි."[109] එහෙත්, බර අවි වැඩි වශයෙන් යොදා ගත් බව වාර්තා වූ පසුව, අප්‍රේල් 27 දා ශ්‍රී ලංකාවේ ජනාධිපති ලේකම් කාර්යාලය මෙලෙස ප්‍රකාශ කළේය: "සිවිල් වැසියන්ට හානි සිදු විය හැකි බර අවි කාණ්ඩයේ තුවක්කු, සටන් ගුවන් යානා හා ගුවන් ආයුධ යොදා ගැනීම නතර කරන ලෙස අපගේ ආරක්ෂක හමුදාවලට උපදෙස් දී ඇත."[110] යොදා නොගන්නා බවට ආණ්ඩුව කළ සහතික කිරීම්වලින් පසුවත් බර අවි නිතිපතා අඛණ්ඩව යොදා ගත් බවට ප්‍රමාණවත් තරම් ඇසින් දුටු සාක්ෂි පවතින්නේය.[111]

### 3. අවසන් "යුද මුක්ත කලාපය"

මැයි 8 දා ආණ්ඩුව ප්‍රකාශයට පත් කළ අවසන් යුද මුක්ත කලාපය, වර්ග කිලෝමීටර් කිහිපයකින් පමණක් සමන්විත වූවකි. ඒ තුළ සිවිල් වැසියෝ 100,000කට ආසන්න

---

[108] "Sri Lanka admits bombing safe zone," Al Jazeera (අල් ජසීරා), 2009 මැයි 2.

[109] "Colombo rejects UN civilian plea," BBC (බීබීසී), 2009 අප්‍රේල් 23.

[110] "Sri Lanka: Government admission shows need for UN inquiry," press release (පුවත්පත් නිවේදනය), Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2009 අප්‍රේල් 27.

[111] අප්‍රේල් මාසයේ අග දී යුද මුක්ත කලාපය තුළට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම නතර කිරීම පිළිබඳ නිවේදනය සඳහා පෙලඹුණේ, ඉන්දියාවේ මහ මැතිවරණයට කලින් තමිල් නාඩුව තුළ ආතතීන් නිෂ්ක්‍රිය කරන ලෙස ඉන්දියානු ආණ්ඩුව කල ඉල්ලීම හේතුවෙන් බවට ආණ්ඩුවේ නිලධාරීන් අඟවා ඇත. "Winning wars: political will is the key," *Indian Defence Review* (ඉන්ඩියන් ඩිෆෙන්ස් රිවීව්), කලින් සඳහන් කර ඇත.

www.padippakam.com

සංඛ්‍යාවක් ද ඉතිරි එල්ටීටීඊ සාමාජිකයන් සිටියේ නම් ඔවුහු ද සිටියෝය. ඊළඟ දින දහය තුළ දී, මුළු ගැටුම තුළ දී දක්නට ලැබුණු වඩාත් ම තදබල ෂෙල් වෙඩි ප්‍රහාර හා සටන් සිදු වූයේය. සාක්ෂිකරුවන් අතිවිශාල විනාශයක් පිළිබඳ සිදුවීම් හා සිවිල් වැසියන් විඳි පීඩාවන් පිළිබඳ සිදුවීම් විස්තර කර ඇත. ආරක්ෂක හමුදා කලපුව හරහා බටහිර සිට, ගුවනේ සිට හා සාගරයේ සිට වෙඩි තබමින් සිටියේය.

බංකර තිබූ සිවිල් වැසියන් දින ගණනාවක් තිස්සේ ඒවා තුළ කොටු වී සිටි අතර, ආහාර පිසීම හෝ ආහාර හෝ ජලය ලබා ගැනීම සඳහා එළියට යාමට ඔවුන්ට නොහැකි විය. මැයි 14 දා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව නිවේදනය කළේ, අඛණ්ඩව සිදු වන දරුණු සටන් හේතුවෙන් තුන් වන දිනටත් ඔවුන්ට තුවාලකරුවන්ගෙන් කිසිවෙකු ඉවත් කිරීමට නොහැකි වී ඇති බවය.[112] ආරක්ෂක හමුදා ප්‍රදේශය අල්ලා ගැනීමෙන් පසු ද දිවි බේරා ගැනීමට හා නැගී සිටීමට තරම් වාසනාවන්ත වූ අය, සිවිල් වැසියන් - කාන්තාවන්, ළමයින්, වැඩිහිටියන් හා පිරිමින් - සිය ගණනක්, ඇතැම් විට දහස් ගණනක් තුවාල ලබා හා මරණයට පත් වී භූමියෙහි වැතිරී සිටින ආකාරය දුටුවෝය. තවත් බොහෝ සංඛ්‍යාවක් ඝාතනය වන්නට ඇති බවට හෝ බංකර තුළ පණ පිටින් වැළලෙන්නට ඇති බවට හෝ වෛද්‍ය ප්‍රතිකාර නොමැතිව මිය යාමට ඉඩ හරිනු ලබන්නට ඇති බවට විශ්වාස කෙරෙන්නේය.

"... සිවිල් ජනගහනයට එරෙහිව, හෝ එදිරිවාදීකම්වල ඍජු කොටස්කරුවන් නොවන සිවිල් පුද්ගලයන්ට එරෙහිව හිතාමතා ප්‍රහාර එල්ල කිරීම ම යුද අපරාධයක් වේ.[113] යුද මුක්ත කලාප තුළ නැවත නැවතත් සිදු වූ ප්‍රහාර පිළිබඳව අර්බුද කණ්ඩායම රැස් කර ගෙන ඇති සාක්ෂිවලින්, මෙම අපරාධ සිදු කළේ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්හි පුද්ගලයන් බව විශ්වාස කිරීමට සැලකිය යුතු පදනමක් සැපයෙන්නේය. එවැනි පුද්ගලයන් මෙන් ම චූදිත අපරාධයන්ට අණ කළ හෝ සහාය දුන් හෝ ඉහළ පෙළේ මිලිටරි හෝ සිවිල් නිලධාරීන් ලෙස වගකිව යුතු අය සාපරාධී ලෙස වගකීම දරනු

---

[112] "Sri Lanka: humanitarian assistance can no longer reach civilians," ICRC ජාත්‍යන්තර රතු කුරුස කමිටුව), 2009 මැයි 14, www.icrc.org/web/eng/siteeng0.nsf/html/sri-lanka-news-140509.

[113] රෝම ව්‍යවස්ථාව, 8 වගන්තිය (2)(e)(i).



படிப்பகம்

www.padippakam.com

ඇත. පෙර උපකොටස් තුළ දී සාකච්ඡා කළ සාක්ෂිවලින් බොහෝ ඒවා මෙම අපරාධයේ ප්‍රධාන මූලයන්ට අදාළ වන්නේය.[114] සාරාංශ වශයෙන් කියතොත්:

- **අපරාධකාරයා ප්‍රහාරයක් එල්ල කළේය.** පස් මාසයක් තුළ දී, ආරක්ෂක හමුදා බර අවිවලින් වෙඩි තබා යුද මුක්ත කලාපය තුළ සිටි සිවිල් වැසියන්ට හෝ එහි පැවති සිවිල් ඉලක්කවලට වැදුණු අවස්ථා දුසිම් ගණනක් සාක්ෂිකරුවන් විස්තර කර ඇත. මෙම සිදුවීම්වලින් බොහෝ ගණනක දී, ආසන්නතාව සැලකිල්ලට ගන්නා විට එල්ටීටීඊය බර අවිවලින් මෙම ඉලක්කවලට වෙඩි තැබීම භෞතික වශයෙන් සිදු විය නොහැකි දෙයක් වන්නේය. තමන්ගේ ම පවුල් හා ආධාරකරුවන් ඉලක්ක කර නොගැනීම සඳහාත්, යුද මුක්ත කලාපයෙන් ඉවත් වී යාමේ වුවමනාව ඇති කිරීමට ඊට වඩා වැඩි හේතුවක් ඔවුන්ට ලබා නොදීම සඳහාත්, එල්ටීටීඊයට බලගතු පෙලඹවීම් පැවතුණි.

- **ප්‍රහාරයේ ඉලක්කය වූයේ සිවිල් ජනගහනයක් හෝ එදිරිවාදීකම් තුළ දී ඍජු භූමිකාවක් ඉටු නොකළ සිවිල් පුද්ගලයන්ය.** මෙම ප්‍රහාරයන්හි දී ඝාතනයට හෝ තුවාලවලට ලක් වූ ජනයා අත ආයුධ නොතිබූ බවට හා ආරක්ෂක හමුදාවල මිලිටරි මෙහෙයුම්වලට අහිතකර ලෙස බලපාන ක්‍රියාවන්හි ඔවුන් නොයෙදුණු බවට සාක්ෂිකරුවන් සාක්ෂි සපයා ඇත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්, නිසි වාසස්ථානයක් නොමැතිව මාස ගණනාවක් තිස්සේ පලා යමින් සිටි ළමයින්, කාන්තාවන්, තුවාලකරුවන් හා මන්දපෝෂණයට ගොදුරු වූ වැඩිහිටියෝ වූවෝය.

- **ප්‍රහාරයේ ඉලක්කය විය යුත්තේ සිවිල් ජනගහනයක් හෝ එදිරිවාදීකම් තුළ ඍජු භූමිකාවක් ඉටු නොකළ සිවිල් පුද්ගලයන් බව අපරාධකාරයා අදහස් කළේය.** ආණ්ඩුව හා මිලිටරිය යුද මුක්ත කලාප තුළට යාමට සිවිල් ජනගහනය යොමු කර තිබුණේය. ගුවන් ඡායාරූප, දෘෂ්ටි රේඛාව හා එක්සත් ජාතීන්ගෙන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවෙන් හා වෙනත් සංවිධාන ඇතුළු නානාවිධ මූලාශ්‍රවලින් ලැබුණු දැනුමෙන් තම ප්‍රහාරයන්හි ඉලක්කවල සිවිල් ස්වභාවය පිළිබඳව ඔවුහු දැනුවත්ව සිටියෝය. මේවා එක් වතාවක් පමණක් සිදු වූ ෂෙල් වෙඩි ප්‍රහාර පිළිබඳ සිදුවීම් නොවූයේය. එය මාස

---

[114] රෝම ව්‍යවස්ථාවේ අපරාධ මූලයෝ (Rome Statute , Elements of Crimes) 8 වගන්තිය (2)(e)(i), සිවිල් වැසියන්ට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ යුද අපරාධය.



படிப்பகம்

ගණනාවක් තිස්සේ පැවති රටාවක් වූ අතර, ඔවුන් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරමින් සිටින්නේ සිවිල් වැසියන්ට බව ආණ්ඩුවට හා ආරක්ෂක හමුදාවලට නැවත නැවතත් පවසනු ලැබුණි. එහෙත්, නොකඩවා එසේ කර ගෙන යාමට නියම කර ගෙන සිටි ආණ්ඩුව හා ආරක්ෂක හමුදා, තමන් එසේ නොකළ බව සරලව කියා සිටියේය.

මෙම චූදිත කල්ක්‍රියා මාලාව හා ඊට වගකිව යුතු පුද්ගලයන් පරීක්ෂාවට ලක් කළ යුතුය. ඒවා මෑත අවුරුදුවල දී ලෝකය දැක ඇති ඇතැම් නරක ම මානුෂීය පීඩාවන්ට හේතු වූ අතර, ජාත්‍යන්තර මානුෂීය නීතියට පැහැදිලි අභියෝගයක් එල්ල කරන්නේය. මානුෂීය මෙහෙයුම්වලට හා රෝහල්වලට එල්ල කළ බවට චූදිත ප්‍රහාර ඇතුළුව සිවිල් වැසියන්ට ආහාර හා වෛද්‍ය රැකවරණ සැපයීම සම්බන්ධයෙන් ආණ්ඩුව කළ බවට චූදිත ක්‍රියාවන් වෙන වෙන ම සලකා බැලීමට යෝග්‍යය. ඒවා ඉහත විස්තර කළ චූදිත ක්‍රියාවන් තවත් උග්‍ර කරනවා පමණක් නොව, අපරාධ වගකීම සඳහා පැහැදිලි පදනමක් සපයනවා ද විය හැකි අතර, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් පුද්ගලයන් වගකිව යුතු ද යන ප්‍රශ්නය මතු කරනවා ද විය හැකිය.[115]

---

115 රෝම ව්‍යවස්ථාව "මනුෂ්‍යත්වයට එරෙහි අපරාධය" නිර්වචනය කරන්නේ, "ප්‍රහාරය පිළිබඳව දැනුවත්ව, කවර හෝ සිවිල් ජනගහනයකට එරෙහිව එල්ල කරන පුළුල්ව පැතිරුණු හෝ ක්‍රමානුකූල ප්‍රහාරයක කොටසක් ලෙස සිදු කරනු ලබන පහත දැක්වෙන ඕනෑ ම ක්‍රියාවක්" ලෙසයඃ "(අ) ඝාතනය; (ආ) සමූලෝත්පාඨනය; (ඇ) වහල් භාවයට පත් කිරීම; (ඈ) ජනගහනය රටින් නෙරපීම හෝ බලාත්කාරයෙන් පැවරීම; (ඉ) ජාත්‍යන්තර නීතියේ මූලික නියමයන් උල්ලංඝනය කරමින් සිර ගත කිරීම හෝ වෙනත් දරුණු ආකාරයකින් කායික නිදහස අහිමි කිරීම; (ඊ) වධහිංසා පැමිණවීම; (උ) ලිංගික දූෂණය, ලිංගික වහල් භාවය, බලාත්කාරයෙන් ගණිකා වෘත්තියෙහි යෙදවීම, බලාත්කාරයෙන් ගැබ් ගැන්වීම, බලාත්කාරයෙන් වඳ භාවයට පත් කිරීම හෝ ඒ හා සමාන බරපතළ බවකින් යුක්ත ලිංගික ප්‍රචණ්ඩත්වයේ වෙන යම් ආකාර; (ඌ) 3 වන ඡේදයේ නිර්වචනය කොට ඇති ආකාරයට දේශපාලනික, වාර්ගික, ජාතික, ජනවාර්ගික, සංස්කෘතික, ආගමික, ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ පදනම මත හෝ මෙම ඡේදය තුළ සඳහන් වන ඕනෑ ම ක්‍රියාවක් හෝ අධිකරණයේ අධිකරණ බලය තුළ අපරාධයක් වන ඕනෑ ම අපරාධයක් සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතිය යටතේ අවසර දිය නොහැකි බව විශ්වීය වශයෙන් පිළිගන්නා වෙනත් පදනම් මත හඳුනා ගත හැකි කවර හෝ කණ්ඩායමකට හෝ සමූහයකට එරෙහිව වධහිංසා කිරීම; (එ) බලාත්කාරයෙන් පුද්ගලයන් අතුරුදන් කිරීම; (ඒ) වර්ණ භේදය පිළිබඳ අපරාධය; (ඓ) හිතාමතා විශාල පීඩාවක් හෝ ශරීරයට හෝ මානසික හෝ ශාරීරික සෞඛ්‍යයට බරපතළ අනර්ථයක් සිදු කරන ඒ හා සමාන ස්වභාවයක් ගන්නා වෙනත් අමානුෂික ක්‍රියා." 7 වගන්තිය.

## IV. එල්ටීටීඊයේ ක්‍රියා

අර්බුද කණ්ඩායම රැස් කර ගෙන ඇති සාක්ෂිවලින් එල්ටීටීඊය හා එහි නායකත්වය සිදු කළ යුද අපරාධ පිළිබඳ චෝදනා සඳහා ද බලගතු පදනමක් සැපයෙන්නේය. මෙම චුදිත අපරාධ, බොහෝ දුරට ම, තමන් අල්ලා ගෙන සිටි ප්‍රදේශ තුළ සිටි දෙමළ සිවිල් ජනගහනය මත සීමාවන් පැනවීම, වැඩිහිටියන් හා ළමයින් බලාත්කාරයෙන් බඳවා ගැනීම හා එකඟ නොවන්නන් සාහසික ලෙස මර්දනය කිරීම පිළිබඳව කැරලිකරුවන් සතු දීර්ඝ ඉතිහාසය පුළුල් වීමක් වන්නේය. ආරක්ෂක හමුදා නොකඩවා වන්නිය තුළට එන විට හා ආණ්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශ තුළට මාරු වීමට සිවිල් වැසියන්ට ඉඩ දෙන ලෙස එල්ටීටීඊයෙන් ඉල්ලා සිටින විට, කොටි දෙමළ ජනයා මත තම ග්‍රහණය තද කළෝය. 2009 ආරම්භයේ දී ඔවුන්ගේ මිලිටරි පරාජය පැහැදිලි වූ විටත්, විවෘත මානුෂීය බිම් තීරුවකට (human corridors) එකඟ වීම හෝ යටත් වීමක් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ප්‍රයත්න දැරීම වැනි සිවිල් වැසියන් ආරක්ෂා කළ හැකි පියවරයන් ගැනීමට ඔවුහු අසමත් වූවෝය.

ආරක්ෂක හමුදා නොකඩවා යුද මුක්ත කලාප තුළට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම හා ඉදිරියට ඒම, එල්ටීටීඊය සම්බන්ධයෙන් වැඩෙන අපේක්ෂා භංගත්වයත් මුළාව දුරු වීමත් සමග ඒකාබද්ධ වූයේය. යුද පෙරමුණු හරහා ගොස්, දෙමළ ජනයාට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඉතිහාසයක් සහිත ආණ්ඩුවකට යටත් වීමෙන් ඇති වන අවදානම්වලට වඩා, අනාරක්ෂිත බව වැඩි වෙමින් පවතින ප්‍රදේශ තුළට ආපසු යාමට බල කෙරෙමින් පවතින තත්ත්වය නිසා ඇති වන අවදානම් දැවැන්ත බව, එමගින් බොහෝ සිවිල් වැසියන්ට ඒත්තු ගන්වනු ලැබුණි. මීට ප්‍රතිචාර වශයෙන්, සිවිල් වැසියන් ප්‍රදේශය මාරු කිරීම නතර කොට ඔවුන් ආපසු හරවන ලෙස, ඔවුන් එය ප්‍රතික්ෂේප කළ හොත් ඔවුන්ට වෙඩි තබන ලෙස, එල්ටීටීඊය සිය සාමාජිකයන්ට අණ කළේය. ඔවුහු දරුණු ලෙස තුවාල ලබා වෛද්‍ය රැකවරණය පතමින් සිටි ඇතැමුන් ද වැළැක්වූ අතර, සටන්කරුවන් හෝ යුද පෙරමුණුවල කම්කරුවන් ලෙස සේවය කිරීම සඳහා බලාත්කාරයෙන් සිවිල් වැසියන් බඳවා ගැනීම නොකඩවා කර ගෙන ගියෝය.[116] මෙකී පුද්ගලයන්ගෙන් බොහෝ දෙනෙක් සටනේ දී ඝාතනයට ලක් වූවෝය.

[116] සටනේ අවසන් මාසවල දී කොපමණ සිවිල් වැසියන් ප්‍රමාණයක් බලාත්කාරයෙන් බඳවා ගනු ලැබුණේ ද යන වග නිසැක ලෙස දැන ගැනීම දුෂ්කර වුවත්, හැකි අවස්ථාවල දී බොහෝ දෙනෙකු



படிப்பகம்

ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවලින් මෙම සිදුවීම් විස්තරාත්මකව දැක්වෙන අතර, එල්ටීටීඊ සාමාජිකයන් ඔවුන්ගේ ඉහළ පෙළේ ප්‍රධානීන්ගේ අණ කිරීම යටතේ යුද අපරාධ කළ බව විශ්වාස කිරීමට ඒවායින් සැලකිය යුතු පදනමක් සම්පාදනය වන්නේය. පහත සාරාංශ කරනු ලබන සාක්ෂිවල දී ද නිදර්ශන දැක්වීම සඳහා යොදා ගනු ලබන්නේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව තුළ සඳහන් නිර්වචනයන්ය. වගකිව යුතු බොහෝ දෙනෙකු මිය ගොස් ඇති නමුත්, මෙම චෝදනා මෙන් ම ඇතැම් ළමයින් බඳවා ගැනීම ඇතුළුව මෙම කාල සීමාව තුළ දී එල්ටීටීඊය සිදු කරන්නට ඇති වෙනත් අපරාධ ද පරීක්ෂා කළ යුතු වන්නේය.[117] ගැටුම් කලාපය තුළ සිටි දෙමළ සිවිල් වැසියන්ට හෝ හිටපු සාමාජිකයන්ට රැකවරණය සැලසිය හැකි ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වූයේ නම් එල්ටීටීඊයේ අපයෝජනයන් පිළිබඳ අතිරේක විශ්වසනීය සාක්ෂි එළිදරව් විය හැකිය. දැනට පවතින තත්ත්වය යටතේ, එල්ටීටීඊ ආධාරකරුවන්ගෙන් එල්ල වන පළිගැනීමේ අවදානම හෝ, ආණ්ඩුවෙන් හෝ, එල්ටීටීඊ ය තහනම් කර ඇති විදේශ ආණ්ඩුවක් විසින් දඬුවම් පැමිණවීමේ අවදානම හේතුවෙන්, එවැනි සාක්ෂි සමඟ ඉදිරිපත් වීමට ඔවුනට කිසිදු දිරිගැන්වීමක් නැත.

## අ. සිවිල් වැසියන් ඝාතනය හා ඔවුන්ට කුරිරු ලෙස සැලකීම

---

පලා ගොස් සිවිල් ජනගහනය වෙත ආපසු යාම ද මීට එක් හේතුවකි; සංඛ්‍යාව දහස් ගණනක් විය හැකි බවට අර්බුද කණ්ඩායම විශ්වාස කරන්නේය.

[117] "වයස අවුරුදු පහළොවට වඩා අඩු ළමයින්, සන්නද්ධ බලකායන් තුළට හෝ කණ්ඩායම් තුළට බලෙන් සේවයට ගැනීම හෝ බඳවා ගැනීම හෝ ඔවුන් එදිරිවාදිකම් තුළ ක්‍රියාකාරී ලෙස යෙදවීම" යුද අපරාධයක් වන්නේය. රෝම ව්‍යවස්ථාව, 8 වගන්තිය (2)(e)(vii). අර්බුද කණ්ඩායම විසින් සම්මුඛ සාකච්ඡාවන්ට ලක් කරනු ලැබුණු ඇසින් දුටු සාක්ෂිකරුවෝ, වැඩිපුර ම සටනේ අවසන් මාස දෙක තුළ දී, එල්ටීටීඊය වයස අවුරුදු පහළොව හෝ ඊට වඩා අඩු බව විශ්වාස කෙරෙන ළමයින් බඳවා ගැනීම කළ බවට වාර්තා කිහිපයක් සැපයුවෝය. වයස අවුරුදු දහසය හෝ දහහත වයසේ අය බඳවා ගැනීම පිළිබඳවත් සාක්ෂි පවතින අතර, එක් සිදුවීමක දී එල්ටීටීඊ බඳවා ගන්නන් වයස අවුරුදු පහළොවේ කණ්ඩායමක් පැහැර ගත්තත් දෙමාපියෝ විරෝධය පා ළමයින් ඉවත් කර ගැනීමට සමත් වූවෝය. ළමයින් බඳවා ගැනීම පිළිබඳ දිගු ඉතිහාසයක් එල්ටීටීඊය සතුව පවතින අතර, යුද්ධය අවසන් වන තෙක් යම් ප්‍රමාණයකට එය කර ගෙන යන්නට ඉඩ තිබේ. 2004 දී කොටින්ගෙන් කැඩී එතැන් සිට ආණ්ඩුව සමග පෙළ ගැසී ඇති "කරුණා කණ්ඩායම" ද ළමා සොල්දාදුවන් බඳවා ගන්නා බවට ඇඟවී ඇත.

www.padippakam.com

ජනවාරි මාසයේ මුල දී නිලධාරීන්ගේ හා සාමාජිකයන්ගේ රැස්වීමක් ඇමතූ එල්ටීටීඊ කර්නල්වරයෙක්, කිසි ම දෙමළ ජාතිකයෙකුට ආණ්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශයට යාම සඳහා වන්නියෙන් ඉවත් වීමට ඉඩ නොදෙන ලෙස ඔවුන්ට උපදෙස් දුන්නේය. දෙමළ ජනයා ප්‍රදේශය මාරු කිරීමට උත්සාහ කරමින් සිටින බව දැන ගත හොත් ඔවුන් නතර කිරීමටත් ඔවුන් ප්‍රතික්ෂේප කළ හොත් හෝ විරෝධය පෑව හොත් උණ්ඩ පොළොවේ වැදී පෙරළා ඔවුන්ට වදින්නට ඉඩ තිබුණ ද ඔවුන් ඉදිරිපිට පොළොවට වෙඩි තැබීමටත් ඔහු තව දුරටත් සාමාජිකයන්ට අණ කළේය. වන්නියෙන් පැමිණි දෙමළ ජනයාට අවසරයකින් තොරව පිටව යා නොහැකිය යනුවෙන් ප්‍රතිපත්තියක් එල්ටීටීඊය යම් කාලයකට පවත්වා ගෙන ගියේය. ජනවාරි මාසයේ සිට, තත්ත්වයන් නොතකා, ඉවත් වී යාමෙන් සියලු දෙමළ ජනයා වැළැක්වීමටත් එසේ කිරීමේ දී මාරක බලය යොදා ගැනීමටත් ආඥාවක් පැවතුණි.[118]

ගැටුම් කලාපය තුළ දී බොහෝ දෙමළ ජනයාටත් එමෙන් ම ආණ්ඩුවටත් එල්ටීටීඊයේ ඉහළ ආඥාපතිත්වයේ චේතනාව පැහැදිලි වූයේය. එල්ටීටීඊයට වුවමනා කළේ, ජනගහනයක් සහිත රාජ්‍යයක් පිළිබඳ බාහිර සංඥා පවත්වා ගෙන යාමට පමණක් නොව සිවිල් වැසියන්ට සිදු වන හානි නොතකා ආරක්ෂක හමුදා නොකඩවා ඉදිරියට එන බව ඔවුන් දැන සිටි නිසා ද, හැකි තාක් කල් සිවිල් ජනගහනය වන්නිය තුළ තබා ගැනීමය.[119] ඔවුන්ගේ ගණන් බැලීම වූයේ - එහෙත් අවසානයේ දී එම ගණන් බැලීම වැරදි එකක් විය - සිවිල් වැසියන්ට සිදු වන හානි වැඩි වීමෙන් අන්තිමේ දී සටන් විරාමයකට තැරැව්කාරකම් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවේ අවධානය ලැබෙනු ඇති බව හා ඒ අනුව එල්ටීටීඊයට නැවත සංවිධානය වීමට හෝ ඇතැම් විට සාකච්ඡාවන්ට පිවිසීමට හැකි වනු ඇති බවය. ඒ අනුව යමින්, හැකිළෙමින් පැවති හා වඩ වඩා මාරක වෙමින් පැවති ගැටුම් කලාපයක් තුළ නතර වී සිටීමට සිවිල් වැසියන් බිය ගන්වා පෙලඹවීම සඳහා, ඉහළ ආඥාපතිත්වය විසින් ඝාතනය කිරීම හා තුවාල කිරීම යොදා ගනු ලැබුණේය. නොවැළැක්විය හැකි ප්‍රතිඵලය වූයේ, ජාත්‍යන්තර මානුෂීය

118 එල්ටීටීඊය කලින් ගොඩබිමින් පලා යාමට උත්සාහ කරන්නන්ට නොව මුහුදින් පලා යාමට උත්සාහ කරන්නන්ට වෙඩි තැබීමට අවසර දී තිබුණි.

119 බලාත්කාරයෙන් එසේ කිරීමට අමතරව මානුෂීය සැපයුම් සැපයීමට අනුබල දීමෙන් ද ඔවුහු එසේ කළෝය. එලටීටීඊය තම සාමාජිකයන් සඳහා ආහාර (එහෙත් ඖෂධ නොවේ) පැහැර ගත් බවට ඇඟවෙන සාක්ෂි පැවතුණත්, බලන්න ඉහත 53 වන පා සටහන, දෙමළ සහන සංවිධානය *(Tamil Relief Organization - TRO)* වැනි එල්ටීටීඊය හා සම්බන්ධ මානුෂීය සංවිධාන ජනගහනයට ආහාර සැපයීමෙහිලා තීරණාත්මක භූමිකාවක් ඉටු කළේය.



படிப்பகம்

www.padippakam.com

නීතිය පැහැදිලිව උල්ලංඝනය කරමින් එල්ටීටීඊය සිවිල් වැසියන්ට සමීපව හා ඇතැම් විට සිවිල් වැසියන් අතරට විහිදීමය.[120]

එල්ටීටීඊ සාමාජිකයන්, සිවිල් වැසියන්ට වෙඩි තැබූ බවට වාර්තා වූ සිදුවීම් බොහෝ ගණනක් ඇත.[121] අර්බුද කණ්ඩායම සතුව පහත දැක්වෙන ඇසින් දුටු සාක්ෂි ඇත්තේය:

- පෙබරවාරි 4 දා හෝ ඒ ළඟ දී, පළමු වන යුද මුක්ත කලාපය තුළ පිහිටි උඩයාර්කඩ්ඩු ආසන්නයෙහි ඒ-35 මාර්ගයට සමීපව, සිය ගණනක් සිවිල් වැසියෝ යුද පෙරමුණු හරහා ගොස් බටහිරට යාමට උත්සාහ කරමින් සිටියෝය. එල්ටීටීඊ සාමාජිකයන් කණ්ඩායමක් ඔවුන් වළක්වමින් ඔවුන් ඉදිරියට පැමිණ ආපසු යන ලෙස සිවිල් වැසියන්ට පැවසුවෝය. ඔවුන් නොකඩවා ගමන් කරද්දී කේඩර අහසට වෙඩි තැබුවෝය; ඔවුන් නොනැවතුණු විට සාමාජිකයන් පොළොවට වෙඩි තැබුවෝය. සිවිල් වැසියන් දහ දෙනෙකුට වැඩි සංඛ්‍යාවකට තුවාල වූ අතර, එක් අයෙක්

[120] ආණ්ඩුව හා අනෙක් අය එල්ටීටීඊයේ ක්‍රියාවන් සඳහන් කර ඇත්තේ "මිනිස් පලිහවල් යොදා ගැනීම" ලෙසය. සාමාන්‍ය අර්ථයෙන් මෙය නිවැරදි වුවත්, එම ක්‍රියාවන් මිනිස් පලිහවල් යොදා ගැනීම පිළිබඳ යුද අපරාධයට සමාන නොවිය හැක්කේය. එම අපරාධය, අපරාධකාරයා "ප්‍රහාරයකින් මිලිටරි ඉලක්කයක් ආරක්ෂා කිරීමට අදහස් කිරීම හෝ මිලිටරි මෙහෙයුම් ආරක්ෂා කිරීම, ඒවාට වාසි සහගත වීම හෝ බාධා කිරීම" ඉල්ලා සිටින්නේය. රෝම ව්‍යවස්ථාව, අපරාධවල මූලයෝ, 8 වගන්තිය (2)(b)(xxiii). මෙය අදාළ වන්නේ, සිවිල් වැසියන් සිටීම ආරක්ෂක හමුදාවන් ඉදිරියට ඒමට බාධාවක් වෙතැයි එල්ටීටීඊය අපේක්ෂා කළේ නම් පමණකි. සාක්ෂිවලින් ඇඟවෙන දෙය නම් එසේ නොවූ බවය. සැබවින් ම, ආණ්ඩුවේ බාධා කිරීම එල්ටීටීඊයට අත්‍යවශ්‍ය ම නොවූයේය. මෙම අපරාධය පිළිබඳ රෝම ව්‍යවස්ථාවේ නිර්වචනය අදාළ වන්නේ, ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වලට පමණක්ය යන්න සැලකිය යුතු කරුණකි. ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය යටතේ, අභ්‍යන්තර සන්නද්ධ ගැටුම්වල දීත් එය අපරාධයක් වේ. මෙම ක්‍රියාවන්, මිනිස් පලිහවල් යොදා ගැනීම පිළිබඳ යුද අපරාධය බවට පත් නොවිය හැකි වුවත්, පහත සාකච්ඡා කෙරෙන"කුරිරු ලෙස සැලකීම" වැනි රෝම ව්‍යවස්ථාව හා ව්‍යවහාරික නීතිය යටතේ අපරාධ බවට පත් විය හැකි වෙනත් අපරාධවලට ඒවා පැහැදිලිව ම අදාළ වන අතර, ඒ අනුව පරීක්ෂාවට ලක් කළ යුතු වේ.

[121] බලන්න, උදා., "War on the displaced," Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 5-10 පිටු; "Let them speak", UTHR (මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය)), දෙක ම කලින් සඳහන් කර ඇත. එල්ටීටීඊ නිලධාරීන් හෝ ඒකක සිවිල් වැසියන්ට ප්‍රදේශය මාරු කිරීමට ඉඩ දුන් අවස්ථා පිළිබඳව ද සාක්ෂි පවතී. ඇතැම් අවස්ථාවල දී සාමාජිකයන් ඔවුන්ට එකතු වූවෝය.



படிப்பகம்

ඝාතනය විය; සෙනග වහා ම විසිර ගියෝය. සාමාජිකයන් විසින් මිය ගිය තැනැත්තා හඳුන්වනු ලැබුණේ ජාතිය පාවා දෙන්නෙකු ලෙසය.

- මාර්තු මාසයේ එක් රාත්‍රියක, පිරිමින්, කාන්තාවන් හා ළමයින් කණ්ඩායමක්, රෝහලට හා පුදුමාතලන්හි එක්සත් ජාතීන්ගේ අංගනයට ආසන්න ප්‍රදේශයේ සිට කලපුව තරණය කිරීමට උත්සාහ කරමින් සිටියෝය. දකුණින් ඉදිරියට පැමිණි එල්ටීටීඊ සාමාජිකයන් රයිෆල්වලින් ඔවුන්ට වෙඩි තැබීමට පටන් ගත්තෝය. මිනිසුන් පස් දෙනෙකු හෝ හය දෙනෙකු එතැන ම මිය ගිය අතර, තවත් හය දෙනෙක් බරපතළ තුවාළ ලබා පසුව රෝහලේ දී මිය ගියෝය. 50කට වැඩි ගණනකට තුවාල සිදු වූයේය.

- පෙබරවාරි මාසයේ හෝ මාර්තු මාසයේ තවත් සන්ධ්‍යාවක දී, සිවිල් වැසියෝ කිහිප දෙනෙක් දෙ වන යුද මුක්ත කලාපයෙන් උතුරට චාලයි දෙසට පලා යාමට උත්සාහ දැරුවෝය. එල්ටීටීඊය ඔවුන්ට වෙඩි තැබීමට පටන් ගත් අතර, පිරිමින්, කාන්තාවන් හා ළමයින් දහහත් දෙනෙකු පමණ ඝාතනය කළේය. පුදුමාතලන් රෝහලෙන් දරුණු ලෙස තුවාල වූ ජනයා ඉවත් කිරීම සඳහා බෝට්ටුවකින් එමින් සිටි ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට පෙන්වීමට, පුද්ගලයෝ කිහිප දෙනෙක් පසුව ඇතැම් සිරුරු වෙරළ වෙත රැගෙන ආවෝය.

- මාර්තු මාසයේ තුන් වන සතිය ආසන්නයේ දී, අවුරුදු දෙකක් වයසැති ගැහැණු දරුවෙකු හා දොළොස් වියැති ගැහැණු ළමයෙකු සහිත පවුලක් පලා යාම සඳහා කලපුව වෙත දිව ගියෝය. එල්ටීටීඊ සාමාජිකයින් දකුණින් ඉදිරියට පැමිණ දොළොස් වයසැති ගැහැණු ළමයාගේ පාදයට වෙඩි තැබුවෝය. සාක්ෂිකරුවෙකු විසින් අභියෝග කරනු ලැබූ විට සාමාජිකයා මෙලෙස පැවසුවේය: "අපට අණ දීල තියෙනවා. මිනිස්සු ඉවත් වෙන්න හැදුවොත් අපිට වෙඩි තියන්න පුළුවන්. ... මම ගැහැණු ළමයාට වෙඩි තැබුවොත් ඔවුන් පැනල යන්න උත්සාහ කරන එක නවත්වාවි. මම තාත්තා මැරුවොත් ඔවුන් පැනල යන එක නවත්වන එකක් නැහැ."

එල්ටීටීඊය වෙනත් ආකාරවලින් ද සිවිල් වැසියන් ප්‍රචණ්ඩත්වයට ගොදුරු කළේය. උදාහරණයක් ලෙස, මාර්තු මාසයේ අග භාගයේ දී සිය ගණනක් ජනයා පුදුමාතලන් රෝහලෙන් හා එක්සත් ජාතීන්ගේ අංගනයෙන් උතුරෙහි පිහිටි ස්ථානයක සිට

www.padippakam.com

බටහිරට කලපුව හරහා පැන යාමට උත්සාහ දරමින් සිටියෝය. ප්‍රයත්නය පිළිබඳව එල්ටීටීඊය කල් තබා දැන ගන්නට ඇති බව විශ්වාස කෙරෙන අතර, එය ජලාශය ආසන්නයේ මුර ස්ථාන පිහිටුවූයේය. ජනයා තරණය කිරීමට උත්සාහ කරන විට එල්ටීටීඊය ඔවුන් වට කර පිරිමින් කාන්තාවන්ගෙන් හා ළමයින්ගෙන් වෙන් කළේය. අවිවාහකව සිටි ඇතැම් අය සටන් කරුවන් ලෙස බලාත්කාරයෙන් බඳවා ගනු ලැබුණු අතර, වයස අවුරුදු දහහතරක් පමණ බවට විශ්වාස කෙරෙන ඇතැම් ළමයි ද ඊට ඇතුළත් වූවෝය. ඉතිරි පිරිමින් එල්ටීටීඊයේ බංකර වෙත යවනු ලැබූ අතර, ඉතිරි කාන්තාවන්ට හා ළමයින්ට ඉවත් වී යාමට ඉඩ දෙනු ලැබුණේය. පවුල් විරෝධය පළ කළ අතර, එල්ටීටීය රිටිවලින් හා පීවීසී පයිප්පවලින් ඔවන්ට පහර දුන්නේය.

ප්‍රචණ්ඩ ලෙස බලාත්කාරයෙන් තරුණයන් බඳවා ගැනීම පිළිබඳ තවත් සිදුවීමක් - එහි දීත් ඇතැමුන් වයස දහහතර තරම් නව යොවුන් වියේ පසු වූවන්ය - වලයාන්මඩම් කතෝලික පල්ලියේ දී මාර්තු 18 දා ආසන්නයේ දී සිදු වූයේය. එල්ටීටීඊය මුල්ලිවයික්කාල්හි පුහුණු කඳවුරු වෙත සිය ගණනක් ගෙන ගිය අතර, එහිදීත් විරෝධය පෑ දෙමාපියන්ට රිටිවලින් හා පීවීසී පයිප්පවලින් පහර දුන්නේය. අර්බුද කණ්ඩායමේ සාක්ෂි හැරුණු විට, බඳවා ගැනීම්වලට එරෙහිව ප්‍රතිරෝධය හා විරෝධය පෑ සිවිල් වැසියන්ට එල්ටීටීඊය වෙඩි තබා ඝාතනය කිරීම පිළිබඳ වාර්තා කිහිපයක් ද පවතින්නේය.[122]

තමන්ගේ උපායාත්මක අරමුණුවලට ගැළපෙන විට, තුවාලකරුවන් හා මිය යමින් සිටි දෙමළ ජනයා සම්බන්ධයෙන් කොටින් සුලු උනන්දුවක් දැක්වූ අවස්ථා පිළිබඳ සාක්ෂි ද ඇත.[123] ජනවාරි 27 දා, පළමු වන යුද මුක්ත කලාපය තුළ සිටි එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සාමාජිකයෝ දෙදෙනා වවුනියාවට යාම සඳහා පුදුකුඩිඉරිප්පුවලින් පිටත් වීමට යත්න දරමින් සිටියෝය. ඔවුහු ආරක්ෂක හමුදා හා එල්ටීටීඊය සමග සාකච්ඡා කර පිටත් වීමේ වේලාවක් හා ආරක්ෂිත බිම් තීරුවක් පිළියෙළ කර ගෙන තිබුණෝය. වවුනියාව රෝහලට ප්‍රවාහනය කිරීම සඳහා එක්සත්

---

[122] බලන්න, උදා., "Let them speak," UTHR (මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය), කලින් සඳහන් කර ඇත, 57, 59 පිටු.

[123] මෙහි සඳහන් කළ ජනවාරි 27 දා සිදුවීමට අමතරව, එල්ටීටීඊ අපරාධ පිළිබඳ තොරතුරු යටපත් කිරීම සඳහා එය තමන් කළ වෙඩි තැබීම්වලින් තුවාල ලබා සිටි සිවිල් වැසියන්ට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නැව්වලින් පිට වී යාමට ඉඩ දීම ප්‍රතික්ෂේප කළ බවට ද වාර්තා චෝදනා කර ඇත. එම, 55 පි.



படிப்பகம்

www.padippakam.com

ජාතීන්ගේ ලොරිවලට හා ගිලන් රථවලට තුවාල ලැබූ 300ක් පමණ ජනයා පටවනු ලැබුණෝය. බොහෝ දෙනෙකුගේ අත් හෝ පාද අහිමි වී තිබුණේය. එහෙත්, ආරක්ෂිත වාහන කණ්ඩායම පුදුකුඩිඉරිප්පු හන්දියට ළඟා වන විට, සටන් නිසා ඔවුන් ඉවත්ව නොයා යුතු බවට එල්ටීටීඊය ඔවුන්ට පැවසුවේය. දැනට මත් තුවාල ලැබූ ජනයා ලොරිවලට පටවා ගෙන ඇති බවත් වහා ම පිටත් නොවුණ හොත් ඔවුන් මිය යා හැකි බවත් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය එල්ටීටීඊයට දැනුම් දුන්නේය. එල්ටීටීඊය එවිටත් ප්‍රතික්ෂේප කළේය. ලොරිවලින් බාන තුරු පොරොත්තු වෙමින් සිටිය දී එක් කාන්තාවක් මිය ගිය අතර, අනෙක් අය පුදුකුඩිඉරිප්පු රෝහලට ආපසු ගිය විට මිය ගියෝය.

එල්ටීටීඊය විසින් ඝාතනය කෙරුණු හෝ තුවාලවලට ගොදුරු කෙරුණු සිවිල් වැසියන් සංඛ්‍යාව තක්සේරු කිරීම මේ අදියරේ දී දුෂ්කර වුවත්,[124] එල්ටීටීඊයේ කෲර ප්‍රතිපත්ති නිසාත් එල්ටීටීඊය පරාජය පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම නිසාත් සියදහස් ගණන් ජනයාගේ ජීවිත අවදානමට ලක් වූයේය. ඉහත දළ වශයෙන් දක්වන ලද සාක්ෂිවලින් එල්ටීටීඊ නායකයන් හා සාමාජිකයන් යුද අපරාධ සිදු කළ බවට හෝ ඒවා සිදු කිරීමට අණ කළ බවට, විශේෂයෙන් ම "... ජීවිතයට හා පුද්ගලයාට ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන් සියලු ආකාරවල ඝාතන [හා] කුරිරු ලෙස සැලකීම"[125] කළ බවට විශ්වාස කිරීමට සැලකිය යුතු පදනමක් සැපයෙන්නේය. මෙම අපරාධවල ප්‍රධාන මූලයන්[126] හා අදාළ සාක්ෂි පිළිබඳ සාරාංශය පහත ආකාරයට වේ:

- **අපරාධකාරයා එක් පුද්ගලයෙකු හෝ වැඩි සංඛ්‍යාවක් ඝාතනය කළේය.** ගැටුම් කලාපයෙන් පලා යාමට උත්සාහ කරමින් සිටි සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් සාමාජිකයන් විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබුණු බව

---

[124] එවැනි සිදුවීම් බොහෝ ගණනක් පිළිබඳව වාර්තා වී ඇති නමුත්, උතුරෙහි දිවි බේරා ගෙන සිටින්නන් වෙත පවතින ප්‍රවේශය සීමිත වීම හේතුවෙන් විස්තරාත්මක තොරතුරු ලබා ගැනීම දුෂ්කර වී ඇත. මීට අමතරව, එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශ තුළ සිටි වෛද්‍ය කාර්ය මණ්ඩලයේ වාර්තා අඩු ගණනේ එකක් හෝ ඇති අතර, කොටින්ගේ බිය ගැන්වීම් නිසා උණ්ඩලවලින් සිදු වූ එල්ටීටීඊ තුවාල කිහිපයක් ෂෙල් වෙඩිවලින් සිදු වූ තුවාල කිහිපයක් ලෙස වාර්තා කළ බව පැවසේ. "Let them speak," UTHR (මානව අයිතිවාසිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය)), කලින් සඳහන් කර ඇත, 68 පි.

[125] රෝම ව්‍යවස්ථාව, 8 වගන්තිය, (2)(c).

[126] රෝම ව්‍යවස්ථාවේ අපරාධ මූලයෝ, 8 වගන්තිය (2)(c)(i)-1 සහ 8 වගන්තිය (2)(c)(i)-2.



படிப்பகம்

ඇසින් දුටු සාක්ෂියෙන් තහවුරු වේ. එමෙන් ම, එසේ කිරීමට එල්ටීටීඊ ආඥාපතිවරුන් සාමාජිකයන්ට අණ කළ බව ද ඉන් පෙන්නුම් කෙරේ.

- **අපරාධකාරයා එක් පුද්ගලයෙකු හෝ වැඩි සංඛ්‍යාවක් මත දරුණු කායික හෝ මානසික වේදනාවක් හෝ පීඩාවක් පැමිණවූයේය.** ආණ්ඩුව අල්ලා ගෙන තිබූ ප්‍රදේශවලට පැන යාමට උත්සාහ කළ සිවිල් වැසියන්ට එල්ටීටීඊය වෙඩි තබා තුවාල සිදු කළ බව, පවුල්වල සාමාජිකයන් බලාත්කාරයෙන් සටනට බඳවා ගැනීම බොහෝ විට ඔවුන්ගේ මරණයට හේතු වූ බව හා සිවිල් වැසියන්ට සැලකිය යුතු හානි සිදු වන්නට යන වගට එල්ටීටීඊය දැන සිටි ප්‍රදේශයකින් ඉවත් වීමට කිසිවෙකුට ඉඩ නොදීම මගින් සිවිල් ජනගහනය පොදුවේ අනතුරට පත් කළ බව පෙන්වන බොහෝ වාර්තා පවතින්නේය. මෙම සියලු ක්‍රියාවන් කරන ලද්දේ තමන් සිවිල් වැසියන් මත දරුණු කායික හෝ මානසික වේදනාවක් හෝ පීඩාවක් පමුණුවන බව පිළිබඳව දැනුවත්වය.

- **එවැනි පුද්ගලයා හෝ පුද්ගලයෝ එදිරිවාදීකම් තුළ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු නොකළ සටන් කළ නොහැකි අය හෝ සිවිල් වැසියන්, වෛද්‍ය කාර්ය මණ්ඩලය හෝ ආගමික කාර්ය මණ්ඩලය වූවෝය.** පැන යාමට උත්සාහ දරමින් සිටිය දී එල්ටීටීඊය වෙඩි තැබූ පුද්ගලයන්, බලාත්කාරයෙන් බඳවා ගන්නා ලද අයගේ පවුල්වල සාමාජිකයන් හා පොදුවේ ගැටුම් කලාපය තුළ සිටි ජනගහනය සිවිල් වැසියෝ වූවෝය. සැබවින් ම, එල්ටීටීඊය බොහෝ විට සිවිල් වැසියන්ගෙන් පලි ගත්තේ ඔවුන් එල්ටීටීඊය වෙනුවෙන් සටන් කිරීම ප්‍රතික්ෂේප කළ බැවින් හෝ එල්ටීටීඊයේ අවශ්‍යතාවන්ට එරෙහිව වෙන යම් ආකාරයකින් ක්‍රියා කරමින් සිටි බැවිනි.

- **මෙම තත්ත්වය තහවුරු කෙරුණේ කවර සැබෑ තත්ත්වයන් යටතේ ද යන වග අපරාධකාරයා දැන සිටියේය.** එල්ටීටීඊයට ජනගහනය මත ප්‍රබල පාලනයක් පැවති අතර, ඔවුන් ඝාතනයට හෝ තුවාලවලට ලක් වූයේ පලා යාමට යත්න දැරීමේ බව දැන එය දැන සිටියේය. එමෙන් ම, එල්ටීටීඊයේ ප්‍රතිපත්ති හේතුවෙන් අනතුරේ වැටුණු අයගෙන් අතිවිශාල බහුතරය සිවිල් වැසියෝ වූවෝය.

## V. පරීක්ෂණ සඳහා පවතින තත්ත්වය

### අ. නීතිමය තත්ත්වය

චූදිත අපරාධවල හා මේ වන විට රැස් කර ඇති සාක්ෂිවල බරපතළ බව හේතුවෙන්, විශ්වසනීය පරීක්ෂණ කර ගෙන යාම සඳහාත් අදාළ තැන්වල දී චෝදනා ඉදිරිපත් කිරීම සඳහාත් බල කරන හේතුවක් සැපයෙන්නේය. මෙය ජාත්‍යන්තර මානුෂීය නීතිය ආන්තික ලෙස උල්ලංඝනය කිරීමක් හෝ "සමපාර්ශ්වීය හානි" (collateral damage) සහිත ආක්‍රමණකාරී මිලිටරි ක්‍රියාවක් පිළිබඳ තත්ත්වයක් නොවන්නේය. යුද නීතිවල හරයට පහර දුන් බරපතළ හා නැවත නැවතත් කළ උල්ලංඝනයන් දෙපාර්ශ්වය විසින්ම ක්ෂමා කිරීම හෝ සාධාරණීකරණය කරනු ලැබූ බව විශ්වාස කිරීමට සැලකිය යුතු පදනමක් සැපයෙන සාක්ෂි පවතී. මෙම තත්ත්වයන් යටතේ වග වීම පවත්වා ගෙන යාමට අසමත් වීමෙන්, යුද්ධයේ කල්ක්‍රියාව නියාමනය කිරීමට හා කෲරකම් වැළැක්වීමට දරන පරිශ්‍රමයන්හිලා සැලකිය යුතු පසුබෑසීමක් ඇති වේ.

මෙම වාර්තාව තුළ විස්තර කරනු ලබන චූදිත අපරාධ සියල්ලට ම පොදු මූලයක් ඇත්තේය: එනම්, සූදානම් වී ඝාතනය කිරීම, තුවාල කිරීම හෝ සිවිල් වැසියන් අනතුරට පත් කිරීමය. එදිරිවාදීකම්වල මුල් අදියරවල දී සටන නීත්‍යානුකූලව සිදු වූ සැලකිය යුතු කාල පරිච්ඡේදයන් පැවතිය ද එය වඩ වඩා කලාතුරකින් ඇති වන තත්ත්වයක් බවට වර්ධනය වූ අතර, මැයි මාසයේ දරුණු සති කිහිපය තුළ දී එම කලාතුරකින් බව උච්චාවස්ථාවට පත් වූයේය. නීත්‍යානුකූල මිලිටරි මෙහෙයුම් දුෂ්කර වන හා සම්පත් අධික වශයෙන් අවශ්‍ය වන වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා දෙපාර්ශ්වය ම පියවර ගෙන තිබුණේය. සාක්ෂිවලින් ඇඟවෙන්නේ, එම අභියෝගයට මුහුණ දෙනවා වෙනුවට ඔවුන් ප්‍රබල ලෙස නීතිමය රාමුව බැහැර කළ බවත් නීති විරෝධී මෙහෙයුම කෙරෙහි සැලකිය යුතු තරමින් විශ්වාසය තැබූ බවත්ය. අවසන් මාස පිළිබඳව ඔවුන් ඉදිරිපත් කළ බොහෝ විස්තරවලින් ඇඟිල්ල දිගු වන්නේ එකිනෙකාටය.[127]

[127] 2009 ඔක්තෝබර් 22 දා අභ්‍යන්තර අවතැන් වූවන් වෙත ලියූ විවෘත ලිපියක දී, ජනාධිපති රාජපක්ෂ මෙලෙස ප්‍රකාශ කළේය: "ඔබගේ පවුල අත්විඳ ඇති පීඩාවන් බොහෝ බව හා දිගු කාලයක් තිස්සේ ඒවා අත්විඳි බව මම දනිමි. ඔබ මත හා ඔබ හා සමානව පීඩාවට පත්ව සිටින අනෙක් සියලු දෙමළ පුරවැසියන් මත මෙම දුෂ්කරතා පටවනු ලැබුණේ, දෙමළ ජනයා ඔවුන්ගේ නොකැමැත්තෙන් උකසට තැබූ, තම පටු අරමුණු දිනා ගැනීම සඳහා භීෂණයට කැප වූ අනුකම්පා

දැනුවත්කම හා අභිප්‍රාය ඔප්පු කිරීම හැම විට ම දුෂ්කර වේ. විශේෂයෙන් ම, මිලිටරිය හා ආණ්ඩුව තුළ සිටින ඉහළ පෙළේ නායකයන් සාපරාධී ක්‍රියාවන්ට අණ දෙන්නට ඇති බව හෝ ඒවා පිළිබඳව දැන සිටි (හෝ දැන සිටිය යුතු) බව හා ඒවා නතර කිරීමට අසමත් වූ බව චෝදනාවලින් ඇඟවෙද්දී, එය එසේ වන්නේය. එහෙත්, වැඩි දුර පරීක්ෂණයක් සඳහා අනුබල දීමට දැනට මත් සැලකිය යුතු සාක්ෂි තිබෙන්නේය. විශ්වසනීය පරීක්ෂණ අඛණ්ඩව කර ගෙන ගිය හොත් තවත් සාක්ෂි මතු විය හැකි අතර, මිලිටරි හා ආණ්ඩු නිලධාරීන්ට සමීප අයට කතා කිරීමට තවත් හේතු ලැබෙනු ඇත. ඉහත සාකච්ඡා කළ චුදිත අපරාධවලට අමතරව - එල්ටීටීඊය විසින් ළමයින් බඳවා ගනු ලැබීම හා තම ආයුධ බිම තබා යටත් වීමට උත්සාහ කරමින් සිටි අය ආරක්ෂක හමුදා විසින් ඝාතනය කරනු ලැබීම ඇතුළුව - තව දුරටත් උල්ලංඝනය කිරීම් සිදු වූ බවට දැනට මත් චෝදනා කරනු ලැබ ඇත. මේවා ද පරීක්ෂා කළ යුත්තේය.

විශ්වසනීය පරීක්ෂණ සඳහා පවතින තත්ත්වයට රාජ්‍ය වාර්තාවලින් තව දුර සහායක් ලැබෙන්නේය - මින් ඇතැම් ඒවා කලින් ඉදිරිපත් කළ කොටස්වල දී ඉස්මතු කරනු ලැබුණේය. කිසි ම තත්ත්වයක් යටතේ කිසි ම සටන් විරාමයක් සඳහා අවස්ථාවක් නොපවතින බව නිල ප්‍රකාශ හා ක්‍රියාවන් ගණනාවකින් පැහැදිලි වූයේය. එල්ටීටීඊය සමඟ "සාකච්ඡා කිරීම" ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් බොහෝ විට කළ ගණන් බැලීම වූයේ මෙය නමුත්, ඇත්ත වශයෙන් ම එය මානුෂීය ප්‍රතිවිපාක නොතකා ඕනෑ ම සටන් විරාමයක් ප්‍රතික්ෂේප කිරීමක් වූයේය. මානුෂීය තත්ත්වය පිළිබඳ ජාත්‍යන්තර සැලකිලිමත් වීම්වලට ප්‍රතිචාර දක්වමින්, ජනාධිපති රාජපක්ෂ මෙලෙස පැවසූ බව උපුටා දක්වා තිබුණි: "අපි එල්ටීටීඊය අවසන් කරනවා, අපි ත්‍රස්තවාදය අවසන්

---

විරහිත සංවිධානයක් විසිනි. තමන් උතුම් දෙමළ ප්‍රජාවේ විමුක්තිදායකයන් බව ඔවුහු කියා සිටියෝය. ඔවුන්ගේ මූලෝපායන් අසාර්ථක වන විට ඔබ තැනින් තැන ගාල් කරන ලද්දෙහිය, ඔබට යැවූ ආහාර, ඖෂධ හා වෙනත් අත්‍යවශ්‍ය දෑ ඔබට ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලැබුණේය. ඔබගේ දරුවන්ට, ඔබ අතර සිටින වැඩිහිටියන්ට ද, මෙම භීෂණයේ බලවේග වෙනුවෙන් ආයුධ උසුලන්නට බල කරනු ලැබුණි. මෙය අප රටේ දෙමළ ජනතාවගේ ප්‍රාර්ථනාව නොවූ බව මට මුළුමනින් ම වැටහේ. අවසානයේ, ඔබගේ ම ජනතාවගේ ලේ බොහෝ සේ වැගිරූ අයගේ ආරක්ෂාව සඳහා මිනිස් පලිහවල් හා ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගැනීමෙන් පසු, ඔබ ඔබගේ ම මව් බිමේ අවතැන් වූවන් බවට පත් කරනු ලැබුණෝය. මේ සියල්ල සම්බන්ධයෙන් ඔබගේ නිර්දෝෂ භාවය අද දින පිළිගනු ලැබේ." "You are on the threshold of a new beginning in life – President tells IDP families," 2009 ඔක්තෝබර් 22, www.priu.gov.lk.

www.padippakam.com

කරනවා, එමෙන් ම මේ රට තුළ කිසි දාක ඊට නැවත සංවිධානය වෙන්න ඉඩ දෙන්නේ නැහැ; එල්ටීටීඊය හැම සටන් විරාමයක් ම යොදා ගෙන තියෙන්නේ ශක්තිමත් වෙන්න, නැවත සංවිධානය වෙන්න හා ප්‍රහාර නැවත දියත් කරන්න, ඒ නිසා සාකච්ඡා නැහැ."[128]

මෙම ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිපත්තිය සියලු තත්ත්වයන් යටතේ පවත්වා ගෙන ගිය බව අනෙක් ප්‍රකාශවලින් ද විදහා දැක්වේ. උදාහරණයක් ලෙස, හඳුනා නොගත් එක් ශ්‍රී ලාංකික ඇමතිවරයෙකු මෙලෙස පැවසූ බව උපුටා දක්වා තිබුණි: "සිවිල් වැසියන්ට හානි සිදු විය හැකිය කියන එක නියත දෙයක් වුණා, දෝෂාරෝපණය භාර ගන්න [ජනාධිපති] රාජපක්ෂ සූදානම්ව සිටියා. මේක හමුදාවට අතිවිශාල විශ්වාසයක් ලබා දුන්නා. සේනාවලට ලබා ගන්න පුළුවන්කම තිබුණු හොඳ ම චිත්ත ධෛර්ය වර්ධනය ඒකයි."[129] මානව හිමිකම් හා ආපදා කළමනාකරණ ඇමති මහින්ද සමරසිංහ, මෙම යුද ව්‍යාපාරය කලින් පරිපාලනයන් පවත්වා ගෙන ගිය ඒවායින් වෙන් කොට දක්වනු ලබන්නේ සිවිල් වැසියන්ට සිදු වන හානි සම්බන්ධ මෙම ඉවසා දැරීම මගින් බව අඟවමින් මෙලෙස පැවසූ බව උපුටා දක්වා තිබුණි: "යුද මෙහෙයුම් අතරතුර දී සිදු වන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හා දෙපසින් වෙඩි තබා ගැනීම තුළ සිවිල් වැසියන් ගිල්වා දමන මානුෂීය අර්බුද හැම විට ම මිලිටරි පසුබැසීමකට අණ කිරීමට හේතු වෙලා තියෙනවා... එල්ටීටීඊය අතීතයේ දී මේ සෙල්ලම කරලා තියෙනවා. නැවත සංවිධානය වෙන්න හා යුද්ධය නැවත ආරම්භ කරන්න ඔවුන් සටන් විරාමය යොදා ගත්තා."[130]

සටන් විරාමයක් ප්‍රකාශයට පත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හරහා, නැතහොත් සිවිල් වැසියන්ට සිදු වන හානි මග හැරීම සඳහා මිලිටරි මෙහෙයුම් වෙනස් කිරීම ප්‍රතික්ෂේප කිරීම හරහා - තත්ත්වය වූයේ මෙය බව විශ්වාස කිරීමට සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සැපයේ - තමන් ලබා ගත් මිලිටරි වාසිය විසින් යුද නීති උල්ලංඝනය කිරීමට බල කරනු ලබන්නේය යන ස්ථාවරයෙහි ආණ්ඩුව ප්‍රබල ලෙස පිහිටා ගත්තේය. මෙය නීතිමය වශයෙන් තහවුරු කළ නොහැකි දෙයක් වනවා පමණක් නොව, එල්ටීටීඊය මිලිටරිමය වශයෙන් විනාශ කිරීම සඳහා විකල්ප

---

[128] V.K. Shashikumar, "Lessons from the War in Sri Lanka," කලින් සඳහන් කර ඇත.

[129] එම.

[130] එම.



படிப்பகம்

මූලෝපායන් යොදා ගැනීමට හැකියාවක් පැවතියේය යන කරුණ විසින් එය මුසාවක් බවට ද පත් කෙරෙන්නේය.

අවසන් වශයෙන්, යුද කලාපය තුළ සිටින සිවිල් ජනගහනයේ ප්‍රමාණය, එදිරිවාදීකම්වල අවසන් මාසයන්හි දී හා සතිවල දී ශ්‍රී ලාංකික ආරක්ෂක හමුදා බර අවි යොදා ගත්තේ ද ඒ කොයි ආකාරයෙන් ද, කොපමණ සිවිල් වැසියන් ප්‍රමාණයක් ඝාතනයට ලක් වූයේ ද ඇතුළු කාරණා ගණනාවක් සම්බන්ධයෙන් මිලිටරි හා ආණ්ඩු නිලධාරීන් සාවද්‍ය ප්‍රකාශයන් කළ බව විශ්වාස කිරීමට සැලකිය යුතු පදනමක් සැපයෙන සාක්ෂි තිබෙන්නේය. නිශ්චිතව ම සිදු වූයේ කුමක් ද යන වග විභාග කිරීම සඳහා හා කිසි යම් වැරදි ක්‍රියාවක් සිදු වී තිබේ නම් ඒවාට වගකිව යුත්තන් හඳුනා ගැනීම සඳහා පවතින තත්ත්වය මින් වඩා ශක්තිමත් කෙරෙනවා පමණක්ය.

**ආ. ප්‍රතිපත්තිමය තත්ත්වය**

ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා එල්ටීටීඊ නායකයන් විසින් කරන ලද, ජාත්‍යන්තර මානුෂීය හා මානව හිමිකම් නීතිය උල්ලඝනය කිරීම් පිළිබඳව පවතින බොහෝ විශ්වසනීය චෝදනා අපක්ෂපාතී පරීක්ෂණයකට ලක් නොකෙරෙන තාක් දුරට ශ්‍රී ලංකාවේ සාමය බිඳෙනසුලු වනු ඇත්තේය. දෙමළ හා සිංහල ජනයා සමාන පුරවැසියන් ලෙස ජීවත් වීමට නම්, යුද්ධය තුළ දී, විශේෂයෙන් ම එහි අවසන් මාස තුළ දී සිදු වූයේ කුමක් ද යන වග පිළිබඳ සත්‍යය තහවුරු කළ යුතු වන්නේය. තමන්ගේ ම නිලධාරීන්ට හා ආරක්ෂක හමුදාවන්ට එරෙහිව ඉදිරිපත් කෙරෙන චෝදනා සාධාරණ ලෙස පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික රාජ්‍යය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි බව ශ්‍රී ලාංකික රාජ්‍යය නැවත නැවතත් ඔප්පු කර ඇත්තේය. සත්‍යය සොයා ගැනීමේ එක ම විශ්වසනීය මාධ්‍යය වනුයේ ජාත්‍යන්තර පරීක්ෂණ වන අතර, වඩ වඩා ඒකාධිපතිවාදී වෙමින් පවතින රාජ්‍යයක් තුළ නීතියේ පාලනය නැවත තහවුරු කිරීමට එය අවශ්‍ය වනු ඇත.

**1. දඬුවම් නොලබා සිටීම පිළිබඳ දුෂ්ට චක්‍රය**

සිවිල් වැසියන්ට එරෙහිව කරන ලද බවට මීට පෙර චූදිත අපරාධ සම්බන්ධයෙන් ආරක්ෂක හමුදාවලට චෝදනා ඉදිරිපත් කිරීම සිදු වී ඇත්තේ ඉතා කලාතුරකින්ය. ඒ අයුරින් ම, එක් අතකින් එල්ටීටීඊය මරා ගෙන මැරෙන බෝම්බ ප්‍රහාර කෙරෙහි විශ්වාසය තැබීම නිසා ද එපමණක් නොව අධිකරණ පද්ධතියේ අසාර්ථකත්වයන් නිසා ද දශක ගණනාවක් පුරා කරන ලද ප්‍රචණ්ඩ ක්‍රියාවන් සම්බන්ධයෙන් එල්ටීටීඊ

www.padippakam.com

සාමාජිකයන්ට චෝදනා ඉදිරිපත් කිරීම සිදු වී ඇත්තේත් බෙහෙවින් කලාතුරකින්ය. සිවිල් ගැටුම තුළ දී සිදු වූ බවට චුදිත අපරාධ සියල්ල ම වාගේ දඬුවම් නොලබා බේරී ඇත්තේය.

එමෙන් ම, ශ්‍රී ලංකාවේ යුද්ධයේ සෑම අදියරක දී ම ප්‍රචණ්ඩත්වයේ මට්ටම් ඉහළ ගියේය. සැබවින් ම, අර්බුද කණ්ඩායම විශ්වාස කරන්නේ ගැටුම් මරණවලින් සැලකිය යුතු කොටසක් සිදු වූයේ 2006 හා 2009 අතර දී බවය.[131] ප්‍රචණ්ඩත්වය, සියලු ප්‍රජාවන් තුළ දුක්ගැනවිලි පෝෂණය කර ද ඇත්තේය. බොහෝ දෙමළ ජනයා, සිංහල ජනයා අධිපතිත්වය දරණ රාජ්‍යයක් තුළ තමන්ට කිසි දිනෙක සුරක්ෂිතව ජීවත් විය නොහැකි බව තමන් විශ්වාස කිරීමට පටන් ගත් මොහොත ලෙස, ගැටුම පූර්ණ පරිමාණ යුද්ධයක් බවට ව්‍යාප්ත කළ 1983 ප්‍රචණ්ඩත්වය පෙන්වා දීමට උනන්දු වන්නෝය.[132]

---

[131] නිවැරදි සංඛ්‍යාවක් සම්පාදනය කිරීම සඳහා ආණ්ඩුව හෝ ස්වාධීන බලාධිකාරයක් විසින් කිසි විටෙක කිසි ම ප්‍රයත්නයක් දරනු ලැබ නොමැති වීම හේතුවෙන්, ශතවර්ෂ කාලක් පුරා පැවති ශ්‍රී ලංකාවේ සටනේ දී ඝාතනයට ලක් වූවන් පිළිබඳව කෙරෙන ඕනෑ ම ගණන් බැලීමක්, එය කොතරම් හොඳින් සිදු කළත්, දළ තක්සේරුවක් වනු ඇත්තේය. 2002 සාම ක්‍රියාවලිය ආරම්භයේ දී පොදු එකඟතාව වූයේ, සටනේ පෙර දහනව අවුරුද්ද තුළ දී 65,000-70,000ක් ඝාතනයට ලක් වූ බවය. ක්‍රියාකාරී කැරැල්ල හා ප්‍රතිකැරැල්ල නිර්දේශ කෙරුණු 2005 අග භාගයත් 2009 මැයි මාසයේ දී සිදු වූ යුද්ධයේ අවසානයත් අතර කාලය තුළ දී ද ඊට සමාන සංඛ්‍යාවක් ඝාතනය වන්නට ඇත. යුද්ධයේ අවසන් අවුරුදුවල දී මරණ හා තුවාලකරුවන් පිළිබඳ තොරතුරු මුදා හැරීම ආණ්ඩුව විසින් සක්‍රිය ලෙස වළක්වනු ලැබූ අතර, ආණ්ඩුව පිළිගන්නේ සටනේ අවසන් අවුරුදු තුන තුළ දී ඝාතනයට ලක් වූයේ මිලිටරි කාර්ය මණ්ඩල සාමාජිකයන් 6,000කට ආසන්න සංඛ්‍යාවක් පමණක් බවය. V.K. Shashikumar, “Winning wars: political will is the key,” *Indian Defence Review* (ඉන්ඩියන් ඩිෆෙන්ස් රිවීව්), කලින් සඳහන් කර ඇත. කෙසේ වුව ද, විශ්‍රාමික මිලිටරි නිලධාරීන් හා ආණ්ඩුවට සමීප මූලාශ්‍ර වාර්තා කරන්නේ සැබෑ සංඛ්‍යාව 15,000-20,000 අතර පරාසයක පවතින බවය. සටනේ අවසන් අවුරුදු තුන තුළ දී එල්ටීටීඊ සටන්කරුවෝ දහස් ගණනක් ද - ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු බලෙන් හමුදා සේවයට බඳවා ගත්තවුන්ය - මිය ගියෝය. එවක හමුදාපති සරත් ෆොන්සේකා තක්සේරු කළේ 22,000ක් ඝාතනය කරනු ලැබුණු බවය. එහෙත් මෙම සංඛ්‍යාව මීට වඩා ඉහළ විය හැක්කේය. Shamindra Ferdinando, “Mission Accomplished: Army 60 years today,” *Island* (අයිලන්ඩ්), 2009 ඔක්තෝබර් 10.

[132] ආණ්ඩුවේ සහාය ලැබුණු 1983 ජූලි ජන ඝාතනය තුළ දී ඝාතනයට ලක් වූ දෙමළ වැසියන් සංඛ්‍යාව පිළිබඳ හොඳ ම තක්සේරුව වනුයේ එය 1,000 සිට 4,000 දක්වා පරාසයක් ගන්නා බවය. කුරිරු ප්‍රචණ්ඩත්වයෙන් යුක්ත වූ සති දෙක ආරම්භ වූයේ, උතුරේ යාපන අර්ධද්වීපයේ දී එල්ටීටීඊය සැඟවී සිට කළ ප්‍රහාරයකින් ඝාතනයට ලක් වූ සොල්දාදුවන් දහතුන් දෙනාගේ අවමංගල්‍යයෙන් පසුව කොළඹ දීය. දෙමළ ව්‍යාපාර හා නිවාස සිය ගණනක් ගිනි තබා මුළුමනින් ම විනාශ කරනු



படிப்பகம்

www.padippakam.com

එල්ටීටීඊයේ මරා ගෙන මැරෙන බෝම්බකරුවන් හා ඝාතකයෝ දැන් සමාජය පුරා පැතිර යන ප්‍රචණ්ඩ සංස්කෘතිය පැන නැගී ඒම වඩා බරපතළ තත්ත්වයට පත් කළෝය. සිංහල දේශපාලනඥයන් විසින් දෙපාර්ශ්වය සසඳන අය පතුරු ගසනු ලබන නමුත්, යුක්තිය ද නොඑකඟතාවට හා මානව හිමිකම්වලට ගරු කිරීම ද වෙනුවට දෙපාර්ශ්වය ම තෝරා ගෙන ඇත්තේ ප්‍රචණ්ඩත්වය හා නොඉවසන සුළු ජාතිකවාදයය යන කරුණ ප්‍රතික්ෂේප කළ නොහැකිය. අපරාධකරුවන්ට දඬුවම් පැමිණවීමට අසමත් වීම තුළින්, වඩා බරපතල අපයෝජනයන් සිදු කිරීමට තව තවත් අනුබල දෙනු ඇත.

## 2. ගැටුම නැවත ආරම්භ වීම පිළිබඳ අවදානම්

එල්ටීටීඊයේ පරාජයෙන් හා දෙමළ සිවිල් වැසියන් පත් වූ අවමානයෙන් පෝෂණය වී ප්‍රචණ්ඩත්වයේ යම් පුනර්ජීවනයක් සිදු වේ ද යන වග පිළිබඳව උනන්දු වීමට ජාත්‍යන්තර ප්‍රජාවට විශේෂ හේතු තිබෙන්නේය. ශ්‍රී ලංකාවේ ගැටුම නිර්මාණය කළ බොහෝ හේතු විසඳා නැති අතර, අමනාපයේ අලුත් මූලාශ්‍ර කිහිපයක් මතු වී ඇත්තේය. ආණ්ඩුවේ ආරක්ෂක තන්ත්‍රය බලසම්පන්න වන අතර, යම් ප්‍රචණ්ඩ ප්‍රතිරෝධයක් නැවත මතු වුව හොත් එය මර්දනය කිරීමට තරම් එය පුළුල් නමුත්, යුක්ති සහගත දුක්ගැනවිලි නොවිසඳෙන තාක් ඊට අනියත කාලයක් තිස්සේ එසේ කළ නොහැකි වන්නේය.

ශ්‍රී ලංකාවේ දෙමළ ජනගහනයෙන් හතරෙන් එකක් ජීවත් වන්නේ විදේශ රටවලය. මිලියනයකින් පමණ ශක්තිමත් මෙම ඩයස්පෝරාව (diaspora) බෙදුම්වාදී ප්‍රාර්ථනාවන්ගේ සංචිතයක් වන අතර, අතීතයේ දී ප්‍රචණ්ඩත්වයට අරමුදල් සැපයීමට කැමැත්තෙන් සිට ඇත. ගැටුමේ අවසන් මාස විසින් නව පරම්පරාවක් දේශපාලනීකරණය කරනු ලැබ ඇත්තේය. එල්ටීටීඊයේ පරාජය බොහෝ අය කම්පනයටත් අරමුණක් නැති තත්ත්වයටත් පත් කර තිබෙන්නේය. අවිනිශ්චිත ක්‍රෝධය හා අවමානය ඒකාබද්ධ වී ප්‍රචණ්ඩත්වයට නැවත සහාය දීමක් ආරම්භ වේ ද යන වග

---

ලැබුණේය. සියදහස් ගණනක් සරණාගතයන් බවට පත් වූ අතර, දෙමළ ඩයස්පෝරාවට (diaspora) උපත දෙමින්, බොහෝ දෙනෙක් කෙටි කලකින් රට හැර ගියෝය. ආධුනිකයෝ දහස් ගණනක් විවිධ දෙමළ සටන්කාමී කණ්ඩායම්වලට එක් වූ අතර, අනතුරුව ශ්‍රී ලංකාවේ උතුර හා නැගෙනහිර තුළ ක්‍රියාකාරී වූවෝය. බලන්න Nira Wickramasinghe, *Sri Lanka in the Modern Age*, (කොළඹ, 2006), 285-7 පිටු.



படிப்பகம்

www.padippakam.com

තව මත් පැහැදිලි නැත.[133] එවැන්නක් සිදු වුව හොත්, නව කැරැල්ලකට අරමුදල් දීමට හා එය පතළ කිරීම සඳහා දිනා ගනු ලබනු ඇත්තේ ඩයස්පෝරාවෙන් කුඩා කොටසක් පමණක්ය.

### 3. ශ්‍රී ලාංකික ආකෘතියː ජාත්‍යන්තර මානුෂීය නීතියට එල්ල කළ ප්‍රහාරය

යුද්ධය අවසාන වූ අවස්ථාවේ සිට, ආණ්ඩුව එල්ටීටීඊය පරාජය කළ ආකාරය පිළිබඳව අටුවාකරුවන් හා නිලධාරීන් ගණනාවක් ප්‍රසාදය පළ කොට ඇත. දැඩි මිලිටරි ප්‍රතිචාරයක්, දේශපාලන විසඳුමකට අනුබල දීම ප්‍රතික්ෂේප කිරීමක්, ජාත්‍යන්තර සැලකිලිමත් වීම් නිෂ්ප්‍රභ කිරීමක් හා සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් ඝාතනය කිරීමේ අධිෂ්ඨාන සහගත බවක් යන ඒවායින් සමන්විත "ශ්‍රී ලංකා විකල්පය," ඊශ්‍රායලය, මියැන්මාරය, තායිලන්තය, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, කොලොම්බියාව හා පිලිපීනය ඇතුළු රටවල් ගණනාවක කැරලිවලට හා ප්‍රචණ්ඩ කණ්ඩායම්වලට පිළිතුරක් ලෙස සාකච්ඡාවට ලක් වී ඇත්තේය.[134]

ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ පරිපාලනයෙන් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" භාෂාව සම්බන්ධයෙන් තව දුර තෝරා ගැනීමක් කළ ශ්‍රී ලංකාව, එල්ටීටීඊයට එරෙහි තම සටනේ දී කිසිදු සීමා කිරීමක් නොතිබිය යුතු බව අවධාරණය කිරීමෙන් එම භාෂාව එහි ඉමට ම ගෙන ගියේය. සංකීර්ණ දේශපාලන ගැටලුවක් ත්‍රස්තවාදය පිළිබඳ ගැටලුවක් බවට පහත හෙළනු ලැබුණේය. (සුලුතර ජනයා උනන්දු වන කාරණා කෙරෙහි අවධානය යොමු කිරීමට කිසිදු දේශපාලන යෝජනාවක් ඉදිරිපත් නොකරනු ලැබුණේය.) චීනය, ඉන්දියාව, පකිස්ථානය හා වෙනත් රටවලින් ආණ්ඩුවට සහාය ලැබුණු අතර, බොහෝ බටහිර රටවල් ද මෙම මූලෝපායට සහාය දුන්නේය. ඔවුහු මානව හිමිකම්වල වැදගත්කම පිළිබඳව සඳහන් කළ නමුත්, තමන් ලබා දෙන සහායට හිලව්වක් වශයෙන් සැබෑ ප්‍රතිසංස්කරණ ඉල්ලා නොසිටියෝය.

කෙසේ වුව ද, යුද්ධයේ අවසන් මාසවල ශ්‍රී ලංකා ආණ්ඩුවේ කල්ක්‍රියාව, වඩා විශාල ආණ්ඩු විසින් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" දී යොදා ගනු ලැබූ උපායන්ගෙන් බෙහෙවින් පිට පැන්නේය. මින් ඇතැම් ඒවා නිසැක වශයෙන් ම නීති විරෝධී විය

---

[133] දෙමළ ඩයස්පෝරාව තුළ වර්තමානයේ පවතින දේශපාලන චින්තනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සඳහා, බලන්න Crisis Group Asia Report Nº186 (අර්බුද කණ්ඩායමේ ආසියාව පිළිබඳ වාර්තාව අංක 186), *The Sri Lankan Tamil Diaspora after the LTTE*, 2010 පෙබරවාරි 23.

[134] කලින් සඳහන් කර ඇත, 4 වන පා සටහන.



படிப்பகம்

හැකිය. වන්නිය තුළ දී සිවිල් වැසියන්ට සිදු වූ මහා පරිමාණ හානිය, 2009 ජනවාරි මාසයේ දී ගාසාහි දී සිදු වූ වඩා ප්‍රකට සිදුවීම්වලට වඩා බෙහෙවින් විශාල එකක් වූයේය. එමෙන් ම, ඛේදජනක වුවත් ප්‍රතිකැරැල්ලේ අවශ්‍ය පැතිකඩක් ලෙස බටහිර ආණ්ඩු විසින් ආරක්ෂා කරනු ලබන "සමපාර්ශ්වීය හානියට" (collateral damage) වඩා වැඩි එකක් වූයේය. එහෙත්, වන්නිය තුළ සිදු වූ මහා පරිමාණ හානිය ආණ්ඩුවේ ඉහළ මට්ටම්වල දී හිතාමතා සූත්‍රගත කරන ලද ප්‍රතිපත්තියක ප්‍රතිඵල බව විශ්වාස කිරීමට අර්බුද කණ්ඩායම රැස් කර ගෙන ඇති සාක්ෂිවලින් සැලකිය යුතු පදනමක් සැපයේ. එම ප්‍රතිපත්තිය සූත්‍රගත කරනු ලැබුණේ, රෝහල්වලට, වෛද්‍ය මධ්‍යස්ථානවලට, මානුෂීය සේවකයන්ට හා ජනවාර්ගික පදනමක් මත නිර්වචනය වූ සිවිල් වැසියන් කණ්ඩායමකට එරෙහිව ප්‍රහාර එල්ල කරමින් යුද්ධයේ අතිමූලික නීති උල්ලංඝනය කිරීම සඳහාය. ප්‍රතිකැරැල්ල පිළිබඳ "ශ්‍රී ලාංකික ආකෘතියෙන්" පිහිටුවනු ලබනුයේ පැහැදිලි ලෙස ම ප්‍රතික්ෂේප කළ යුතු භයානක පූර්වාදර්ශයක් වේ.

### 4. එක්සත් ජාතීන්ට බාධා පැමිණවීම

සටනේ අවසන් මාසවල දී එක්සත් ජාතීන් කළ ක්‍රියාවන්ගෙන් හා එය පළ කළ නිෂ්ක්‍රියතාවෙන් එහි විශ්වසනීයත්වයට ද තදින් හානි සිදු වූයේය. සන්නද්ධ ගැටුමක දී සිවිල් වැසියන්ගේ ආරක්ෂාව පිළිබඳ තේමාව සම්බන්ධ තම සාකච්ඡා නොකඩවා කර ගෙන ගොස් තිබිය දීත්, සිවිල් වැසියන්ට සිදු වන විශාල හානි හා පීඩාවන් දැන දැන ම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට ආරක්ෂක මණ්ඩලය අසමත් වූයේය.[135]

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන ආණ්ඩුව විසින් අයුතු බලපෑම් කරනු ලැබීමට ඉඩ දුන් අතර, සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සම්බන්ධ

---

[135] උපලේකම් ජනාරල් ජෝන් හොල්ම්ස්ගෙන් මානුෂීය තත්ත්වය පිළිබඳව කෙටි අදහස් ලබා ගනිමින් ආරක්ෂක මණ්ඩලය රැස් වූයේ, සටනේ අවසන් මාස පහ මුළුල්ලෙහි ශ්‍රී ලංකාව පිළිබඳව පාදීය කෙටි සාකච්ඡාවක් සඳහා පමණක් වන අතර, එය ද නොනිල වශයෙන්ය. 2009 ජනවාරි 14 දා හා නොවැම්බර් 11 දා ආරක්ෂක මණ්ඩලය සන්නද්ධ ගැටුමේ දී සිවිල් වැසියන් ආරක්ෂා කිරීම පිළිබඳ තේමාව මත විවාද පැවැත්වූයේය. රැස්වීම් දෙකේ දී ම, වෙනත් ගැටුම් තත්ත්වයන්ට අමතරව ශ්‍රී ලංකාව පිළිබඳව ද සාකච්ඡා වූයේය. නොවැම්බර් 11 දා සම්මත කර ගත් 1894 යෝජනාව තුළ දී, "සිවිල් වැසියන් ඉලක්ක කර ගනු ලබමින් පවතින හෝ සිවිල් වැසියන්ට මානුෂීය සහාය සැපයීමට හිතාමතා බාධා කරනු ලබමින් පවතින සන්නද්ධ ගැටුම් තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට තමන්ට පවතින අධිෂ්ඨානය" ආරක්ෂක මණ්ඩලය නැවතත් ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකාව තුළ තත්ත්වය, ආරක්ෂක මණ්ඩලයේ න්‍යාය පත්‍රය තුළට කිසි විටෙක ඇතුළත් නොකරනු ලැබුණේය.

www.padippakam.com

තම භූමිකාව පහත හෙළනු ලැබූ විට එය පිළිගත්තේය, වඩාත් ම සැලකිය යුත්තේ, වන්නියෙන් සම්පූර්ණ කාර්ය මණ්ඩලය ම ඉවත් කරන ලෙස 2008 සැප්තැම්බර් මාසයේ දී ආණ්ඩුව විසින් අණ කරනු ලැබුණු විට ඔවුන් කඩිනමින් එය පිළිගත් ආකාරයය. ජාත්‍යන්තර මානුෂීය නීතිය ආරක්ෂා නොකිරීමට තීරණය කළ මානව හිමිකම් කවුන්සිලය, ඒ වෙනුවට ආණ්ඩුවේ කල්ක්‍රියාවට ප්‍රශංසා කරමින් යෝජනාවක් සම්මත කළේය. මේ සියල්ලෙන් සිදු වී ඇත්තේ, එක්සත් ජාතීන්ගේ ද ශ්‍රී ලංකාව තුළ හා අන් තැන්වල පවතින එහි නියෝජිත ආයතනවල ද කීර්තිය තව දුරටත් බාදනය වීමය.

## ඇ. වග වීමේ දේශපාලනය

### 1. දේශීය බලාපොරොත්තු නැතිකම

සැබවින් ම, වත්මන් ආණ්ඩුව යටතේ ආරක්ෂක හමුදාවන් විසින් සිදු කරන ලද බවට චූදිත අපරාධ පිළිබඳව කිසි ම අර්ථවත් දේශීය පරීක්ෂණයක් සඳහා කිසි ම අවස්ථාවක් නොපවතින්නේය. මෙම තත්ත්වය ඇතිව තිබෙන්නේ අදාළ නීතිමය රාමුවේ අඩුපාඩුවක් හේතුවෙන් නොවේ. කොළඹ සිටින එක් රාජ්‍ය තාන්ත්‍රිකයෙකුගේ වචනවලින් ඉදිරිපත් කළ හොත්, "පාලන තන්ත්‍රය තමන්ගේ ම අතුණුබහන් එළියට ඇද ගන්නේ නැහැ."[136]

2007 මුල දී පිහිටුවනු ලැබුණු ජනාධිපති පරීක්ෂණ කොමිසමේ අසාර්ථකත්වය ද සහතික කරමින්, ආරක්ෂක හමුදාවල අපයෝජනයන් පිළිබඳව පරීක්ෂා කිරීමට තමන්ට අධිෂ්ඨානයක් නොමැති බව ආණ්ඩුව දැනට මත් ඒකාන්ත වශයෙන් පෙන්නුම් කර තිබෙන්නේය.[137] සටනේ අවසන් මාසවල දී සිවිල් වැසියන්ට කිසිදු හානියක් සිදු

---

[136] Crisis Group interview (අර්බුද කණ්ඩායම පැවැත්වූ සම්මුඛ සාකච්ඡා), කොළඹ, 2009 නොවැම්බර්.

[137] කලින් සඳහන් කර ඇත, 14 වන පා සටහන. බංග්ලාදේශය, ඉන්දියාව, ජපානය හා මලයාසියාව යන රටවල මෙන් ම බටහිර රටවල සාමාජිකයන් ද ඇතුළත් විශිෂ්ට පුද්ගලයන්ගේ ස්වාධීන ජාත්‍යන්තර කණ්ඩායම (International Independent Group of Eminent Persons - IIGEP) ජනාධිපති කොමිසම සම්බන්ධයෙන් මෙලෙස ප්‍රකාශ කළේය: "කෙසේ වුව ද, තමන්ගේ ම හමුදාවන්හි කල්ක්‍රියාව ප්‍රශ්නයට බඳුන් වී ඇති අවස්ථා පිළිබඳව උනන්දුවෙන් පරීක්ෂා කිරීමට කරන වර්තමාන පරීක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ පැත්තෙන් අධිෂ්ඨානයක් නැතිකමක් පවතින බව විශිෂ්ට පුද්ගලයන්ගේ ස්වාධීන ජාත්‍යන්තර කණ්ඩායම වටහා ගෙන ඇත්තේය. IIGEP,



படிப்பகம்

www.padippakam.com

නොවූ බව ආණ්ඩුවේ නිලධාරීන් නොකඩවා ප්‍රකාශ කර ඇත.[138] එම මාස තුළ දී සිදු වූයේ කුමක් ද යන වග පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශ වීමට ඔවුන් ක්‍රියාකාරීව බාධා කර ඇති අතර, සත්‍යය සොයන අයට හා පැවසීමට තොරතුරු ඇති අයට අඩන්තේට්ටම් හා බිය ගැන්වීම් කර ඇත.[139] මෙම තත්ත්වයන් යටතේ, ආරක්ෂක

---

public statement (ප්‍රසිද්ධ නිවේදනය), 2008 අප්‍රේල් 15. ශ්‍රී ලාංකික පරීක්ෂණ කොමිසම්වල අසාර්ථකත්වය පිළිබඳ ඉතිහාසය සම්බන්ධ පුළුල් හා සමස්ත අධ්‍යයනයක් සඳහා, බලන්න Kishali Pinto-Jayawardena, *Post-War Justice in Sri Lanka: Rule of Law, The Criminal Justice System and Commissions of Inquiry Since 1977*, (ජිනීවා, 2010 ජනවාරි). එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 2009 ඔක්තෝබර් වාර්තාව තුළ ඇතුළත් වන චෝදනා සමාලෝචනය කිරීමට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ "විශේෂඥ කමිටුව" මහජන සම්බන්ධතා පිළිබඳ ඉඟියකට වැඩි යමක් ලෙස සැලකිය නොහැක්කේය. විශ්‍රාමික නිලධාරීන්ගෙන් හා විශිෂ්ට පුද්ගලයන්ගෙන් - ඇතැමෙකු ආණ්ඩුවට සමීප බව ප්‍රකටය - සමන්විත මෙම කමිටුවට මුල දී නියෝග කෙරුණේ 2009 අවසානය වන විට ජනාධිපති රාජපක්ෂට වාර්තාවක් ඉදිරිපත් කිරීමටය. එහි නියමිත කාලය අප්‍රේල් මාසයේ අවසානය දක්වා දික් කරන ලද අතර, අනතුරුව නැවතත් 2010 ජූලි මාසය තෙක් දීර්ඝ කරනු ලැබුණේය. එය සිදු කර ඇති පරීක්ෂණ මොනවා ද යන වග පිළිබඳව ප්‍රකටව ඇත්තේ සුලු දෙයකි. ආණ්ඩුවේ ප්‍රකාශයක් කියා සිටින්නේ, එය "රැස්වීම් කිහිපයක් පවත්වා, සන්නද්ධ හමුදාවන්හි ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් ද එමෙන් ම වෛද්‍ය නිලධාරීන් ද ඇතුළුව රජයේ නිලධාරීන් පරීක්ෂාවට ලක් කර" ඇති බව හා "අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු තුළ ජනයාට හා යුද මුක්ත කලාප තුළ කොටු වූ ජනයාට ප්‍රමාණවත් තරම් ආහාර හා වෛද්‍ය සැපයුම් සම්පාදනය කිරීමට ආණ්ඩුව අසමත් වූයේය" යන වගට කෙරෙන චෝදනා සම්බන්ධයෙන් "අත්‍යවශ්‍ය සේවා පිළිබඳ මහ කොමසාරිස්වරයා පරීක්ෂා කිරීම" සඳහා සැලසුම් කරන බවය. "Committee on US State Department Report gets time till end July," 2010 මැයි 12, www.priu.gov.lk.

[138] 2009 ජූලි මාසයේ දී පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක දී, ජනාධිපති රාජපක්ෂ මෙලෙස ප්‍රකාශ කළේය: "කිසි ම මානව අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදු වුණේ නැහැ. සිවිල් වැසියන්ට කිසි ම හානියක් සිදු වුණේ නැහැ." එමෙන් ම ඔහු සිවිල් වැසියන්ට සිදු වූ හානි සම්බන්ධයෙන් එක්සත් ජාතීන් ඉදිරිපත් කළ සංඛ්‍යා ද ප්‍රතික්ෂේප කළේය: "හත්දාහක්? එක වෙන්න කිසි ම විදියක් නැහැ. නැගෙනහිර පළාතේ දී කිසි ම හානියක් සිදු වුණේ නැහැ. උතුරේ දී කිසි ම හානියක් සිදු වුණේ නැහැයි කියා මා කියන්නේ නැහැ. පැනලා යන්න උත්සාහ කරද්දී එල්ටීටීඊ එක ඔවුන්ගෙන් සමහරුන්ට වෙඩි තිබ්බා." "Mahinda Rajapaksa: The Man Who Tamed the Tigers," *Time* (ටයිම්), 2009 ජූලි 13.

[139] සටනේ දී ඝාතනයට ලක් වූ තම පවුල්වල සාමාජිකයන් සඳහා මරණ සහතික ලබා ගැනීමට පොදුවේ උතුර තුළ සිටින දෙමළ ජනයාට තව මත් නොහැකි වී ඇත. අතුරුදන් වූවන්ගේ හෝ ඝාතනයට ලක් වූවන්ගේ ලැයිස්තුවක් සකස් කිරීම සඳහා, කොට්ඨාශ මට්ටමේ ජනගහන ලැයිස්තු කඳවුරු තුළ තිබෙන ලැයිස්තු සමග ප්‍රසිද්ධියේ සසඳා බැලීමක් කර නොමැත; අවසන් මාසවල දී



படிப்பகம்

www.padippakam.com

හමුදාවන්හි කල්ක්‍රියාව පිළිබඳ දේශීය පරීක්ෂණයක් පැවැත්වීම සම්බන්ධයෙන් පැවතිය හැකි එක ම බලාපොරොත්තුව වනුයේ මෙම බාධා කිරීම තව දුරටත් ශක්තිමත් වනු ඇති බව හෝ ජාත්‍යන්තර සැලකිලිමත් වීමේ සැර අඩු වන තෙක් කාලය ගනු ඇති බවය. ප්‍රතික්ෂේප කිරීම, බාධා කිරීම හා මුසාවන් පැවසීම පිළිබඳ ඉතිහාසය අනුව, 2010 මැයි 6 දා ජනාධිපති රාජපක්ෂ විසින් යෝජනා කරනු ලැබූ "සමගි සන්ධානය" හා "මෑත ගැටුමෙන් උගත් පාඩම්" පිළිබඳ කොමිසමේ තත්ත්වය ද මෙය බව විශ්වාස කිරීමට සෑම හේතුවක් ම පවතින්නේය.[140]

චූදිත එල්ටීටීඊ අපරාධ පිළිබඳව දේශීය පරීක්ෂණයක් පැවැත්වීම සම්බන්ධයෙන් වඩා විශාල ඉඩක් පවතින නමුත්, එහි විශ්වසනීයත්වය සම්බන්ධයෙන් බරපතළ සලකා බැලීම් පවතී. එල්ටීටීඊයට චෝදනා ඉදිරිපත් කිරීම පිළිබඳ ආණ්ඩුවේ වාර්තාව අනේකාකාරය. සිවිල් වැසියන්ට එරෙහිව එල්ල කරන ලද ඉහළ අවධානයක් යොමු වූ බෝම්බ පිපිරවීම් හා ආණ්ඩුවේ ඇමතිවරුන් ඝාතනය කිරීම පිළිබඳව චෝදනා කෙරෙන ඇතැම් ඒවා පිළිබඳව අපරාධ අධිකරණ තුළ නඩු විභාග කර ඇතත්, දඬුවම්

---

සටන සිදු වූ ස්ථානයට චාරිකා කිරීමට හෝ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ කඳවුරු තුළ රඳවා තබා සිටින්නන්ගේ යුද කාලීන අත්දැකීම් පිළිබඳව සාකච්ඡා කිරීමට, මානුෂීය සේවකයන්ට හා පුවත්පත් කලාවේදීන්ට මග අවුරා ඇත්තේය; සාක්ෂිකරුවන්ට, ස්වාධීන පුවත්පත් කලාවේදීන්ට හා අයිතිවාසිකම්වලට පක්ෂව කතා කරන්නන්ට නැවත නැවතත් තර්ජනය කර ඇති අතර, රට හැර යාමට බල කර ඇත. ව්‍යවස්ථා මණ්ඩලය පත් නොකිරීම මගින් හා ආණ්ඩුව හිතාමතා කරන බාධා කිරීම් මගින් ජාතික මානව හිමිකම් කොමිසම අඩපණ වී ඇත්තේය.

140 කොමිසම, වෙනත් දේවල් අතර, "එවැනි ගැටුම් තත්ත්වයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන් කවර හෝ ආකාරයකින් උල්ලංඝනය වී තිබේ ද යන වග හා එවැනි ක්‍රියාවන්ට මග පෙන්වන්නට ඇතැයි සිතිය හැකි තත්ත්වයන් පරීක්ෂා කිරීම හා එවැනි ක්‍රියාවන්ට වගකිව යුතු කවර හෝ පුද්ගලයන් හෝ කණ්ඩායම් හඳුනා ගැනීම" සඳහා ද පොරොන්දු වේ. දේශීය හෝ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු කිසිවෙකු පරීක්ෂාවට ලක් කිරීම සඳහා හෝ අත් අඩංගුවට ගැනීම සඳහා කොමිසම අදහස් කරන බවට කිසිදු සංඥාවක් නොමැත්තේය. "President to initiate study on post-conflict lessons learnt and reconciliation," 2010 මැයි 6, www.priu.gov.lk. එය "කිසිවක් ඉටු කර නොගැනීම සඳහා දිගු කාලයක්" ගන්නා තවත් ශ්‍රී ලාංකික කොමිසමකට වැඩි දෙයක් බව විශ්වාස කිරීමට කිසිදු හේතුවක් නොමැත්තේය. "Sri Lanka: Government proposal won't address war crimes," press release (පුවත්පත් නිවේදනය), Human Rights Watch (හියුමන් රයිට්ස් වොච්), 2010 මැයි 7.



படிப்பகம்

www.padippakam.com

නොලබා සිටීම පොදුවේ පැතිර පවතින්නේය.[141] දෙමළ හෝ මුස්ලිම් පුද්ගලයන් පහර කෑ සිද්ධි සම්බන්ධ කවර හෝ නඩුවක් විභාග කර නැති තරම් වේ.[142] ආණ්ඩුව දැන් චූදිත එල්ටීටීඊ අපරාධයන්ට සම්බන්ධ පුද්ගලයන් 10,000ක් පමණ රඳවා තබා ගෙන සිටින අතර, ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු රඳවා ගනු ලැබ ඇත්තේ යුද්ධය අවසන් වීමෙන් ක්ෂණික පසු කාල පරිච්ඡේදයේ දීය.[143] ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට

---

[141] 1996 දී කොළඹ පිහිටි මහ බැංකු ගොඩනැගිල්ලට ට්‍රක් රථ බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් එල්ටීටීඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් හා ඔහුගේ බුද්ධි අංශ ප්‍රධානී පොට්ටු අම්මාන් ඔවුන් අනභිමුඛයෙහි වරදකරුවන් බව ඔප්පු කොට, 2002 ඔක්තෝබර් මාසයේ දී ඔවුන්ට 200 අවුරුද්දක සිර දඬුවමක් නියම කරනු ලැබුණේය. ප්‍රහාරය පුද්ගලයන් 78 දෙනෙකු ඝාතනය කොට 1,300කට වැඩි සංඛ්‍යාවකට තුවාල සිදු කළේය. "Prabhakaran, five others get 200 year sentence," *Daily News* (ඩේලි නිවුස්), 2002 නොවැම්බර් 1. 2005 අගෝස්තු මාසයේ දී එවකට විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීම සම්බන්ධයෙන් ද ප්‍රභාකරන්ට හා පොට්ටු අම්මාන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කරනු ලැබුණි. චූදිත ඉතිරි දෙදෙනෙකු පිළිබඳ නඩුව තව මත් විභාග වෙමින් පවතී. Harischandra Gunaratna, "Four accused in Kadir assassination killed in Eelam War IV," *Island* (අයිලන්ඩ්), 2010 මැයි 8.

[142] සැලකිය යුතු ලෙස මින් බැහැර වන අවස්ථා වන්නේ, 1996 දී යාපනයේ දී දහඅට වයසැති ක්‍රිෂාන්ති කුමාරස්වාමි දූෂණය කොට මරා දැමීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික සොල්දාදුවන් හය දෙනෙකුට එරෙහිව හා 2000 දී බිඳුණුවැව ගම්මානයේ දී දෙමළ රැඳවියන් 28 දෙනෙකු සමූලඝාතනය කිරීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරීන් දෙදෙනෙකු ඇතුළු සිංහලයන් පස් දෙනෙකුට එරෙහිව ඉදිරිපත් වූ චෝදනාවන්ය. පසුව කී සිදුවීමේ දී, අවසානයේ දී චෝදනා පහ ම පරාජය කරනු ලැබුණි. Pinto-Jayawardena, කලින් සඳහන් කර ඇත.

[143] සටනේ අවසන් දිනවල දී, සැකකාර එල්ටීටීඊ සටන්කරුවන් හෝ ආධාරකරුවන් බවට හඳුනා ගැනීමෙන් පසුව බොහෝ දෙනෙක් යටත් වූවෝය, නැත් නම් අවතැන් වූවන්ගෙන් වෙන් කොට තබනු ලැබුණෝය. මෙම ඊනියා "යටත් වූ අය" (surrendees) හෝ "වෙන් කොට තැබූ පුද්ගලයන් (separatees) පහර කෑ සිද්ධි," බොහෝ විට වවුනියාව ආසන්නයේ පිහිටි සංවෘත කඳවුරු තුළ, රඳවා තබා ගෙන සිටින්නේ චෝදනාවකින් හෝ නීතිමය අයිතීන් ලබා දීමකින් තොරවය. 500ත් 1,500ත් අතර පරාසයක වෙතැයි තක්සේරු කෙරෙන තවත් රැඳවියෝ කණ්ඩායමක්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත හෝ හදිසි නීතිය යටතේ රටේ දකුණේ පිහිටි බන්ධනාගාර තුළ හෝ රැඳවුම් මධ්‍යස්ථාන තුළ රඳවා ගනු ලැබ සිටින්නෝය; ඉන් ඇතැමෙක් චෝදනා ඉදිරිපත් කෙරෙන තෙක් හෝ නඩු විභාග කෙරෙන තෙක් වසර ගණනාවක් තිස්සේ රඳවා ගනු ලැබ සිටින්නෝය. යුද්ධයෙන් පසුව රඳවා ගත් අයගෙන් 1,350කට චෝදනා ඉදිරිපත් කෙරෙන බව ආණ්ඩුව නිවේදනය කර ඇත; මොවුන්ගෙන් ඇතැමෙකු දැනට මත් නිත්‍ය බන්ධනාගාර වෙත මාරු කර යවනු ලැබ ඇත. "Tiger military wing forming," *Daily Mirror* (ඩේලි නිවුස්), 2010 මැයි 4.



படிப்பகம்

චෝදනා ඉදිරිපත් කොට නොමැත්තේය. ඔවුන් එසේ කරන්නේ නම් - එම නඩුවල පවතින යෝග්‍යතා නොසලකා - තව දුර කාලයක් අත් අඩංගුවේ ගත කිරීම මග හැරීම සඳහා වරද පිළිගන්නා ලෙස පෙලඹවීම් කිරීම ඉහළ මට්ටමකින් සිදු විය හැක්කේය. සාධාරණ හා කඩිනම් නඩු විභාග පැවැත්වීමෙහිලා හෝ ආරක්ෂක හමුදා විසින් සිදු කරනු ලැබූ අපරාධ කෙරෙහි අවධානය යොමු වීමක් සිදු විය හැකි එල්ටීටීඊයට එරෙහි නඩු විභාග කිරීම සඳහා, ආණ්ඩුවට හැකියාවක් හෝ අවශ්‍යතාවක් තිබෙන බවට කිසි ම සාක්ෂියක් නොමැත්තේය.[144]

## 2. ජාත්‍යන්තර ක්‍රියාව

වග වීම සඳහා බාහිරින් පීඩනය යෙදීම අත්‍යවශ්‍ය නමුත් එහි අවදානම් ඇත්තේය. සංක්‍රාන්තිය යුක්තිය (transitional justice) පිළිබඳ කවර හෝ ක්‍රියාවලියකට පක්ෂව කතා කරන අය සැබෑ උභතෝකෝටික ප්‍රශ්නයන්ට මුහුණ පානු ඇත්තේයඃ එනම්, යුද්ධයත් මිලිටරි ජයග්‍රහණයේ සැලසුම්කරුවන් ලෙස දකිනු ලබන අයත් සිංහලයන් අතර අතිශයින් ජනප්‍රියය; යුද්ධයේ යථාර්ථය පිළිබඳව කිසි ම ස්වාධීන මාධ්‍ය ආවරණයක් නොතිබුණේය; එමෙන් ම, රාජපක්ෂ ආණ්ඩුව හා මිලිටරිය බලගතු බවින් හා විදේශීය භීතිකාවකින් යුක්ත සිංහල ජාතිකවාදයක් වගා කර ඇත්තේය. මේ තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස, යුද්ධය සඳහා සිවිල් වැසියන් දැරූ පිරිවැය පිළිබඳව බොහෝ සිංහලයන්ට කිසි ම පැහැදිලි අදහසක් නොමැත්තේය, ඇතැම්හු එය දැන ගැනීම ප්‍රතික්ෂේප කරන්නෝය; ආණ්ඩුවේ ඉහළ පෙළේ අය ඇතුළු අනෙක් අයගේ වරදකාරිත්වය පිළිබඳව ඇඟවීම් සිදු වී ඇති අතර, තමන් ම ආරක්ෂා කර ගැනීම සඳහාත් තමන්ගේ ක්‍රියාවන් යුක්ති සහගත වූහයි ඔවුන්ට හැඟෙන නිසාත් වග වීම සම්බන්ධයෙන් දරනු ලබන පරිශ්‍රමයන් අවහිර කිරීමට ඔවුන් ක්‍රියාකාරීව උත්සාහ කරනු ඇත.

ඕනෑ ම පරීක්ෂණයක් හෝ පැවැත්වීමට යන බවට වාර්තා වී තිබෙන ඕනෑ ම පරීක්ෂණයක් ශ්‍රී ලංකාවට එරෙහි එල්ටීටීඊ හිතවාදී ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් ලෙස

---

144 ශ්‍රී ලංකාව තුළ දී චෝදනා ඉදිරිපත් කිරීමට ඉඩ තිබෙන යුද්ධය හා සම්බන්ධ එක ම අපරාධ වනු ඇත්තේ එල්ටීටීඊය විසින් කරන ලද ඒවාය යන කරුණ, එම නඩු විමසීමේ කටයුතුවල දී පටිපාටිමය සුරක්ෂිත භාවයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ඉල්ලා සිටින්නේය. ආණ්ඩුවේ අත් අඩංගුවේ පසු වන ඕනෑ ම ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ නායකයෙකු සම්බන්ධයෙන් නඩු විභාග කළ යුතු අතර, එහෙත් එය කළ යුත්තේ ක්‍රියාවලිය සාධාරණ වන ආකාරයට - සාධාරණ බව පෙනෙන ආකාරයට - මධ්‍යස්ථ තුන් වන පාර්ශ්වයක සම්බන්ධය ඇතිවය.

ආණ්ඩුව, මිලිටරිය හා සිංහල ජාතිකවාදීන් විසින් පින්තාරු කරනු ලබනු ඇත.[145] ජාත්‍යන්තර පරීක්ෂණවලින් ලැබෙන ඕනෑ ම සාක්ෂියක් තම දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහි ආයුධයක් ලෙස යොදා ගැනීමට දේශපාලනඥයන් විසින් යත්න දරනු ලබනු ඇත.[146] නඩු විභාග කිරීම සඳහා ජීවත්ව සිටින්නේ ඉහළ පෙළේ කොටි නායකයන් අතළොස්සක් පමණක් වීම, ජාත්‍යන්තර යුක්තිය පිළිබඳ ඕනෑ ම ක්‍රියාවලියක් ආණ්ඩුවට හා සිංහලයන්ට එරෙහි නැඹුරුවකින් යුක්ත එකක් ලෙස දකිනු ලැබීමට වැඩි ඉඩක් ඇති කරන්නේය.

එහෙත්, වග වීම සම්බන්ධයෙන් දරන ජාත්‍යන්තර පරිශ්‍රමයන් ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරත්වයට තර්ජනයක් විය හැකිය හෝ ජනාධිපති රාජපක්ෂගේ ස්ථාවරත්වයට හෝ අනාගතවාදී දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා පවතින අධිෂ්ඨානයට හානි කළ හැකිය යනුවෙන් පවතින භීතීන් පදනම් විරහිතය.[147]

---

145 ශ්‍රී ලංකාව තුළ දී මානුෂීය හෝ මානව හිමිකම් නීතිය සම්බන්ධයෙන් සිදු වී තිබිය හැකි උල්ලංඝනයන් පිළිබඳව වග වීමට පවතින විකල්ප පිළිබඳව තමන්ට උපදෙස් දීම සඳහා විශේෂඥ මණ්ඩලයක් පත් කිරීමට එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාට තිබෙන සැලැස්ම "මුළුමනින් ම අශෝභන හා බලයකින් තොර" එකක් ලෙස ශ්‍රී ලංකාවේ ආණ්ඩුව කෝපයෙන් යුක්තව ප්‍රතික්ෂේප කළේය. ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරනු ලැබූ නිල ප්‍රකාශයක් මෙලෙස කියා සිටියේයඃ "ශ්‍රී ලංකාව පිළිබඳ චෝදනා, එල්ටීටීඊයේ ක්ෂමාලාපකයන් විසින් හා බෙහෙවින් නොමග යවනු ලැබ නැතහොත් වෙනත් හේතුවක් නිසා ශ්‍රී ලංකාවට එරෙහිව එල්ල වූ න්‍යාය පත්‍රයක් මත පැහැදිලිව ම කටයුතු කරමින් සිටි ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන විසින් පොලඹවනු ලැබුණු ව්‍යාජ නිරූපණයන්ය. එම එල්ටීටීඊ ක්ෂමාලාපකයන් විසින් ම වඩ වඩාත් මැතිවරණ පීඩනයට යටත් කරනු ලබන බටහිර ලෝකයේ කොටස් ද පවතින්නේය." "'Special Panel on Sri Lanka uncalled for and unwarranted' – President to Ban Ki-moon," 2010 මාර්තු 6, www.priu.gov.lk.

146 කලින් සඳහන් කර ඇත, 37 වන පා සටහන. සරත් ෆොන්සේකා හා රාජපක්ෂවරුන් අතර පවතින උග්‍ර සතුරුකම හා මිලිටරිය තුළ පවතින බෙදීම් විසින් මෙම තත්ත්වය දිරි ගන්වනු ලැබ ඇති අතර, දෙපාර්ශ්වයට එරෙහි යුද අපරාධ පිළිබඳ චෝදනා සම්බන්ධ තවත් තොරතුරු මුදා හැරීමට එය හේතු විය හැක්කේය.

147 මේවා ආණ්ඩුව විසින් ම පෝෂණය කරනු ලබමින් පවතින භීතීන්ය. උදාහරණයක් ලෙස, 2010 මාර්තු 18 දා එවකට විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම විසින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශය, ශ්‍රී ලංකාව තුළ වග වීම සම්බන්ධයෙන් පවතින විකල්ප පිළිබඳව තමන්ට උපදෙස් දීම සඳහා මණ්ඩලයක් නම් කරන ලෙස එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා කළ යෝජනාව ප්‍රතික්ෂේප කළේය. විදේශ ඇමතිවරයා මෙලෙස අනතුරු ඇඟවූයේයඃ "[ජාත්‍යන්තර ප්‍රජාවේ] පාර්ශ්වයෙන් ගන්නා එවැනි අයුක්ති සහගත පියවරයන් මහජන කෝපය පෝෂණය කරන අතර, ඒවා ජාතික

ආණ්ඩුව ප්‍රතිසංස්කරණ සඳහා මුල පිරීමට තීරණය කළ යුතු ද යනුවෙන් වඩා රැඩිකල් සිංහල ජාතිකවාදීන් විසින් තර්ජනය කරනු ලැබීමට හෝ වළ කපනු ලැබීමට තරම් ඉතා දැඩි බල ග්‍රහණයක් ජනාධිපති රාජපක්ෂ, ඔහුගේ පවුල හා ඔහුගේ ආධාරකරුවෝ පවත්වා ගෙන යති. (සැබවින් ම, වර්තමානයේ දී තමන්ගේ බලය පවත්වා ගැනීම සඳහා අන්තවාදීන් රාජපක්ෂවරුන් මත රඳා පවතිනවා මිස, එය අනෙක් අතට සිදු වනවා නොවේ.)

එමෙන් ම, ශ්‍රී ලංකාවේ 30 වසරක ජනවාර්ගික ගැටුමේ හා යුද්ධයේ මූල හේතූන් කෙරෙහි හෝ රටේ ලිබරල් හා ප්‍රජාතන්ත්‍රවාදී ආයතනවලට යුද්ධය කර ඇති හානිය කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා අවශ්‍ය කරන කවර හෝ ප්‍රතිසංස්කරණයකට මුල පිරීමට රාජපක්ෂ කිසි ම නැඹුරුවක් නොපෙන්වන්නේය. උතුර හා නැගෙනහිර තුළ පවතින දෙමළ කතා කරන ප්‍රදේශවලට බලය බෙදා හැරීම සඳහා වූ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳව හෝ යුද්ධයට හේතු වූ සුලුතරයන්ගේ දුක්ගැනවිලිවලට හා කොන් වීමට විසඳුම් ලබා දීම සඳහා වූ අනෙකුත් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කිසිදු බැරෑරුම් අපේක්ෂාවක් නොමැත්තේය. ජනවාර්ගික මායිම් ඔස්සේ නිර්මාණය කෙරෙන කවර හෝ ස්වරූපයක ෆෙඩරල්වාදයක් හෝ බලය බෙදා හැරීමක් ජනාධිපතිවරයා විසින් දිගු කලක් තිස්සේ බැහැර කරනු ලැබ ඇත. දිගු කලක් තිස්සේ පොරොන්දු වූ 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම වුව ද, එහි අඩංගු වන අතිසීමිත බලය බෙදා හැරීම සහිතව පවා, ක්‍රියාත්මක නොකරන බව වඩ වඩාත් පෙනෙන්නට තිබෙන්නේය. ක්‍රියාත්මක ව්‍යවස්ථා මණ්ඩලය නැවත පිහිටුවීම හරහා, පොලීසිය හා අධිකරණය නිර්දේශපාලනීකරණය කිරීම හරහා හෝ උතුර හා නැගෙනහිර නිර්මිලිටරීකරණය කිරීම හරහා, රාජපක්ෂ පරිපාලනය බලය මත පවත්වා ගෙන යන ග්‍රහණය ලිහිල් කරන බවට කිසි ම ලකුණක් ද නොමැත්තේය.[148] සිදු විය හැකි එක ම ව්‍යවස්ථාමය වෙනස්කම් වනුයේ,

---

සමගි සන්ධානය සඳහා පහසුකම් සැලසීමේ ක්‍රියාවලියට අවශ්‍ය කරන පොදු සම්මුතිය බාදනය කරන්නේය. ශ්‍රී ලංකාවේ දේශපාලන ස්ථාවරත්වය කෙරෙහි බරපතල අතුවිහිදීම් මේ හරහා සිදු විය හැකිය. "Remarks by Hon. Rohitha Bogollagama, Minister of Foreign Affairs to the media on 18th March 2009," www.slmfa.gov.lk.

[148] ඇඳිරි නීතිය පැනවීමේ, දේශපාලන රැස්වීම් හා ප්‍රකාශන තහනම් කිරීමේ, පෞද්ගලික පරිශ්‍රයන් සෝදිසි කිරීමේ හා නිවාස හිමිකරුවන් තමන්ගේ දේපළ තුළ ජීවත් වන අයගේ නම් පොලීසියට වාර්තා කළ යුතු බවට ඉල්ලා සිටීමේ බලය ඇතුළුව බොහෝ හදිසි නීතිවලින් ඇතැම් ඒවා ඉවත් කිරීමට හෝ ලිහිල් කිරීමට 2010 මැයි 5 දා පාර්ලිමේන්තුව ගත් තීන්දුව ධනාත්මකය. කෙසේ වුව ද,

ජනාධිපතිවරයාට තුන් වන වාරයකටත් තනතුරේ සිටීමට ඉඩ දෙමින් හා බහුතරය පදනම් කර ගෙන නියෝජිතයන් තෝරා ගන්නා ඡන්ද ක්‍රමයක් නැවත පිහිටුවමින් රාජපක්ෂගේ, ඔහුගේ පවුලේ හා ඔහුගේ පක්ෂයේ බලය තව දුරටත් දැඩිව තහවුරු කිරීමට සැලසුම් කළ ඒවාය.

මෙම තත්ත්වය තුළ, අර්ථවත් දේශපාලන ප්‍රතිසංස්කරණ දෙසට රාජපක්ෂ ආණ්ඩුව තල්ලු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවට තමන් සතු එක ම බැරෑරුම් බලය පිළිගැන්වෙන්නේ, චූදිත යුද අපරාධ සම්බන්ධයෙන් හා මානව හිමිකම් නීතිය පිළිබඳ මාරක උල්ලංඝනයන් සම්බන්ධයෙන් වග වීමට ස්ථිරසාර හා ක්‍රමානුකූල පීඩනයක් යෙදීමේ දිගු කාලීන සැලසුමකින්ය.[149] එවැනි පීඩනයකින් තොර වුව හොත් ආණ්ඩුවේ ඒකාධිපතිවාදී හා බලගතු ලෙස සිංහල ජාතිකවාදී ස්වභාවය වඩා ගැඹුරු වීමට බෙහෙවින් ඉඩ ඇති අතර, ඒ සමග බොහෝ දෙමළ ජනයාගේ කෝපය හා අවමානය ද ගැඹුරු වී ප්‍රචණ්ඩත්වය නැවත ආරම්භ වීමේ ඉඩක් ඇත්තේය.

වගවීමේ ක්‍රියා පටිපාටි සඳහා සිංහලයන් හා මුස්ලිම්වරුන් දිනා ගැනීම සම්බන්ධ තීරණාත්මක පියවරක් වනුයේ, යුද්ධයේ අවසන් අදියරවල දී හා පෙරාතු අවුරුදුවල දී එල්ටීටීඊය විසින් සිදු කරන ලද අපරාධ පිළිගන්නා ලෙස දෙමළ ඩයස්පෝරාවේ සැලකිය යුතු අංශයන්ට ඒත්තු ගැන්වීමය. එල්ටීටීඊය කළ උල්ලංඝනයන්ගේ බරපතළ ස්වභාවය පිළිබඳව දෙමළ ඩයස්පෝරාවේ සැලකිය යුතු කණ්ඩායමකින් පිළිගැනීම දිනා ගැනීම දුෂ්කර වනු ඇති නමුත්, එය තමන්ගේ නාමයෙන් කළ අපරාධ

---

හදිසි නීති තත්ත්වය බලාත්මකව පවතින අතර, නඩු විභාගයකින් තොරව අත් අඩංගුවට ගැනීමේ හා රඳවා ගැනීමේ අත්තනෝමතික බලතල ද ඒ අනුව බලාත්මකව පවතින්නේය. "Parliament approves Emergency with lesser regulations – Majority of 118 votes," 2010 මැයි 5, www.priu.gov.lk.

[149] වග වීම සම්බන්ධයෙන් යොදන පීඩනය හේතුවෙන්, එක්සත් ජාතීන්, ඉන්දියාව හා බටහිර ආධාර දෙන්නන් ප්‍රමුඛතාව දී ඇති ඇතැම් කෙටි කාලීන කාරණාවල - උදා. උතුරු පළාත තුළ අභ්‍යන්තරව අවතැන් වූවන් ආපසු නිවෙස් බලා යාමේ කටයුතුවලට ප්‍රවේශ වීමට අවස්ථාව හෝ ඔවුන් සඳහා පවතින තත්ත්වයන් වැඩි දියුණු කිරීමට අවස්ථාව - ප්‍රගතිය වඩා දුෂ්කර විය හැක්කේය. වග වීම සම්බන්ධයෙන් බටහිර ආණ්ඩුවලින් හා එක්සත් ජාතීන්ගෙන් එල්ල වන පීඩනය මගින් චීනයට හා අනෙකුත් බටහිර නොවන ආධාර දෙන්නන්ට වැඩි අවකාශයක් පවරා දෙනු ලැබිය හැක්කේය. එහෙත් චීනයේ ආනුභාවය දැනට මත් වර්ධනය වෙමින් පවතින අතර, දැවැන්ත මුදල් ප්‍රමාණයන් වැය කිරීමෙන් හා වැදගත් දේශපාලන මූලධර්ම අත හැරීමෙන් තොරව බටහිර ආධාර දෙන්නන්ට එය දුර්වල කළ නොහැකි වනු ඇත්තේය.

www.padippakam.com

පිළිගැනීමට සිංහලයන්ට අවකාශ විවර කර දීම සඳහා සහායක් වනු ඇත්තේය. බොහෝ දෙමළ ජනයා දකින්නේ ශ්‍රී ලංකාවේ දශක ගණනාවක සිවිල් යුද්ධයේ එක ම ගොදුර තමන් ලෙස වන අතර, වග වීමට පක්ෂව කතා කරන්නන් විසින් බොහෝ සිංහලයන් හා මුස්ලිම්වරුන් අතර පවතින යුද සජ්ජිත අනන්‍යතාව හා ගොදුරක්ය යන හැඟීම හඳුනා ගනු ලැබීම තීරණාත්මක වන්නේය.[150]

අවසානයේ දී, ශ්‍රී ලංකාව සඳහා සක්‍රිය බහුසංස්කෘතික සමාජයක් පැවතීම සඳහාත් එහි ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නැවත ගොඩ නැඟීම සඳහාත් අවශ්‍ය වන්නේ, වඩා බැරෑරුම් වන, අධිකරණමය නොවන, දණ්ඩනීය නොවන, සත්‍යය හා සමගි සන්ධානය පිළිබඳ ක්‍රියාවලියක්ය.[151] දෙමළ ජනයාගේ පීඩාවන් හා අවමානය හඳුනා ගත හැකි මාධ්‍යයක් ද ඔවුන්ගේ පෞද්ගලික හා සාමූහික සුරක්ෂිතතාව ආරක්ෂා කෙරෙන නව රාජ්‍යයක් ගොඩ නැගෙමින් පවතින බවට සහතිකයන් ද එය පිරිනැමිය යුත්තේය. මින් තොර වුව හොත් සිදු විය හැක්කේ, බොහෝ දෙමළ ජනයා අතර පවතින බෙදුම්වාදී හැඟීම් හා ප්‍රචණ්ඩත්වය අඛණ්ඩව පැවතී ගෙන යාම පිළිබඳ අවදානම ඉතිරි වීම මෙන් ම දෙමළ ජනයාගේ ආසන්න දැඩි නික්ම යාමක් හා වඩ වඩාත් ඒකීය ජනවාර්ගික වන ශ්‍රී ලංකාවක් පැවතීමය. සත්‍යය හා සමගි සන්ධානය

[150] 1990 දී, එල්ටීටීඊය මුස්ලිම්වරුන් 100,000කට ආසන්න ප්‍රමාණයක් උතුරු පළාතෙන් නෙරපීම ශ්‍රී ලංකාව තුළ සිදු වී ඇති එක ම විශාල පරිමාණ ජනවාර්ගික ශුද්ධ කිරීමේ ක්‍රියාව (ethnic cleansing) වේ. බොහෝ මුස්ලිම්වරුන් අද වන තෙක් සරණාගත කඳවුරු තුළ රැඳී සිටින අතර, සමාජ හා දේශපාලන පලුදු ගැඹුරු වී තිබෙන්නේය. 1980 ගණන්වල දී හා 1990 ගණන්වල දී, සටන විසින් උතුරෙන් හා නැගෙනහිරෙන් සිංහලයෝ දසදහස් ගණනක් ද බලාත්කාරයෙන් අවතැන් කරනු ලැබුණෝය. අවුරුදු ගණනාවක් තිස්සේ, එල්ටීටීඊ ප්‍රහාරවලින් බොහෝ සිංහල සිවිල් වැසියෝ ඝාතනයට ලක් වූවෝය. බලන්න Crisis Group Asia Report N°141 (අර්බුද කණ්ඩායමේ ආසියාව පිළිබඳ වාර්තාව අංක 141), *Sinhala Nationalism and the Elusive Southern Consensus*, 2007 නොවැම්බර් 7, සහ Crisis Group Asia Report N°134 (අර්බුද කණ්ඩායමේ ආසියාව පිළිබඳ වාර්තාව අංක 134), *Sri Lanka's Muslims: Caught in the Crossfire*, 2007 මැයි 29.

[151] ජවිපෙ දේශපාලන මණ්ඩලය මෙලෙස ප්‍රකාශ කර ඇත්තේය: "විවිධ ප්‍රජාවන් ගොදුරු කරනු ලැබ ඇති අසාධාරණකම් පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා හා ප්‍රජාවන් අතර පවතින අමනාපකම් තුරන් කිරීම ඉලක්ක කර ගත් අව්‍යාජ ජාතික 'සත්‍යය හා සමගි සන්ධානය පිළිබඳ ක්‍රියාවලියක්' තහවුරු කළ යුත්තේය." වර්තමානයේ දී, සත්‍යය පිළිබඳ කොමිසමක් ඉල්ලා සිටින එක ම දේශපාලන පක්ෂය ජවිපෙ වන්නේය. "A practical initiative to overcome challenges Motherland is confronted with after defeating separatist terrorism," 2009 මැයි 27, www.jvpsrilanka.com.



படிப்பகம்

www.padippakam.com

පිළිබඳ සක්‍රිය ක්‍රියාවලියකින්, සිංහලයන්ගේ හා මුස්ලිම්වරුන්ගේ පීඩාවන්හි හා භීතීන්හි සත්‍යතාව හා සුජාතභාවය තහවුරු කිරීම ද දිවයිනේ අඛණ්ඩතාවට පැවති තර්ජනය තව දුරටත් නොමැති බවට සහතිකයන් පිරිනැමීම ද ඉලක්ක කර ගනු ලැබීමට ඉඩ ඇත්තේය. මේ සඳහා, සියලු ජනවාර්ගික ප්‍රජාවන්ට එරෙහිව එල්ටීටීඊය සිදු කළ බොහෝ අපරාධ තහවුරු කිරීම අවශ්‍ය වන්නේය.[152]

කෙසේ වුව ද, ප්‍රජාවන් තුනේ ම බහුතරයන් විසින් සාධාරණ බව පිළිගනු ලබන්නට පෙර එවැනි කවර හෝ ක්‍රියාවලියකට දේශපාලනික හෝ මූල්‍යමය සහාය පිරිනැමීම පිළිබඳව ආධාර දෙන්නන් පරිස්සම් විය යුතුය. වත්මන් ආණ්ඩුව යටතේ, සත්‍යය හා සමගි සන්ධානය පිළිබඳ කවර හෝ ක්‍රියාවලියක් විසින් උපදවනු ලබන්නට ඉඩ තිබෙන්නේ සුලු සත්‍යයක් හා ඊටත් අල්ප සමගි සන්ධානයක් වේ: එනම්, සත්‍යය සෙවීමේ වඩා පුළුල් ක්‍රියාවලියක් සඳහා පවතිනු ඇත්තේ සුලු අවස්ථාවක්ය. ඒ හා සමානව වැදගත් අනෙක් කාරණය වනුයේ, ජනාධිපති රාජපක්ෂ විසින් යෝජනා කරනු ලැබ ඇති "උගත් පාඩම්" පිළිබඳ මණ්ඩලය වැනි ආණ්ඩුව විසින් පවත්වා ගෙන යනු ලබන සත්‍යය හා සමගි සන්ධානය පිළිබඳ කිසිදු ක්‍රියාවලියකට, වග වීම පිළිබඳ ජාත්‍යන්තර ක්‍රියාවලියක් සඳහා ආදේශකයක් වීමට හෝ ඒ සඳහා පවතින සහාය යටින් කපා හැරීමට ඉඩ නොදිය යුතුය යන වගය.

එසේ කීවත්, වඩා අර්ථවත් සමගි සන්ධාන ක්‍රියාවලියක් සඳහා මූලික කටයුතු ඉටු කිරීමට උදව් විය හැකි පියවරයන් ගන්නා ලෙස ආණ්ඩුවට ඒත්තු ගැන්වීමට ගත හැකි පියවරයන් ගණනාවක් පවතියි. මේ අතරට පහත සඳහන් ඒවා ඇතුළත් වනු ඇත්තේය. එනම්, ඝාතනයට ලක් වූ හෝ තුවාල ලැබූ හා දේපළ විනාශ වූ හෝ හානි වූ සිවිල් වැසියන්ට මරණ සහතික නිකුත් කිරීම හා වන්දි නිකුත් කිරීම; ඝාතනයට ලක් වූවන්, තුවාල ලැබූවන් හා අතුරුදන් වූවන් පිළිබඳව ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහාය ඇතිව පූර්ණ ලැයිස්තුවක් සකස් කිරීම; යටත් වූවන්, සැකකාර එල්ටීටීඊ සාමාජිකයන් හා තවමත් කඳවුරු තුළ සිටින අවතැන් වූවන් සහ තමන්ගේ මව් දිස්ත්‍රික්කවලට ආපසු ගියවුන් වෙත පූර්ණ ලෙස ප්‍රවේශ වීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට ඉඩ ලබා දීම; එල්ටීටීඊය සම්බන්ධ වැරදි පිළිබඳව චෝදනා ලැබ සිටින කවර හෝ අයෙකු සම්බන්ධයෙන් ජාත්‍යන්තර නිරීක්ෂකයන් සහිතව සාධාරණ හා කඩිනම්

[152] වර්තමානයේ දී ආණ්ඩුවේ අත් අඩංගුවේ සිටින ඕනෑ ම ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ නායකයෙකු නඩු විභාගවලට යටත් කළ යුතුය. හොඳ ම දේ වනුයේ, ක්‍රියාවලිය සාධාරණ බව පෙනී යන ආකාරයට යම් මධ්‍යස්ථ තුන් වන පාර්ශ්වයක සම්බන්ධය ඇතිව මෙය සිදු කිරීම වේ.



படிப்பகம்

නඩු විභාග ඇති කිරීම; එල්ටීටීඊය සමග සම්බන්ධකම් පැවති බවට සැක කරනු ලබන නමුත්, චෝදනා ඉදිරිපත් කරනු ලැබ නැති සියල්ලන් මුදා හැරීම.

www.padippakam.com

## VI. යුක්තිය සඳහා පවතින විකල්ප

ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා හා එල්ටීටීඊය විසින් සිදු කරනු ලැබුණු බවට චුදිත අපරාධ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ට චෝදනා ඉදිරිපත් කිරීම සඳහා ආසන්න කාලයේ දී ක්‍රියාවට නැංවිය හැකි විකල්පයන් පවතින්නේ සීමිත සංඛ්‍යාවක්ය. යුක්තිය හඹා යාම සම්බන්ධයෙන් ආණ්ඩුවේ බලාධිකාරයන්ට පවතින්නේ සුලු උනන්දුවක් වන අතර, ජාත්‍යන්තර හෝ විදේශීය බලාධිකාරයන්ට අපරාධ ක්‍රියාව සම්බන්ධයෙන් පවතින අවකාශය පටුය. එහෙත් දැන් වහ වහා වැඩ කටයුතුවල යෙදීම - එක්සත් ජාතීන්ගේ නියෝගයෙන් පවත්වනු ලබන ජාත්‍යන්තර පරීක්ෂණයකට ප්‍රමුඛත්වය ලබා දීම - අනාගතයේ දී පුළුල් වග වීමක් සඳහා පීඩනය යෙදීමට පවතින ක්‍රම කීපයෙන් එකක් වන්නේය.

### අ. ජාත්‍යන්තර පරීක්ෂණය

ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසන් මාස පිළිබඳ පුළුල් හා විශ්වසනීය වාර්තාවක් සකස් කිරීමේ දී පළමු පියවර විය යුත්තේ, එක්සත් ජාතීන්ගේ අනුග්‍රහයෙන් සිදු කරනු ලබන ජාත්‍යන්තර පරීක්ෂණයය. ආණ්ඩුව විසින් ත්‍රස්තවාදය පරාජය කරනු ලැබීම ප්‍රශංසා කරමින් ඉදිරිපත් කළ 2009 මැයි යෝජනාව අනුව යමින් මානව හිමිකම් කවුන්සිලය තමන්ගේ ම පරීක්ෂණයක් නොපනවන වග මුළුමනින් ම පාහේ නිසැක වන අතර, ආරක්ෂක මණ්ඩලයේ ක්‍රියාව ද ඒ හා සමානව නොවිය හැක්කක් වන්නේය. කෙසේ වුව ද, තමන්ගේ ම පරීක්ෂණයකට බලය පැවරීම සඳහා මහ ලේකම්වරයාට බලය තිබෙන අතර, එසේ කිරීම සඳහා බලගතු ලෙස දිරි ගැන්විය යුත්තේය.

දෙපාර්ශ්වයේ ම කල්ක්‍රියාව පරීක්ෂා කිරීමට, සාධාරණ කෙටි කාල පරිච්ඡේදයක් තුළ දී සිය කාර්යය සම්පූර්ණ කිරීමට හා කවර හෝ අපරාධයක් සම්බන්ධයෙන් වග වීම සහතික කිරීමට ජාතික හා ජාත්‍යන්තර බලාධිකාරයන් විසින් ගත යුතු පියවරයන් නිර්දේශ කිරීමට පරීක්ෂණයට පැවරිය යුතුය. කොමිසම මහ ලේකම්වරයාට වාර්තා කරනු ඇති අතර, සාක්ෂි රැස් කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳව ඊට දැඩි අවධාරණයක් තිබිය යුත්තේය. මේ සියල්ල සිදු කිරීමට නම්, එක්සත් ජාතීන්ගේ නිලධාරීන් හා සාමාජික රාජ්‍යයන් වග වීම පිළිබඳ දේශීය වැඩ පිළිවෙළවල් ඉල්ලා සිටින ප්‍රකාශවලින් ඔබ්බට යා යුතු අතර, ශක්තිමත් පරීක්ෂණයක් ඇති කිරීමෙහිලා



படிப்பகம்

මහ ලේකම්වරයාට ප්‍රබල ලෙස සහාය දිය යුතුය.[153] අඛණ්ඩව සාක්ෂි මතු වන විට තව දුර පරීක්ෂණ කර ගෙන යාම සඳහා යෙදෙන පීඩනය වැඩි වනු ඇත්තේය.

එක්සත් ජාතීන්ගේ වෙනත් ආයතනවලටට ද වැදගත් භූමිකාවක් පවතින්නේය. ගැටුමේ අවසන් මාස පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවට අදාළව ඒකාබද්ධ දූත කණ්ඩායමක් නිර්මාණය කිරීම සඳහා - අධිකරණයෙන් බැහැර ඝාතන, වධහිංසා පැමිණවීම, ආහාර

[153] "ශ්‍රී ලංකාවට අදාළ වග වීම පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ඉදිරියට කටයුතු කර ගෙන යාමේ දී තමන්ට උපදෙස් දීම" සඳහා විශේෂඥ මණ්ඩලයක් ඇති කිරීමට තමන්ට පවතින අභිප්‍රාය පිළිබඳව බෑන් ජනාධිපති රාජපක්ෂට දැනුම් දී ඇති බව 2010 මාර්තු 5 දා මහ ලේකම් බෑන් කි-මූන්ගේ ප්‍රකාශකයා නිවේදනය කළේය. ඊළඟ දිනයේ, "මිලිටරි ක්‍රියාව හේතුවෙන් සිදු වන ප්‍රධාන මානුෂීය ව්‍යසනයන් ඇතුළත් වන හා සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක මරණවලට හේතු වන මහා පරිමාණයකින් අඛණ්ඩව කෙරී ගෙන යන සන්නද්ධ ගැටුම් සහිත අනෙක් රාජ්‍යයන් පිළිබඳව එවැනි කිසිදු පියවරක් ගෙන නැති බැවින්" සැලැස්ම "පෙර නොවූ විරූ එකක් හා බල රහිත එකක්" බව හඳුන්වමින් රාජපක්ෂගේ කාර්යාලය ප්‍රකාශයක් නිකුත් කළේය."'Special Panel on Sri Lanka uncalled for and unwarranted' – President to Ban Ki-moon," 2010 මාර්තු 6, *www.priu.gov.lk.* පිළිගත නොහැකි අයුරින් ශ්‍රී ලංකාවේ ස්වෛරී භාවය උල්ලංඝනය කිරීමක් ලෙස පවසමින් ආණ්ඩුව ප්‍රසිද්ධියේ විරෝධය පෑමට පියවර ගත්තේය. එවැනි මණ්ඩලයක් පිහිටුවීම සඳහා ඔහුට පවතින අධිකාරයට අභියෝග කර හා සාමාජික රාජ්‍යයක අභ්‍යන්තර කටයුතුවල දී බාධා කිරීම පිළිබඳව චෝදනා කර මහ ලේකම්වරයාට ලිවීමට නොබැඳි ව්‍යාපාරය ඒත්තු ගන්වා ගනිමින්, ශ්‍රී ලාංකික රාජ්‍ය තාන්ත්‍රික ප්‍රහාරය අඛණ්ඩව කෙරී ගෙන ගියේය. 2010 මාර්තු 16 දා, බෑන්ගේ හා රාජපක්ෂගේ 2009 මැයි ඒකාබද්ධ ප්‍රකාශය පිළිබඳව සඳහන් කරමින්, මණ්ඩලය පිහිටුවීමට තමන්ට පවතින අයිතිය බෑන් විසින් තරයේ ප්‍රකාශ කරනු ලැබුණේය. 2009 මැයි ඒකාබද්ධ ප්‍රකාශයේ දී "මහ ලේකම්වරයා, ජාත්‍යන්තර මානුෂීය හා මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා වග වීමේ ක්‍රියාවලියේ වැදගත්කම අවධාරණය කළ" අතර, "එම දුක්ගැනවිලිවලට විසඳුම් ලබා දීම සඳහා පියවර ගැනීමට" ආණ්ඩුව පොරොන්දු වූයේය. මණ්ඩලය "ජාත්‍යන්තර අත්දැකීම මත පදනම් වන ප්‍රමිතීන්, මිනුම් දඬු හා පරාමිතීන් පිළිබඳව මට උපදෙස් ලබා දෙනු ඇති අතර, ඒකාබද්ධ ප්‍රකාශයේ දී සඳහන් කළ ආකාරයේ කවර හෝ වග වීමේ ක්‍රියාවලියකට මග පෙන්විය යුතු වේ...මණ්ඩලය පිහිටුවීම සම්බන්ධයෙන් කිසිදු පමාවක් සිදු නොවන බව පැහැදිලි කිරීමට මම කැමැත්තෙමි"යි බෑන් පැහැදිලි කළේය. "Secretary-General's press conference," 2010 මාර්තු 16, *www.un.org/apps/sg/offthecuff.asp?nid=1391*. මණ්ඩලය ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට පවතින දේශීය විකල්ප සලකා බැලීමෙන් ඔබ්බට යනු ඇතැයි සැකයක් පවතින නමුත්, අද වන තෙක් මණ්ඩලයේ විෂය ක්ෂේත්‍රය, එහි සාමාජිකත්වය හෝ එය වැඩ කටයුතු පටන් ගන්නේ කවර දා ද යන වග පිළිබඳව කිසිදු නිවේදනයක් කර නොමැත්තේ ය. Crisis Group interviews (අර්බුද කණ්ඩායම පැවැත්වූ සම්මුඛ සාකච්ඡා), diplomats and UN officials (රාජ්‍ය තාන්ත්‍රිකයෝ හා එක්සත් ජාතීන්ගේ නිලධාරීහු), 2010 මාර්තු-අප්‍රේල්.

www.padippakam.com

සඳහා ඇති අයිතිය, සෞඛ්‍යය සඳහා ඇති අයිතිය, ත්‍රස්තවාදයට විරුද්ධව ක්‍රියා කිරීමේ දී මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, මානව අයිතිවාසිකම් ආරක්ෂා කරන්නන්ගේ තත්ත්වය හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂ සබැඳියාකරුවන් ද, එමෙන් ම අභ්‍යන්තර අවතැන් වූවන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳව සහ ළමයින් හා සන්නද්ධ ගැටුම පිළිබඳව කටයුතු කරන මහ ලේකම්වරයාගේ නියෝජිතයන් ද යොදා ගත යුත්තේය.

**ආ. ජාත්‍යන්තර අපරාධ අධිකරණය**

වර්තමානයේ දී ජාත්‍යන්තර අපරාධ අධිකරණයට (ICC) ශ්‍රී ලංකාව තුළ ඉටු කරන්නට ඇත්තේ සුලු භූමිකාවකි. ශ්‍රී ලංකාව රෝම ව්‍යවස්ථාවේ පාර්ශ්වකරුවෙකු නොවන නිසා හා පෙරදැකිය හැකි අනාගතය තුළ දී එම ස්ථාවරය වෙනස් විය නොහැකි නිසා, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් හා එල්ටීටීඊ පිළිබඳ චූදිත අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර අපරාධ අධිකරණයට අධිකරණ බලය යොදා ගත හැකි එක ම ක්‍රමය වනුයේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ලවා යොමු කර ගැනීමය.[154] ආණ්ඩුවට රුසියාවේ හා චීනයේ සහාය ලැබෙන තාක් හා ආරක්ෂක මණ්ඩලයේ අනෙක් ස්ථිර සාමාජිකයන් වග වීම පිළිබඳව දෙගිඩියාවෙන් සිටින තාක් එවැනි යොමු කිරීමක් ඉටු කර ගැනීම දුෂ්කර වනු ඇත.[155]

---

[154] ජන සංහාර, යුද අපරාධ හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර අපරාධ අධිකරණයට අධිකරණ බලය ඇත. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII පරිච්ඡේදය යටතේ ක්‍රියා කරන ආරක්ෂක මණ්ඩලයට, එවැනි අපරාධ එකක් හෝ වැඩි ගණනක් සිදු වී ඇති බව පෙනෙන ඕනෑ ම තත්ත්වයක් ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ චෝදකයා වෙත යොමු කළ හැකිය. රෝම ව්‍යවස්ථාව, 13 වගන්තිය. රෝම ව්‍යවස්ථාවේ රාජ්‍ය පාර්ශ්වය ද, "චෝදනා කළ යුත්තේ එක් විශේෂ පුද්ගලයෙකුට ද නැතහොත් පුද්ගලයන් වැඩි සංඛ්‍යාවකට ද යන වග තීරණය කර ගැනීමේ අරමුණින් තත්ත්වය පරීක්ෂා කරන ලෙස චෝදකයාගෙන් ඉල්ලා සිටිනු ලබන" තත්ත්වයන් චෝදකයා වෙත යොමු කරන්නට ඉඩ තිබෙන නමුත්, ප්‍රශ්නයට බඳුන් වී තිබෙන කල්ක්‍රියාව සිදු වූයේ කවර භූමි ප්‍රදේශයක ද නැතහොත් චූදිත පුද්ගලයා කවර ජාතියකට අයත් ද ප්‍රශ්නයට බඳුන් වී තිබෙන අපරාධයට සම්බන්ධ අධිකරණ බලය පිළිගන්නේ රාජ්‍ය පාර්ශ්වයක් ද නැතහොත් රාජ්‍ය නොවන පාර්ශ්වයක් ද යන තත්ත්වයන්ගෙන් අධිකරණ බලය යොදා ගැනීම සීමා වනු ලබන්නේය. එම, 12-14 වගන්ති. චෝදකයා විසින් ස්වාධීනව ද පරීක්ෂණ ආරම්භ කරනු ලැබිය හැකි නමුත්, අධිකරණ බලය යොදා ගැනීම ඒ අයුරින් ම සීමා වන්නේය. එම, 12-13, 15 වගන්ති.

[155] ජාත්‍යන්තර අපරාධ අධිකරණයට නඩු යොමු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට පවතින අධිකරණ බලය තීරණය වන්නේ, ජාත්‍යන්තර සාමයට හා ආරක්ෂාවට පවතින



படிப்பகம்

www.padippakam.com

මෙම තත්ත්වය වෙනස් වුවහොත් උදාහරණයක් ලෙස, අපයෝජනයන් පිළිබඳ සාක්ෂි තවතවත් හෙළිදරවු වුවහොත් යම් වග වීමක් සහතික කිරීම සඳහා ජාත්‍යන්තර අපරාධ අධිකරණයට ඉටු කළ හැකි වැදගත් භූමිකාවක් ඇත. 2002 ජුලි 1 දාට පසුව සිදු කරනු ලැබුණු ජන සංහාර, යුද අපරාධ හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවලට එහි අධිකරණ බලය පැතිරේ.[156]

**ඇ. විදේශීය අධිකරණ බලය**

ජාත්‍යන්තර විකල්ප හැරුණු විට, යුද්ධයේ අවසන් මාසවල දී සිදු කරන ලැබුණු බවට චුදිත අපරාධයන්ට චෝදනා ඉදිරිපත් කිරීම සඳහා අවසර ලැබෙන නීති බොහෝ රටවල ද ඇත්තේය. කෙසේ වුව ද, මෙම අධිකරණ බලතල සියල්ල ම පාහේ, චෝදනා ඉදිරිපත් කිරීමට ඒවාට අවසර ලැබෙන්නට කලින්, චුදිත අපරාධකාරයා සමග - අපරාධය සිදු වන අවස්ථාවේ දී පුරවැසියෙකු වීම හෝ පසුව අධිකරණ වසම තුළ සිටීම වැනි - ඍජු සම්බන්ධයක් ඉල්ලා සිටින්නේය. අපරාධය සිදු වන අවස්ථාවේ ඊට ගොදුරු වූ අයගේ පුරවැසි භාවය ද ප්‍රමාණවත් පදනමක් විය හැකිය. මෙම තත්ත්වයන්හි දී - එනම්, සාක්ෂි රැස් කිරීම සම්බන්ධයෙන් දුෂ්කරතා හා රාජ්‍ය තාන්ත්‍රික ගැටලු ඉදිරිපත් කෙරෙන තත්ත්වයන්හි දී - ඉදිරියට යාමට ආණ්ඩු බොහෝ විට පසුබට වන්නේය.

එහෙත්, අර්ථවත් වග වීමක් ඉටු කර ගැනීමට නම් ශ්‍රී ලංකාවෙන් බාහිර ජාතික අධිකාරයන් විසින් කරනු ලබන පරීක්ෂණ හා චෝදනා ඉදිරිපත් කිරීම් අවශ්‍ය වනු ඇත. විදේශීය අධිකරණයන් තුළ දී, ගොදුරු වූවන් විසින් හෝ ගොදුරු වූවන් වෙනුවෙන් පවරනු ලබන සිවිල් නඩු ද දිරි ගැන්විය යුතු වේ. නීතිය හා ප්‍රතිපත්තිය පිළිබඳ කාරණාවන් සඳහා මෙම ක්‍රියා මාර්ග අවශ්‍යම වේ. වාදයට බඳුන් වී තිබෙන චුදිත අපරාධ මහා පරිමාණ ඒවා වූ අතර, ජාත්‍යන්තර මානුෂීය නිතියේ හර

---

තර්ජන මතය. ශ්‍රී ලංකාව තුළ ගැටුමේ උච්ච අවස්ථාවේ දී එවැනි තර්ජනයක් පවතින බව ආරක්ෂක මණ්ඩලය නොපිළිගත් අතර, සාමයට නව තර්ජනයක් නොපවතින්නේ නම් එය අතීත සිදුවීම් සම්බන්ධයෙන් මැදිහත් නොවිය හැක්කේය.

[156] ශ්‍රී ලංකාව අනාගතයේ දී රෝම ව්‍යවස්ථාව පිළිගැනීම සිදු විය නොහැක්කක් වන අතර, 2002 ජුලි 1 දිනෙන් ඔබ්බට නොයන කලින් දිනයක සිට අධිකරණ බලය බලපවත්වන ආකාරයෙන් ආණ්ඩුව විශේෂයෙන් පිළිගැනීමක් නොකළ හොත්, ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ අධිකරණ බලය ආරම්භ වනු ඇත්තේ යට කී දිනයෙන් පසුව පමණකි. රෝම ව්‍යවස්ථාව, 11 වගන්තිය.



படிப்பகம்

www.padippakam.com

මූලධර්මයන්ට හානි කිරීමට ඒවා තර්ජනය කරන්නේය. එමෙන් ම, වඩාත් ම බැරෑරුම් චූදිත වරදකරුවන් වන්නේ විදේශීය රටවල පුරවැසියන් හෝ පදිංචිකරුවන්ය.

## 1. අපරාධ චෝදනා ඉදිරිපත් කිරීම

එක්සත් ජනපදයට මේ සම්බන්ධයෙන් ඉටු කිරීමට තීරණාත්මක භූමිකාවක් ඇත්තේය. ගෝඨාභය රාජපක්ෂ පුරවැසිකම පිළිගනු ලැබුණු පුරවැසියෙකු වන අතර, හිටපු හමුදාපති සරත් ෆොන්සේකා ස්ථිර පදිංචිකරුවෙක්ය.[157] එක්සත් ජනපදය, ප්‍රතිපත්තිය පිළිබඳ කාරණාවක් ලෙස සලකා, වග වීම පිළිබඳව පවත්නා කවර හෝ න්‍යායක පදනම් කර ගෙන මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ හා යුධ අපරාධ සිය පුරවැසියන්ට හා වැසියන්ට එරෙහි චෝදනා පූර්ණ ලෙස පරීක්ෂා කළ යුතු අතර, අදාළ තැන්වල දී චෝදනා ඉදිරිපත් කළ යුත්තේය. අවාසනාවන්ත ලෙස, එක්සත් ජනපද නීතියේ අවකාශය පටුය, එහෙත් අඩු ගණනේ පහත දැක්වෙන ඒවා පරීක්ෂා කිරීම සඳහා පැහැදිලි නීතිමය පදනමක් ඇත්තේයඃ එනම්, චූදිත අපරාධකාරයා එක්සත් ජනපද පුරවැසියෙකු වන තාක් දුරට, ඝාතනය, හිතාමතා බරපතළ ශාරීරික හානි සිදු කිරීම හා කුරිරු හෝ අමානුෂික සැලකීම පිළිබඳ යුද අපරාධ;[158] චූදිත වරදකාරයා එක්සත් ජනපද පුරවැසියෙකු වන හෝ එක්සත් ජනපද භූමි ප්‍රදේශය තුළට පැමිණි

[157] ගෝඨාභය හා ෆොන්සේකා, ජන සංහාරයට එරෙහි දෙමළ ජනයා (Tamils Against Genocide - TAG) නමින් හැඳින්වෙන සංවිධානයක් විසින් ජන සංහාරය, වධහිංසා පැමිණවීම හා යුද අපරාධ සම්බන්ධයෙන් එක්සත් ජනපදය තුළ දී චෝදනා ඉදිරිපත් කළ යුතු බවට කෙරෙන උද්ඝෝෂණ ව්‍යාපාරයක එල්ලය බවට පත්ව සිටින්නෝය. බලන්න, www.tamilsagainstgenocide.org.

[158] එක්සත් ජනපද යුද අපරාධ පණතට අනුව, අනුපිළිවෙළින් ගත විට මෙම අපරාධ පිළිබඳ නිර්වචන වනුයේඃ "රෝගී වීම, තුවාල වීම, රඳවා තැබීම හෝ වෙන යම් තත්ත්වයන් විසින් සටනින් ඉවත් කරනු ලැබ ඇති අයද අතුළුව, එදිරිවාදිකම් තුළ ක්‍රියාකාරීව සහභාගි නොවන, එක් පුද්ගලයෙක් හෝ පුද්ගලයන් වැඩි සංඛ්‍යාවක් , හිතා මතා ඝාතනය කරන  හෝ, ඝාතනය කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම හෝ, යත්න දරන හෝ, මෙම උපකොටස යටතේ වෙන යම් වරදක් කිරීම තුළදී, හිතා මතා හෝ නොහිතා මතා ඝාතනයක යෙදෙන පුද්ගලයෙකුගේ ක්‍රියාව'', "... යුද නීති උල්ලංඝනය කරමින්, නීත්‍යනුකූල සටන්කරුවන් ඇතුළු එක් පුද්ගලයෙකුට හෝ පුද්ගලයන් කිහිප දෙනෙකුට බරපතළ ලෙස ශාරීරිකව හානි කිරීම සඳහා හිතාමතා හේතු වන හෝ කුමන්ත්‍රණය කරන හෝ යත්න දරන පුද්ගලයෙකුගේ ක්‍රියාව;" සහ "... තම අත් අඩංගුවේ පසු වන හෝ පාලනය යටතේ සිටින වෙනත් කෙනෙකු මත බරපතළ ශාරීරික අපයෝජනය ඇතුළු දරුණු හෝ බරපතළ ශාරීරික හෝ මානසික (නීත්‍යනුකූල දණ්ඩනවලට අනන්‍ය වේදනාව හෝ පීඩාව හැර) වේදනාව හෝ පීඩාව පැටවීමට අදහස් කරන ක්‍රියාවක් සිදු කරන හෝ සිදු කිරීමට කුමන්ත්‍රණය කරන හෝ යත්න දරන පුද්ගලයෙකුගේ ක්‍රියාව."



படிப்பகம்

www.padippakam.com

තැනැත්තෙකු වන තැන්වල දී වධහිංසා පැමිණවීම පිළිබඳ යුද අපරාධ;[159] චූදිත අපරාධකාරයා එක්සත් ජනපද පුරවැසියෙකු හෝ ස්ථිර පදංචිකරුවෙකු හෝ එක්සත් ජනපද භූමි ප්‍රදේශය තුළට පැමිණි තැනැත්තෙකු වන තැන්වල දී වයස පහළොවට අඩු ළමා සොල්දාදුවන් යොදා ගැනීම හෝ බඳවා ගැනීම පිළිබඳ යුද අපරාධ.[160] අධිකරණ දෙපාර්තමේන්තු (Department of Justice - DOJ) ඒකකය තුළ සිටින මෙම අපරාධ සම්බන්ධයෙන් වගකීම දරණ චෝදකයන්[161] එල්ටීටීඊයට සම්බන්ධ පුද්ගලයන්

---

[159] එක්සත් ජනපද වධහිංසා පැමිණවීම පිළිබඳ පනත (18 USC 2340, 2340A) වධහිංසා පැමිණවීම නිර්වචනය කරන්නේ, "තම අත් අඩංගුවේ හෝ කායික පාලනය යටතේ සිටින වෙනත් පුද්ගලයෙකු මත (නීත්‍යානුකූල දණ්ඩනවලට අනන්‍ය වේදනාව හෝ පීඩාව හැර) දරුණු ශාරීරික හෝ මානසික වේදනාව හෝ පීඩාව පැටවීමට විශේෂයෙන් අදහස් කරන, නීතියේ ව්‍යාජය යටතේ ක්‍රියා කරන පුද්ගලයෙකු විසින් කරනු ලබන ක්‍රියාවක්" ලෙසය.

[160] එක්සත් ජනපද ළමා සොල්දාදුවන් පිළිබඳ පනත (18 USC 2442) මෙලෙස සම්පාදනය කරයිඃ " දැනුවත්ව, (1) අවුරුදු 15ට අඩු වයසේ පසු වන පුද්ගලයෙකු සන්නද්ධ හමුදාවක් හෝ කණ්ඩායමක් තුළ සේවය කිරීම සඳහා බඳවා ගන්නා, ලැයිස්තු ගත කර ගන්නා හෝ බලෙන් හමුදාවට බඳවා ගන්නා; හෝ (2) "එදිරිවාදීකම් තුළ ක්‍රියාකාරීව සහභාගි වීමට අවුරුදු 15ට වඩා අඩු වයසේ පසු වන පුද්ගලයෙකු යොදා ගන්නා කවර හෝ පුද්ගලයෙකුට" දඬුවම් පැමිණවිය යුතු වේ. "එදිරිවාදීකම් තුළ ක්‍රියාකාරීව සහභාගි වීම" නිර්වචනය කරනු ලබන්නේ, "(අ) කඩාකල්පපල් කිරීම ඇතුළුව සටනට සම්බන්ධ සටන් හෝ මිලිටරි ක්‍රියාවන් තුළ කොටස්කරුවෙකු වීම සහ උපාය දූතයෙකු, පණිවුඩකරුවෙකු ලෙස හෝ මිලිටරි මුර පොළක සේවය කිරීම; හෝ (ආ) සැපයුම් ප්‍රවාහනය කිරීම හෝ වෙනත් සේවාවන් සැපයීම ඇතුළුව සටනට සම්බන්ධ ඍජු ආධාරක ක්‍රියාකාරිත්වයන්හි කොටස්කරුවෙකු වීම" ලෙසය. වරද එක්සත් ජනපදයෙන් පිටත සිදු වන තැන්වල දී, චූදිත වරදකරු එක්සත් ජනපද පුරවැසියෙකු, ස්ථිර පදිංචිකරුවෙකු හෝ පුරවැසිභාවය නොතකා එක්සත් ජනපදය තුළ සිටින්නේ නම් අධිකරණ බලය ඇත්තේය.

[161] යුද අපරාධකරුවන්ට හා මානව හිමිකම් උල්ලංඝනය කරන්නන්ට චෝදනා ඉදිරිපත් කිරීම සඳහා නව ඒකකයක් ඇති කරන බව, 2010 මාර්තු 30 දා අධිකරණ දෙපාර්තමේන්තුව නිවේදනය කළේය. මෙම තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා, මානව හිමිකම් හා විශේෂ චෝදනා ඉදිරිපත් කිරීමේ අංශයට (Human Rights and Special Prosecution Section - HRSP) නව අරමුදල් හා කාර්ය මණ්ඩලයක් ලැබී ඇත. මේ වන තෙක්, කවර හෝ එක්සත් ජනපද යුද අපරාධයක්, වධහිංසා පැමිණවීමක් හෝ ළමා සොල්දාදුවන් පිළිබඳ නීති යටතේ දඬුවම් පමුණුවා ඇත්තේ එක් අයෙකුට පමණක්ය. 1999 අප්‍රේල් හා 2003 ජූලි අතරතුර ලයිබීරියාවේ දී වධහිංසා පැමිණවීමක් සිදු කිරීම පිළිබඳව, 2008 දී එක්සත් ජනපද පුරවැසි, හිටපු ලයිබීරියානු ජනාධිපති චාල්ස් ටේලර්ගේ පුත්‍ර (චකී ටේලර් නමින් ද හඳුන්වනු ලබන) කනිෂ්ඨ රෝයි එම්. බෙල්ෆාස්ට්ට දඬුවම් පමුණුවනු ලැබුණේය. මානව හිමිකම් හා විශේෂ චෝදනා ඉදිරිපත් කිරීමේ අංශය තම පළමු වන අත් අඩංගුවට ගැනීම සිදු කළේ, 2010 මැයි 5 දාය - රටවැසි භාවය ලබා ගැනීම පිළිබඳ තම අයැදුම් පත පදනම් කර ගනිමින්



படிப்பகம்

ඇතුලු එම පුද්ගලයන් එක්සත් ජනපදය තුළ සිටින්නේ නම් හෝ එක්සත් ජනපදය තුළ හෝ තුළට චාරිකා කරමින් සිටින්නේ නම් එක්සත් ජනපද අධිකරණ බලය තුළ චූදිත අපරාධ හඹා යාම සඳහා පවතින වගකීම පිළිබඳ සියලු න්‍යායන් සලකා බැලිය යුතුය.

